326 වන කාණ්ඩය - 03 වන කලාපය
தொகுதி 326 - இல. 03
Volume 326 - No. 03

2026 අප්‍රේල් 09වන බ්‍රහස්පතින්දා
2026 ஏப்பிரல் 09, வியாழக்கிழமை
Thursday, 09th April, 2026

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා** [තීරුව 386]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 388-411]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
උතුරු පළාතේ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල කාර්ය සාධනය [තීරුව 413]
ලක්විජය බලාගාරයේ ප්‍රමිතියෙන් තොර ගල් අඟුරු භාවිතය හේතුවෙන් පැන නැඟී ඇති ගැටලු [තීරුව 418]

**ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර මුහුණ දෙන ගැටලු:**
මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 434]

**මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත:**
පළමුවන වර කියවන ලදී [තීරුව 439]

**ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති (සංශෝධන) පනත් කෙටුම්පත:**
පළමුවන වර කියවන ලදී [තීරුව 439]

**කොළඹ වරායේ සිට බහලුම් 323ක් අනිවාර්ය භෞතික පරීක්ෂණයට භාජනය කිරීමකින් තොරව නිදහස් කිරීම සම්බන්ධයෙන් සොයා බලා වාර්තා කිරීමටත් ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන විශේෂ කාරක සභාව:** කාලය දීර්ඝ කිරීම [තීරුව 440]

**යුද්ධ හමුදා පනත:**
නියෝග [තීරු 441-491]

**නාවික හමුදා පනත:**
නියෝග [තීරුව 491]

**ගුවන් හමුදා පනත:**
නියෝග [තීරුව 491]

**මහජන ආරක්ෂක ආඥාපනත:**
යෝජනා සම්මතය [තීරුව 492]

**අත්‍යවශ්‍ය මහජන සේවා පනත:**
යෝජනා සම්මතය [තීරුව 499]

**කල් තැබීමේ යෝජනාව:**
2019 අප්‍රේල් 21 වන දින පාස්කු ඉරිදා ප්‍රහාරය [තීරු 500-570]


# பிரதான உள்ளடக்கம்


**அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்** [ப: 386]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 388-411]

**தனி அறிவித்தல் மூல வினா:**
வடக்கு மாகாணத்தில் மாவட்ட மற்றும் பிரதேச ஒருங்கிணைப்புக் குழுக் கூட்டங்களின் செயற்பாடுகள் [ப: 413]
லக்விஜய மின் உற்பத்தி நிலையத்தில் தரமற்ற நிலக்கரியைப் பயன்படுத்தியதால் எழுந்துள்ள சிக்கல்கள் [ப: 418]

**நுண், சிறிய மற்றும் நடுத்தர அளவிலான தொழில் முயற்சிகள் எதிர்கொள்ளும் சிக்கல்கள்:**
நிதி, திட்டமிடல் பிரதி அமைச்சரினது கூற்று [ப: 434]

**நிதிசார் கொடுக்கல்வாங்கல்களை அறிக்கையிடல் (திருத்தம்) சட்டமூலம்:**
முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 439]

**பயங்கரவாதி நிதியளிப்பை ஒடுக்குதல் மீதான சமவாய (திருத்தம்) சட்டமூலம்:**
முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 439]

**கொழும்பு துறைமுகத்திலிருந்து 323 கொள்கலன்களை கட்டாய பௌதிகப் பரிசோதனைக்கு உட்படுத்தாமல் விடுவித்தமை தொடர்பில் ஆராய்ந்து அறிக்கை யிடுவதற்காகவும் அது குறித்த அதன் முன்மொழிவு களையும் விதப்புரைகளையும் சமர்ப்பிப்பதற்குமான தெரிகுழு:** கால நீடிப்பு [ப: 440]

**தரைப்படைச் சட்டம்:**
ஒழுங்குவிதிகள் [ப: 441-491]

**கடற்படைச் சட்டம்:**
ஒழுங்குவிதிகள் [ப: 491]

**வான்படைச் சட்டம்:**
ஒழுங்குவிதிகள் [ப: 491]

**பொதுமக்கள் பாதுகாப்புக் கட்டளைச் சட்டம்:**
தீர்மானம் [ப: 492]

**அத்தியாவசிய பொதுச் சேவைகள் சட்டம்:**
தீர்மானம் [ப: 499]

**ஒத்திவைப்புப் பிரேரணை:**
2019 ஏப்பிரல் 21 இடம்பெற்ற உயிர்த்த ஞாயிறு தாக்குதல் [ப: 500-570]


# PRINCIPAL CONTENTS


MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS [Col. 386]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 388-411]

QUESTION BY PRIVATE NOTICE:
Performance of District and Divisional Coordinating Committees of Northern Province [Col. 413]
Issues Arisen Due to Use of Substandard Coal at Lakvijaya Power Plant [Col. 418]

ISSUES FACED BY MICRO, SMALL AND MEDIUM-SIZED ENTERPRISES:
Statement by Deputy Minister of Finance and Planning [Col. 434]

FINANCIAL TRANSACTIONS REPORTING (AMENDMENT) BILL:
Read the First time [Col. 439]

CONVENTION ON THE SUPPRESSION OF TERRORIST FINANCING (AMENDMENT) BILL:
Read the First time [Col. 439]

SELECT COMMITTEE TO LOOK INTO AND REPORT TO PARLIAMENT ON THE RELEASE OF 323 CONTAINERS FROM THE PORT OF COLOMBO WITHOUT UNDERGOING MANDATORY PHYSICAL INSPECTION AND SUBMIT ITS PROPOSALS AND RECOMMENDATIONS IN THAT REGARD:
Extension of Time [Col. 440]

ARMY ACT:
Regulations [Cols. 441-491]

NAVY ACT:
Regulations [Col. 491]

AIR FORCE ACT:
Regulations [Col. 491]

PUBLIC SECURITY ORDINANCE:
Resolution [Col. 492]

ESSENTIAL PUBLIC SERVICES ACT:
Resolution [Col. 499]

ADJOURNMENT MOTION:
Easter Sunday Attack on 21st April, 2019 [Cols. 500-570]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2026 අප්‍රේල් 09වන බ්‍රහස්පතින්දා***
*2026 ஏப்பிரல் 09, வியாழக்கிழமை*
*Thursday, 09th April, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මම පහත සඳහන් නියම සහ නියෝග ඉදිරිපත් කරමි.

(i) 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 53 වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ නිර්දේශ සැලකිල්ලට ගෙන සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලබා ගැනීමෙන් පසුව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2026 ජනවාරි 16 දිනැති අංක 2471/52 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(ii) 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 53 වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ නිර්දේශ සැලකිල්ලට ගෙන සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලබා ගැනීමෙන් පසුව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2026 ජනවාරි 16 දිනැති අංක 2471/53 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(iii) 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 53 වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ නිර්දේශ සැලකිල්ලට ගෙන සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලබා ගැනීමෙන් පසුව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2026 ජනවාරි 16 දිනැති අංක 2471/54 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(iv) 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 53 වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ නිර්දේශ සැලකිල්ලට ගෙන සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2026 ජනවාරි 16 දිනැති අංක 2471/55 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(v) 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 52 වගන්තිය සමඟ කියවිය යුතු 71 වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව විමසා, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2026 පෙබරවාරි 13 දිනැති අංක 2475/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග.

මෙම නියම සහ නියෝග රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2021 වර්ෂය සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා
## அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்
## MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)

ගරු කථානායකතුමනි, ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම, එම කාරක සභාව වෙත යොමු කරන ලද -

[ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා]

(i) (357 අධිකාරය වූ) යුද්ධ හමුදා පනතේ 29 සහ 155 වගන්ති යටතේ ආරක්ෂක අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 පෙබරවාරි 15 දිනැති අංක 2423/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(ii) (358 අධිකාරය වූ) නාවික හමුදා පනතේ 161 වගන්තිය යටතේ ආරක්ෂක අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 පෙබරවාරි 15 දිනැති අංක 2423/35 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග; සහ

(iii) (359 අධිකාරය වූ) ගුවන් හමුදා පනතේ 29 සහ 155 වගන්ති යටතේ ආරක්ෂක අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 පෙබරවාරි 15 දිනැති අංක 2423/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු ගමගෙදර දිසානායක මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கமகெதர திசாநாயக்க - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Gamagedara Dissanayake - Deputy Minister of Buddhasasana, Religious and Cultural Affairs)

ගරු කථානායකතුමනි, උකුවෙල, උකුවෙල වත්ත, අංක 2/140 යන ලිපිනයෙහි පදිංචි ඊ.එම්. කිත්සිරි විජේරත්න මහතා සහ වෙනත් පස්දෙනෙකුගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු නීතිඥ සරත් කුමාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சரத் குமார)
(The Hon. Sarath Kumara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් පහ පිළිගන්වමි.

(1) බිබිල, යල්කුඹුර, තානායම්ගම, 'ශාන්ත සෙවන' යන ලිපිනයෙහි පදිංචි ඩී.එම්. සුමනසේකර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) බිබිල, වෑගම, ගල්කඩවල, ශ්‍රී ධම්මපාල මාවත යන ලිපිනයෙහි පදිංචි ජී.ඒ. හීන්බණ්ඩා මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) බිබිල, යල්කුඹුර, ලියන්ගහමුල්ලවත්ත යන ලිපිනයෙහි පදිංචි ජී.එච්. සයිමන් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(4) බිබිල, යල්කුඹුර, තානායම්ගම, 'ශාන්ත සෙවන' යන ලිපිනයෙහි පදිංචි කේ.එම්. ජේමසිරි මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(5) බිබිල, කවුඩැල්ල, කටුපොත යන ලිපිනයෙහි පදිංචි එල්.ඒ.බී. රත්නපාල මහතාගෙන් ලැබුණු පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1 - 1187/2025 - (1), ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

Hon. Speaker, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමාගේ point එක මොකක්ද, ගරු විපක්ෂ නායකතුමා?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

After Questions for Oral Answers, I will raise that issue, Sir.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 2 - 1408/2025 - (1), ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 3 - 1473/2025 - (1), ගරු කේ. කාදර් මස්තාන් මන්ත්‍රීතුමා.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)

கௌரவ சபாநாயகர் அவர்களே, நான் அந்தக் கேள்வியைக் கேட்கின்றேன்.

**ගරු උපාලි සමරසිංහ මහතා (සමුපකාර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு உபாலி சமரசிங்ஹ - கூட்டுறவு அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Upali Samarasingha - Deputy Minister of Co-operative Development)

ගරු කථානායකතුමනි, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති තුනක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 4 -1503/2025- (1), ගරු බී. ආරියවංශ මන්ත්‍රීතුමා.

**ගරු බී. ආරියවංශ මහතා**
(மாண்புமிகு பி. ஆரியவங்ஷ)
(The Hon. B. Ariyawansha)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## වතු ප්‍රජාව: ඉඩම් හිමිකම් ඔප්පු ලබා දීම
## பெருந்தோட்ட மக்கள்: காணி உறுதிப்பத்திரங்கள் வழங்கல்
## PLANTATION COMMUNITY: GRANT OF TITLE DEEDS

1545/2025

**5. ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා**
(மாண்புமிகு (கலாநிதி) நந்தன மில்லகல)
(The Hon. (Dr.) Nandana Millagala)
වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වතු ප්‍රජාව ජීවත් වන ඉඩම් සඳහා නිරවුල් හිමිකම් ඔප්පු නොලැබීම හේතුවෙන් විවිධ අවස්ථාවලදී ඔවුන් අපහසුතාවට පත්වන බව දන්නේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) නොඑසේ නම්, ඒ සම්බන්ධයෙන් ඉදිරියේදී ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பெருந்தோட்ட மக்கள் வாழும் காணிகளுக்கான முழு உரிமையுள்ள காணி உறுதிப்பத்திரங்கள் கிடைக்கப்பெறாமையால், பல்வேறுபட்ட சந்தர்ப்பங்களில் அவர்கள் அசௌகரியங்களுக்கு உள்ளாவதை அறிவாரா;

(ii) ஆமெனில், இது தொடர்பில் இன்றளவில் எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை;

(iii) இன்றேல், இது தொடர்பில் எதிர்காலத்தில் மேற்கொள்ளப்படவுள்ள நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation and Community Infrastructure:

(a) Will he inform this House -

(i) whether he is aware that the plantation community encounters inconveniences at various times due to not receiving clear Title Deeds for the lands they live in;

(ii) if so, the actions that have been taken so far in this regard; and

(iii) if not, the actions that are expected to be taken in the future in this regard?

(b) If not, why?

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

වතු ප්‍රජාව අතුරින් කොටසක් ලයින් කාමරවල ජීවත් වන අතර, තවත් කොටසක් රජය හෝ වෙනත් ආයතන හෝ විදේශීය රාජ්‍ය ආධාර මත හෝ ස්වයං දායකත්වයෙන් ඉදි කරගත් නිවාසවල ජීවත් වේ.

(ii) වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයට අයත් ප්‍රජා යටිතල පහසුකම් අංශය සහ අමාත්‍යාංශය යටතට ගැනෙන අනෙකුත් අදාළ ආයතන මඟින් පහත පරිදි ක්‍රියාත්මක ඒ යටතේ වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය කියලා අපේ අමාත්‍යාංශය යටතේ ආයතනයක් ක්‍රියාත්මක වනවා. ඒ මඟින් ඉන්දියානු නිවාස යෝජනා ක්‍රමය යටතේ හදන ගෙවල් සඳහා ඔප්පු සූදානම් කර තිබෙනවා.

ඒ වාගේම අපේ ජනතා වතු සංවර්ධන මණ්ඩලය - ජනවසම - මඟින් අදාළ ඔප්පු සූදානම් කර තිබෙනවා. මලෛයහම් ප්‍රජාවේ එක නිවාසලාභියෙකුට පර්චස් 10ක් දෙන්න අපි සැලසුම් කර තිබෙනවා සහ ලබා දී තිබෙනවා.

ඒ වාගේම ඇල්කඩුව වැවිලි සමාගම මඟිනුත්, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව මඟිනුත් ඒ කටයුත්ත ඒ විධියට කරනවා.

(iii) ඉහත (i) සහ (ii) මඟින් පිළිතුර සපයා තිබෙනවා.

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නයට අදාළ සවිස්තරාත්මක පිළිතුර මම **සභාගත*** කරනවා.

**ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා**
(மாண்புமிகு (கலாநிதி) நந்தன மில்லகல)
(The Hon. (Dr.) Nandana Millagala)
ගරු කථානායකතුමනි, මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මේ මලෛයහම් ප්‍රජාව, එහෙම නැත්නම් වතු ආශ්‍රිතව ජීවත් වන, පේළි නිවාසවල ජීවත් වන මේ ප්‍රජාව තමයි පසුගිය "දිට්වා" සුළි කුණාටුව මොහොතේත් මම හිතන හැටියට සැලකිය යුතු

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා]

ආපදා තත්ත්වයකට මුහුණ දුන්නේ. ඔවුන්ගේ ඒ පේළි නිවාස නාය යෑමට ලක් වෙලා අධි අවදානමට ලක් වුණා. එහෙත් අර සාමාන්‍ය ජනතාවට ලැබෙන විධියේ සහනාධාර නොලැබීම පිළිබඳ ලොකු ගැටලුවක ඔවුන් ඉන්නවා. ඒ නිසා මේ ජනතාවට සහන ලබා දීම සඳහා රජයේ තිබෙන වැඩ පිළිවෙළ කුමක්ද කියලා මා ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු කථානායකතුමනි, මෙතුමා අහපු ප්‍රශ්නය ඉතා වැදගත්. මොකද, "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් විශේෂයෙන් මධ්‍යම කඳුකරයේ, නැත්නම් වැවිලිකරයේ මලෙයහම් ප්‍රජාවට සිදු වුණු හානිය බරපතළයි. ඒ සුළි කුණාටුව පැමිණීමත් සමඟම ජනාධිපතිතුමාත්, කැබිනට් මණ්ඩලයත්, රජයත් හැටියට අපි ඒ "දිට්වා" සුළි කුණාටුවට ලක් වෙච්ච ජනතාවට විශාල සහන ප්‍රමාණයක් ලබා දෙන්න තීන්දු කළා.

එහිදී පූර්ණ වශයෙන් නිවාස හානියක් වුණු කෙනෙකුට අපි ලක්ෂ 50ක් ලබා දෙන්න තීන්දු කළා. පූර්ණ නිවාස හානියක් සිදු වුණු අයට ලක්ෂ 50ක් දුන්නේ, තමන්ටම හිමි ගෙයක්, තමන්ටම හිමි ඉඩමක හදලා තිබුණු අයට පමණයි. ලයින් කාමරවල ඉන්න ජනතාවට ඒ නිවාසවලට අයිතියක් නැහැ; ඉඩමට අයිතියක් නැහැ. ඒ නිසා ඔවුන්ට ලක්ෂ 50 හිමිකම ලබන්න බැරි වුණා. නමුත් කැබිනට් මණ්ඩලය සහ විශේෂයෙන්ම ජනාධිපතිතුමා සුවිශේෂී අවධානයක් යොමු කරලා මේ ජනතාවට සහන ලබා දිය යුතුයි කියන තීන්දුවට ආවා. අවුරුදු 200ක් වෙනවා මේ රටට මලෙයහම් ප්‍රජාව ඇවිල්ලා. නමුත් ඔවුන්ට කියලා තවම ඉඩමක් නැහැ, නිවසක් නැහැ. ඒ නිසා අපේ රටේ සහෝදර පුරවැසියන් ලෙස ආපදාවට පත් වුණු ඔවුන්ටත් ඒ සහනය ලබා දිය යුතුයි කියලා පසුගිය 6වෙනි දා කැබිනට් මණ්ඩලයේදී අපි විශේෂ තීන්දුවක් ගනු ලැබුවා. ඒ අනුව, මලෙයහම් ප්‍රජාව, වැවිලිකරයේ ප්‍රජාව, ලයිම්වල ඉන්න ප්‍රජාවගේ නිවසක් "දිට්වා" ආපදාවෙන් පූර්ණ ලෙස හානි නම් හෝ පූර්ණ ලෙස හානි නැතත් ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය - NBRI එක - "මේ ගේ අධි අවදානම්, වාසය කරන්න සුදුසු නැහැ" කියනවා නම් හෝ නිවසට අර්ධ හානියක් වෙලා, හැබැයි ආපදා කළමනාකරණ කමිටුව තීන්දු කරනවා නම් දැන් ඒ නිවාසය හදලා වැඩක් නැහැ, ජීව කාලය අවසන් කියලා, ඒ වර්ග තුනට ලක්ෂ 50ක ආධාරයක්, නැත්නම් ආපදා වන්දියක හිමිකමක් තිබෙනවා කියලා අපි තීන්දුවක් ගත්තා. ඒ අනුව අපි ඔවුන්ට නිවාසයක් සඳහා ලක්ෂ 50ක් ලබා දෙනවා සහ පර්චස් 10ක ඉඩමකුත් ලබා දෙනවා.

වැවිලිකරයේ ඉන්න අපේ මලෙයහම් පවුලකට, ඒ ආපදා සහන හිමිකම ලබන පවුලකට පුළුවන්කම තිබෙනවා, ඔවුන් කැමති තැනකින් ලක්ෂ 50කට ඉඩමක් හා නිවසක් මිලදී ගන්න. ඒකටත් හිමිකම තිබෙනවා. ලැයිමේ හිටියත් ඔවුන්ට කොතැනක හරි වෙනත් ඉඩමක් තිබෙනවා නම් ඒකේ ගේ හදා ගන්නත් ලක්ෂ 50 දෙනවා. එහෙම නැත්නම්, රජය විසින් පර්චස් 10ක ඉඩමක් දීලා, වර්ග අඩි 650කින් යුක්ත නිවසක් රුපියල් ලක්ෂ 50කින් හදලා දෙනවා කියලා අපි කැබිනට් තීන්දුවක් ගත්තා. ඒ වාගේම එහි අර්ධ හානි කියන කොටස ගැනත් මතක් කරන්න කැමැතියි. පූර්ණ හානි නොවී අර්ධ හානි සිදු වෙලා තිබෙනවා නම්, අනෙකුත් අයට අපි මුලදී සහන ලබා දුන්නා. තමන්ගේ ඉඩමකට, තමන්ගේ නිවසකට අර්ධ හානියක් සිදු වෙලා තිබෙනවා නම්, රුපියල් ලක්ෂ 5 සිට ලක්ෂ 25 දක්වා වශයෙන් අර්ධ හානි සඳහා වන්දි දුන්නා. නමුත්, මම මුලින් කිව්වා වාගේ, ලැයිම්වල ඉන්න මලෙයහම් ජනතාවට ඒකට හිමිකම ලැබුණේ නැහැ. එහෙම නොලැබෙන්න හේතුව තමයි, ඒ නිවස ඔවුන්ගේ නොවීම; ඒ ඉඩම ඔවුන්ගේ නොවීම. නමුත්, මේ 06වැනි දා ගත්ත කැබිනට් තීන්දුවෙන්ම අපි තවත් තීන්දුවක් ගත්තා. ඒ ලැයිම් පේළිවල පදිංචි ජනතාවටත් අර්ධ හානි සිදු වෙලා තිබෙනවා නම්, ප්‍රාදේශීය ලේකම්, වැවිලි මානව සංවර්ධන භාරය, ඒ වාගේම වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය හැටියට අපි ඒවා තක්සේරු කරලා, අර්ධ හානි සම්පූර්ණ කරලා, ඒ අයට සුදුසු නිවසක් ලබා දෙන්න ඕනෑය කියන තීන්දුව ගත් බව මම ගරු මන්ත්‍රීතුමාට මතක් කරන්න කැමැතියි.

**ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා**
(மாண்புமிகு (கலாநிதி) நந்தன மில்லகல)
(The Hon. (Dr.) Nandana Millagala)

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ දීර්ඝ පිළිතුරට බොහොම ස්තුතියි.

අපි ඒ කථා කළ මලෙයහම් ප්‍රජාව වාගේම අපේ රටට විදේශ විනිමය උපයා ගැනීමේදී විශාල මැදිහත්වීමක් කරන තවත් කණ්ඩායමක් තමයි කුඩා තේ වතු හිමියන්. ඒ කුඩා තේ වතු හිමියන්ගෙන් පසුගිය කාල සීමාව තුළ ලොකු මැසිවිල්ලක් ඉදිරිපත් වුණා. එක පැත්තකින් "දිට්වා" ආපදාව නිසා ඔවුන්ට සැලකිය යුතු හානියක් සිද්ධ වුණා. එසේ හානියට පත් වුණු තේ වතු සඳහා සහනාධාර ලබා දීමට විධිමත් වැඩ පිළිවෙළක් තිබෙනවාද කියන කාරණය ගැන ඔවුන් ප්‍රශ්න කරන්න පටන් ගත්තා. පසුගිය දා අපේ ජනාධිපතිතුමා පැහැදිලි කිරීමක් කළා, කුඩා තේ වතු හිමියන් සඳහා පොහොර සහනාධාරයක් ලබා දෙනවාය කියන කාරණය පිළිබඳව. ඒ නිසා කුඩා තේ වතු හිමියන්ට සහනයක් විධියට ලබා දීමට බලාපොරොත්තු වන පොහොර සහනාධාරය පිළිබඳව තමයි මා පළමුවන අතුරු ප්‍රශ්නයෙන් අහන්නේ. ගරු ඇමතිතුමාගෙන් ඒ සඳහා පැහැදිලි කිරීමක් බලාපොරොත්තු වෙනවා.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු කථානායකතුමනි, මේ රටට විදේශ විනිමය සපයා දෙන ප්‍රධාන වැවිලි භෝගයක් තමයි තේ. අපේ රටේ තේ නිෂ්පාදනයෙන් සියයට 75ක් සපයන්නේ කුඩා තේ වතු ගොවීන්. මේ මොහොතේ කුඩා තේ වතු ගොවීන් මුහුණ දෙන ප්‍රශ්න ප්‍රමාණයක් තිබෙනවා. ලෝකයේ ඇති වී තිබෙන යුද්මය තත්ත්වය සහ බලශක්ති ප්‍රශ්නයත් එක්ක ඔවුන් පවා සැලකිය යුතු පීඩාවකට ලක් වී තිබෙනවා. පසුගිය මාසවල දළු මිලත් සියයට 16කට, සියයට 20කට ආසන්න ප්‍රමාණයකින් පහළට ගියා. තේ අපනයනය සම්බන්ධවත් යම් ප්‍රශ්න ප්‍රමාණයක් මතු වුණා.

2025 වසරේදී අපි වාර්තාගත ආදායමක් ලැබුවා. ගරු කථානායකතුමනි, 2017 වසරට පසුව තේවලින් වැඩිම අපනයන ආදායම ලැබුවේ 2025 වසරේදීයි. අපි තේ ආශ්‍රිතව ඩොලර් මිලියන 1,507ක අපනයන ආදායමක් ලබා ගෙන තිබෙනවා. ඒ නිසා තේ කර්මාන්තය ආරක්ෂා කිරීම රජයේ වගකීමක් හැටියට අපි සලකනවා. ජනාධිපතිතුමා විසින් හඳුන්වා දුන් විශේෂ පැකේජයට පෙර සිටම අපි තේ පොහොර සහනාධාරය QR code එකක් හරහා ලබා දෙන්න තීන්දු කර තිබුණා. ඒක තීන්දු කළේ ගිය අවුරුද්දේ. මම ඒ ගැන පළමුව පැහැදිලි කරන්නම්. QR code එක හරහා අපි මේ වනවිට ගොවීන් 187,759 දෙනෙකුට පොහොර සහනාධාරය ලබා දී තිබෙනවා.

ඒ අනුව අපි පොහොර මෙට්‍රික් ටොන් 21,117.7ක් ලබා දී තිබෙනවා. අපි ගොවීන් 187,759දෙනෙකුට පොහොර සහනාධාරය ලබා දෙනකොට, 2024දී අපි බලයට එන්නට

පෙරාතුව අවුරුද්දේ කුඩා තේ වතු ගොවීන් 84,472කට තමයි පොහොර සහනාධාරය ලබා දී තිබුණේ. එතකොට කලින් අසූහතර දහස් ගණනකට ලබා දීපු පොහොර සහනාධාරය අපි ලක්ෂයකට වැඩි ගොවීන් සංඛ්‍යාවකට ලබා දී තිබෙනවා. ඊට අමතරව ඇති වෙලා තිබෙන මේ තත්ත්වය හමුවේ කුඩා තේ වතු ගොවීන් වෙත මේ මොහොතේ විශේෂ සහනයක් ලබා දෙන්න ජනාධිපතිතුමා ඇතුළු කැබිනට් මණ්ඩලය තීන්දු කළා. ඒක, එකවරක් පමණක් ලබා දෙන සහනාධාරයක් කියන එක මතක් කරන්න කැමැතියි. අපි කුඩා තේ වතු ගොවීන්ට පරණ විධියට මෙතුවක් පොහොර කිලෝ 50 මිටියකට රුපියල් 4,000ක් රජයෙන් ලබා දුන්නා. ඉතුරු ගණන විධියට ගොවියා දරන සහනාධාරය තමයි දුන්නේ. එහිදී අපි අනුපාත ක්‍රමයකට තමයි පොහොර ලබා දුන්නේ. අපි ඒ රුපියල් 4,000ක් ලබා දීපු එකට අමතරව අතිරේක පොහොර වටයක් දාන්න; තව අලුත් වටයකින් පොහොර දාගන්න තව අලුත් එකක් හැටියට භාණ්ඩාගාරයෙන් ලබා දීපු මේ සහනය අනුව එක් ගොවියෙකුට පොහොර මිටියක් දෙනවා නම් ඔහුට රුපියල් 5,000ක පොහොර සහනාධාරයක් එක් වටයකට පමණක් ලබා දෙන්න තීන්දු කළා. ගරු කථානායකතුමනි, ඒ අනුව මේ සහනය සඳහා භාණ්ඩාගාරයෙන් අලුතෙන් වෙන් කර තිබෙන මුදල රුපියල් මිලියන 2,500ක් වෙනවා. එය රුපියල් ලක්ෂවලින් ගත්තොත්, රුපියල් ලක්ෂ 25,000ක් කුඩා තේ වතු ගොවීන් වෙනුවෙන් පොහොර සහනාධාරය සඳහා වෙන් කර තිබෙන බව ඔබතුමාට මතක් කරන්න කැමැතියි.

## තෝප්පූර් උප ප්‍රාදේශීය ලේකම් කාර්යාලය: උත්ශ්‍රේණිගත කිරීම

### தோப்பூர் உப பிரதேச செயலகம்: தரமுயர்த்துதல்

THOPPUR SUB-DIVISIONAL SECRETARIAT: UPGRADING

1640/2025

**6. ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) තෝප්පූර් උප ප්‍රාදේශීය ලේකම් කාර්යාලය උත්ශ්‍රේණිගත කර නොමැති බවත්, ඒ හේතුවෙන් මහ ජනතාවට සිදුවන අපහසුතා පිළිබඳවත් දන්නේද;

(iii) එම උප ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් ලෙස උත්ශ්‍රේණිගත නොකිරීමට හේතු කවරේද;

(iv) එම උප ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ඉදිරියේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් ලෙස උත්ශ්‍රේණිගත කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) திருகோணமலை மாவட்டத்துக்குரிய பிரதேச செயலகங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) தோப்பூர் உப பிரதேச செயலகம் தரமுயர்த்தப்படவில்லை என்பதையும், அதன் காரணமாக பொதுமக்களுக்கு ஏற்படும் அசௌகரியங்கள் பற்றியும் அறிவாரா என்பதையும்;

(iii) மேற்படி உப பிரதேச செயலகமானது பிரதேச செயலகமாகத் தரமுயர்த்தப்படாமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

(iv) குறித்த உப பிரதேச செயலகத்தை எதிர்காலத்தில் பிரதேச செயலகமாகத் தரமுயர்த்துவதற்கு நடவடிக்கைகள் மேற்கொள்ளப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) the number of Divisional Secretariats that fall under the Trincomalee District;

(ii) whether he is aware that the Thoppur Sub-Divisional Secretariat has not been upgraded, and of the difficulties experienced by the general public, as a result;

(iii) the reasons for the said Sub-Divisional Secretariat not been upgraded to a Divisional Secretariat; and

(iv) whether measures will be taken in the future to upgrade that Sub-Divisional Secretariat to a Divisional Secretariat?

(b) If not, why?

**ගරු පී. රුවන් සෙනරත් මහතා (පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீ. ருவன் செனரத் - மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சிப் பிரதி அமைச்சர்)
(The Hon. P. Ruwan Senarath - Deputy Minister of Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 11යි.

(ii) සේවා ලබා ගැනීමේදී මූතූර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත යාමට සිදුවීම හේතුවෙන් මහජනතාවට සිදු වන අපහසුතාව අවම කර ගැනීම සඳහා තෝප්පූර් උප ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිහිටුවා ඇත. එමඟින් තෝප්පූර් ප්‍රදේශයේ ජනතාව වෙත සේවාවන් කාර්යක්ෂමව ලබා ගැනීමට හැකියාව ලැබී ඇත.

(iii) මේ වන විට තෝප්පූර් උප ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කටයුතු කිසිදු බාධාවකින් තොරව පවත්වාගෙන යනු ලබයි.

(iv) තෝප්පූර් උප ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් ලෙස උත්ශ්‍රේණිගත කිරීම සම්බන්ධයෙන් විද්‍යාත්මක ක්‍රමවේදයක් ඔස්සේ පරීක්ෂා කර බලා ඉදිරි කටයුතු සිදු කිරීමේ හැකියාවක් පවතී.

(ආ) අදාළ නොවේ.

ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

நன்றி! கௌரவ பிரதி அமைச்சர் அவர்களே, தோப்பூர் உப பிரதேச செயலகமானது, 2007ஆம் ஆண்டு ஆரம்பிக்கப்பட்டு இருந்தாலும், அதற்கென ஓர் அரச கட்டிடம் இல்லாத காரணத்தால் நீண்ட காலமாக இயங்க முடியாத நிலைப்பாட்டில் இருந்தது. எங்களுடைய நல்லாட்சிக் காலத்தில் இதற்கான ஒரு கட்டிடத்தை இனங்கண்டு, தளபாட வசதிகளையும் ஏற்பாடு செய்து, அந்தக் கட்டிடத்தில் இயங்குவதற்கான நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டன. என்றாலும், அது இன்னமும் ஓர் உப பிரதேச செயலகமாகவே இயங்கிக்கொண்டு இருக்கின்றது.

மூதூர் பிரதேச செயலகத்தை எடுத்துக்கொண்டால், அது பல GN Divisionsஐக் கொண்ட ஒரு பிரதேச செயலகமாகக் காணப்படுகின்றது. அதனால் அங்கு வாழுகின்ற மக்கள் நீண்ட தூரத்திலிருந்து வந்து இங்கு சேவையைப் பெறுவதற்காகக் கஷ்டப்படவேண்டிய சூழல் இருக்கின்றது. இந்த உப பிரதேச செயலகம் தரமுயர்த்தப்படுமாக இருந்தால், பல GN Divisionsஐச் சேர்ந்த மக்கள் இங்கு வந்து இலகுவாக தங்களுடைய சேவைகளைப் பெற்றுக்கொள்வதற்கான வாய்ப்புகள் காணப்படும். அந்த அடிப்படையில், உங்களுடைய இந்த அரசாங்கத்தின்கீழ் எந்தக் காலப்பகுதியில் இதைத் தரமுயர்த்துவதற்கான நடவடிக்கைகளை எடுக்கப் போகின்றீர்கள் அல்லது அதற்கான நடவடிக்கைகளை எடுக்க மாட்டீர்களா என்பதைத் தெளிவான முறையில் விளக்க முடியுமா? என்பதை என்னுடைய முதலாவது மேலதிக வினாவாகக் கேட்கின்றேன்.

ගරු පී. රුවන් සෙනරත් මහතා
(மாண்புமிகு பீ. ருவன் செனரத்)
(The Hon. P. Ruwan Senarath)

ගරු මන්ත්‍රීතුමනි, පොදුවේ ගත්තොත්, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විශේෂයෙන් මතු වෙලා තිබුණු ගැටලු පිළිබඳව පසුගිය කාලයේ අපි සාකච්ඡා කළා. විශේෂයෙන්ම තෝප්පූර් උප ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් දැනට බාධාවක් නැහැ. නමුත්, පොදුවේ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්බන්ධව මතු වෙලා තිබෙන ගැටලු ටික එම උප කාර්යාලයේත් තිබෙනවා. කෙසේ වෙතත්, ඔබතුමා අහපු (iv) වන ප්‍රශ්නයට මා ලබා දීපු පිළිතුර අනුව අපි ඒ පිළිබඳව නැවත සාකච්ඡා කරනවා, ඒ සඳහා ඉදිරියේදී ඔබතුමන්ලාගේ අදහසුත් ලබා ගන්න අපි කැමැතියි. දැනට තෝප්පූර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය උප කාර්යාලයක් ලෙසයි පවත්වාගෙන යන්නේ. ඒ පිළිබඳව විද්‍යාත්මක සැලැස්මක් සකස් කරලා ඉදිරි ක්‍රියාමාර්ග ගන්න අපට පුළුවන්.

ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

கௌரவ சபாநாயகர் அவர்களே, என்னுடைய இரண்டாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

தோப்பூர் உப பிரதேச செயலகம் சம்பந்தமாக எல்லை நிர்ணயம் செய்யப்பட்டு இருக்கின்றது. என்றாலும், cadre creation செய்யப்படாததன் காரணமாக இதை ஒரு பிரதேச செயலகமாகத் தரமுயர்த்த முடியாதென சென்ற அரசாங்கங்களால் சொல்லப்பட்டது. ஆகையால், அந்த cadre creation விடயத்திலும், நீங்கள் சொல்லுகின்ற எல்லை நிர்ணய விடயத்திலும் மீண்டுமொரு தரம் கவனம் செலுத்தி, இந்த உப பிரதேச செயலகத்தை எப்படியாவது ஒரு பிரதேச செயலகமாகத் தரமுயர்த்துவதற்கான நடவடிக்கைகளை எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

திருகோணமலை மாவட்டத்திலுள்ள கிண்ணியா பிரதேச செயலகமும் பல GN Divisionsஐக் கொண்ட, பல இலட்சம் மக்கள் சேவைகளைப் பெறுகின்ற ஒரு பிரதேச செயலகமாகக் காணப்படுகின்றது. ஆகையால், அங்கு மேலதிகமாக இன்னும் ஒரு பிரதேச செயலகத்தை அமைப்பதன்மூலம் மக்கள் இலகுவான சேவைகளைப் பெறுவதற்கான வாய்ப்புகள் காணப்படும். அந்த அடிப்படையிலே, எதிர்காலத்தில் பிரதேச செயலகங்கள் அதிகரிக்கப்படுகின்றபொழுது, கிண்ணியா பிரதேசத்தில் இன்னுமொரு பகுதியை மையப்படுத்தி புதிய பிரதேச செயலகமொன்றை உருவாக்குவதற்கான நடவடிக்கை கள் உங்களுடைய அரசாங்கத்திலே மேற்கொள்ளப்படுமா? என்பதை இந்த இடத்தில் கேட்க விரும்புகின்றேன்.

ගරු පී. රුවන් සෙනරත් මහතා
(மாண்புமிகு பீ. ருவன் செனரத்)
(The Hon. P. Ruwan Senarath)

ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් ඒ ප්‍රදේශවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවකයින්ගේ - විශේෂයෙන් ක්ෂේත්‍ර නිලධාරින්ගේ - යම් යම් අඩුපාඩු පිළිබඳව ස්ථාන ගණනාවකින් වාර්තා වනවා. ඒවා සම්පූර්ණ කිරීම සඳහා රජය මේ වන විට අවශ්‍ය බඳවා ගැනීම් සිදු කරමින් තිබෙනවා. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ විතරක් නොවෙයි, පසුගිය කාලයේ නැඟෙනහිර පළාතේ බොහෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඔය ප්‍රශ්නය මතු වෙලා තිබුණා. කෙසේ වෙතත්, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ජනතාවට මතු වෙච්ච ගැටලු කිහිපයක් තිබුණා. ඒ අතර ඉඩම් සම්බන්ධ ගැටලුත් තිබුණා. ඒ වාගේම පොදුවේ මතු වෙලා තිබුණු ගැටලු පිළිබඳව ජනතාවට අවශ්‍ය මැදිහත් වීම කර ගනිද්දි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මතු වෙච්ච යම් අඩුපාඩු ප්‍රමාණයක් අපේ අවබෝධයේ තිබෙනවා. ඒක නිසා විශේෂයෙන් අපි බලාපොරොත්තු වනවා, ජනතාවට වඩා සමීප සේවාවන් ලබා දෙන්න පුළුවන් විධියට තාක්ෂණය ඇතුළු අනෙකුත් ක්ෂේත්‍රවලට අවශ්‍ය පහසුකම් ලබා දෙන්න. තෝප්පූර් විතරක් නොවෙයි, පොදුවේ රටේ සියලු ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ඒ අවශ්‍ය පහසුකම් ලබා දෙන්න අපි කටයුතු කරනවා. ඊට අවශ්‍ය කරන මැදිහත්වීම කරන්න රජය කටයුතු කරමින් තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉදිරිපත් කරපු අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්බන්ධ ප්‍රශ්නයටත් ඒ ආකාරයෙන් අපි මැදිහත් වෙමින් තිබෙනවා. අපට ඉදිරි කාලයේදී පුළුවන්, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ මහජන නියෝජිතයින් සියලුදෙනා එක්ක සාකච්ඡා කරමින් ඔබතුමාගේ යෝජනා සහ අදහස් සමඟ ඒ අවශ්‍ය කරන මැදිහත් වීම කරන්න. ඔබතුමන්ලා අවශ්‍ය යෝජනා ලබා දෙන්න. ඒ පිළිබඳව අපේ මැදිහත් වීම ඉදිරි කාලයේදී කරන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 7 -1673/2025- (1), ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා.

ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)

கௌரவ சபாநாயகர் அவர்களே, நான் அந்தக் கேள்வியைக் கேட்கின்றேன்.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ත්‍රිකුණාමලය වරාය: මෙහෙයුම් ලාභය හෝ අලාභය
## திருகோணமலைத் துறைமுகம்: செயற்பாட்டு இலாபம் அல்லது நட்டம்
## PORT OF TRINCOMALEE: OPERATIONAL PROFIT OR LOSS

1853/2026

**8. ගරු රොෂාන් අක්මීමන මහතා**
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)
වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ත්‍රිකුණාමලය වරාය පසුගිය වර්ෂ 15ක කාලය තුළ ලබා ඇති මෙහෙයුම් ලාභය හෝ අලාභය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම වරායට අයත්ව තිබූ ජැටි හෝ පර්යන්ත, පසුව විවිධ පෞද්ගලික සමාගම් වෙත බදු පදනම මත හෝ වෙනත් පදනමක් යටතේ ලබා දී තිබේද;

(iii) එසේ නම්, එම සමාගම්වල නම් කවරේද;

(iv) එම සමාගම් විසින් වරාය අධිකාරියට ගෙවිය යුතු බදු හෝ වෙනත් ගෙවීම් නිසි පරිදි සිදු කර තිබේද;

(v) එසේ නම්, පසුගිය වර්ෂ 20ක කාලය තුළ එම ගෙවීම් සම්බන්ධ විස්තර කවරේද;

(vi) මේ වනවිට ත්‍රිකුණාමලය වරාය තුළ රජයට පූර්ණ, අර්ධ හෝ යම් ප්‍රමාණයක හිමිකාරිත්වයක් පවතින ජැටි හෝ පර්යන්ත තිබේද;

(vii) එසේ නම්, ඒවා කවරේද;

(viii) ත්‍රිකුණාමලය වරාය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් පවතින සැලසුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) திருகோணமலைத் துறைமுகம் கடந்த 15 ஆண்டு காலப்பகுதியில் ஈட்டியுள்ள செயற்பாட்டு இலாபம் அல்லது நட்டம் ஒவ்வோர் ஆண்டுவாரியாக வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி துறைமுகத்துக்குச் சொந்தமாகவிருந்த இறங்குதுறைகள் அல்லது முனையங்கள் பின்னர் பல்வேறு தனியார் நிறுவனங்களுக்குக் குத்தகை அடிப்படையில் அல்லது வேறு ஏதேனும் அடிப்படையில் வழங்கப்பட்டுள்ளனவா என்பதையும்;

(iii) ஆமெனில், மேற்படி நிறுவனங்களின் பெயர்கள் யாவை என்பதையும்;

(iv) மேற்படி நிறுவனங்கள் துறைமுக அதிகாரசபைக்குச் செலுத்தவேண்டிய குத்தகைப் பணம் அல்லது ஏனைய கொடுப்பனவுகளைச் சரியான முறையில் செலுத்தியுள்ளனவா என்பதையும்;

(v) ஆமெனில், கடந்த 20 ஆண்டு காலப்பகுதிக்குரிய மேற்படி கொடுப்பனவுகள் தொடர்பான விபரங்கள் யாவை என்பதையும்;

(vi) தற்போது திருகோணமலைத் துறைமுகத்தினுள் அரசாங்கத்துக்கு முழுமையான, ஓரளவு அல்லது பகுதியளவிலான உரித்தைக்கொண்டுள்ள இறங்குதுறைகள் அல்லது முனையங்கள் உள்ளனவா என்பதையும்;

(vii) ஆமெனில், அவை யாவை என்பதையும்;

(viii) திருகோணமலைத் துறைமுகத்தை அபிவிருத்தி செய்வது தொடர்பாகக் காணப்படும் திட்டங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Ports and Civil Aviation:

(a) Will he inform this House -

(i) the operational profit or loss of the Port of Trincomalee, separately for each year, during the last 15 years;

(ii) whether the jetties or terminals belonging to the said Port have been leased or otherwise, transferred to various private companies later;

(iii) if so, the names of such companies;

(iv) whether taxes or other payments due to the Ports Authority have been duly settled by the said companies;

(v) if so, the details of such payments made during the last 20 years;

(vi) whether there are any jetties or terminals currently within the Port of Trincomalee, over which the Government has full, semi or partial ownership;

(vii) if so, the names of them; and

(viii) the plans for developing the Trincomalee Port?

(b) If not, why?

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) පවතින වාර්තාවලට අනුව මෙහෙයුම් ලාභය/ (පාඩුව) පහත දැක්වෙන ආකාරයට වාර්තා කරනු ලැබේ.

| වර්ෂය | රුපියල් (මිලියන) |
|---|---|
| 2010 | (382.94) |
| 2011 | (532.28) |
| 2012 | (248.91) |
| 2013 | (242.26) |
| 2014 | (220.64) |
| 2015 | (229.07) |
| 2016 | 139.32 |
| 2017 | 317.46 |
| 2018 | 160.22 |
| 2019 | 278.37 |
| 2020 | 96.49 |
| 2021 | (111.91) |
| 2022 | 1,176.09 |
| 2023 | 479.32 |
| 2024 | 926.03 |

[ගරු අනුර කරුණාතිලක මහතා ]

(ii) වරාය අධිකාරිය සතු කිසිම ජැටියක් පෞද්ගලික සමාගම් වෙත බදු දීලා නැහැ.

නමුත්, ඇතුළත වරායේ තිබෙන Vegetable Jetty කියන එක සංචාරක ආකර්ෂණය ලැබෙන පරිදි අලංකරණය කර සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා නැගෙනහිර පළාත් සංචාරක කාර්යාංශය වෙත තාවකාලික පදනමක් මත කෙටි කාලීනව බදු දීලා තිබෙනවා.

(iii) අදාළ නොවේ. මොකද, සමාගමකට බදු දීලා නැහැ.

(iv) 2025 නොවැම්බර් මාසයේ ඉඳලා 2026 පෙබරවාරි මාසය දක්වා කාල සීමාව සඳහා වන මාසික බදු මුදල හැර, බදු කුලිය සහ අනෙක් සියලුම බදු මුදල් මෙම ආයතනය විසින්ම ගෙවා තිබෙනවා.

(v) බදු ආදායම, 2024 - 2025

| වර්ෂය | බදු කුලිය | 2.50% සමාජ ආරක්ෂණ දායක බද්ද | 18% වැට බදු | එකතුව |
|---|---|---|---|---|
| 2024 (සැප්තැම්බර් - දෙසැම්බර්) | 400,000.00 | 10,256.40 | 73,846.12 | 484,102.52 |
| 2025 | 1,250,000.00 | 32,051.28 | 230,769.14 | 1,512,820.42 |

(vi) ඔව්.

(vii) අෂ්රොෆ් ජැටිය, පරණ ජැටිය (කස්ටම් ජැටිය) - භාවිතයේ නැත. වෙජිටබල් ජැටිය (භාවිතයේ නැත), තෙල් ජැටිය, TTA ජැටිය, ලංකා පාලම (භාවිතයේ නැත), මඩ්කෝ ජැටිය, ටවුන් ජැටිය, මුතුර් ජැටිය (භාවිතයේ නැත)

(viii) සමස්ත වරාය සම්බන්ධයෙන් Master Plan එකක් ක්‍රියාත්මක වෙනවා. ඒ Master Plan එක අනුව ත්‍රිකුණාමලය වරාය සඳහා වන සැලැස්ම ඇමුණුමෙහි දක්වා ඇත.

ඇමුණුම **සභාගත*** කරමි.

(ආ) පැන නොනඟී.

**ගරු රොෂාන් අක්මීමන මහතා**
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)
මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි.

ගරු ඇමතිතුමනි, ත්‍රිකුණාමලය වරාය ආශ්‍රිතව ක්‍රියාත්මක වන ප්‍රධාන සමාගම් දෙකක් තමයි, ප්‍රීමා සහ ටෝකියෝ සිමෙන්ට් කියන සමාගම්. ඔවුන් ආර්ථික වශයෙන් විශාල වැදගත්කමක් දරනවා එම දිස්ත්‍රික්කයටත්, රටටත්. ඒ වාගේම ඔවුන් රැකියා අවස්ථා විශාල ප්‍රමාණයක් සපයනවා. එම නිසා ඒ කාර්යභාරය අපි අගය කරනවා. ගරු අමාත්‍යතුමනි, නමුත් වරාය වෘත්තීය සමිති ඇතුළු යම් ප්‍රජාවන්ගෙන් චෝදනාවක් එල්ල වී තිබෙනවා, ත්‍රිකුණාමලය වරායට අය විය යුතු වරාය ගාස්තු - harbour tonnage dues - මෙම සමාගම් දෙක ආරම්භයේ සිට මේ දක්වාම ගෙවා නැති බවට. මෙම සමාගම් දෙක නිරත වන ව්‍යාපාර කටයුතුවලට සමාන ව්‍යාපාර කටයුතුවලම නිරත වන අනෙකුත් සමාගම් - විශේෂයෙන්ම හම්බන්තොට වරාය සහ කොළඹ වරාය තුළදී මෙවැනිම ආකාරයෙන් ක්‍රියාත්මක වන, මෙම ව්‍යාපාර කටයුතුම කරන සමාගම් - එම ගාස්තු ගෙවනවා. නමුත්, ත්‍රිකුණාමලය වරාය තුළදී එම ටෝකියෝ සිමෙන්ට් සහ ප්‍රීමා කියන සමාගම් දෙක වරායට අය විය යුතු වරාය ගාස්තු - harbour tonnage dues - ආරම්භයේ සිටම ගෙවා නැති බවට චෝදනාවක් තිබෙනවා. මෙහි සත්‍යතාවක් තිබෙනවාද, නොඑසේ නම් එහෙම බදු ගෙවීමක් ඔවුන් කරනවාද, එසේ බදු නොගෙවන්නේ නම් ඒවා අය කර ගැනීමට හැකියාවක් තිබෙනවාද, එසේ බදු අය කර ගැනීමට කටයුතු කරනවාද කියලා මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ගරු මන්ත්‍රීතුමනි, ලැබී තිබෙන තොරතුරුවලට අනුව එවැනි බදු නොගෙවීමක් සම්බන්ධයෙන් වාර්තා වන්නේ නැහැ. කොහොම වුණත්, ඔබතුමා සඳහන් කළා වාගේ මම අදාළ නිලධාරින්ගෙන් ඒ පිළිබඳව විමසීමක් කරලා, එහෙම නොගෙවනවා නම් ඒකට හේතු මොනවාද කියා සොයා බලලා, විශේෂ හේතුවක් තිබෙනවා නම් ඒ සම්බන්ධයෙනුත් අවශ්‍ය පියවර ගන්නම්.

## 2019දී බඳවා ගත් පාසල් ක්‍රීඩා පුහුණුකරුවන්: විස්තර
### 2019இல் ஆட்சேர்ப்புச் செய்யப்பட்ட பாடசாலை விளையாட்டுப் பயிற்றுநர்கள்: விபரம்
### SCHOOL SPORTS COACHES RECRUITED IN 2019: DETAILS

1861/2026

**9. ගරු රුවන් විජේවීර මහතා**
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)
අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2019 වර්ෂයේදී පාසල් ක්‍රීඩා පුහුණුකරුවන් ලෙස බඳවාගෙන ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම බඳවා ගැනීමට අදාළ මූලික සුදුසුකම් කවරේද;

(iii) පාසල් ක්‍රීඩා පුහුණුකරුවන් ලෙස ඔවුන්ගෙන් අපේක්ෂිත කාර්ය භාරය කවරේද;

(iv) මේ දක්වා එම තනතුරේ සේවය කරන පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 2019ஆம் ஆண்டில் பாடசாலை விளையாட்டுப் பயிற்றுநர்களாக ஆட்சேர்ப்புச் செய்யப்பட்டுள்ள வர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி ஆட்சேர்ப்பு சார்ந்த அடிப்படைத் தகைமைகள் யாவை என்பதையும்;

(iii) பாடசாலை விளையாட்டுப் பயிற்றுநர்களாக இவர்களிடமிருந்து எதிர்பார்க்கப்படும் பணிப்பொறுப்பு யாது என்பதையும்;

(iv) இற்றைவரை மேற்படி பதவியில் கடமையாற்றும் நபர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

---
* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House the -

(i) number of personnel who were recruited as school sports coaches in 2019;

(ii) basic qualifications that were considered for such recruitments;

(iii) role expected of such personnel as school sports coaches; and

(iv) number of personnel who have been serving in the said post until now?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 2019 වර්ෂයේදී පාසල් ක්‍රීඩා පුහුණුකරුවන් ලෙස පුද්ගලයන් 3,888දෙනෙකු බඳවාගෙන ඇත.

(ii) **අධ්‍යාපන සුදුසුකම්:**

අපොස (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව ඇතුළු විෂයයන් 06ක් සමත් වී තිබීම.

**වෘත්තීය සුදුසුකම්:**

1. අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් පවත්වන සමස්ත ලංකා පාසල් ක්‍රීඩා තරගයකදී අවම වශයෙන් 3 වන ස්ථානය ලබා තිබීම.

හෝ

2. ක්‍රීඩා අමාත්‍යාංශය මඟින් පවත්වන ජාතික මහා ක්‍රීඩා උළෙලේදී අවම වශයෙන් 3 වන ස්ථානය ලබා තිබීම.

හෝ

3. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් පවත්වන පළාත් ක්‍රීඩා තරගවලදී අවම වශයෙන් 2 වන ස්ථානය ලබා තිබීම.

හෝ

4. ක්‍රීඩා පනත යටතේ ලියාපදිංචි ජාතික ක්‍රීඩා සංගම් හෝ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලියාපදිංචි ශ්‍රී ලංකා පාසල් ක්‍රීඩා සංගම් මඟින් පවත්වන ජාතික මට්ටමේ තරගයන්හි දී (පළාත් මට්ටම/දිස්ත්‍රික් මට්ටම හැර) අවම වශයෙන් 3 වන ස්ථානය ලබා තිබීම.

හෝ

5. ජාතික ශිෂ්‍යභට බලකායේ බාලක/බාලිකා යුධ, ගුවන්, නාවික, පොලිස් හා තූර්ය වාදක අංශයන්හි ශිෂ්‍යභට සැරයන් නිලධාරියෙක්/ නිලධාරිනියක වීම.

**කායික සුදුසුකම්**

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් මනා ශාරීරික හා මානසික සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.

(iii) ක්‍රීඩා පුහුණුකරු තනතුරේ රැකියා විස්තරය අනුව තනතුරට අයත් රාජකාරි පහත පරිදි වේ.

1. පාසල් සිසුන්ගේ ක්‍රීඩා දක්ෂතා සංවර්ධනය සඳහා ක්‍රීඩා පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම හා පවත්වාගෙන යාම.

2. පාසලේ උදෑසන ශාරීරික සුවතා ව්‍යායාම් වැඩසටහන ක්‍රියාත්මක කිරීමට දායක වීම.

3. එක් එක් ශ්‍රේණි සඳහා නිකුත් කර ඇති ශාරීරික අධ්‍යාපන විෂය නිර්දේශයන්හි අන්තර්ගත ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා ශාරීරික අධ්‍යාපන ගුරු භවතාට ක්‍රීඩාංගණයේදී අවශ්‍ය සහයෝගය ලබාදීම, ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නිරත වීම.

4. පාසලෙහි ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී ඒ හා සම්බන්ධ පවරන රාජකාරි ඉටු කිරීම හා සහාය ලබා දීම.

5. පාසලෙහි ක්‍රීඩා භාර ආචාර්යවරයා හෝ ශාරීරික අධ්‍යාපන ගුරුභවතා විසින් පවරන ක්‍රීඩා සම්බන්ධ රාජකාරි සඳහා සහාය වීම.

6. පාසල තුළ නිවාසාන්තර ක්‍රීඩා උත්සව සංවිධානය කිරීමට පූර්ණ සහාය ලබාදීම.

7. ක්‍රීඩා පුහුණුවීම් සඳහා දරුවන්ගේ සහභාගීත්වය වැඩි කරලීම සඳහා සුදුසු වැඩසටහන් පාසල තුළ ක්‍රියාත්මක කිරීම.

8. පාසලේ විදුහල්පතිවරයා විසින් පවරනු ලබන තනතුරට අදාළ විෂය සමගාමී හා අනෙකුත් රාජකාරි කටයුතු ඉටු කිරීම.

(iv) දැනට සේවයේ නියුතු ක්‍රීඩා පුහුණුකරුවන් සංඛ්‍යාව 2,981කි.

(ආ) අදාළ නොවේ.

**ගරු රුවන් විජේවීර මහතා**
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)

ගරු කථානායකතුමනි, පිළිතුර ලබා දීම සම්බන්ධයෙන් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම ගත්තොත්, ක්‍රීඩා පුහුණුකරුවන් බඳවා ගැනීමේදී 3,888ක් බඳවාගෙන තිබෙනවා. බඳවා ගැනීමේ අධ්‍යාපන සුදුසුකම් ලෙස සාමාන්‍ය පෙළ විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත් වීම තමයි දක්වා තිබෙන්නේ. ක්‍රීඩා පුහුණුකරුවන් 2,981ක් වාගේ තමයි දැනට ඉන්නේ. ක්‍රීඩා පුහුණුකරුවන්ගේ කාර්යභාරය ගැන නියෝජ්‍ය අමාත්‍යතුමා පැහැදිලි කළා.

ගරු කථානායකතුමනි, මෙතැන තිබෙන ගැටලුව තමයි ක්‍රීඩා පුහුණුකරුවන්ගේ රාජකාරි ස්වභාවය අද වනකොට වෙනස් වීමකට ලක් වෙලා තිබීම. ඒ කියන්නේ, ක්‍රීඩා පුහුණුකරුවන් පාසලක අනධ්‍යයන කාර්යභාරයේ ඉඳලා අධ්‍යයන කාර්යභාරය දක්වා පරාසයක යම් යම් කාර්යභාරයන් ඒ ඒ තැන්වලට සාපේක්ෂව ඉටු කරනු ලබනවා. ඒ වාගේම මේගොල්ලන් බඳවා ගැනීමේ සුදුසුකම ලෙස අපොස සාමාන්‍ය පෙළ සමත් වීම තමයි

[ගරු රුවන් විජේවීර මහතා]

තිබෙන්නේ. නමුත්, මේ වෙනකොට ඉන්න ක්‍රීඩා පුහුණුකරුවන් අතරින් යම් කණ්ඩායමක් සාමාන්‍ය පෙළ සුදුසුකමේ ඉඳලා උපාධිය සහ සමහර වෙලාවට උපාධියත් ඉක්මවා ගිය සුදුසුකම් සපුරාගෙන තිබෙනවා. ඔවුන්ගේ වෘත්තීයභාවය, වෘත්තිකභාවය සංවර්ධනය කරගෙන ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව හරහා ගුරු සේවයට බැඳෙන්නත් අපේක්ෂාවක් තිබෙන කණ්ඩායමක් ඉන්නවා. මම නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් අහන පළමුවැනි අතුරු ප්‍රශ්නය තමයි, මේ ඉන්න ක්‍රීඩා පුහුණුකරුවන්ගේ වෘත්තිකභාවය සංවර්ධනය කරලා අධ්‍යාපන පද්ධතියට ඵලදායීව භාවිතයට - උපයෝජනය කර - ගැනීම සඳහා තිබෙන සැලසුම කුමක්ද කියන එක.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ගරු කථානායකතුමනි, ඒ ප්‍රශ්නය ඇසීම සම්බන්ධයෙන් එතුමාට ස්තුතිවන්ත වෙනවා. ඇත්තටම මෙම ක්‍රීඩා පුහුණුකරුවන්ගේ සේවය සම්බන්ධයෙන් අපට අදහසක් තිබෙනවා. විශේෂයෙන්ම ගත්තොත්, ක්‍රීඩා පුහුණුකරුවන්ගේ පුහුණුකාරීත්වය යටතේ ලංකාවේ ජාතික පරිසාධන මට්ටමේ ක්‍රීඩකයන් සැලකිය යුතු සංඛ්‍යාවක් බිහි කරලා තිබෙනවා. ඒ වාගේම තමයි ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් සැලකිය යුතු ප්‍රමාණයක් බිහි වෙලා තිබෙනවා. එම නිසා මෙම ක්‍රීඩා පුහුණුකරුවන්ගේ සේවය අපි ඇගයීමට ලක් කළ යුතුයි. එතැනදී එක කාරණාවක් තමයි ගුරු සේවයට ඇතුළත් වීම. මේ වෙනකොට අපි මෙම ක්‍රීඩා පුහුණුකරුවන් සමඟ සාකච්ඡා වට කිහිපයක් පවත්වා තිබෙනවා.

ඔබතුමා සඳහන් කළා වාගේ මෙතැන ඉන්න ප්‍රමාණයෙන් සැලකිය යුතු පිරිසක් උපාධිය සපුරාගෙන තිබෙනවා. මෙවර ඌන සේවා උපාධිධාරින් බඳවා ගැනීමේදී මෙම කොටසින් සැලකිය යුතු ප්‍රමාණයකට ඒ සඳහා ඉඩ කඩ විවර වෙනවා. ඒක සුබදායක කටයුත්තක්. ඒ වාගේම, මෙම ක්‍රීඩා පුහුණුකරුවන්ගේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය - CPD - ඇති කරන්න ඕනෑ. ඒ සඳහා ක්‍රීඩා අමාත්‍යාංශය සහ අධ්‍යාපන අමාත්‍යාංශය එකතුව නිශ්චිත වැඩ පිළිවෙළ කිහිපයක් පිළිබඳව තීරණය කරලා තිබෙනවා. එකක් තමයි, ඒ අය ක්‍රීඩා පුහුණුකරුවන් සහ විනිශ්චයකරුවන් ලෙස පුහුණු සැසිවලට නිශ්චිත කාල රාමුවකදී ඉදිරිපත් කිරීම සහ විදේශ පුහුණු අවස්ථා ලබා දීම. මෙම ක්‍රීඩා පුහුණුකරුවන් විශේෂ කටයුත්තක් ලෙස පර්යන්ත පාසල්වල ක්‍රීඩාව සංවර්ධනය කිරීමටත් මැදිහත් වෙනවා. විශේෂයෙන්ම ක්‍රීඩා ගුරුවරුන් නොමැති පාසල්වල ක්‍රීඩා පුහුණු කිරීමේ කටයුතු කරන්නේ මේ ක්‍රීඩා පුහුණුකරුවන්. ඒ නිසා පාසල් පොකුරක් ලෙස අරගෙන ඒ පොකුරට අදාළව පුහුණුකරුවන් යෙදවීම සඳහාත් ඉදිරියේදී අපි ක්‍රියාමාර්ග ගන්නවා. ඒ වාගේම මේ ක්‍රීඩා පුහුණුකරුවන්ට යම්කිසි ක්‍රීඩාවක් සම්බන්ධයෙන් විශේෂඥතාවක් ඇති කිරීම සඳහා කටයුතු කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා. පුහුණුකරුවන්ගේ වෘත්තීයභාවය සුරැකීම සඳහා ඉදිරියේදී අපි ලොකු වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වෙනවා, ක්‍රීඩා අමාත්‍යාංශය හා ඒකාබද්ධ කමිටුවක් මාර්ගයෙන්.

**ගරු රුවන් විජේවීර මහතා**
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාට මා ස්තුතිවන්ත වෙනවා, ඒ පැහැදිලි පිළිතුර ලබා දීම සම්බන්ධව. මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි.

ක්‍රීඩා පුහුණුකරුවන්ගේ වෘත්තීමයභාවය සංවර්ධනය කිරීම වැදගත් වනවා. පාසලේ ක්‍රීඩාව සංවර්ධනය සහ සිසුන් තුළ ක්‍රීඩා කුසලතාව සංවර්ධනය සම්බන්ධයෙන් ක්‍රීඩා පුහුණුකරුවන් සහ ක්‍රීඩා ගුරුවරුන් වාගේම පාසල් පද්ධතිය තුළ තිබෙන භෞතික සම්පත්වල ප්‍රමාණාත්මක බව සහ ඒවා විෂමතාවකින් තොරව බෙදී යෑමේ අවශ්‍යතාවද ඉතාම වැදගත් වෙනවා. ඒ නිසා අපේ රටේ පාසල් පද්ධතිය තුළ ක්‍රීඩාව සංවර්ධනය කිරීම සහ භෞතික සම්පත් සංවර්ධනය කිරීම සඳහා තිබෙන සැලසුම මොකක්ද කියලා ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ඒ ප්‍රශ්නය ඇසීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

විශේෂයෙන්ම අප හඳුනාගත් කාරණයක් තමයි භෞතික සම්පත් බෙදී යෑමේ ගැටලුව. ක්‍රීඩාව සම්බන්ධයෙන් එය සුවිශේෂීව බලපානවා. එකක් තමයි, ක්‍රීඩා පිටි සම්බන්ධයෙන් තිබෙන ගැටලුව. අපි මේ අවුරුද්ද තුළ ලංකාවම ආවරණය වන පරිදි සියලු දිස්ත්‍රික්කවල පළාත් පාසල් 3ක අවම වශයෙන් මීටර් 400කින් යුත් ක්‍රීඩා පිටි 3ක් සංවර්ධනය කරනවා වාගේම එක ජාතික පාසලක අවම වශයෙන් මීටර් 400ක ට්‍රැක් එකක් සහිත ක්‍රීඩා පිටි සංවර්ධනය කරනවා. එතකොට සියලු දිස්ත්‍රික්කවල පර්යන්තයට සහ අනෙකුත් ප්‍රදේශවලට භෞතික සම්පත්වල බෙදී යෑමේ ගැටලුවලට යම්කිසි විසඳුමක් ලැබෙයි කියලා අපි මුල් වටයේදී හිතනවා. නමුත්, ඒක ප්‍රමාණවත් කියලා අපි හිතන්නේ නැහැ. මෙම සංවර්ධන ක්‍රියාදාමය ඉදිරියට ගෙන යන්න අපි බලාපොරොත්තු වෙනවා. මෙකී ක්‍රීඩා පිටි සංවර්ධනය නිශ්චිත නිර්ණායක මත තමයි කරන්නේ. එය නිකම්ම කරන දෙයක් නොව, ක්‍රීඩා අමාත්‍යාංශය මඟින් සැලසුම් කරලා අධ්‍යාපන අමාත්‍යාංශයට එවන නිර්ණායක මත කරන දෙයක්. ඒ නිසා විද්‍යාත්මක විධියට තමයි එම ක්‍රීඩා පිටි සංවර්ධනය සිද්ධ වෙන්නේ.

ගරු කථානායකතුමනි, අනෙක් එක තමයි ක්‍රීඩා පාසල් පිළිබඳ කාරණය. දැනට ක්‍රීඩා පාසල් 17ක් තිබෙනවා. නමුත්, සමහර ක්‍රීඩා පාසල් පිළිබඳව විමර්ශනය කළාට පසුව අපට මතු වුණු ප්‍රශ්නයක් තමයි, ඒවායෙන් මූලික අරමුණ ඉෂ්ට වෙනවාද, නැද්ද කියන එක. එතැනදී අපි සියලු ක්‍රීඩා පාසල් මූලික අරමුණ ඉෂ්ට වන ආකාරයට සංවර්ධනය කිරීමට කටයුතු කරනවා. විශේෂයෙන්ම පෝෂණ වැඩසටහනක් තිබෙනවා. කාල සටහන් වෙනස්. ඒ වාගේම, පුහුණුකරුවන් අවශ්‍යයි. පුහුණුකරුවන් සහ ක්‍රීඩා ගුරුවරුන් බඳවා ගැනීම සඳහා අපට දැන් අවස්ථාවක් තිබෙනවා. විශේෂයෙන්ම ක්‍රීඩා ගුරුවරුන් මේ අවුරුද්ද අවසන් වෙද්දී අපට බඳවා ගන්න පුළුවන්, ගුරු අධ්‍යාපන විද්‍යාපීඨවලින්. එතකොට ක්‍රීඩා ගුරුවරුන්ගේ අවශ්‍යතාව යම්කිසි මට්ටමකට සපුරාලීමට මැදිහත් වීමක් කරන්න අපට පුළුවන්කම තිබෙනවා. නමුත්, මෙය තවදුරටත් වර්ධනය කිරීම සඳහා අපි ක්‍රීඩා අමාත්‍යාංශය හා එකතුව අඩු ගණනේ එක දිස්ත්‍රික්කයකට එක පාසලක්වත් ක්‍රීඩා පාසලක් ලෙස සම්පූර්ණ ලෙස දියුණු කිරීමේ හැකියාව ගැන සොයා බලනවා. ලබන අවුරුද්ද වෙද්දී සෑම දිස්ත්‍රික්කයකටම පරිපූර්ණ ක්‍රීඩා අවශ්‍යතා සපුරා ගත හැකි ක්‍රීඩා පාසලක් එකතු කිරීම තමයි අදහස වී තිබෙන්නේ. මේක තමයි දැනට තිබෙන යටිතල පහසුකම් සම්බන්ධයෙන් නිශ්චිතව අප කරන ක්‍රියාදාමය.

බොහොම ස්තුතියි.

## හඟුරන්කෙත තානායම: විස්තර
ஹங்குரன்கெத வாடிவீடு: விபரம்
HANGURANKETHA REST HOUSE: DETAILS

1905/2026

**10.ගරු ආර්.ජී. විජේරත්න මහතා**
(மாண்புமிகு ஆர்.ஜீ. விஜேரத்ன)
(The Hon. R.G. Wijerathna)
විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්න - (1):

(අ) (i) හඟුරන්කෙත තානායම අමාත්‍යාංශයේ විෂයපථයට අයත් බවත්;

(ii) එහි නීති විරෝධී ක්‍රියා සිදු වන බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) වර්තමානයේ එම තානායම පවත්වාගෙන යනු ලබන පුද්ගලයාගේ නම කවරේද;

(ii) ඔහුට එම තානායම භාර දී ඇති පදනම කවරේද;

(iii) ඔහු එම තානායම පවත්වාගෙන යනු ලබන කාලය කවරේද;

(iv) රජයේ තානායම්වලින් ඵලදායි සේවාවක් ලබා ගැනීම සඳහා ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஹங்குரன்கெத வாடிவீடு அமைச்சின் விடயப்பரப்புக்கு உட்பட்டது என்பதையும்;

(ii) அங்கு சட்டவிரோதச் செயற்பாடுகள் இடம் பெறுகின்றன என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) தற்போது மேற்படி வாடிவீட்டை நடத்திச் செல்பவரின் பெயர் யாது என்பதையும்;

(ii) அவருக்கு மேற்படி வாடிவீடு ஒப்படைக்கப் பட்டுள்ள அடிப்படை யாது என்பதையும்;

(iii) அவர் மேற்படி வாடிவீட்டை நடத்திச்செல்லும் காலம் யாது என்பதையும்;

(iv) அரசாங்க வாடிவீடுகளிலிருந்து பயனுறுதிமிக்க சேவையைப் பெற்றுக் கொள்வதற்காக எதிர்காலத்தில் எடுக்கப்படவுள்ள நடவடிக்கை கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Affairs, Foreign Employment and Tourism:

(a) Is he aware that -

(i) the Hanguranketha Rest House falls within the purview of the Ministry; and

(ii) illegal activities are being carried out on the premises?

(b) Will he inform this House the -

(i) name of the person currently operating the said rest house;

(ii) basis on which the operations of the said rest house have been entrusted to him;

(iii) period during which the said rest house has been under his operation; and

(iv) measures that will be taken in the future to ensure effective service from State-owned rest houses?

(c) If not, why?

**ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා (සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ - சுற்றுலாப் பிரதி அமைச்சர்)
(The Hon. (Prof.) Ruwan Ranasinghe - Deputy Minister of Tourism)

ගරු කථානායකතුමනි, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) හඟුරන්කෙත තානායම ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට අයත් තානායම් 37න් එකක් වන බැවින් එය අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වේ.

(ii) තානායම් සඳහා සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවන්හිදී නීති විරෝධී කටයුතු සිදු වන බව අනාවරණය වී නොමැත.

(ආ) (i) ජයලත් මුදියන්සේලාගේ ජයලත් බණ්ඩාර දිසානායක මහතා.

(ii) අධ්‍යක්ෂ මණ්ඩල තීරණ 2008.05.13 සහ අමාත්‍යාංශ ලේකම්ගේ 2008 මැයි 26 දිනැතිව ලද අනුමැතිය මත බදුකරුවන් ගෙන්වා කරන ලද සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව තානායම බදු දී ඇත.

(iii) ගිවිසුම් අංක 54 යටතේ 2008 අප්‍රේල් 01 සිට 2018 මාර්තු 31 දක්වා

ගිවිසුම් අංක 157 යටතේ 2018 අප්‍රේල් 01 සිට 2020 මාර්තු 31 දක්වා

ගිවිසුම් අංක 190 යටතේ 2020 අප්‍රේල් 01 සිට 2028 මාර්තු 31 දක්වා

(iv) නිකේතන කළමනාකරණ අංශයේ නිලධාරින් වරින් වර බදු පදනම මත දෙන ලද තානායම් සඳහා ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදු කරන අතර, එහිදී තානායමක් පවත්වාගෙන යාමේදී ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට අනුමත මාර්ගෝපදේශ මත පවත්වාගෙන යනවාද යන්න පරීක්ෂා කරනු ලබයි. එහිදී පවතින අඩුපාඩු පෙන්වා දී ඒවා සියල්ල සම්පූර්ණ කර දේශීය සංචාරකයන්ට නවාතැන් ලබා ගත හැකි අයුරින් ඉතාමත් ඵලදායි ආකාරයට පවත්වාගෙන යන ලෙස තරයේ උපදෙස් දෙනු ලබයි.

තවද, මෙම තානායම් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි කර ඇති බැවින් තානායමේ වාර්ෂික ආදායමෙන් සියයට එකක මුදලක් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන බදු මුදල් ලෙස අය කර ගන්නා බැවින්, එමඟින්ද සංචාරක සංවර්ධනය සඳහා දායකත්වයක් ලබා ගනී.

(ඇ) අදාළ නොවේ.

**ගරු ආර්.ජී. විජේරත්න මහතා**
(மாண்புமிகு ஆர்.ஜீ. விஜேரத்ன)
(The Hon. R.G. Wijerathna)

ගරු කථානායකතුමනි, එම පිළිතුර ලබා දීම සම්බන්ධයෙන් ගරු නියෝජ්‍ය ඇමතිතුමාට මා ස්තුතිවන්ත වෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා ලබා දුන් පිළිතුර අනුව, එක දිගට අවුරුදු 28ක කාලයක් එකම පුද්ගලයෙකු තමයි ඒ තානායමේ බදුකරු වශයෙන් කටයුතු කර තිබෙන්නේ. තවදුරටත් පැහැදිලි කරනවා නම්, ජයලත් බණ්ඩාර දිසානායක කියන්නේ හඟුරන්කෙත ආසනයේ සමගි ජන බලවේගයේ ප්‍රධාන සංවිධායකවරයායි. ඒ විතරක් නොවෙයි, අප කවුරුත් දන්නා, ඉතිහාසයේ හඟුරන්කෙත ඡන්ද මැෂිම, එහෙම නැත්නම් හඟුරන්කෙත ආසනයේ භීෂණය ක්‍රියාත්මක වුණු කේන්ද්‍රස්ථානය තමයි හඟුරන්කෙත තානායම කියන්නේ. ඒකට සාක්ෂි දරනවා, මීට අවුරුදු 21කට පෙරාතුව මේ පාර්ලිමේන්තුවට මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කළ ප්‍රශ්නය. ඒකට ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ මහතා පිළිතුර ලබා දී තිබෙනවා.

එම පිළිතුර 2005 මාර්තු 10 දිනැති හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 1439හි සඳහන් වනවා. එහි (ආ) සහ (ඇ) (i) කොටස් සඳහා පිළිතුරු මෙසේ සඳහන් වෙනවා:

> "(ආ) තානායම අවිධිමත්ව පාලනය කෙරෙන බව සංචාරක මණ්ඩලය විසින් නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව එය විධිමත් පරිදි වැඩිදියුණු කළ යුතු බව තානායම්කරුට දන්වා තිබෙන අතර එතෙක් 2005 වසර සඳහා මත්පැන් බලපත්‍රය නිර්දේශ නොකිරීමටද තීරණය කර ඇත.
>
> (ඇ) (i) දුර්වල පරිපාලනය යන කාරණය මත තානායමේ බදු ගිවිසුම අවලංගු කිරීම සංචාරක මණ්ඩලයේ අරමුණු වී පවතී. ඒ සම්බන්ධව තිබෙන නීතිමය හැකියාව පරීක්ෂා කරගෙන යනු ලැබේ."

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මෙයින් පැහැදිලි වන්නේ මීට කලින් ඉතාම අවිධිමත් ආකාරයට මේ තානායම පවත්වාගෙන ගිහිල්ලා තිබෙනවා කියන එක තමයි. ඒ වාගේම දැනටත් මේකට රා බලපත්‍රයක් නිකුත් කරලා තිබෙනවා. නමුත් මේක ආසන්නයේ ප්‍රසිද්ධ බාලිකා පාසලක් තියෙනවා. මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය වන්නේ අනීතික ආකාරයට පවත්වාගෙන යන මේ තානායම එරෙහිව නීතිය ක්‍රියාත්මක වන්නේ නැද්ද කියන එකයි.

**ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ)
(The Hon. (Prof.) Ruwan Ranasinghe)

ගරු කථානායකතුමනි, මා මුලින් සඳහන් කළ පරිදි ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සතුව තානායම් 37ක් තිබෙනවා. කලින් කලට අපේ නිලධාරින් මේවායේ ක්ෂේත්‍ර චාරිකාවල නිරත වෙනවා. ඉතින් පසුගිය ක්ෂේත්‍ර චාරිකාව අවස්ථාවේදී මේ ස්ථානයට අදාළව ගැටලුවක් මතු වෙලා නැහැ, නීති විරෝධී ක්‍රියා සම්බන්ධයෙන්. නමුත් ගරු මන්ත්‍රීතුමා සඳහන් කරන පරිදි වසර ගණනාවකට පෙර මේ පාර්ලිමේන්තුවේ හිටපු ඇමතිවරයෙක් සඳහන් කරලා තිබෙනවා, ඒ පිළිබඳව නීතිමය කටයුතු කරන්න කටයුතු කරමින් ඉන්නවා කියලා. නමුත් ඒක එහෙම වෙලා නැහැ කියන එක දැන් පැහැදිලියි. ඒ පිළිබඳව අපට සොයා බලන්න පුළුවන්. අපි බලයට පත් වෙනකොටත් 2024 ඉඳලා 2028 වෙනකම් නැවත මේ ගිවිසුමට එළඹිලා තිබෙනවා. නමුත් යම්කිසි අනීතික, නීති විරෝධී කටයුතු සිද්ධ වෙනවා නම්, ඒ පිළිබඳව සංචාරක සංවර්ධන අධිකාරියේ තිබෙන නීති රෙගුලාසි අනුව අපට කටයුතු කරන්න පුළුවන්. ඒ සඳහා අපි මැදිහත් වෙනවා.

**ගරු ආර්.ජී. විජේරත්න මහතා**
(மாண்புமிகு ஆர்.ஜீ. விஜேரத்ன)
(The Hon. R.G. Wijerathna)

මගේ දෙවන අතුරු ප්‍රශ්නය මේකයි.

රටේම තිබෙන මෙවැනි තානායම් විධිමත් නීතිමය කළමනාකරණ පද්ධතියක් යටතේ, නියමිත මිල ගණන් යටතේ පවත්වාගෙන යනවා. නමුත් අපි කවුරුත් දන්නා හැටියට මෙයින් පරිබාහිරව, විශේෂයෙන් නුවරඑළිය දිස්ත්‍රික්කයේ විවිධ ස්ථානවල විවිධ මිල ගණන් යටතේ මත්පැන් නිකුත් කිරීම් සිද්ධ වෙනවා. එතකොට ඔබේ අමාත්‍යාංශය විධියට ඒ සඳහා ඉදිරියට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද?

**ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ)
(The Hon. (Prof.) Ruwan Ranasinghe)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා සඳහන් කරන කාරණයේ සත්‍යයක් තිබෙනවා. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විධියට අපි නිර්දේශයක් තමයි Excise Department එකට නිකුත් කරන්නේ ඒවාට අවශ්‍ය මත්පැන් බලපත්‍ර නිකුත් කරන්නට. නමුත් මන්ත්‍රීතුමා සඳහන් කරන පරිදිම උද්ගත වෙලා තිබෙන තත්ත්වයක් තිබෙනවා.

නීත්‍යනුකූලව රජයේ බලපත්‍ර ලබාගෙන මත්පැන් වෙළඳාම සිදු කරන අය ඉන්නවා. ඒ වාගේම, නීති විරෝධී ලෙස, එහෙමත් නැත්නම් නිසි බලපත්‍රයක් නොමැතිව මත්පැන් අළෙවි කරන අය මේ සංචාරක කලාප තුළ විශාල වශයෙන් ඉන්නවා. එහිදී සිදු වන්නේ රජයට අය විය යුතු ගාස්තු සහ බදු විශාල ප්‍රමාණයක් අහිමිවීම. අපි ඒ පිළිබඳව මුදල් අමාත්‍යතුමා සමඟ සාකච්ඡා කරලා ඉදිරියේදී මේ සංචාරක කලාපවල ඉන්න, විශේෂයෙන් මේ ක්ෂේත්‍රයට අදාළ ව්‍යාපාර කරන අයට නිසි ගාස්තු සහ බදු අය කරමින් බලපත්‍ර නිකුත් කරන්න කටයුතු කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දෙවන වටය.

## කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පෙර පාසල් ගුරුවරු: වැටුප්
### கிளிநொச்சி மாவட்டத்திலுள்ள முன்பள்ளி ஆசிரியர்கள்: சம்பளம்
### PRESCHOOL TEACHERS IN KILINOCHCHI DISTRICT: SALARIES

1187/2025

**1. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சிவஞானம் சிறீதரன் சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon.Sivagnanam Shritharan)

මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) කිලිනොච්චි දිස්ත්‍රික්කයේ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් පෙර පාසල් පවත්වාගෙන යනු ලබන අතර, එම පෙර පාසල්වල ඉගැන්වීමේ කටයුතුවල නිරත ගුරුවරුන්ට වැටුප් ගෙවීම් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන බව දන්නේද;

(ii) එම දිස්ත්‍රික්කයේ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන පෙර පාසල් සංඛ්‍යාව කොපමණද;

(iii) එම පෙර පාසල්වල සේවය කරන, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් වැටුප් ගෙවනු ලබන ගුරුවරුන් සංඛ්‍යාව සහ ඔවුන්ට ගෙවනු ලබන මුළු මාසික වැටුප කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) එම පෙර පාසල්වල සිසුන්ගේ නිල ඇඳුම් සඳහා දෙමාපියන්ගෙන් මුදල් අය කරගනු ලබන බව දන්නේද;

(ii) එසේ නම්, එක් දරුවෙකුගෙන් අයකරනු ලබන මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) එම මුදල අය කිරීමට හේතු කවරේද;

(iv) එම නිල ඇඳුම්වල හමුදා ලාංඡනය යෙදීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) එම පෙර පාසල් පළාත් සභාව යටතේ පවතින බව දන්නේද;

(ii) එසේ නම්, ඒවා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවීම සඳහා වන නෛතික පදනම කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சிவில் பாதுகாப்புத் திணைக்களம் கிளிநொச்சி மாவட்டத்தில் முன்பள்ளிகளை நடத்துகிறது என்பதையும், அத்தகைய முன்பள்ளிகளில் கற்பித்தல் நடவடிக்கைகளில் ஈடுபடும் ஆசிரியர்களுக்கு சிவில் பாதுகாப்புத் திணைக்களத்தால் சம்பளம் வழங்கப்படுகிறது என்பதையும் அவர் அறிவாரா;

(ii) அந்த மாவட்டத்தில் சிவில் பாதுகாப்புத் திணைக்களத்தால் செயற்படுத்தப்படும் முன்பள்ளிகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) மேற்படி முன்பள்ளிகளில் கடமையாற்றுகின்ற, சிவில் பாதுகாப்புத் திணைக்களத்தால் சம்பளம் வழங்கப்படுகின்ற ஆசிரியர்களின் எண்ணிக்கை மற்றும் அவர்களுக்குச் செலுத்தப்படுகின்ற மாதாந்த மொத்தச் சம்பளம் எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி முன்பள்ளி மாணவர்களின் சீருடைகளுக்காகப் பெற்றோரிடமிருந்து பணம் அறவிடப்படுவதை அறிவாரா என்பதையும்;

(ii) அவ்வாறாயின், ஒரு பிள்ளைக்கான அறவீட்டுத் தொகை எவ்வளவு என்பதையும்;

(iii) அத்தொகை அறவிடப்படுவதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(iv) அத்தகைய சீருடைகளில் இராணுவச் சின்னம் பொறிக்கப்பட்டுள்ளதற்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) மேற்படி முன்பள்ளிகள் மாகாண சபையின்கீழ் இயங்குவதை அறிவாரா என்பதையும்;

(ii) அவ்வாறாயின், சிவில் பாதுகாப்புத் திணைக்களத்தால் இந்த முன்பள்ளிகள் வழிநடத்தப்படுவதன் சட்டப் பின்னணி யாது என்பதையும்;

அவர் மேலும் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Public Security and Parliamentary Affairs:

(a) Will he inform this House -

(i) whether he is aware that the Civil Security Department maintains preschools in the Kilinochchi District and that the Civil Security Department pays the salaries of the teachers engaged in teaching in those preschools;

(ii) the number of preschools maintained by the Civil Security Department in that district; and

(iii) the number of teachers employed in those preschools, who are paid by the Civil Security Department, together with the total monthly salary paid to them?

(b) Will he also inform this House -

(i) whether he is aware that money is collected from parents for the uniforms of the students of those preschools;

(ii) if so, the amount of money collected from each child;

(iii) the reasons for collecting the aforesaid amount of money; and

(iv) the reasons for the military symbol being placed on those uniforms?

(c) Will he further inform this House -

(i) whether he is aware that those preschools are under the Provincial Council; and

(ii) if so, the legal basis for them being run by the Civil Security Department?

(d) If not, why?

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) කිලිනොච්චි දිස්ත්‍රික්කය තුළ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් පෙර පාසල් පවත්වාගෙන යනු නොලබන අතර, ඒවා උතුරු පළාත් සභාව යටතේ ඇති පූර්ව ළමාවිය සංවර්ධන අධිකාරිය මඟින් පවත්වාගෙන යයි.

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත කාන්තා සිවිල් ආරක්ෂක භට තනතුරට පෙර පාසල් ගුරුවරියන් ලෙස බඳවාගෙන වැටුප් හා දීමනා ගෙවමින් එම පෙර පාසල් සඳහා අනුයුක්ත කර ඇත.

(ii) සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් එම දිස්ත්‍රික්කය තුළ පෙර පාසල් පවත්වාගෙන යනු නොලබයි.

[ගරු ආනන්ද විජේපාල මහතා]

(iii) පෙර පාසල් ගුරුවරියන් සංඛ්‍යාව - 228කි.

<u>ගෙවනු ලබන මුළු මාසික වැටුප් හා දීමනා (නිලය අනුව)</u>

කාන්තා සිවිල් ආරක්ෂක භටයකුගේ මාසික වැටුප් හා දීමනා - රු. 62,313.00

ගෙවනු ලබන මුළු මාසික වැටුප් හා දීමනාව 228x62,313.00 - 14,207,364.00

(ආ) (i) සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් පාලනය නොකරන බැවින් එම දෙපාර්තමේන්තුව විසින් මුදල් අය කරනු නොලබයි.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(iv) සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් නිල ඇඳුම් ලබාදීම සිදු නොකරයි.

(ඇ) (i) ඔව්.

(ii) යුද්ධය නිමාවත් සමඟ එම ප්‍රදේශවල සිදු කළ සංවර්ධන වැඩ පිළිවෙළ යටතේ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු ඉහළ නැංවීම සඳහා උතුරු පළාත් සභාව යටතේ ආරම්භ කර ඇති පෙර පාසල් සඳහා එම ප්‍රදේශවලින් සුදුසුකම් ලත් දමිළ තරුණියන් ගුරුවරියන් ලෙස බඳවාගෙන ඔවුන්ගේ පාලන කටයුතු කිරීමට එවකට පැවති රජය විසින් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත ඇතුළත් කර ඇත. ඒ අනුව එම ගුරුවරියන්ගේ පාලන කටයුතු පමණක් (වැටුප් හා දීමනා ගෙවීම ඇතුළුව) සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් සිදු කරන අතර, උතුරු පළාත් සභාව යටතේ පවතින කිසිදු පෙර පාසලක් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් පාලනය නොකරයි.

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රතිව්‍යුහගත ක්‍රියාවලිය යටතේ දැනට දිවයින පුරා පෙර පාසල් ගුරුවරියන් ලෙස යොදවා සිටින සියලුම ගුරුවරියන් නවත ඔවුන් රාජකාරී කරනු ලබන පළාත් සභා සඳහා අනුයුක්ත කිරීමට නිර්දේශ ලබාදීමට නියමිතය.

(ඈ) පැන නොනඟී.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2 -1408/2025- (1), ගරු (වෛද්‍ය) පද්මනාදන් සත්‍යාලිංගම් මහතා.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
Sir, I ask the Question.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, ඔබතුමාගේ රීති ප්‍රශ්නය මොකක්ද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා අවස්ථාව ලබා දීම ගැන. ස්ථාවර නියෝග 92 (2)හි වගන්ති යටතේ තමයි මම මේ කාරණය ඉදිරිපත් කරන්නේ.

ගරු කථානායකතුමනි, මේ සභාවට මේ වන විටත්, "ලක්විජය බලාගාරය සඳහා ගල්අඟුරු සමාගම විසින් ගල්අඟුරු මිලදී ගැනීමේ ක්‍රියාවලිය සහ 2025/2026 වාරය සඳහා ගල් අඟුරු ප්‍රසම්පාදනය පිළිබඳ විශේෂ විගණන වාර්තාව" ඉදිරිපත් කරලා තිබෙනවා.

විශේෂයෙන් මම සඳහන් කරන්න කැමැතියි, මේ පාර්ලිමේන්තු සම්ප්‍රදාය පිළිගන්නා Erskine Mayගේ "Parliamentary Practice" සහ M.N. Kaul and S.L. Shakdherගේ "Practice and Procedure of Parliament" පොත් මා ඉදිරිපිට තිබෙනවා. මම ඒවායින් තමයි කරුණු උපුටා දක්වන්නේ. ගරු කථානායකතුමනි, මේ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළාට පස්සේ, ඒ වාගේම මන්ත්‍රීවරුන්ටත් එහි පිටපත් ලබා දුන්නාට පස්සේ, මේ වාර්තාවට තවත් කරුණු කාරණා ඇතුළත් කිරීම, මීට පෙර සිදු වුණු ගල් අඟුරු මිල දී ගැනීම් පිළිබඳව අලුත් කරුණු කාරණා ඇතුළත් කිරීම මම හිතන විධියට සදාචාර සම්පන්න නැහැ. ඒ පෙර කාරණා පිළිබඳවත් විමර්ශනය කරලා වෙනම සාකච්ඡාවකට භාජන කිරීම තමයි සුදුසුම දේ.

ගරු කථානායකතුමනි, අපට ආරංචියි එවන් උත්සාහයක් තිබෙනවා කියලා. ගල් අඟුරු ප්‍රසම්පාදනය පිළිබඳව මේ table කරපු විශේෂ විගණන වාර්තාවට අමතරව, තවත් කරුණු කාරණා කිහිපයක් පිළිබඳ වාර්තාවක් අද COPE එක හරහා ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා කියලා ආරංචියි. මම යෝජනා කරනවා, ඒ කාලවකවානු තුළ සිදු වුණු ගනුදෙනු පිළිබඳව වෙනම විමර්ශනයක් කරලා, විධිමත් ආකාරයෙන් ඒ වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම ඉතාම වැදගත් කියලා. එසේ නොකළහොත්, ඇත්ත වශයෙන්ම විගණකාධිපතිවරයාගේ ස්වාධීනත්වයට අභියෝගයක් එල්ල වෙනවා. ඒ ස්වාධීනත්වය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 හා 154 ව්‍යවස්ථා යටතේ අපි ආරක්ෂා කළ යුතු දෙයක්.

ඒ වාගේම මේ විධියට කටයුතු කළොත් ඒක පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද කඩ කිරීමක්. ඇත්ත වශයෙන්ම oversight body එකක් හැටියට ඒ ආයතන පිළිවෙළට ඒ කටයුතු ක්‍රියාත්මක කරන්නට ඕනෑ. ඒ වාගේම, අයථා බලපෑමට - undue influencesවලට - ලක් නොකිරීමේ න්‍යායක්, doctrine එකක් තිබෙනවා. මේ ක්‍රියා හරහා ඒකත් violate වෙනවා.

ගරු කථානායකතුමනි, වගවීම සහ සාරධර්ම උල්ලංඝනය කිරීමක් කියන කරුණු මත මම ඔබතුමාට යෝජනා කරනවා, විශේෂයෙන්ම ඒ පෙර කාරණා පිළිබඳවත් මීට වඩා විධිමත් පරීක්ෂණයක් කරලා, ඒ සඳහාත් වෙනම විගණකාධිපතිවරයාගේ වාර්තාවක් සමඟ විධිමත්ව ඉදිරිපත් කිරීම සුදුසුයි, යෝග්‍යයි කියලා. මේ වාර්තාවට ම ඒ කරුණුත් අමුණලා දමන්න හදන එක සුදුසු ක්‍රියාවක් කියලා මම හිතන්නේ නැහැ. ඇත්ත වශයෙන්ම එහෙම දෙයක් සිද්ධ වෙනවා නම්, ඒ පිළිබඳව අපේ විරෝධතාව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමැතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නය, ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### උතුරු පළාතේ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල කාර්ය සාධනය
### வடக்கு மாகாணத்தில் மாவட்ட மற்றும் பிரதேச ஒருங்கிணைப்புக் குழுக் கூட்டங்களின் செயற்பாடுகள்
### PERFORMANCE OF DISTRICT AND DIVISIONAL COORDINATING COMMITTEES OF NORTHERN PROVINCE

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

ගරු කථානායකතුමනි, பாராளுமன்ற நிலையியற் கட்டளை 27(2)இன்கீழ் பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர் அவர்களிடம் மாவட்ட மற்றும் பிரதேச ஒருங்கிணைப்புக் குழுக் கூட்டம் தொடர்பில் கேள்வி கேட்பதற்கு அனுமதித்தமைக்கு நன்றி!

கௌரவ அமைச்சர் அவர்களே, வடக்கு மாகாணத்தின் யாழ்ப்பாணம் மற்றும் கிளிநொச்சி மாவட்டங்களில், மாவட்ட மற்றும் பிரதேச ஒருங்கிணைப்புக் குழுக் கூட்டங்கள் பாராளுமன்ற உறுப்பினரும் Cabinet அமைச்சருமான கௌரவ ராமலிங்கம் சந்திரசேகர் அவர்களின் தலைமையிலும் அவர் சார்ந்த கட்சிப் பாராளுமன்ற உறுப்பினர்களின் தலைமையிலும் நடைபெற்று வருகின்றன. இவை, வடக்கு மாகாணத்தில் இருக்கின்ற இந்த மாவட்டங்களின் அபிவிருத்தி தொடர்பான முடிவுகளை ஆளும்கட்சி, எதிர்க்கட்சிப் பாராளுமன்ற உறுப்பினர்களின் ஒத்திசைவுடன் கலந்தாலோசித்து, அதேநேரம் சமூகமட்ட மற்றும் அரசாங்க அதிகாரிகளின் பங்களிப்புடன் அந்தப் பிராந்தியத்தின் அபிவிருத்தியை மாத்திரமே கருத்திற்கொண்டு எடுப்பதற்காக ஒழுங்கமைக்கப்படுகின்ற கூட்டங்களாகும். கடந்த அரசாங்கங்களால் செயற்படுத்தப்பட்ட இந்த விடயத்தைத் தங்களுடைய அரசாங்கமும் கொண்டுநடாத்துவது இங்கு குறிப்பிடப்பட வேண்டிய ஒன்றாகும்.

இந்தக் கூட்டங்களில் ஆளுந்தரப்பு, எதிர்த்தரப்புப் பாராளுமன்ற உறுப்பினர்கள் கலந்துகொள்வதையும் இங்கே சுட்டிக்காட்ட விரும்புகின்றேன். இந்தக் கூட்டங்கள் பொது மக்களுடைய அபிவிருத்தியை நோக்காகக்கொண்டு மட்டுமே செயற்படுவதால், அங்கு விவாதிக்கப்படுகின்ற விடயங்கள் பொது மக்களைச் சென்றடைய வேண்டுமென்ற கருத்தைத் தாங்கள் எதிர்க்க மாட்டீர்களென நான் நம்புகின்றேன். இவை கட்சிகளின் அந்தரங்கக் கூட்டங்கள் அல்ல. இங்கே மறைப்பதற்கு எதுவுமே இல்லை. இங்கு அபிவிருத்தி மட்டுமல்ல, அபிவிருத்திக்குத் தடையாக இருக்கின்ற மாகாண, மாவட்ட ஊழல் சார்ந்த விடயங்களும் சுட்டிக் காட்டப்படுகின்றன. இந்தக் கூட்டங்களுக்குத் தலைமை தாங்கும் தலைவர் அவர்கள், அந்த ஊழல் விடயங்கள் தொடர்பில் சட்ட நடவடிக்கை எடுக்க வேண்டும் என்பதையும், அவை பொது மக்களின் நலன் கருதியே எடுக்கப்பட வேண்டும் என்பதையும் இங்கே தெரிவிக்க விரும்புகின்றேன்.

ஊழலுக்கு எதிரான அரசாங்கமெனக் கூறி பொது மக்களைத் திசைதிருப்பி அரசாட்சிக்கு வந்த நீங்கள், அது தொடர்பில் இன்று வரை வடக்கு மாகாணத்தில் கண்டுபிடித்த அல்லது வழக்குத் தொடரப்பட்ட எந்தவோர் நடவடிக்கையும் இல்லை என்பதையும், எங்களால் சுட்டிக்காட்டப்பட்ட பல்வேறு ஊழல்கள் தொடர்பாக அரசாங்கம் இதுவரை எந்த நடவடிக்கையும் எடுக்கவில்லை என்பதையும் பொது மக்களுக்காக இங்கே தெரிவிக்க விரும்புகின்றேன். ஆயினும், இவை தொடர்பாக விவாதிக்கப்படும் இந்தக் கூட்டங்கள் பொது மக்களின் பார்வைக்கு மறைக்கப்பட எத்தணிக்கப்படுகின்ற தருணங்களையும் இங்கே சுட்டிக்காட்ட விரும்புகின்றேன். குறிப்பாக, யாழ்ப்பாணம், கிளிநொச்சி மாவட்டங்களில் நடந்த கூட்டங்களில் இத்தகைய பல விடயங்கள் சுட்டிக்காட்டப்பட்டு, அவை பொது மக்களைச் சென்றடைந்து இருந்தபோதும், இதுவரை அவற்றுக்கெதிராக அரசாங்கம் எந்தவொரு நடவடிக்கையும் எடுக்கவில்லை. இது ஊழலுக்கு எதிரான அரசாங்கமா? என்ற சந்தேகத்தைத் தமிழ் மக்கள் மத்தியில் இன்றுவரை ஏற்படுத்தி வருகின்றது. இவை இப்படியிருக்க, யாழ்ப்பாணம் மற்றும் கிளிநொச்சி மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டங்களில் நடைபெறுகின்ற விடயங்களை மறைக்கும் முகமாக தங்களுடைய கௌரவ அமைச்சர் ராமலிங்கம் சந்திரசேகர் அவர்கள் தொடர்ந்தும் செயற்பட்டு வருகிறார். அது தொடர்பாக பின்வரும் வினாக்களை இங்கே எழுப்ப விரும்புகின்றேன்.

1. மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டங்களுக்குத் தலைமைதாங்குவதற்கு, ஆகக்குறைந்தது மக்களால் தெரிவு செய்யப்பட்ட ஒரு பாராளுமன்ற உறுப்பினரை நியமிப்பதற்கு ஏதாவது சாதக நிலை இருக்கின்றதா?

2. தேசியப் பட்டியல் மூலம் பாராளுமன்ற உறுப்பினராக நியமிக்கப்பட்ட தங்களுடைய அமைச்சர், வடக்கு மக்களின் ஜனநாயகப் பிரதிநிதி அல்ல என்பதைத் தாங்கள் ஏற்றுக் கொள்கின்றீர்களா?

3. வடக்கில் ஒருபோதும் தன்னுடைய வாழ்க்கையைக் கொண்டிராத ஓர் அமைச்சரை, வடக்கு மாகாண அபிவிருத்திக் குழுக் கூட்டங்களுக்குத் தலைவராக நியமித்திருப்பது வடக்கு மாகாணத்துக்கு இழுக்கு என்பதை ஏற்றுக்கொள்கின்றீர்களா?

4. வடக்கு மாகாணத்தில் இடம்பெற்ற மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டங்களில் தெரிவிக்கப்பட்ட ஊழல் தொடர்பான ஏதாவது ஒரு முறைப்பாட்டுக்காவது, அரசாங்கம் என்ற ரீதியில் Cabinet அமைச்சரும் பாராளுமன்ற உறுப்பினருமான கௌரவ ராமலிங்கம் சந்திரசேகர் அவர்கள் இதுவரை நடவடிக்கை எடுத்திருக்கின்றாரா?

5. மாவட்ட, பிரதேச அபிவிருத்திக் குழுக் கூட்டங்களில் நடைபெறும் விவாதங்களின்போது, எதிர்க்கட்சிப் பாராளுமன்ற உறுப்பினர்களை மரியாதைக் குறைவாகக் கதைப்பதற்குத் தங்களுடைய அரசாங்கம் அனுமதிக்கிறதா?

6. அப்படியாயின், தங்களுடைய ஆளுமைக்கு உட்பட்ட பிரதேச ஒருங்கிணைப்புக் குழுக் கூட்டங்களிலும் மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டங்களிலும் எடுக்கப்படுகின்ற தீர்மானங்களில் ஏதாவது ஒன்றாவது இதுவரை நடைமுறைப்படுத்தப்பட்டு இருக்கின்றதா? உதாரணங்கள் இருந்தால் கூறவும்.

7. எந்தவொரு பிரயோசனமும் இல்லாத இந்தக் கூட்டங்களில் கதைக்கப்படுகின்ற விடயங்களைப் பொது மக்களுக்குத் தெரிவிக்கக் கூடாதென்ற அடிப்படையில், பாராளுமன்ற உறுப்பினரும் அமைச்சருமான கௌரவ ராமலிங்கம் சந்திரசேகர் அவர்கள் கருத்து வெளியிட்டிருக்கின்றாரா?

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා]

8. இந்தக் கூட்டங்களில் பங்குபற்றுகின்ற பாராளுமன்ற உறுப்பினர் ஒருவரின் தனிப்பட்ட ஊடக செய்தியாளரையும் அதேநேரம் சுதந்திர செய்தியாளர்களையும் தடைசெய்துள்ளார்களா?

9. ஊடகங்களைத் தடைசெய்கின்ற அரசாங்கம், பொது மக்களின் அபிவிருத்தியை முன்னெடுக்குமென தாங்கள் நம்புகின்றீர்களா?

10. எதிர்க்கட்சிப் பாராளுமன்ற உறுப்பினர்களின் தனிப்பட்ட ஊடக செய்தியாளரை அனுமதிக்க முடியாதென்ற வரையறையை ஏற்படுத்தும் அதிகாரம் எந்தச் சட்டவரம்பின் ஊடாக இந்த ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்துக்குக் கிடைக்கின்றது? சட்டத்தையும் அதன் வரையறையையும் குறிப்பிடவும்.

11. அவ்வாறு சட்டவரையறைகள் இல்லாத சந்தர்ப்பத்தில், இவ்வாறு பொது மக்களின் நலனுக்காகச் செயற்படுத்தப்படும் கூட்டங்களின் முழுக் காணொளியையும் வெளியிடத் தங்களுடைய கௌரவ அமைச்சருக்குத் தங்களால் தெளிவான அறிவுறுத்தலை வழங்க முடியுமா?

ஊடக சுதந்திரம் என்பது ஒருவரின் தனிப்பட்ட முடிவுடன் மட்டுப்படுத்தப்படுவதில்லை; அது ஒரு நாட்டின் ஜனநாயகத்தின் அடிப்படை என்பதை இங்கு தங்களுக்குத் தெரிவிக்க விரும்புகின்றேன்.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, ගරු රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු මෙසේයි.

1. පවතී.
2. ගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි පත්කර ඇත.
3. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු පළාතකට නොව එක් එක් දිස්ත්‍රික්කයට ක්‍රියාත්මක වේ. අසාධාරණයක් සිදු වී ඇති බවට වාර්තා වී නොමැත.
4. ඔප්පු කළ හැකි සාක්ෂි සහිත පැමිණිලි ඉදිරිපත්ව නොමැති බව දිස්ත්‍රික් ලේකම් දන්වන ලදී.
5. වාර්තා වී නොමැත.
6. මෙම වසරේ සංවර්ධන යෝජනා සඳහා අනුමැතිය ලබා ගෙන ඇත. වැඩිදුර තොරතුරු දිස්ත්‍රික් ලේකම්වරුන් විමසා ඉදිරියේදී ඉදිරිපත් කළ හැක.
7. වාර්තා වී නොමැත.
8. වාර්තා වී නොමැත.
9. රජය මඟින් මාධ්‍ය තහනම් කර නොමැත.
10. අකටයුතුකම් වාර්තා වී නොමැත.
11. චක්‍රලේඛය ප්‍රකාරව මාධ්‍ය ආවරණයට ඉඩ පහසුකම් ලබා දී ඇත.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමාට පැහැදිලි කර ගැනීමකට අවස්ථාව තිබෙනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

நன்றி! கௌரவ சபாநாயகர் அவர்களே, பாராளுமன்ற நிலையியற் கட்டளை 27(2)இன் கீழான கேள்விக்கு 15 நிமிடங்கள் ஒதுக்கப்பட்டிருப்பதாக நான் நினைக்கிறேன். என்றாலும், 8 நிமிடங்களில் என்னுடைய கேள்வி நிறைவடைந்திருக்கின்றது. ஆகவே, மிகுதி 7 நிமிடங்களில் ஒருசில விடயங்களை நான் தெளிவாகச் சொல்ல வேண்டும். நாட்டில் இருக்கின்ற மிக முக்கியமான பிரச்சினையாக ஊடக சுதந்திரம் காணப்படுகின்றது.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා පෙරවරු 10.23 සිට පෙරවරු 10.27 දක්වා කාලය තුළ විනාඩි හතරක් ඇතුළත ප්‍රශ්නය ඉදිරිපත් කළා. ඔබතුමාට ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට දෙන්නේ විනාඩි පහයි. එයින් විනාඩියක කාලයක් ඉතුරු වෙලා තිබෙනවා. ඒ අනුව ඔබතුමාට විනාඩි තුනක් ඇතුළත කරුණු පැහැදිලි කර ගන්න පුළුවන්.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Thank you, Sir.

கௌரவ சபாநாயகர் அவர்களே! ஊடக சுதந்திரம் என்பது மிகவும் முக்கியமானது. அந்தந்தப் பிரதேச மக்களுடைய அபிவிருத்தியை அரசாங்கம் எவ்வாறு செய்கின்றது என்பதை வெளிப்படுத்துவதற்காக நடைபெறுவதுதான் DCC கூட்டங்கள். அந்தக் கூட்டங்களுக்கு அந்தந்த மாவட்டங்களில் அல்லது பிரதேசங்களில் இருக்கின்ற அரச உத்தியோகத்தர்களும் அழைக்கப்படுகின்றனர். அந்தக் கூட்டங்களில் கதைக்கப்படுகின்ற விடயங்கள் பொது மக்களுக்கு கட்டாயம் போய்ச் சேர வேண்டும். அதைத் தடுக்க வேண்டிய தேவை கௌரவ அமைச்சர் ராமலிங்கம் சந்திரசேகர் அவர்களுக்கு இல்லை. ஆனால், கிளிநொச்சியிலே நடைபெற்ற ஊழல் தொடர்பாக நான் கதைக்கின்றபோது, கௌரவ அமைச்சர் அவர்கள் என்னுடைய mikeஐ off பண்ணி வைத்திருந்தார். பாராளுமன்ற உறுப்பினர் ஒருவர் கதைக்கின்றபோது mikeஐ off பண்ணி வைத்திருக்கின்ற அளவுக்கு இந்த அரசாங்கத்திற்கு என்ன தேவையிருக்கின்றது என்று எனக்கு விளங்கவில்லை. நீங்கள்கள்கூட பாராளுமன்றத்தில் என்னை பேச விடாது என்னுடைய mikeஐ 8 நாட்கள் பிழையாக நிறுத்தி வைத்திருந்ததாக Committee on Ethics and Privilegesஇல் நடைபெற்ற inquiryமூலம் தெளிவாகச் சொல்லப்பட்டிருக்கிறது. நான் என்னுடைய வாழ்க்கையில் பெயர் சொல்லிக் குறிப்பிடாத பெண் சட்டத்தரணி ஒருவருடைய பெயரைச் சொல்லிக் கருத்துத் தெரிவித்ததாக கௌரவ பிமல் ரத்நாயக்க அவர்கள் என்மீது முறைப்பாட்டைச் செய்ததால், 8 நாட்கள் என்னுடைய ஊடக சுதந்திரத்தைத் தடை செய்திருந்தீர்கள்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අදාළ ප්‍රශ්නය ගැන පැහැදිලි කරන්න. ප්‍රශ්නයට අදාළව කථා කරන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

பැහැදිලි කරනවා. அதேமாதிரி, யாழ்ப்பாணம் மற்றும் கிளிநொச்சி மாவட்டங்களில் நடைபெறுகின்ற DCC கூட்டங்களில் கதைக்கப்படுகின்ற விடயங்களை வெளியே

சொல்வதற்குக்கூட தங்களுடைய அமைச்சர் கௌரவ ராமலிங்கம் சந்திரசேகர் அவர்கள் பயப்படுகின்றார். அதற்குரிய முக்கியமான காரணம் என்ன? அவரால் பாராளுமன்ற உறுப்பினர் ஒருவருடைய ஊடகச் சுதந்திரத்தைத் தடை செய்ய முடியுமா? என்பதை கௌரவ அமைச்சர் அவர்களிடம் நான் கேட்க விரும்புகின்றேன்.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, මමත් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවක සභාපතිවරයෙක්. සාමාන්‍යයෙන් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවක් සමහර වෙලාවට පැය 5ක්, 6ක් පැවැත්වෙනවා. පාර්ලිමේන්තුව වාගේ නොවෙයි, එතැනදි දිස්ත්‍රික්කයේ ඇත්ත ප්‍රශ්න පිළිබඳව පක්ෂ, විපක්ෂ මන්ත්‍රීවරු කරුණු ඉදිරිපත් කළාම නිලධාරින් මාර්ගයෙන් ඒ ප්‍රශ්න විසඳීම සඳහා අපි කටයුතු කරනවා. ඒවාට සම්බන්ධ වීමට මාධ්‍යවලට කිසිදු තහනමක් දාලා නැහැ. හැබැයි ප්‍රායෝගික තත්ත්වය අනුව මාධ්‍යවේදීන් පැය 5ක්, 6ක් එතැන රැඳී ඉන්නේ නැහැ. ඔවුන් අවශ්‍ය කරුණක් අරගෙන ගිහිල්ලා ඊට පස්සේ ඒක ඉවර වුණාම එළියේදී voice-cut එකක් ගන්නවා. බොහෝ වෙලාවට අපේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ සභාපතිවරු ඒ සමස්ත කාලය තුළ අපි ගනු ලැබූ තීන්දු පිළිබඳව දැනුම් දෙනවා. විපක්ෂයේ මන්ත්‍රීවරුත් එහෙම කරනවා මම දැකලා තිබෙනවා. මොකද, පසුගිය අවුරුදු එකහමාරටම සාමාන්‍යයෙන් අපේ දිස්ත්‍රික්කයේත් මුළු පැය 5, 6ම රැඳිලා ඉන්න විපක්ෂ මන්ත්‍රීවරයෙක් කවදාවත් හිටියේ නැහැ. ඒගොල්ලෝ යම් කාරණයක් කියලා එළියට ගිහිල්ලා voice-cut එකක් දීලා යනවා. එහෙම තමයි සිදු වුණේ. ඒවාට කවුරුත් තහනමක් දාලා නැහැ.

ඒ නිසා මම ඉල්ලීමක් කරන්න කැමැතියි. මේක යාපනය දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ප්‍රශ්නයක්. අපි මේකට පාර්ලිමේන්තුවේ වැඩි කාලයක් ගන්න අවශ්‍ය නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මාධ්‍යයට කියන්න මොනවා හරි දේවල් තිබෙනවා නම් ඒවා කියන්න අවස්ථාව දීලා තිබෙනවා. ඒවා social mediaවලට දෙන්න පුළුවන්කමක් තිබෙනවා. නමුත් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවලදී සහ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවලදී ජනතාවගේ ඇත්ත ප්‍රායෝගික ප්‍රශ්නවලට උත්තර ලබාදීමට වැඩි කාලයක් යොදවලා, ඇත්තටම සමහර දේවල් ඒ මාධ්‍යවලට සම්පූර්ණයෙන් නිරාවරණය කළාම නිලධාරින් අපහසුතාවට පත් වෙනවා කියලා මම හිතනවා. සමහර කෙනෙක් ප්‍රශ්න අහන විධියට අදාළ නිලධාරියා ඒ මොහොතේ ඒ ගොඩනැඟිල්ල ඇතුළෙදි දෙන පිළිතුර සහ පැහැදිලි කිරීම ඒ නිලධාරියා එළියේ කටයුතු කිරීමේදී ඔහුට බලපානවා. සමහර කෙනෙකුට වැඩ මඟහැරිලා තිබෙන්න පුළුවන්. සමහර විට අකාර්යක්ෂමතාත් වාර්තා වෙලා තිබෙන්න පුළුවන්. නමුත් ගරු මන්ත්‍රීතුමනි, ඔහුගේ මුළු ජීවිත කාලයේම, මුළු රාජකාරි කාලයේම ඔහු වැඩ පාඩු කරලා අකාර්යක්ෂමව වැඩ කටයුතු කළා කියලා ඒකෙන් අදහස් වෙන්නේ නැහැ. සමහර දේවල්වලදි එහෙම වෙලා තිබෙන්න පුළුවන්. ඒ නිසා ඒ සිදුවීම් පිළිබඳව මාධ්‍යවලින් වාර්තා කිරීමේදී අපි ඒ ගැන යම් අදහසක ඉන්න ඕනෑකම තිබෙනවා. ඒකේ ප්‍රශ්නයක් නැහැ. ඕනෑ කෙනෙකුට ඒවා වාර්තා කරන්න පුළුවන්. එහෙම ගැටලුවක් තිබෙනවා නම් අපි කමිටුවේ සභාපතිතුමාත් එක්ක කථා කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු සජිත් ප්‍රේමදාස මහතා.

## II

## ලක්විජය බලාගාරයේ ප්‍රමිතියෙන් තොර ගල් අඟුරු භාවිතය හේතුවෙන් පැන නැඟී ඇති ගැටලු
## லக்விஜய மின் உற்பத்தி நிலையத்தில் தரமற்ற நிலக்கரியைப் பயன்படுத்தியதால் எழுந்துள்ள சிக்கல்கள்
## ISSUES ARISEN DUE TO USE OF SUBSTANDARD COAL AT LAKVIJAYA POWER PLANT

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මෙරට විදුලි සැපයුම අඛණ්ඩව හා ස්ථාවරව සැපයීම සම්බන්ධයෙන් අභියෝගාත්මක තත්ත්වයක් උද්ගත වී ඇති පසුබිමක් තුළ ඊට මූලික හේතුවක් ලෙස සලකනු ලබන්නේ ලක්විජය බලාගාරයට සපයන ලද ගල් අඟුරුවල ගුණාත්මකභාවය පිළිබඳව ඇති වී තිබෙන මතභේදාත්මක තත්ත්වයයි.

ඇත්තවශයෙන්ම මතභේදාත්මක තත්ත්වයක් කියන්නේ, යොදවලා තිබෙන්නේ බාල ගල් අඟුරු. ඒක ඉතාම පැහැදිලියි. එම නිසා ඒ සම්බන්ධයෙන් අපි ප්‍රශ්න ගණනාවක් මේ අවස්ථාව් ඉදිරිපත් කරන්නට අදහස් කරනවා.

1. Trident Chemphar Limited මඟින් ලැබුණු එක් එක් නැව් භාවිතයෙන් ලක්විජය බලාගාරයට ලබාගත හැකි වූ උපරිම විදුලි නිෂ්පාදන ධාරිතාව - මෙගාවොට් ප්‍රමාණය - කොපමණද? මීට ඉහත සැපයුම්කරු වෙතින් ලබාගත් ගල් අඟුරු නැව්වලින් ලක්විජය බලාගාරයට ලබා ගත හැකි වූ උපරිම විදුලි නිෂ්පාදන ධාරිතාව - මෙගාවොට් - නැව් වශයෙන් කොපමණද?

   මේ ප්‍රශ්නය අහන අතරතුර මම මතක් කරන්න කැමැතියි, මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ වාර්තාවේ දත්තත් අපි ළඟ තියාගෙනයි කථා කරන්නේ කියන එක. එම නිසා, මහජන උපයෝගිතා කොමිසමේ දත්ත සහ ඇමතිවරයාගේ දත්ත එක හා සමාන ද කියන කාරණාව මම අහන්න කැමැතියි.

2. Trident Chemphar Limited විසින් ලබා දුන් ගල් අඟුරුවල නිශ්චිත ගල් අඟුරු දහන අනුපාතය - metric tons per hour - එක් එක් නැව් මට්ටමින් වෙන් වෙන්ව දක්වන්නේද? මීට ඉහත සැපයුම්කරු විසින් සපයන ලද ගල් අඟුරුවලට සාපේක්ෂව එම අගයන් කවරේද?

3. Trident Chemphar Limited මඟින් ලබා දුන් ගල් අඟුරුවල දළ තාප ජනන අගයන් - gross calorific values - කවරේද? මීට ඉහත සපයන ලද සමාගමේ ගල් අඟුරුවල එම අගයන් කොපමණද? ගල් අඟුරු දළ තාප ජනන අගය සම්බන්ධයෙන් වූ ලියාපදිංචි අවස්ථාවේ නිර්ණායක ලිහිල් කිරීමක් සිදු කළේද? ඒ සම්බන්ධයෙන් ලබා ගත් නීතිමය හා තාක්ෂණික උපදෙස් මොනවාද?

4. Trident Chemphar Limited වෙතින් ලබා ගත් ගල් අඟුරුවලින් දිනකට නිකුත් කරනු ලබන fly ash ප්‍රමාණය කොපමණද?

   එයින් විකුණනු ලබන ප්‍රමාණය හා අළු අංගණයට එකතු කරනු ලබන ප්‍රමාණ කවරේද?

   මොකද, මේ බාල ගල් අඟුරු යෙදවීම තුළ fly ash කඳු නිර්මාණය වෙලා තිබෙනවාය කියන චෝදනාව එනවා.

   මීට ඉහත ගල් අඟුරු සපයන ලද සමාගමේ ගල් අඟුරුවල එම ප්‍රමාණයන් කවරේද? ඒ කියන්නේ, fly ash ප්‍රමාණයන් කවරේද?

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

5. බාල ගල් අඟුරු භාවිතය තුළ ඉදිරි කාලයේදී ලක් විජය බලාගාරය ඇතුළු තවත් බලාගාර කිහිපයක ක්‍රියාකාරිත්වය අත්හිටුවන්නට සිදුවනවා, නඩත්තු කටයුතු සඳහා. එම නිසා වැඩිම විදුලි ප්‍රමාණයක් භාවිත වන කාලය තුළ - ඒ කියන්නේ, peak time demand එක තුළ - අඛණ්ඩව විදුලිය සැපයීමේ තත්ත්වය කුමක්ද?

   ඒ කියන්නේ, රජයට මේ peak time එක තුළ විදුලිය සැපයීමේ හැකියාව තිබෙනවාද?

6. ලක් විජය බලාගාරය සඳහා ගල් අඟුරු ප්‍රසම්පාදනයේදී ලංසු කැඳවීම සඳහා විධිමත් පරිදි නියමිත දිනට ලියාපදිංචි ගාස්තු ගෙවා ලියාපදිංචිය සම්පූර්ණ කිරීමට අපහොසත් වූ සැපයුම්කරුවෙකු සමඟ ගල් අඟුරු සැපයීමට ගිවිසුම්ගත වී ඇති බවට අමාත්‍යවරයා පිළිගන්නේද? මේ සම්බන්ධව අමාත්‍යවරයාගේ පැහැදිලි කිරීම කුමක්ද?

7. ඒ අනුව, ගිවිසුම්ගත වීමෙන් අනතුරුව Trident Chemphar Limited ආයතනය විසින් ලක් විජය බලාගාරයට සපයා ඇති ගල් අඟුරු නැව් ගණන කීයද? සැපයුම් කාලසටහනට අනුව 2026 අප්‍රේල් 07 දින වන විට පැමිණීමට තිබුණු නැව් ප්‍රමාණය හා සැබැවට පැමිණි නැව් ප්‍රමාණය අතර ඇති විෂමතාව කීයද? එම විෂමතාවට හේතු කවරේදැයි පැහැදිලි කරන්නේද?

8. බාල ගල් අඟුරු සැපයීම තුළ සිදු වී ඇති අලාභය නැව් වශයෙන් වෙන් වෙන්ව කොපමණද? විදුලිය ජනනය කිරීමේදී ගල් අඟුරු අධි පරිභෝජනය හේතුවෙන් ඇති විය හැකි යැයි අපේක්ෂිත අලාභය පියවා ගැනීමට රජය කටයුතු කරන්නේද? එය කරන්නේ කුමන ආකාරයටද?

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම මම යම් කරුණක් අහන්නත් කැමැතියි. මේ පෙබරවාරි මස අග සිට දකුණු අප්‍රිකානු ගල් අඟුරු පමණක් යොදවා ලක් විජය බලාගාරයේ විදුලි ජනන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම තුළ බලාපොරොත්තු වූ විදුලිය ප්‍රමාණය ජනනය කිරීමට අපොහොසත් වීම තුළ යුගදනවි බලාගාරයෙන් ඩීසල් සහ furnace oil මිලදී ගැනීම සඳහා මාර්තු 31 දක්වා රුපියල් බිලියන 10ක මුදලක් වැය කරලා තිබෙනවාලු. ඒ පිළිබඳවත් කරුණු පැහැදිලි කරන්න කියලා මම මේ අවස්ථාවේ ගරු අමාත්‍යවරයාගෙන් ඉල්ලීමක් කරනවා.

**ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)

ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා ඉදිරිපත් කළ ප්‍රධාන ප්‍රශ්න 8 ඇතුළේ සම්පූර්ණයෙන් ගත්තාම ප්‍රශ්න 15ක් තිබෙනවා. මේක ස්ථාවර නියෝගවලට පටහැනියි. නමුත්, රටේ ජනතාවගේ දැනුවත්වීම සඳහා මම මේ ප්‍රශ්නවලට උත්තර ලබා දෙන්නම්. මොකද, පොඩි කාලයක් ඇතුළත ප්‍රශ්න 15කට උත්තර දෙන්න තිබෙනවා. ස්ථාවර නියෝග 27(2) යටතේ අසනු ලබන කාලීන වැදගත්කමින් යුතු ප්‍රශ්නයකට පමණයි අපි මෙතැනදී උත්තර දෙන්න ඕනෑ. මොකද, කාලය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙන නිසා.

ගරු කථානායකතුමනි, මම එතුමාගේ ස්ථාවර නියෝග 27(2) යටතේ වූ ප්‍රශ්නවලට පිළිතුරු ලබා දෙනවා.

1. මෙම ප්‍රශ්නයට පිළිතුර විධියට ඇමුණුම 01 වශයෙන් ලොකු ලැයිස්තුවක් තිබෙනවා.
2. මෙම ප්‍රශ්නයට අදාළ පිළිතුරත් ඇමුණුම 01හි තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පිළිතුර ලබා දෙනකල් ඉන්න, ගරු විපක්ෂ නායකතුමනි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොකක්ද, ඔබතුමාගේ point of Order එක?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

අඩුම ගණනේ එතුමා කියන්නට ඕනෑ, මේ ආයතන දෙකෙන් ලැබුණු ගල් අඟුරුවල සාමාන්‍ය ගණන. සභාගත කළාම අපි කොහොමද අතුරු ප්‍රශ්න අහන්නේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා පිළිතුර ලබා දෙන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කරුණාකරලා සාමාන්‍ය ගණන හරි කියන්න.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

සාමාන්‍ය ගණන පිළිබඳව ප්‍රශ්නයක් නඟලා නැහැ. මේ වෙලාවේ ගණන් හදලායි මට එය කියන්න වෙන්නේ. නැව් 13ක සාමාන්‍ය ගණනයි, පරණ නැව් 38ක සාමාන්‍ය ගණනයි එකතු කරලා, බෙදලා කියන්න වෙනවා. මම හිතනවා, ඒකට මට මේ වෙලාවේ අවස්ථාව නැහැ කියලා. වෙනම ප්‍රශ්නයක් විධියට ඇහුවොත් මට එය කියන්න පුළුවන්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අඩුම ගණනේ ඇමුණුම මට එවන්න කියන්නකෝ.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

මම පිළිතුර දීලා ඉවර වෙලා අනිවාර්යයෙන් ඔබතුමාට එය ලබා දෙන්නම්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, මොකක්ද point of Order එක?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, පළමුවැනි ප්‍රශ්නයටයි, දෙවැනි ප්‍රශ්නයටයි පිළිතුර වශයෙන් ඇමුණුමක් තිබෙනවාය කිව්වා. ඒ ඇමුණුම මට එවන්නකෝ. එතකොට මට අතුරු ප්‍රශ්නය අහන්න පුළුවන් නේ. ඇමුණුම, ඇමුණුම කිව්වාම මම කොහොමද අතුරු ප්‍රශ්නය අහන්නේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, ඇමුණුම විපක්ෂ නායකතුමාට ලබා දෙන්න කටයුතු කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මේක රටට වැදගත් කාරණයක්. කරුණාකරලා ඇමුණුම එවන්න කියන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා, පිළිතුර ඉදිරිපත් කරන්න.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

3. ඇමුණුම 02 මඟින් ඉදිරිපත් කරනවා.

   තුන්වන ප්‍රශ්නයේ දෙවන කොටසට පිළිතුරත් ඇමුණුම 03හි තිබෙනවා. ඊට අමතරව 2022 සැප්තැම්බර් 30 දිනැති විගණකාධිපති වාර්තාවේ නිර්දේශ අනුව 2023-2024 වර්ෂය සඳහා ප්‍රසම්පාදනයට අදාළව කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුව විසින් අදාළ සංශෝධන සිදු කර ඇත.

4. මෙම ප්‍රශ්නයට පිළිතුරත් ඇමුණුම 03 යටතේ තිබෙනවා.

   ගරු කථානායකතුමනි, ඇමුණුම් 01, 02 සහ 03 **සභාගත*** කරනවා.

5. බලාගාරයේ ඇත්තේ මෙගාවොට් 300ක් බැගින් වන ඒකක 3ක් පමණි. ඒකක 4ක් නැත. ඔබතුමා ඒකක 4ක් ගැන ප්‍රශ්නයක් අහලා තිබෙනවා. මට ඒකක 4ක් පිළිබඳව උත්තර දෙන්න බැහැ. ඒකක 4ක් හදන්න plan කරලා තිබුණත්, 2011 ඉඳලා තවමත් පවතින්නේ ඒකක 3යි.

   ගල් අඟුරුවල ප්‍රමිතිය සම්බන්ධ ගැටලු නිසා බලාගාරයේ ඒකක එකක්වත් ක්‍රියා විරහිත කර නොමැත. විශේෂයෙන්ම ජනවාරි මාසයේ සිට මේ දක්වා අපි බලාගාරයේ ටර්බයින් තුනම නොකඩවා ක්‍රියාත්මක කරමින් පවතිනවා. මම හිතන්නේ, ඒක මෑත කාලයේ බොහොම කලාතුරකින් වෙච්ච දෙයක්. ඒ තත්ත්වය අපි දිගටම ක්‍රියාත්මක කරමින් පවතිනවා. මේ වන විටත් නොකඩවා ක්‍රියාත්මක වනවා. මෙවැනි ප්‍රශ්නයක් නිසා, ඒ කියන්නේ දැනට සපයන ගල් අඟුරුවල ප්‍රමිතිය හින්දා එක් ඒකකයක්වත් ක්‍රියා විරහිත වෙන්න ඉඩ දීලා නැහැ.

   ලක් විජය බලාගාරයෙන් ලබා ගත හැකි විදුලි ධාරිතාවත් එක්ක අවශ්‍ය කරන විදුලි ධාරිතාව ජල විදුලි බලාගාර හා තාප විදුලි බලාගාරවලින් නිෂ්පාදනය කර වැඩිම විදුලිය ප්‍රමාණයක් භාවිත කරන කාල සීමාවේදී සැපයීම සිදු කරනු ලබයි.

   ඇත්තටම රටේ තිබෙන ජල මූලාශ්‍රවල විභවතාව, සූර්ය බලයේ තිබෙන විභවතාව, වැහි වලාකුළුවල තිබෙන විභවතාව වාගේ බොහෝ සාධක මත තමයි ඇත්තටම අපි එම බලාගාරය ක්‍රියාත්මක කිරීමට අදාළ තීරණ ගන්නේ.

6. ගල් අඟුරු සමාගම විසින් ප්‍රසම්පාදන අස්ථිත්වය ලෙස සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම ලංසු ඇගැයීම් කමිටු නිර්දේශ සහ ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටු අනුමැතීන් මත සිදු කරනු ලබයි. සැපයුම්කරු විසින් 2025.08.18 දින ගල් අඟුරු සමාගමේ ගිණුමට මුදල් තැන්පත් කිරීම සිදු කර ඇත. එදින පැවති විනිමය අනුපාත අනුව ඇමෙරිකානු ඩොලර් 5,000ක මුදල වෙනුවට ඇමෙරිකානු ඩොලර් 4,980ක මුදලක් පමණක් මාරු වී ඇත.

   ඇමෙරිකානු ඩොලර් 5,000ක මුදලක් තැන්පත් කළාට, ලංකාවට එනකොට ඇමෙරිකානු ඩොලර් 4,980ක් විධියට තමයි අපේ බැංකුව හරහා ලැබී තිබෙන්නේ. ඒ අනුව හිඟ ඇමෙරිකානු ඩොලර් 20 සැපයුම්කරු විසින් කඩිනමින් ගෙවා ඇති අතර, 2025.08.22 දින ලදුපත නිකුත් කර ඇත. ඉන් පසු ලංසු ලියවිලි නිකුත් කර ඇත. ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය පරිදි අයදුම්පත් ඉදිරිපත් කරන විට අදාළ සමාගම ලියාපදිංචි සැපයුම්කරුවකු වී සිටිය යුතුය. ලියාපදිංචි සැපයුම්කරුවකු විධියට පැහැදිලිවම 2025.08.14වැනි දින Lanka Coal Company (Pvt.) Limited විසින් ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත අදාළ සැපයුම්කරු වෙත දැනුම් දීලා තිබෙනවා. ඒ අනුව සැපයුම්කරු ලංසු ලේඛන ඉදිරිපත් කරන විට ලියාපදිංචිය සිදුව ඇත.

   ඇත්තටම ඩොලර් 5,000 තැන්පතුව තියන්න ඕනෑ, ලංසු ලේඛන ඉදිරිපත් කිරීමට ප්‍රථම. එතකොට ලංසු ලේඛන ඉදිරිපත් කරන්න වෙලා තිබෙන්නේ සැප්තැම්බර් මාසයේ. එතකොට අනිවාර්යයෙන් ඒක ඉදිරිපත් කරලා තිබිලා තිබෙනවා.

7. 2026.04.07 දින වනවිට නැව් වාර 12ක් සැපයුම් කර ඇත. නැව් වාර කාල සටහන අනුව 2026.04.07 දින වනවිට නැව් වාර 7ක් ලැබිය යුතුව තිබුණි. නැව් වාර 7ක ප්‍රමාදය සම්බන්ධයෙන් ගල් අඟුරු සමාගම විසින් එම සැපයුම්කරු වෙත අය කරනු ලබන දඩ මුදල් අය කර ගැනීම සම්බන්ධව දැනට දැනුවත් කර ඇත.

   තවද, පසුගිය සතියේ සිදු කළ හදිසි ප්‍රසම්පාදනය මඟින් තවත් ගල් අඟුරු නැව් වාර 5ක් ලබා ගැනීමට 2026.04.20වන දින සිට කටයුතු කරමින් පවතී.

8. ප්‍රතික්ෂේපිත අගයන් තුළ ඇති නැව් වාර ගණන 3කි. මේ වනවිට එම සැපයුම්කරුගෙන් ඒ සඳහා අදාළ දඩ මුදල් අය කර ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. නියමිත පරාසයන් තුළ අදාළ දඩ මුදල් සහ නියමිත පරාසයන්ගෙන් පිටත ඇති වූ අවස්ථාවලදී දෙගුණ දඩ මුදල් අය කර ගැනීම සඳහාද කටයුතු සිදු කරමින් ඇත. මේ වනවිට නැව් වාර 12ක් සම්බන්ධයෙන් ඇමෙරිකානු ඩොලර් 12,678,335.71ක දඩ මුදලක් අය කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත. මේ සම්බන්ධයෙන් තවදුරටත් ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කරමින් පවතී.

---
*** පිළිතුර අවසානයේ පළ කර ඇත.**
* விடையினிறுதியில் தரப்பட்டுள்ளது.
* *Produced at end of Answer.*

[ගරු කුමාර ජයකොඩි මහතා]

***සභාමේසය මත තබන ලද ඇමුණුම්:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்புகள்:*
** Annexes tabled:*

**Annexure - 1**

**Answer for Question 01 & 02**

| Shipment No. | Maximum Operated Capacity (MW) | | | Grams of Coal used per KWh (average value) | | | Coal required per hour to generate 300 MW (t/h) - Note 1 | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | U1 | U2 | U3 | U1 | U2 | U3 | U1 | U2 | U3 |
| Russian coal | 300 | 300 | 300 | 377 | 359 | 357 | 113.11 | 107.58 | 107.07 |
| SA Ship. 01 (12) | Note 2 | Note 2 | 296 | Note 2 | Note 2 | 404 | Note 2 | Note 2 | 121.12 |
| SA Ship. 02 (13) | Note 2 | Note 2 | 300 | Note 2 | Note 2 | 391 | Note 2 | Note 2 | 117.19 |
| SA Ship. 03 (14) | 257 | 267 | 267 | 461 | 436 | 435 | 138.26 | 130.75 | 130.35 |
| SA Ship. 04 (15) | 281 | 300 | 300 | 429 | 391 | 387 | 128.60 | 117.27 | 116.01 |
| SA Ship. 05 (16) | 285 | Note 3 | 294 | 418 | Note 3 | 403 | 125.30 | Note 3 | 120.85 |
| SA Ship. 06 (17) | 265 | Note 3 | 281 | 447 | Note 3 | 417 | 133.96 | Note 3 | 125.10 |
| SA Ship. 07 (18) | 277 | Note 3 | 280 | 433 | Note 3 | 413 | 129.96 | Note 3 | 123.91 |
| SA Ship. 08 (19) | 260 | Note 3 | 267 | 461 | Note 3 | 441 | 138.22 | Note 3 | 132.32 |
| SA Ship. 09 (20) | 260.82 | Note 3 | 271 | 464 | Note 3 | 441 | 139.16 | Note 3 | 132.17 |
| SA Ship. 10 (21) | 270 | Note 3 | 285 | 448 | Note 3 | 428 | 134.38 | Note 3 | 128.43 |
| SA Ship. 11 (22) | 257 | 257 | Note 4 | 466 | 445 | Note 4 | 139.74 | 133.41 | Note 4 |
| SA Ship. 12 (23) | 246 | 262 | 270 | 484 | 436 | 436 | 145.32 | 130.86 | 130.78 |
| SA Ship. 13 (24) | 252 | 242 | 257 | 471 | 430 | 446 | 141.36 | 129.15 | 133.94 |

Note 1: The possible maximum coal feed rate for a unit is 120 t/h. It is not possible to feed more than 120 t/h
Note 2: Unit Shut down
Note 3:The coal from the specific shipment was not fed to the unit due to a fault
Note 4:Unit was not loaded fully due to one CW pump at stop condition and mill loading constrain due to mill clogging

**Annexure - 2**

**Answer for Question 03**

| Shipment No (laycan) | Name of the Vessel | Load Port Sampling Laboratory | UnLoad Port Sampling Laboratory | Comodity | Qty | Load Port Gross Calorific Value As received | Unload Port Gross Calorific Value As received | LVPP Lab Gross Calorific Value |
|---|---|---|---|---|---|---|---|---|
| 2024/25 | | | | | | | | |
| 407 | MV Karadeniz S | Incolab Services Russia S.C | Cotecna Inspection India (Pvt)Ltd | Nakhodka, Russia | 55,350.00 | 6,257.00 | 6,210.00 | 6,318 |
| 408 | MV African Pride | Incolab Services Russia S.C | Cotecna Inspection India (Pvt)Ltd | Nakhodka, Russia | 65,037.60 | 6,254.00 | 6,224.00 | 6,272 |
| 409 | MV Marmara S | Incolab Services Russia S.C | Cotecna Inspection India (Pvt)Ltd | Nakhodka, Russia | 55,410.00 | 6,305.00 | 6,267.00 | 6,061 |
| 410 | MV Hua Rong 26 | Incolab Services Russia S.C | Cotecna Inspection India (Pvt)Ltd | Nakhodka, Russia | 64,750.00 | 6,377.00 | 6,331.00 | 5,949 |
| 411 | MV Porto Kioni | Incolab Services Russia S.C | Cotecna Inspection India (Pvt)Ltd | Nakhodka, Russia | 54,730.00 | 6,312.00 | 6,272.00 | 5,864 |
| 412 | MV Porthos | Incolab Services Russia S.C | Cotecna Inspection India (Pvt)Ltd | Nakhodka, Russia | 54,790.00 | 6,320.00 | 6,281.00 | 4,214 |
| 413 | MV Bulk Orianna | Incolab Services Russia S.C | Cotecna Inspection India (Pvt)Ltd | Nakhodka, Russia | 54,800.00 | 6,318.00 | 6,265.00 | 6,305 |
| 414 | MV Meghna Star | Incolab Services Russia S.C | Cotecna Inspection India (Pvt)Ltd | Nakhodka, Russia | 56,078.00 | 6,373.00 | 6,320.00 | 6,134 |
| 415 | MV NS Dalian | Incolab Services Russia S.C | Cotecna Inspection India (Pvt)Ltd | Nakhodka, Russia | 54,700.00 | 6,358.00 | 6,320.00 | 6,116 |
| 416 | MV Karadeniz S | Incolab Services Russia S.C | Cotecna Inspection India (Pvt)Ltd | Nakhodka, Russia | 55,650.00 | 6,341.00 | 6,280.00 | 6,199 |
| 417 | MV AC Oren | Incolab Services Russia S.C | Cotecna Inspection India (Pvt)Ltd | Nakhodka, Russia | 55,170.00 | 6,261.00 | 6,196.00 | 5,939 |
| 418 | MV Unicorn | Incolab Services Russia S.C | Cotecna Inspection India (Pvt)Ltd | Nakhodka, Russia | 54,480.00 | 7,865.00 | 6,295.00 | 6,053 |
| 419 | MV Yangtze Dawn | Incolab Services Russia S.C | Cotecna Inspection India (Pvt)Ltd | Nakhodka, Russia | 55,170.00 | 7,846.00 | 6,352.00 | 6,345 |
| 420 | MV Bao Express | Incolab Services Russia S.C | Cotecna Inspection India (Pvt)Ltd | Nakhodka, Russia | 55,100.00 | 7,873.00 | 6,321.00 | 6,095 |
| 421 | MV Red Fin | Incolab Services Russia S.C | Cotecna Inspection India (Pvt)Ltd | Nakhodka, Russia | 55,375.00 | 7,882.00 | 6,335.00 | 6,000 |
| 422 | MV AN Yang 2 | Incolab Services Russia S.C | Cotecna Inspection India (Pvt)Ltd | Nakhodka, Russia | 54,400.00 | 7,987.00 | 6,425.00 | 6,235 |
| 423 | MV Glory Tom | Incolab Services Russia S.C | Cotecna Inspection India (Pvt)Ltd | Nakhodka, Russia | 61,900.00 | 7,953.00 | 6,340.00 | 6,061 |
| 424 | MV FYM Crystal | Incolab Services Russia S.C | Cotecna Inspection India (Pvt)Ltd | Nakhodka, Russia | 55,100.00 | 8,135.00 | 6,362.00 | 6,205 |
| 425 | MV Karadeniz S | Incolab Services Russia S.C | Cotecna Inspection India (Pvt)Ltd | Nakhodka, Russia | 55,250.00 | 8,200.00 | 6,472.00 | 5,982 |
| 426 | MV Chang Chang Nan Hai | Incolab Services Russia S.C | Cotecna Inspection India (Pvt)Ltd | Nakhodka, Russia | 55,163.00 | 8,170.00 | 6,425.00 | 6,013 |
| 427 | MV Bulk Orianna | Incolab Services Russia S.C | Cotecna Inspection India (Pvt)Ltd | Nakhodka, Russia | 54,110.00 | 8,196.00 | 6,372.00 | 6,127 |
| 428 | MV ALMYROS | Incolab Services Russia S.C | Cotecna Inspection India (Pvt)Ltd | Nakhodka, Russia | 54,800.00 | 6,458.00 | 6,410.00 | 6,060 |
| 429 | MV Marmara s | Incolab Services Russia S.C | Cotecna Inspection India (Pvt)Ltd | Nakhodka, Russia | 55,580.00 | 6,467.00 | 6,412.00 | 6,087 |
| 430 | MV Chang Chang Dong Hai | Incolab Services Russia S.C | Cotecna Inspection India (Pvt)Ltd | Nakhodka, Russia | 54,600.00 | 6,388.00 | 6,290.00 | 6,018 |
| 431 | MV Yangatxe Impression | Incolab Services Russia S.C | Cotecna Inspection India (Pvt)Ltd | Nakhodka, Russia | 61,700.00 | 6,406.00 | 6,345.00 | 6,158 |
| 432 | MV Pilatus Marine | Incolab Services Russia S.C | Cotecna Inspection India (Pvt)Ltd | Nakhodka, Russia | 55,200.00 | 6,359.00 | 6,310.00 | 6,127 |
| 433 | MV Dato Lucy | Incolab Services Russia S.C | Cotecna Inspection India (Pvt)Ltd | Nakhodka, Russia | 55,450.00 | 6,429.00 | 6,375.00 | 6,157 |
| 434 | MV Yangtze Dawn | Incolab Services Russia S.C | Cotecna Inspection India (Pvt)Ltd | Nakhodka, Russia | 55,150.00 | 6,478.00 | 6,421.00 | 6,185 |
| 435 | MV Glory Tom | Incolab Services Russia S.C | Cotecna Inspection India (Pvt)Ltd | Nakhodka, Russia | 61,700.00 | 6,493.00 | 6,435.00 | 6,344 |
| 436 | MV Emmanuel | Incolab Services Russia S.C | Cotecna Inspection India (Pvt)Ltd | Nakhodka, Russia | 61,904.00 | 6,385.00 | 6,325.00 | 6,191 |
| 437 | MV FYM Crystal | Incolab Services Russia S.C | Cotecna Inspection India (Pvt)Ltd | Vanino, Russia | 55,000.00 | 6,424.00 | 6,362.00 | 5,907 |
| 438 | MV Bao Express | Incolab Services Russia S.C | Cotecna Inspection India (Pvt)Ltd | Vanino, Russia | 55,080.00 | 6,436.00 | 6,372.00 | 6,398 |

| Shipment No (laycan) | Name of the Vessel | Load Port Sampling Laboratory | UnLoad Port Sampling Laboratory | Comodity | Qty | Load Port Gross Calorific Value As received | Unload Port Gross Calorific Value As received | LVPP Lab Gross Calorific Value |
|---|---|---|---|---|---|---|---|---|
| 439 | MV Hua Rong 26 | Incolab Services Russia S.C | Cotecna Inspection India (Pvt)Ltd | Vanino, Russia | **65,000.00** | 6,482.00 | 6,425.00 | 6,176 |
| 440 | MV Karadeniz S | Incolab Services Russia S.C | Cotecna Inspection India (Pvt)Ltd | Nakhodka, Russia | **55,700.00** | 6,426.00 | 6,365.00 | 6,094 |
| 441 | MV Marmara S | Incolab Services Russia S.C | Cotecna Inspection India (Pvt)Ltd | Nakhodka, Russia | **55,530.00** | 6,415.00 | 6,382.00 | 5,977 |
| 442 | MV NS Dalian | Incolab Services Russia S.C | Cotecna Inspection India (Pvt)Ltd | Vanino, Russia | **55,220.00** | 6,469.00 | 6,410.00 | 6,110 |
| 443 | MV Baoshan Glory | Incolab Services Russia S.C | Cotecna Inspection India (Pvt)Ltd | Vanino, Russia | **55,200.00** | 6,295.00 | 6,225.00 | 5,835 |
| 444 | MV Chang Chang Dong Hai | Incolab Services Russia S.C | Cotecna Inspection India (Pvt)Ltd | Nakhodka, Russia | **55,150.00** | 6,454.00 | 6,392.00 | 6,190 |
| | | | | | **2,150,477.60** | | | |

**2025/26**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 445 | MV Porto Fiscardo | SGS Vostok Limited | Cotecna Inspection India (Pvt)Ltd | Vanino, Russia | **54,200.00** | 6,230.00 | 6,170.00 | 5,945 |
| 446 | MV Bulk Orianna | SGS Vostok Limited | Cotecna Inspection India (Pvt)Ltd | Vanino, Russia | **54,000.00** | 6,235.00 | 6,189.00 | 5,410 |
| 447 | MV IVY Gold | SGS Vostok Limited | Cotecna Inspection India (Pvt)Ltd | Vanino, Russia | **53,240.00** | 6,432.00 | 6,327.00 | 5,980 |
| 448 | MV Fuhang | SGS Vostok Limited | Cotecna Inspection India (Pvt)Ltd | Vanino, Russia | **55,550.00** | 6,246.00 | 6,195.00 | 5,682 |
| 449 | MV Hua Rong 26 | SGS Vostok Limited | Cotecna Inspection India (Pvt)Ltd | Vanino, Russia | **65,300.00** | 6,319.00 | 6,241.00 | 5,954 |
| 450 | MV Queen Win | SGS Vostok Limited | Cotecna Inspection India (Pvt)Ltd | Vanino, Russia | **54,950.00** | 6,275.00 | 6,221.00 | 5,629 |
| 451 | MV Tiger Hebel | SGS Vostok Limited | Cotecna Inspection India (Pvt)Ltd | Vanino, Russia | **62,182.00** | 6,328.00 | 6,243.00 | 6,057 |
| 452 | MV Rimau Perkasa | SGS Vostok Limited | Cotecna Inspection India (Pvt)Ltd | Vanino, Russia | **55,296.00** | 6,350.00 | 6,282.00 | 5,418 |
| 453 | MV Dato Lucky | SGS Vostok Limited | Cotecna Inspection India (Pvt)Ltd | Vanino, Russia | **55,500.00** | 6,251.00 | 6,172.00 | 5,883 |
| 454 | MV G Putuo | SGS Vostok Limited | Cotecna Inspection India (Pvt)Ltd | Nakhodka, Russia | **55,300.00** | 6,331.00 | 6,285.00 | 5,972 |
| 455 | MV Tiger Pioneer | SGS Vostok Limited | Cotecna Inspection India (Pvt)Ltd | Nakhodka, Russia | **61,800.00** | 6,356.00 | 6,278.00 | 5,991 |
| 456 | MV Ceylon Breeze | Mitra Sk South Africa (Pty) Ltd. | Cotecna Inspection India (Pvt)Ltd | RBCT | **59,831.00** | 6,053.00 | 5,520.00 | 5,348 |
| 457 | NS Guangzhou | Mitra Sk South Africa (Pty) Ltd. | Cotecna Inspection India (Pvt)Ltd | RBCT | **60,639.00** | 6,193.00 | 6,017.00 | 5,420 |
| 458 | Xin Hong Bao Shi | Mitra Sk South Africa (Pty) Ltd. | Cotecna Inspection India (Pvt)Ltd | RBCT | **54,242.00** | 5,904.00 | 5,928.00 | 4,805 |
| 459 | Ceylon Princes | Mitra Sk South Africa (Pty) Ltd. | Cotecna Inspection India (Pvt)Ltd | RBCT | **61,285.00** | 6,174.00 | 6,107.00 | 5,355 |
| 460 | MV Unicorn | Mitra Sk South Africa (Pty) Ltd. | Cotecna Inspection India (Pvt)Ltd | RBCT | **54,074.00** | 6,162.00 | 5,951.00 | 5,265 |
| 461 | MV Leyla Akso | Mitra Sk South Africa (Pty) Ltd. | Cotecna Inspection India (Pvt)Ltd | RBCT | **59,174.00** | 6,160.00 | 5,967.00 | 5,116 |
| 462 | MV Conon | Mitra Sk South Africa (Pty) Ltd. | Cotecna Inspection India (Pvt)Ltd | RBCT | **56,007.00** | 6,175.00 | 5,973.00 | 4,887 |
| 463 | NS Guangzhou | Mitra Sk South Africa (Pty) Ltd. | Cotecna Inspection India (Pvt)Ltd | RBCT | **60,319.00** | 6,158.00 | 5,964.00 | 4,582 |
| 464 | Ceylon Breeze | Mitra Sk South Africa (Pty) Ltd. | Cotecna Inspection India (Pvt)Ltd | RBCT | **60,415.00** | 6,176.00 | 5,543.00 | 4,731 |
| 465 | Mercury Sky | Mitra Sk South Africa (Pty) Ltd. | Cotecna Inspection India (Pvt)Ltd | RBCT | **59,650.00** | 6,184.00 | 5,953.00 | 4,985 |
| 466 | Yasa Mars | Mitra Sk South Africa (Pty) Ltd. | Cotecna Inspection India (Pvt)Ltd | RBCT | **59,189.00** | 6,178.00 | 5,947.00 | 4,476 |
| 467 | Ultra Confident | Mitra Sk South Africa (Pty) Ltd. | Cotecna Inspection India (Pvt)Ltd | RBCT | **60,497.00** | 6,169.00 | 4,899.00 | 4,934 |
| 468 | Yasa Sun | Mitra Sk South Africa (Pty) Ltd. | Cotecna Inspection India (Pvt)Ltd | RBCT | **60,401.00** | 6,080.00 | Not Received Yet | 4,951 |
| 469 | Josco Yangzhou | Mitra Sk South Africa (Pty) Ltd. | Cotecna Inspection India (Pvt)Ltd | RBCT | | 6,105.00 | Not Received Yet | Not Received Yet |
| | | | | | | | | |

**Annexure - 3**

## Answer for Question 04

| Year | Month | Sold Quantity (MT) | Dump (MT) |
|---|---|---|---|
| 2025 | January | 23,183.26 | 0 |
| | February | 19,571.48 | |
| | March | 30,361.88 | |
| | April | 27,949.31 | |
| | May | 25,431.78 | |
| | June | 20,780.32 | |
| | July | 21,175.98 | |
| | August | 21,506.92 | |
| | September | 22,644.44 | |
| | October | 22,768.12 | |
| | November | 18,621.12 | |
| | December | 12,666.54 | |
| | | **266,661.15** | |

[ගරු කුමාර ජයකොඩි මහතා]

| Date | Unit 1 (MT) | Unit 2 (MT) | Unit 3 (MT) | Total Sold (MT) | Dump (MT) | Total (MT) |
|---|---|---|---|---|---|---|
| March/26 | | | | | | |
| 1-Mar-26 | 396.44 | 330 | 401.62 | 1128.06 | 0 | **1,128.06** |
| 2-Mar-26 | 461.12 | 251.48 | 309.94 | 1022.54 | 0 | **1,022.54** |
| 3-Mar-26 | 334.74 | 419.72 | 311.1 | 1065.56 | 0 | **1,065.56** |
| 4-Mar-26 | 397.42 | 298.82 | 295.42 | 991.66 | 0 | **991.66** |
| 5-Mar-26 | 491.96 | 250.54 | 98.72 | 841.22 | 0 | **841.22** |
| 6-Mar-26 | 421.08 | 630.5 | 442.16 | 1493.74 | 0 | **1,493.74** |
| 7-Mar-26 | 121.84 | 630.38 | 597.58 | 1349.8 | 147 | **1,496.80** |
| 8-Mar-26 | 152.04 | 672.16 | 682.24 | 1506.44 | 0 | **1,506.44** |
| 9-Mar-26 | 378.76 | 359.8 | 450.7 | 1189.26 | 0 | **1,189.26** |
| 10-Mar-26 | 516.82 | 279.62 | 305.2 | 1101.64 | 235.2 | **1,336.84** |
| 11-Mar-26 | 874.48 | 94.34 | 332.5 | 1301.32 | 254.8 | **1,556.12** |
| 12-Mar-26 | 640.56 | 168.18 | 505.32 | 1314.06 | 323.4 | **1,637.46** |
| 13-Mar-26 | 475.76 | 475.54 | 357.8 | 1309.1 | 235.2 | **1,544.30** |
| 14-Mar-26 | 515.68 | 441.1 | 377.44 | 1334.22 | 362.6 | **1,696.82** |
| 15-Mar-26 | 533.78 | 452.48 | 317.44 | 1303.7 | 421.4 | **1,725.10** |
| 16-Mar-26 | 286.32 | 345.74 | 267.68 | 899.74 | 490 | **1,389.74** |
| 17-Mar-26 | 469.64 | 570.72 | 179.88 | 1220.24 | 588 | **1,808.24** |
| 18-Mar-26 | 600 | 341.62 | 375.12 | 1316.74 | 519.4 | **1,836.14** |
| 19-Mar-26 | 540.62 | 321.68 | 360.2 | 1222.5 | 411.6 | **1,634.10** |
| 20-Mar-26 | 471.52 | 537.02 | 321.68 | 1330.22 | 460.6 | **1,790.82** |
| 21-Mar-26 | 619.82 | 248.92 | 524.76 | 1393.5 | 450.8 | **1,844.30** |
| 22-Mar-26 | 708.76 | 308.12 | 443.52 | 1460.4 | 480.2 | **1,940.60** |
| 23-Mar-26 | 447.48 | 365.68 | 350.28 | 1163.44 | 588 | **1,751.44** |
| 24-Mar-26 | 548.48 | 340.86 | 364.82 | 1254.16 | 421.4 | **1,675.56** |
| 25-Mar-26 | 583.04 | 431.22 | 297.56 | 1311.82 | 480.2 | **1,792.02** |
| 26-Mar-26 | 505.06 | 353.16 | 211.5 | 1069.72 | 499.8 | **1,569.52** |
| 27-Mar-26 | 493.52 | 518.26 | 288.52 | 1300.3 | 539 | **1,839.30** |
| 28-Mar-26 | 730.7 | 399.68 | 442.4 | 1572.78 | 470.4 | **2,043.18** |
| 29-Mar-26 | 659.06 | 376.92 | 332.9 | 1368.88 | 284.2 | **1,653.08** |
| 30-Mar-26 | 608.34 | 369.1 | 123.82 | 1101.26 | 421.4 | **1,522.66** |
| 31-Mar-26 | 740.22 | 320.82 | 239.16 | 1300.2 | 499.8 | **1,800.00** |
| | | | | **38,538.22** | **9,584.40** | **48,122.62** |

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම එතුමාට කාරණාවක් කියන්න ඕනෑ, විදුලි බලාගාර 4ක් නඩත්තුව සඳහා නතර කිරීම සම්බන්ධව. ඒකක හතරක් හැටියට අපි කිව්වේ; Unit One එකයි, Unit Two එකයි, කෙරවලපිටියයි, කැලණිතිස්සයි. දැන් ඔබතුමා ලබා දුන් පිළිතුරුවලින් ඉතාම පැහැදිලියි, මීට පෙර ගල් අඟුරු සැපයීමත්, මේ අලුත් ගල් අඟුරු සැපයීමත් අතර සම්පූර්ණ ජනන ධාරිතාව, ඒ කියන්නේ මෙගාවොට් 300 x 3 - 300 times three megawatts - මෙගාවොට් 900 ලබා ගන්නට මේ බාල ගල් අඟුරු සපයපු තත්ත්වය තුළ හැකියාව ලැබී නැහැ කියන එක. ඒ වාගේම සාමාන්‍ය ගල් අඟුරු දහන අනුපාතය - average coal consumption rate - ගත්තොත්, ඔබතුමා දුන් වාර්තා අනුව මීට පෙර සැපයුමයි, මේ සැපයුමයි දිහා බැලුවාම ඉතාම පැහැදිලියි, බාල ගල් අඟුරු තමයි භාවිත කරලා තිබෙන්නේ කියන එක. ඒ වාගේම නිශ්චිත ගල් අඟුරු දහනය - specific coal consumption - දිහා බැලුවාමත් මේ Trident Chemphar Limited එකෙන් ගෙනාපු ගල් අඟුරු සහ මීට පෙර සැපයුම්කරුවාගේ ගල් අඟුරු එක්ක සන්සන්දනය කරනකොට බාල ගල් අඟුරු යොදා තිබෙනවාය කියන එක දැන් ඔබතුමා ලබා දුන් පිළිතුරුවලිනුත් පැහැදිලියි; ඒ වාගේම මහජන උපයෝගිතා කොමිසම ලබා දුන් පිළිතුරුවලිනුත් එය පැහැදිලියි; ඒ වාගේම බලාගාරයේ කාර්ය සාධන දත්ත මත පදනම්ව Gross Calorific Value එක ගණනය කරනකොටත් එය ඉතාම පැහැදිලියි. මහජන උපයෝගිතා කොමිසමේ වාර්තාව සහ ඔබතුමා ලබා දුන් පිළිතුර අනුවත් පැහැදිලිවම ප්‍රකාශ වෙනවා, භාවිත කරලා තිබෙන්නේ බාල ගල් අඟුරු බව. ඒ වාගේම අවසාන වශයෙන් ash content එක දිහා බැලුවාමත් මීට පෙර සැපයුම්කරු ලබා දුන් ගල් අඟුරු ඉහළ ප්‍රමිතියේ ගල් අඟුරු සහ ඔබතුමන්ලාගේ ප්‍රසම්පාදන ක්‍රමවේදය තුළ තිබුණේ බාල ගල් අඟුරුය කියන එක ඉතාම පැහැදිලියි.

මට අවසාන වශයෙන් අහන්න තිබෙන්නේ මේකයි, ගරු කථානායකතුමනි. දැන් මේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය දෙස බැලීමේදී අපට පෙනෙනවා, ඇත්තවශයෙන්ම Trident Chemphar Limited කියන්නේ, ලියාපදිංචි අවශ්‍යතාව සම්පූර්ණ නොකළ ආයතනයක්

බව. ඇයි, ඒ වාගේ ආයතනයකට මේ ගල් අඟුරු ටෙන්ඩරය පිරිනැමුවේ? ඒ වාගේම ගල් අඟුරු පරීක්ෂා කළ විද්‍යාගාරවල බලපත්‍රය බැලුවාම, බලපත්‍රය expire වුණු විද්‍යාගාරවල වාර්තා තමයි උපයෝගී කරගෙන තිබෙන්නේ. ඒ වාගේ දෙයක් ඉෂ්ට සිද්ධ කළේ ඇයි?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, දැන් අවසන් කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
පොඩි පැහැදිලි කිරීම් තුනක් තිබෙන්නේ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, පැහැදිලි කර ගැනීම් එකයි කර ගන්න පුළුවන්. දැන් ඔබතුමා විනාඩි තුනක් අරගෙන තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මොකද, මේක ඇත්තවශයෙන්ම බරපතළ ප්‍රශ්නයක් නිසායි මම මේ ගැන අහන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විවාදයකට යන්න බැහැ, ගරු විපක්ෂ නායකතුමනි. දැන් විනාඩි තුනක් ඉවරයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
පැහැදිලි කර ගැනීමක් සඳහායි මම මේ කාරණය අහන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් විනාඩි තුනක් ඉවරයි, ගරු විපක්ෂ නායකතුමනි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
පැහැදිලි කර ගැනීමකට මට අවස්ථාව ලබා දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පැහැදිලි කිරීම අවසන් කරන්න, ගරු විපක්ෂ නායකතුමනි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මේ බාල ගල් අඟුරු භාවිතය නිසා නිශ්චිත විදුලි ප්‍රමාණය ජනනය නොවීම තුළ විදුලි බිල වැඩි කිරීමෙන් මෙය ඇත්තවශයෙන් පාරිභෝගිකයාගෙන් අයකර ගන්නට මේ රජය උත්සාහයක් දරා තිබෙනවා. මම ඊයේ කිව්වා, ඒක සියයට 30ක් කියලා. රජය ඒක දැනගෙන දැන් සියයට 15ක් කරලා තිබෙනවා. නමුත් අවසානයේ විදුලි බිල සියයට 30කින් වැඩි කරනවා. ඒකයි ඇත්ත කථාව. ඒ නිසා මම මේ කාරණය අහන්න කැමතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා දැනට විනාඩි 4ක් අරගෙන තිබෙනවා, ගරු විපක්ෂ නායකතුමනි.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ගරු කථානායකතුමනි, ප්‍රධාන ප්‍රශ්න ඇතුළේ ප්‍රශ්න 15යි. ඊට අමතරව තව ප්‍රශ්න 4ක් එතුමා ඇහුවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාට විනාඩි 3ක් දුන්නාම,- *[බාධා කිරීමක්]* ඔබතුමාට තත්පර කීපයක් දෙන්නම්. *[බාධා කිරීමක්]* ඔබතුමා දැන් විනාඩි 4ක් අරගෙන ඉවරයි.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
මේක ඇත්තටම කාලය කා දැමීමක්. මොකද, ප්‍රශ්න අංක 6 යටතේ දුන් පිළිතුර,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදනයකුත් ඉදිරිපත් කරන්න තිබෙනවා. කාලය නාස්ති වෙනවා, ගරු විපක්ෂ නායකතුමනි. ඉක්මනින් කියන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, දැන් ඇණවුම් කරපු නැව් ප්‍රමාණය එන්නේ නැති නිසා මෙට්‍රික් ටොන් ලක්ෂ 3ක් ගෙන්වන එකත් ක්‍රියාත්මක කරලා තිබෙන්නේ නියමිත ප්‍රමිතියට ගල් අඟුරු සපයන්නේ නැති ආයතනයකින් කියන එක ඉතාම පැහැදිලියි. මට අහන්න තිබෙන්නේ මේ අපරාධය අපේ රටට කළේ ඇයි කියන එකයි. 7,500,000ක් පමණ වන විදුලි පාරිභෝගිකයන්ට සිද්ධ වෙනවා, ඔබගේ දූෂණය නිසා සිදු වන මේ වන්දිය ගෙවන්න. ඇයි එහෙම කළේ කියන එක මම අහන්න කැමතියි.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා කාලය අපතේ යවනවා. ප්‍රශ්න අංක 6 වෙනුවෙන් මම ලබා දුන් උත්තරයේ පැහැදිලිව තිබෙනවා, සැපයුම්කරු ඒකට qualify වුණේ කොහොමද කියන එක පිළිබඳව.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමනි, කෙටියෙන් පිළිතුරු සපයන්න.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

ඒ ගැන මම සිංහලෙන් කිව්වා. ඒක එතුමාට පැහැදිලි නැද්ද මන්දා, ගරු කථානායකතුමනි. ඕනෑ නම් මට මේ ලියපු ලේඛනයත් දෙන්න පුළුවන්. අපරාදේ, ඒ ගැන නැවත නැවතත් අහන්නේ. ඔය වාගේ ප්‍රසම්පාදන කටයුතුවලදී සිදු වන අඩුපාඩුවලට අදාළව කොන්දේසි තිබෙනවා. මේවා නිකම් බාලාංශයේ වැඩ නොවෙයි. International trading කරනකොට ඒවාට කොන්දේසි - internationally accepted conditions - දාලා තිබෙනවා. ඒවාට අනුව තමයි මේ අලාභය අය කර ගන්නේ, ඒගොල්ලන්ව default කරන්නේ. ඒ හැම දෙයක්ම කරන්න ඕනෑ. ඒක ලෝකයේම තිබෙන නීතිමය තත්ත්වයක්. අපි ඒකට අනුව කටයුතු කරනවා. අපි එහේ මෙහේ කථා කළා කියලා රටටවත්, ජනතාවටවත් කිසිම දෙයක් හම්බ වෙන්නේ නැහැ. ඒ වාගේම මම කියන්න ඕනෑ, මේකේ පාඩුව හෝ අලාභය අපි නඩු කියලා හෝ සැපයුම්කරුගෙන් අය කර ගන්නවා මිස ඒක ජනතා මත පටවන්නේත් නැහැ කියන එක. අපේ විදුලි බිලේ සංශෝධනයට කිසිම විධියකින් මේකට අදාළ පිරිවැයක් ඇතුළත් වෙලාත් නැහැ කියන එක මම පැහැදිලිව කියන්න ඕනෑ.

ඊළඟට, හදිසි ප්‍රසම්පාදනය ගැනත් කිව්වා. ඒ ගැන මෙතුමා කොහොමද දන්නේ? තවම ගල් අඟුරු නැවට පටවලා ආවේත් නැහැ. නමුත් මෙතුමා කියනවා, ඒකෙත් බාල ගල් අඟුරු තමයි තිබෙන්නේ කියලා. මම දන්නේ නැහැ, මෙතුමන්ලාම කුමන්ත්‍රණකාරීව මේවාට බඩු පටවනවාද කියලාත් මට පොඩි සැකයක් ඇති වෙනවා. මොකද, නැවට පටවන්නත් ඉස්සරවෙලා මේක බාලයි කියන්න තරම් මේගොල්ලන් දැනුවත් වෙලා තිබෙන්නේ. ඒ ගැන අපි පරීක්ෂණයක් කරන්න ඕනෑය කියලා ආණ්ඩුව විධියට මම ප්‍රකාශ කරනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

අද දවසේ GMOA එක පැය 48ක strike එකක් පටන් අරගෙන තිබෙනවා. අපේ ජනතාව ඔයගොල්ලන්ට ඡන්දය දුන්නේ, මේ වාගේ කාලකණ්ණි GMOA එකකින් බේරාගන්න. දැන් බලන්නකෝ, ගිය සතියේ දිගටම strike කළා. එතකොට දුප්පත් මිනිස්සු ගිහිල්ලා බෙහෙත් ගන්නේ කොහෙන්ද? සෞඛ්‍ය ඇමතිතුමාට මේකට උත්තර දෙන්න කියන්නකෝ, කරුණාකරලා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, අද වෙනකොට අප්‍රේල් මාසයේදී දවස් 5ක් GMOA එක වැඩ වර්ජනය කර තිබෙනවා; දවස් 5ක වැඩ වර්ජන. එක් පැත්තකින් මැද පෙරදිග අර්බුදයක් පවතිද්දී, ජනතාව ටිකක් අර්බුදකාරී විධියට ජීවත් වෙනකොට මෙවැනි වැඩ වර්ජනයක් කරන එක කිසිසේත් සාධාරණ නැහැ. අනික් එක, මේකට හේතු කරගෙන තිබෙන්නේ මොකක්ද? මේ පශ්චාත් සීමාවාසික වෛද්‍යවරුන්ට පත්වීම් ලබා දීමට ඒ පත්වීම් ලැයිස්තුව සකස් කරන්න, දුෂ්කර සේවා ලැයිස්තුව සකස් කරන්න trade union එකක් හැටියට GMOA එක සිටිය යුතුයි කියන ස්ථාවරයේ හිඳිමින් ඔවුන් වැඩ වර්ජනය කරනවා. මේක, මේ රටේ හෝ විදේශීයව හෝ වෛද්‍ය උපාධිය අරගෙන, ඒ අනුව සීමාවාසික පුහුණුව අවුරුද්දක් කරලා, රජයේ සේවයට ඇතුළත් වීම සඳහා සුදුසුකම් ලැබුවාම ඒ අයට ලැබෙන පළමුවන පත්වීම. ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා පළමුවන පත්වීමට මාරු මණ්ඩල අදාළ නැහැ. ඒක පළමුවන පත්වීම. එහෙනම්, අපට ඇවිල්ලා කියන්න ඕනෑ ඒගොල්ලන් මේ පත්වීමට කලින් වෙන කොහේ හෝ පත්වීමක් අරගෙන තිබෙනවාද කියලා, ස්ථාන මාරු කරගන්න. මේ ඔවුන්ගේ පළමුවන පත්වීම. ගිය අඟහරුවාදා - මාර්තු 31වැනි දා - මේ වෛද්‍යවරු කණ්ඩායමක් කොළඹට කැඳවලා GMOA එකේ මූලස්ථානයේදී තර්ජනය කළා, පත්වීම ගන්න එපා කියලා. පත්වීම අරගෙන යන අය ගැන ඒගොල්ලන් බලාගන්නම් කිව්වා. ඊට පස්සේ දිගින් දිගටම ප්‍රසිද්ධියේ මාධ්‍යවල තර්ජනය කළා, පත්වීම ගන්න එපා කියලා. ඒ කණ්ඩායමේ 453ක් සිටියා. ඒ 453න්, 436ක් අප්‍රේල් 04වැනි දා වෙනකොට අයදුම් කළා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

සියයට 96.2ක්.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

සියයට 96.25ක් අයදුම් කළා තමන්ට මේ පත්වීම අවශ්‍යයි කියලා. ඉතිරි 17දෙනාගෙන් 16දෙනෙකුම සීමාවාසික පුහුණුවෙන් පසු RHO period එක හරියට නොකරපු අය. ඇත්තටම කිව්වොත්, එක්කෙනායි සීමාවාසික පුහුණුව - internship - අවසන් කරලා, RHO period එකේත් යෙදිලා ඉඳලා ඉල්ලුම් නොකළේ. ඉතිරි 16දෙනාම ඇත්තටම රජයේ පත්වීමක් සඳහා කටයුතු නොකරපු අය. ඒ අනුව ගත්තාම 453න්, 436ක් ඉල්ලුම් කරලා තිබියදීත් මේ විධියට වැඩ වර්ජනය කරන එකේ කිසි පදනමක් නැහැ. ඒ වෛද්‍යවරු සෙනසුරාදා ඉල්ලුම් කළාට පස්සේ සෞඛ්‍ය අමාත්‍යාංශය මැදිහත් වෙලා ලැයිස්තුව සකස් කළා. ඊයේ එම ලැයිස්තුව ප්‍රකාශයට පත් කළා. ඒ අනුව අද උදෑසන සිට සීමාවාසික පුහුණුව අවසන් කරපු ඒ වෛද්‍යවරු සේවා කරපු ස්ථානයෙන් නිදහස් වෙනවා. නිදහස් වෙලා අප්‍රේල් 9, 10, 11 කියන දවස් තුන තුළ - සෙනසුරාදා දක්වා - ඒ අයට තමන්ගේ අලුත් සේවා ස්ථානයට වාර්තා කරන්න පුළුවන්. ඒක තමයි සාමාන්‍ය ක්‍රමවේදය. මීට කලිනුත් අමාත්‍යාංශය සිදු කර තිබෙන්නේ මේ ක්‍රමවේදය තමයි. පශ්චාත් සීමාවාසික පුහුණුව අවසන් කරලා රජයේ පත්වීම ලබා ගත්තාට පස්සේ ඒ නිදහස් වෙන අය සේවයට වාර්තා කළාම එතැන් සිට ඒ අයට වැටුප් සකස් වෙනවා අලුත් සේවා ස්ථානයේ සිට. සේවයෙන් නිදහස් වෙන්න ඉල්ලුම් නොකරන අයගේ සේවය අත්හිටුවනවා සහ වැටුප් නතර වෙනවා. ඒක තමයි සාමාන්‍ය ක්‍රමවේදය. ගරු කථානායකතුමනි, මේකේ එහෙම ලොකු ප්‍රශ්නයක් එන්න විධියක් නැත්තේ, එක්කෙනායි ඉන්නේ ඒ විධියට ඉල්ලුම් නොකරපු. අනෙක් 16 දෙනාම සාමාන්‍යයෙන් රජයේ සේවයට ඇතුළත් නොවීම සඳහාම තමයි කටයුතු කර තිබෙන්නේ.

ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමනි, ගිය සෙනසුරාදා වෙනකොට සියයට 96.25ක් ඉල්ලුම් කළාට පස්සේ, ඊත් ඉරිදාත් වැඩ වර්ජනය කළා. ඒ වෛද්‍යවරු රජයේ සේවයට එන්න සූදානම් නම්, ඒක පදනම් කරගෙන වැඩ වර්ජනයක් කරලා රෝගීන්

අපහසුතාවට පත් කිරීම කිසිසේත්ම සාධාරණ නැහැ. ඒක පිටුපස තිබෙන්නේ වෙනත් දේශපාලන අරමුණක්. ඒ වෛද්‍යවරු පත්වීම බාර ගන්න ඉන්නකොට ආයෙත් පැය 48ක් වැඩ වර්ජනය කරනවා. ඒ කියන්නේ කිසිදු පදනමක් නැතිව. සමහර වැඩ වර්ජන තිබෙනවා සමස්ත වෛද්‍යවරුන්ට බලපාන. අපි හිතමු, වැටුප් වැඩිවීමකදී, දීමනා වැඩිවීමකදී, එතකොට සමස්ත වෛද්‍යවරු ඒක අනුමත කරනවා. හැබැයි, මේ මාරු මණ්ඩලවලට අයිතියක් නැති කාරණයක්. ආයතන සංග්‍රහයේ එහෙම එකක් නැහැ. ආයතන සංග්‍රහයේ තිබෙන්නේ ස්ථාන මාරු සඳහා මාරු මණ්ඩල සම්බන්ධ කර ගන්නයි. එතකොට, මේ වෛද්‍යවරුන්ගේ පළමුවැනි පත්වීම මේක. මේ අය තව අවුරුදු 4කට පස්සේ මාරු වෙනකොට මාරු මණ්ඩලයට පුළුවන් මැදිහත් වෙන්න. එහෙම නැත්නම් දුෂ්කර සේවා ස්ථානවල අවුරුදු දෙකක් ඉන්න අය වෙනුවෙන් පුළුවන්, ඒ අවස්ථාවේදී මාරු මණ්ඩලයට මැදිහත් වෙන්න. පළමුවැනි පත්වීමට මාරු මණ්ඩල අයත් වෙන්නේ නැහැ. ඒක තමයි රජයේ සාමාන්‍ය ක්‍රියාවලිය. ඒක අපි කරමින් ඉන්නවා. අතීතයේ ඒවා අවභාවිත කරමින් වැරදි සිද්ධ වුණා නම් ඒවාට අපට කරන්න දෙයක් නැහැ. අපි තිබෙන නීතිය අනුව කටයුතු කරනවා. එම නිසා මම කියන්න කැමැතියි, මේක ඉතාම අසාධාරණ වැඩ වර්ජනයක් බව. මේ වැඩ වර්ජනයට පදනමක් නැහැ. ඒ වෛද්‍යවරු තමන්ගේ පත්වීම ලබාගෙන තමන්ට හිමි සේවා ස්ථානයට යනවා. මම ඒ අයට කියන්න කැමැතියි, කිසිම කෙනෙක් භය වෙන්න එපා, ඔබ ගිහිල්ලා ඔබගේ සේවයට වාර්තා කරන්න කියලා. ඔබට අවශ්‍ය ආරක්ෂාව පොලීසිය පැත්තෙනුත්, ඒ වාගේම මහජනතාවගේ පැත්තෙනුත් ලැබෙනවා. ඒවාට කිසි කෙනෙකුට අත තියන්න බැහැ. ඔබ රාජකාරිය කරගෙන යන්න. ඔබේ වෘත්තීය ජීවිතය වෙනුවෙන් අපි ඔබට සුබ පතනවා.

අපි ඔක්කෝම එකතු වෙලා මේ රටේ හොඳ සෞඛ්‍ය සේවාවක් හදමු. මේ දේශපාලන අරමුණු වෙනුවෙන් කුඩා කල්ලියක් කරන වැඩ වර්ජනය තවදුරටත් කරගෙන යන්න එපාය කියන ඉල්ලීමත් මම මේ වෙලාවේ කරන්න කැමැතියි.

කොහොම වුණත්, මේ විධියට නම් හැසිරෙන්නේ, අද දවසේ ලබා දීපු සාකච්ඡාව මම කරන්නේ නැහැ. ගිය ඉරිදා සාකච්ඡාවක් ලබා දුන්නා, ගරු කථානායකතුමනි. මේ ප්‍රශ්නය ඉවරයි. පශ්චාත් සීමාවාසික පත්වීම් සම්බන්ධ ප්‍රශ්නය ඉවරයි. එතැනින් එහාට වෙන වෙන ගැටලු තිබෙනවා නම්, සාකච්ඡා කරන්න අවස්ථාවක් ලබා දුන්නා. හැබැයි මේ විධියට නම් හැසිරෙන්නේ, - *[බාධා කිරීමක්]* මේ විධියට නම් හැසිරෙන්නේ, ඒ සාකච්ඡා වැඩක් නැහැ. ඒ නිසා ඒ සාකච්ඡාව GMOA එකට අද ලබා දෙන්නේ නැත. මේ වැඩ වර්ජනය අසාධාරණයි. අපි ඒකට රජය හැටියට මුහුණ දෙන්න සූදානම්. අර්චුනා මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා වාගේ හරි, මේ පළමු පත්වීම් ලබා දීමේදී රජය වරදක් සිදු කරලා තිබෙනවා නම්, හොඳම වැඩේ තමයි අධිකරණයට යන එක, වැඩ වර්ජන කරන්නේ නැතුව. අධිකරණයට ගියාට පස්සේ අධිකරණයෙන් දෙපැත්තේ නඩුව අහලා නියෝගයක් ලබා දෙයි. ඒ නිසා මේකට ජනතාව ගොදුරු කර ගන්න එපා. ඒක තමයි අපි ඉල්ලා සිටින්නේ. බොහොම ස්තුතියි, ප්‍රශ්නය ඉදිරිපත් කළාට, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අමාත්‍යාංශ නිවේදන. මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍ය ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා.

## ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර මුහුණ දෙන ගැටලු: මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය

## நுண், சிறிய மற்றும் நடுத்தர அளவிலான தொழில்முயற்சிகள் எதிர்கொள்ளும் சிக்கல்கள்: நிதி, திட்டமிடல் பிரதி அமைச்சரினது கூற்று

## ISSUES FACED BY MICRO, SMALL AND MEDIUM-SIZED ENTERPRISES: STATEMENT BY DEPUTY MINISTER OF FINANCE AND PLANNING

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ ගරු විපක්ෂ නායකතුමා විසින් 2026.02.06වන දින අසන ලද ප්‍රශ්නයට මා පිළිතුරු ලබා දෙනවා.

1. දළ දේශීය නිෂ්පාදිතය ඇස්තමේන්තු කිරීමේදී 2024 වර්ෂයේ දත්ත අනුව එය වර්ගීකරණය කරන්නේ, සාංගමික අංශය, කුටුම්බ අංශය සහ රාජ්‍ය අංශය විධියට. සාංගමික අංශයෙන් සියයට 51කුත්, කුටුම්බ අංශයෙන් සියයට 42.5කුත්, රාජ්‍ය අංශයෙන් සියයට 6.5කුත් තිබෙනවා. නමුත් කුටුම්බ අංශය සහ සාංගමික අංශය යන දෙකටම දායකත්වයක් තිබෙනවා, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්. ඒ දත්ත ඇස්තමේන්තු සහිතව මුදල් අමාත්‍යාංශයේ 2024 වාර්ෂික වාර්තාවේ ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ අනුව සියයට 52ක ප්‍රමාණයක් තමයි දළ දේශීය නිෂ්පාදිතයට දායකත්වය දක්වන්නේ. ඔවුන්ගේ අපනයන ආදායම 2023 වර්ෂයේදී ඩොලර් මිලියන 1,091යි; 2024 වර්ෂයේදී ඩොලර් මිලියන 1,167යි; 2025 වර්ෂයේදී ඩොලර් මිලියන 1,128යි. ප්‍රතිශතයක් වශයෙන් ගත්තාම, සියයට 10කට වඩා අඩු ප්‍රමාණයක් තිබෙන්නේ.

2. ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ වශයෙන් ආර්ථික කටයුතු සිදු කරනු ලබන ව්‍යාපාර ඇතුළත් ආයතන ලැයිස්තුව සාමාන්‍යයෙන් සකස් කරන්නේ අවුරුදු 10කට වරක්. ඒ, සංගණනයකින්. අවසාන සංගණනය සිදු වෙලා තිබෙන්නේ 2013දී. කෙසේ වුණත්, 2018-2022 කාලච්ඡේදයට අදාළව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද Impact of Economic Crisis on MSMEs, 2022 සමීක්ෂණයට අදාළව ලබා ගත්ත තොරතුරු මත මේ අසා තිබෙන, දැනට ක්‍රියාත්මක වෙලා තිබෙන MSMEs සංඛ්‍යාව කොපමණද, අර්බුදය නිසා වසා දමපු ප්‍රමාණය කොපමණ යන ප්‍රශ්නවලට සාරාංශ පිළිතුරක් ලබා දෙන්න පුළුවන්. සමස්තයක් වශයෙන් ගත්තාම එවැනි ආයතන මිලියන 1.3ක් තිබෙනවා. ඒ සමස්ත සංඛ්‍යාව. ඒ සමස්ත සංඛ්‍යාවෙන් දැනට ක්‍රියාත්මකව පවතිනවා, 1,037,000ක්. ආර්ථික අර්බුදය නිසා වසා දමපු සංඛ්‍යාව 108,000යි. ඒ වාගේම ආර්ථික අර්බුදයට අමතරව වෙනත් හේතු නිසා වසා දමපු සංඛ්‍යාව 155,000යි.

3. ක්ෂුද්‍ර, සුළු හා මහා පරිමාණ ව්‍යවසාය සංවර්ධනය සඳහා විවිධ වූ වැඩසටහන් ඉදිරිපත් කරන අතර, මූල්‍ය පහසුව ලබා දීමට රාජ්‍ය බැංකු සම්බන්ධ වෙලා කරනු ලබන වැඩසටහන් ගණනාවක් තිබෙනවා. ඊට අමතරව මුදල් අමාත්‍යාංශයේ සංවර්ධන මූල්‍ය අංශය මැදිහත් වෙලා

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

ඉදිරිපත් කරනු ලබන ණය වැඩසටහන් ගණනාවක් තිබෙනවා. එහි 2025 වර්ෂය සඳහා ණය යෝජනා ක්‍රම 5ක් තිබෙනවා. ඒ යටතේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය නැවත පණ ගැන්වීම සඳහා වන ණය පැකේජය යටතේ රුපියල් මිලියන 16,494ක් 1,722දෙදෙනකුට ණය වශයෙන් ලබා දීලා තිබෙනවා. ආසියානු සංවර්ධන බැංකු අරමුදල භාවිතයෙන් ක්‍රියාත්මක කරන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන ව්‍යාපෘති යටතේ 1,735දෙනෙකුට ලබා දීලා තිබෙනවා, රුපියල් මිලියන 12,830ක්. ඒ වාගේම, ඔඩපණ ණය - pledge loan - යෝජනා ක්‍රමය කියන එකේදී 672කට ලබා දීලා තිබෙනවා, ණය මුදල වශයෙන් රුපියල් මිලියන 13,488ක්. නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය - NCRCS - යටතේ 39,338දෙනෙකුට ලබා දීලා තිබෙනවා, රුපියල් මිලියන 14,723ක්. ඒ වාගේම, විස්තීර්ණ ආපදා සහන ණය යෝජනා ක්‍රමය යටතේ 315දෙනෙකුට ලබා දීලා තිබෙනවා, රුපියල් මිලියන 241ක්.

2026 වසරේදී මෙය තවත් පුළුල් කරමින් ලබා දීමට අපේක්ෂිත මුළු ණය ප්‍රමාණය රුපියල් මිලියන 95,686කට අදාළ පැකේජ ගණනාවක් තිබෙනවා. එහි ප්‍රධාන කොටස් දෙකක් තිබෙනවා. එකක් තමයි, ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම. ඒ යටතේ රුපියල් මිලියන 55,686ක් යෝජනා වෙනවා, ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය - MSME - අංශය නැවත බලගැන්වීම සඳහා වන ණය පහසුකම - Loan Scheme for Re-energizing the MSME Sector - යටතේ රුපියල් මිලියන 25,000කුත්, විස්තීර්ණ ආපදා සහන ණය යෝජනා ක්‍රමය යටතේ රුපියල් මිලියන 10,000කුත්, තිරසාර කෘෂි සංවර්ධන වැඩසටහන යටතේ රුපියල් මිලියන 800කුත් වශයෙන්.

ආසියානු සංවර්ධන බැංකුවේ අරමුදල් මඟින් ක්‍රියාත්මක කරන යෝජනා ක්‍රම යටතේ රුපියල් මිලියන 19,886ක් වෙන් වෙනවා. ඒ යටතේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය වැඩිදියුණු කිරීමේ, එනම් චක්‍රීය ණය යෝජනා ක්‍රමය තිබෙනවා, SMELoC 2 - Revolving කියලා. ඊට අමතරව, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ක්ෂේත්‍රය සංවර්ධනය කිරීමේ වැඩසටහනට අදාළව ආංශික සංවර්ධන වැඩසටහන - SME Sector Development Programme - කියලා එකක් තිබෙනවා. ඒ සඳහා රුපියල් මිලියන 7,750ක් වෙන් වෙනවා. කෘෂිකාර්මික අගය දාම මූල්‍යකරණය හා වාණිජකරණය කිරීමේ සංවර්ධන වැඩසටහන - Agriculture Value Chain Financing and Commercialization Sector Development Project - යටතේ රුපියල් මිලියන 6,200ක් වෙන් වෙනවා.

දෙවැන්න තමයි, පොලී සහනාධාර ලබා දෙන ණය යෝජනා ක්‍රම. ඒ යටතේ රුපියල් බිලියන 40ක් - මිලියන 40,000ක් - වෙන් වෙනවා. ඒ, Pledge Loan Scheme for SME Paddy Millers and Co-operative Societies එකක් සහ නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය වශයෙන් කොටස් දෙකක් යටතේයි.

මීට අමතරව අපි යෝජනා කරලා තිබෙනවා, ඇප රහිත credit guarantee එකක් ලබා දීමට. එහිදී ලබා ගන්නා ණයෙන් තුනෙන් දෙකක් සඳහා මහා භාණ්ඩාගාරය විසින් ඇප වෙනවා. ඒ අනුව 2026 වර්ෂයේදී අපි ඉලක්කසහගත වෙලා තිබෙනවා, එවැනි ණය සහතික කිරීම්, ඇප සහතික වීම් 2,600ක් ලබා දීමට. ඒවායේ ණය වටිනාකම රුපියල් මිලියන 16,300ක් වනවා. ඒ, සමස්ත ණය වටිනාකම. අපි guarantee එක ලබා දෙනවා 10,900කට. මේ වනකොට එහි ප්‍රගතිය ගත්තොත්, ඒ කියපු 2,600න් 374දෙනෙකුට ලබා දීලා තිබෙනවා. සමස්ත ණය වටිනාකම 2,976ක් සහ guaranteed value එක 1,984ක් වනවා.

4. මෙහිදී බලපත්‍රලාභී බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන වශයෙන් කොටස් දෙකකට වෙන් කරලා තිබෙනවා. ඒ, 2025.12.31 වන කොට මුළු ණය පහසුකම්වල ප්‍රතිශතයක් ලෙස බලපත්‍රලාභී බැංකුවලින් 15.3ක් සහ මූල්‍ය සමාගම්වලින් 7.1ක් ලෙසයි.

ඒ වාගේම, මෑත කාලීනව හටගත් අහිතකර ආර්ථික තත්ත්වය මෙන්ම ස්වාභාවික විපත්වලින් බලපෑමට ලක් වෙච්ච ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා ණය ලබා දීමේ අරමුණින් මහ බැංකුව විසින් විශේෂ චක්‍රලේඛ 2ක් නිකුත් කරලා තිබෙනවා. ඒ, මෑත කාලීනව ඇති වූ තත්ත්වයත්, ඊට කලින් ඇති වෙච්ච ආර්ථික අර්බුදය හා පැන නැඟුණු තත්ත්වයත් සම්බන්ධවයි. ඒවා අතරින් පළමුවැනි චක්‍රලේඛයේ සුවිශේෂත්වය වී තිබෙන්නේ, එය 2019.04.01 දින හෝ ඉන් පසුව ලබා ගත් අදියර 3හි ණයවලට අදාළව, ඒ කියන්නේ සම්පූර්ණ වශයෙන් අකර්මණ්‍ය වෙච්ච -impaired - ණය නැවත ගෙවා දැමීම හෝ නැවත ලේඛනගත කිරීමේ පරමාර්ථයෙන් නිකුත් කළ එකක් වීමයි. ඒ අනුව ඔවුන්ට බැංකුවකට ගිහිල්ලා සාකච්ඡා කරලා ඒ ණය ප්‍රතිලේඛනගත කිරීමේ අවස්ථාව තිබෙනවා. එහිදී වැදගත්ම දේ තමයි, ඔවුන් ඒ ණය ආපසු ගෙවන්නේ කොහොමද කියන කාරණයත්, ව්‍යාපාරය යළි පණ ගන්වන්නේ කොහොමද කියන කාරණයත් ඉදිරිපත් කළ යුතු වීම. ණය යෝජනා ක්‍රමවලට අදාළව ගෙවිය යුතු මුළු හිඟ ණය ප්‍රාග්ධනය රුපියල් මිලියන 25ට අඩු, රුපියල් මිලියන 25ත්, 50ත් අතර සහ රුපියල් මිලියන 50ට වැඩි කියන අයට මේ සහනය ලබා දීලා තිබෙනවා. ඒ ණය ආපසු ගෙවීමේදී පොලී සහනාධාරය ලෙස, විශේෂයෙන්ම ඔවුන් නොගෙවූ - හිඟ වෙලා තිබෙන - පොලීවලින් සියයට 65ක උපරිමයක් අඩු කර ගන්න, ඒ කියන්නේ සුළු පරිමාණයේ ණයවලට අදාළ - රුපියල් මිලියන 5 සිට 10 දක්වා වන - හිඟ පොලියෙන් උපරිම වශයෙන් සියයට 65ක් නිදහස් කර ගැනීමේ ඉඩ කඩ සහ මිලියන 10ට වැඩි අයගේ නොගෙවූ පොලියෙන් සියයට 35ක් ආවරණය කර ගැනීමේ ඉඩ කඩ තිබෙනවා. මෙම චක්‍රලේඛය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කළ 2024.12.20 දිනැති මාධ්‍ය නිවේදනය මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

එහි එම සම්පූර්ණ විස්තර ටික තිබෙනවා.

දෙවැනි චක්‍රලේඛය නිකුත් කර තිබෙන්නේ, "දිට්වා" සුළි කුණාටු තත්ත්වය නිසා ඇති වෙච්ච ගැටලුවලට මුහුණ දීම සඳහා තාවකාලික ණය සහනයක් ලබා දීම පිණිසයි. එතැනදී මුදල් හෝ ණය පොලිය, ඒ කියන්නේ මූලික ණය මුදල හා ණය පොලිය ආපසු ගෙවීම මාස 3 සිට මාස 6 දක්වා කාලයක් සඳහා අත්හිටුවීමටත්, එම කාල පරිච්ඡේදයේදී ඔවුන්ට ගිවිසුම්ගත පොලිය සහ අත්හිටුවන අවස්ථාව වනකොට තිබුණු පොලී අනුපාතයෙන් අඩු පොලී අනුපාතය, ස්ථාවර පොලී අනුපාතයක් විධියට ගෙවන්න තමයි එම චක්‍රලේඛය නිකුත් කරලා තිබෙන්නේ. ඒ වාගේම පවතින ණය වාරික සහ පොලීවලට අමතරව සහන කාලය ඉක්මවා ඒ කටයුත්ත කළාට පස්සේ ඔවුන් දිරිගැන්වීමක් විධියට, නැවත ව්‍යාපාර කර ගැනීමට නව ණය පහසුකම් ලබා දීමේ ක්‍රමවේදයකුත් මෙමඟින් යෝජනා කරනවා.

5. මේ ප්‍රශ්නයෙනුත් අහන්නේ, ඒ කාල සීමාවන්හිදී ලබා දෙන ණය පිළිබඳවයි. මේ 4වන ප්‍රශ්නයට අදාළ පිළිතුරේත්, මේ කියපු චක්‍රලේඛ දෙකේත් විස්තරාත්මකව කරුණු සඳහන්ව තිබෙනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

6. ජාතික බදු ප්‍රතිපත්තිය යටතේ අමු ද්‍රව්‍ය ආනයනයේදී පහත ආකාරයට සහන ලබා දෙනවා.

- අපනයනය සඳහා භාණ්ඩ නිෂ්පාදනයට තාවකාලික ආනයන සහ අපනයන ක්‍රියාවලිය - TIEP programme එක - යටතේ හා Industrial Facilitation Centre යෝජනා ක්‍රම ශ්‍රී ලංකා රේගුව හරහා ක්‍රියාත්මක කරනවා. මෙහිදී ආනයනය කරනු ලබන අමු ද්‍රව්‍ය සඳහා PAL, CESS සහ තීරුබදු ඉවත් කරලා තිබෙනවා. මෙම සියලු ක්‍රම සඳහා කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයෙන් නිර්දේශ ලබා ගැනීමට අවශ්‍යයි.

- එමෙන්ම කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ නිර්දේශ මත දේශීය වෙළෙඳ පොළ සඳහා නිෂ්පාදනය කරනු ලබන මුද්‍රණ තීන්ත නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍ය ආනයනයේදීත් CESS සහ තීරුබදු සහනය ලබා දෙනවා. සනීපාරක්ෂක තුවා නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍ය ආනයනයේදී PAL, CESS සහ තීරු බදු ඉවත් කර තිබෙනවා. ටයර් නිෂ්පාදනය සඳහා අවශ්‍ය casings ආනයනය කිරීමේදීත් CESS සහ තීරුබදු සම්පූර්ණයෙන්ම ඉවත් කර තිබෙනවා. දේශීයව නිෂ්පාදනය කරනු ලබන සම් ආශ්‍රිත නිෂ්පාදන සඳහා වන අමු ද්‍රව්‍ය ආනයනය කරන අවස්ථාවේ තීරුබදු සම්පූර්ණයෙන් ඉවත් කරලා තිබෙනවා.

- ඒ වාගේම TIEP IV සහ INFAC යටතේ යන්ත්‍ර සූත්‍ර ආනයනය සඳහා ශ්‍රී ලංකා රේගුව විසින් ඉල්ලනු ලබන නිර්දේශ ලබා දීම ද කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය විසින් සිදු කරනු ලබනවා.

- අමු ද්‍රව්‍ය හා අන්තර් මාධ්‍ය අමු ද්‍රව්‍ය ආනයනය බදු රහිතව සිදු කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර තිබෙනවා.

7. එවැනි ප්‍රතිපත්තිමය තීරණයක් දැනට අරගෙන නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාම ඔබතුමාගේ පිළිතුරෙන් පිළිගත්තා, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන් දළ දේශීය නිෂ්පාදිතයට සියයට 52ක දායකත්වයක් ලබා දෙනවා කියලා. හැබැයි, එයට සාපේක්ෂව පසුගිය කාලයේ සිදු වුණු පාස්කු ඉරුදින ප්‍රහාරය, රට බංකොලොත් වීම, කොරෝනා වසංගතය, "දිට්වා" සුළි කුණාටුව, මැද පෙරදිග අර්බුදය ආදි සියල්ල නිසා මේ රටේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන් බරපතළ ප්‍රශ්නයකට මුහුණ දෙනවා. IMF එකේ කොන්දේසියක් මත ඔබතුමන්ලා ගහපු CESS එක ඉවත් කරන්න යනවා; ක්‍රමානුකූලව හරි ඉවත් කරන්න යනවා. ඒ තුළින් සිද්ධ වන්නේ අපේ රටේ දේශීය කර්මාන්තකරුවන්ට බරපතළ අගතියක්. විශේෂයෙන්ම infant industries සඳහා ආරම්භයේදීම ලැබෙන රැකවරණය අහිමි වෙනවා. ඒ වාගේම මම ඔබතුමාට මේ කාරණයත් කියන්න කැමැතියි. ඔබතුමන්ලා විශේෂයෙන්ම *parate* execution - ඒ වෙන්දේසිය - ඒ කාලවකවානුව තුළ තාවකාලිකව නතර කළත්, ණය බරින් පිරිච්ච, CRIB එකට ගිය, හුඟක් ණය බරින් තැළිච්ච පොඩි වෙච්ච කර්මාන්තකරුවන් වෙනුවෙන් ණය ප්‍රතිව්‍යුහගත කිරීමක් කරන්න ඒ අතරතුර කටයුතු කළේ නැහැ. ඒ නිසා ඒ අය බරපතළ අගතියකට ලක් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම මම ඔබතුමන්ලාගෙන් අහන්න කැමැතියි, මේ රටේ දේශීය කර්මාන්ත ගොඩ නඟන්නට, ආරක්ෂා කරන්නට, විශේෂයෙන්ම අපනයන කේන්ද්‍රීය කර්මාන්ත ඇති කිරීමට වැඩ පිළිවෙළක් තිබෙනවාද කියලා. දැන් ඔබතුමා දන්නවා ඇති, අපේ රටේ තිබෙන factories වහලා ඒවා රැගෙන යනවා ආන්ද්‍ර ප්‍රදේශ්, ඔඩිෂා වැනි ප්‍රාන්තවලට. ගරු ඇමතිතුමාට මම යෝජනා කරනවා, ආන්ද්‍ර ප්‍රදේශ්, ඔඩිෂා වැනි ප්‍රාන්තවල සිටින ඒ කර්මාන්තකරුවන්ට වෙනමම කර්මාන්ත නොවෙයි, industrial parks ඇති කරන්න කියලා. ඇත්ත වශයෙන්ම අපේ රටේ තිබුණු Brandix, MAS Holdings වැනි ආයතන එක එක හේතු කියලා මේ රටේ තිබෙන factories වහලා ඒවා රැගෙන යනවා විශාකාපට්ටනම්වලට, ආන්ද්‍ර ප්‍රදේශ්වලට, ඔඩිෂාවලට. ඒක අපේ රටේ කර්මාන්ත පද්ධතියට බරපතළ හානියක්. රැකී රක්ෂා දස ලක්ෂ ගණනින් අපට අහිමි වෙනවා. ඒ නිසා IMF එක කියන කියන පදයට නටන්නේ නැතිව මේ රටේ කර්මාන්ත ක්ෂේත්‍රය ශක්තිමත් කරන්න, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් රැකගන්න, විශේෂයෙන්ම අපනයන ක්ෂේත්‍රය ශක්තිමත් කරන්න පියවර ගන්න. එහෙම නැත්නම් MAS Holdings, Brandix වාගේ කර්මාන්තශාලා බහුතරයක් මේ රටේ තිබෙන factories වහලා විශාකාපට්ටනම්වලට, ඔඩිෂාවලට හා වෙනත් ප්‍රාන්තවලට යාවි, ඒ අයට හොඳ පැකේජ් එකක් ලැබෙන නිසා. එහෙම වුණොත් අපට කර්මාන්ත ශාලාත් අහිමි වෙයි, රස්සාත් අහිමි වෙයි, ඒ රටවලට - ඉන්දියාව වැනි - ලොකු ශක්තියක් ලැබෙයි. ඒ සම්බන්ධයෙන් ඔබතුමන්ලා ගන්න පියවර මොකක්ද කියලා මම අහන්න කැමැතියි.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, දැන් විපක්ෂ නායකතුමා මතු කරපු ණය ප්‍රතිව්‍යුහගත කිරීම කියන කාරණය සම්බන්ධව අවස්ථා දෙකකට - ආර්ථික අර්බුදය සහ මේ මෑතකදී ඇති වුණු "දිට්වා" ව්‍යසනය - අදාළව තමයි මම පිළිතුර ඉදිරිපත් කළේ. මේ ඇමුණුම් දෙක මම ඉදිරිපත් කරන්නම්. හැබැයි අපි පිළිගන්නවා, සමහර අවස්ථාවලදී මේ ප්‍රතිව්‍යුහගත කිරීම්වල යම් යම් අඩුපාඩු වෙන්න පුළුවන්. ඒ නිසා ණය හිමියන්ටත්, ණය ගත්තු අයටත් අපි යෝජනා කරනවා, දැනුම් දුන් පරිදි බැංකුවලට ගිහිල්ලා සාකච්ඡා කරන්න කියලා. බැංකුවලට ගිහිල්ලා අදාළ කතිකාව නිර්මාණය කරගත්තු සියලු දෙනාට ඒ සහනය ලැබුණා. බැංකුවට ගියේ නැති අයට ඒ සහනය ලැබී නැහැ.

දෙවැනි කාරණය තිබෙන්නේ, CESS බද්ද සම්බන්ධයෙන්. ඒක IMF එකේ කොන්දේසියක් හෝ එකඟතාවක් නොවෙයි. අපේ ආණ්ඩුවේ අරමුණ තමයි බදු ක්‍රමය විධිමත් කරගැනීම හා රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව. එහිදී para-tariffs ක්‍රමිකව අයින් වෙන්න ඕනෑ. මේක එකවර අයින් කිරීමක් නොවෙයි කරන්නේ. ජාත්‍යන්තරය පිළිගත් ප්‍රමිති පද්ධතීන්වලට අනුව HS codes හදලා යන ක්‍රමයක් අපි ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ යෝජනා ගන්නකොට කර්මාන්තයේ ඉන්න සියලුම අංශවල අය දායක කරගන්නවා. ඔවුන්ගේ අදහස් අනුවයි මේ කටයුත්ත කළේ. ඒ වාගේම සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ගේ අපනයන ආදායම ගත්තොත්, අපනයන ඉපැයීම්වලින් සියයට 10කටත් වඩා අඩුයි. ඒක තමයි අතීතයේ ඉඳලාම ඇවිල්ලා තිබෙන තත්ත්වය. අපි අලුතෙන් සැලැස්මක් - උපාය මාර්ගික සැලැස්මක් - හදලා ඉදිරිපත් කරනවා. ඒක තව සතියකින් දෙකකින් ඉදිරිපත් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. එතකොට අපනයන ආදායම සියයට 25 දක්වා වැඩි කරගන්නේ කොහොමද කියලා බලාගන්න පුළුවන්. බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පනත් කෙටුම්පත් පිළිගැන්වීම.

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
BILLS PRESENTED

### මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත
நிதிசார் கொடுக்கல்வாங்கல்களை அறிக்கையிடல் (திருத்தம்) சட்டமூலம்
FINANCIAL TRANSACTIONS REPORTING (AMENDMENT) BILL

"2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවට ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා විසිනි.***

***2026 මැයි 05වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சருமானவர் சார்பாக மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2026 மே 05, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் அரசாங்க நிதி பற்றிய குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. (Dr.) Anil Jayantha on behalf of the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education; to be read a Second time upon Tuesday, 05th May, 2026 and to be printed; and to be referred to the Committee on Public Finance.*

### ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති (සංශෝධන) පනත් කෙටුම්පත
பயங்கரவாதி நிதியளிப்பை ஒடுக்குதல் மீதான சமவாய (திருத்தம்) சட்டமூலம்
CONVENTION ON THE SUPPRESSION OF TERRORIST FINANCING (AMENDMENT) BILL

" 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවට ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා විසිනි.***

***2026 මැයි 05වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சருமானவர் சார்பாக மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2026 மே 05, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் அரசாங்க நிதி பற்றிய குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. (Dr.) Anil Jayantha on behalf of the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education; to be read a Second time upon Tuesday, 05th May, 2026 and to be printed; and to be referred to the Committee on Public Finance.*

## පාර්ලිමේන්තුවේ කටයුතු
பாராளுமன்ற அலுவல்
BUSINESS OF THE PARLIAMENT

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 4 සහ 5 දරන විෂයයන් පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27 හි විධිවිධානවලින් නිදහස් විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. අ.භා. 2.00ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය. "

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කොළඹ වරායේ සිට බහලුම් 323ක් අනිවාර්ය භෞතික පරීක්ෂණයට භාජනය කිරීමකින් තොරව නිදහස් කිරීම සම්බන්ධයෙන් සොයා බලා වාර්තා කිරීමටත් ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන විශේෂ කාරක සභාව
கொழும்பு துறைமுகத்திலிருந்து 323 கொள்கலன்களை கட்டாய பௌதிகப் பரிசோதனைக்கு உட்படுத்தாமல் விடுவித்தமை தொடர்பில் ஆராய்ந்து அறிக்கையிடுவதற்காகவும் அது குறித்த அதன் முன்மொழிவுகளையும் விதப்புரைகளையும் சமர்ப்பிப்பதற்குமான தெரிகுழு
SELECT COMMITTEE TO LOOK INTO AND REPORT TO PARLIAMENT ON THE RELEASE OF 323 CONTAINERS FROM THE PORT OF COLOMBO WITHOUT UNDERGOING MANDATORY PHYSICAL INSPECTION AND SUBMIT ITS PROPOSALS AND RECOMMENDATIONS IN THAT REGARD

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"කොළඹ වරායේ සිට බහාලුම් 323ක් අනිවාර්ය භෞතික පරීක්ෂණයට භාජනය කිරීමකින් තොරව නිදහස් කිරීම සම්බන්ධයෙන් සොයා බලා වාර්තා කිරීමටත් ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව විසින් නිරීක්ෂණය කරනු ලැබූ කරුණු, 2025 නොවැම්බර් 19 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව මඟින් නියම කර ඇති පරිදි පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට තවදුරටත් කාලය අවශ්‍ය වන බැවින්, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 102 ප්‍රකාරව එකී කාරක සභාවට ලබාදී ඇති කාලසීමාව, 2026 ජූලි 21 දින දක්වා දීර්ඝ කළ යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 5 දක්වා ඉදිරිපත් කිරීම, ගරු ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා.

## යුද්ධ හමුදා පනත: නියෝග
## தரைப்படைச் சட்டம்: ஒழுங்குவிதிகள்
## ARMY ACT: REGULATIONS

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"(357 අධිකාරය වූ) යුද්ධ හමුදා පනතේ 29 සහ 155 වගන්ති යටතේ ආරක්ෂක අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 පෙබරවාරි 15 දිනැති අංක 2423/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.03.17 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ඊට අමතරව, න්‍යාය පත්‍රයේ විෂය අංක 2 - නාවික හමුදා පනත යටතේ නියෝග, විෂය අංක 3 - ගුවන් හමුදා පනත යටතේ නියෝග, විෂය අංක 4 - මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනා සම්මතය සහ විෂය අංක 5 - අත්‍යවශ්‍ය මහජන සේවා පනත යටතේ යෝජනා සම්මතය ද මා ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The Hon. Major General (Rtd.) Aruna Jayasekera to start the Debate. You have 13 minutes.

[පූ.භා. 11.22]

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)

ගරු කථානායකතුමනි, අද දින විෂය පථ දෙකක් සාකච්ඡා කිරීමට ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒ තමයි ත්‍රිවිධ හමුදාවට අදාළ පනත් මූලික කරගෙන ගෙනෙන නියෝග සහ "දිට්වා" සුළි කුණාටුවෙන් පස්සේ දීර්ඝ කළ හදිසි නීතිය නැවතත් දීර්ඝ කර ගැනීමේ අවශ්‍යතාව මත ඉදිරිපත් කරන යෝජනා.

යුද, ගුවන්, නාවික කියන ත්‍රිවිධ හමුදාව අද අප රටේ විශාල රාජකාරියක් ඉෂ්ට කරමින් පවතිනවා. විශාල රාජකාරියකට එහා ගිය මහා විශාල කැපවීමක් කරන ආයතන 3කින් සමන්විත ත්‍රිවිධ හමුදාවක විෂය පථය පිළිබඳව තමයි අද අපි සාකච්ඡා කරන්නේ. මාතෘ භූමිය වෙනුවෙන් දිවි කැප කරලා කටයුතු කළ පිරිසක් සිටින ප්‍රධාන ආයතන තුනක් තමයි යුද, නාවික සහ ගුවන් හමුදාව කියන්නේ. ඒවායේ රාජකාරි සලකා බැලීමේදී මෙතෙර පමණක් නොවෙයි, එතෙරත්, එනම් එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදා යටතේ ද විශේෂ රාජකාරියක් කරලා ඉතා හොඳ පිළිගැනීමකට ලක් වෙලා ලෝක සාමය වෙනුවෙන් කරන ලද මෙහෙවර වෙනුවෙන් ප්‍රසාදයක් ලබා ගත් ත්‍රිවිධ හමුදාවක් තමයි අපට තිබෙන්නේ.

මේ අතරේ ත්‍රිවිධ හමුදාවේ කාන්තා බලකායන් තිබෙනවා. ඒ තමයි යුද, ගුවන්, නාවික කාන්තා බලකායන්. ඒවායේ අධිකාරි ලත් කාන්තා නිලධාරින් සිටිනවා. ඒ වාගේම සෙසු කාන්තා නිලධාරිනුත් විශාල ප්‍රමාණයක් සිටිනවා. ඒ වාගේම විශාල ලෙස කැප වුණු බලඇණි තිබෙනවා. ත්‍රිවිධ හමුදාවේ සිටින කාන්තා බලඇණි අපේ රට වෙනුවෙන්, රටේ ජාතික ආරක්ෂාව වෙනුවෙන් විශේෂ මෙහෙයුම්, හදිසි ආපදා තත්ත්ව හමුවේ විශේෂිත වූ රාජකාරියක් කරනවා. මේ පනත් තුනට අදාළව ගෙනැවිත් තිබෙන නියෝග අනුව, කාන්තා බලකායවල කාන්තා නිලධාරින් අවුරුදු 20ක සේවා කාලයක් සඳහා ප්‍රවේශයක් තිබෙන අතර, වයස අවුරුදු 45දී විශ්‍රාම ගත යුතුයි. සෙසු කාන්තා නිලධාරින්ට අවුරුදු 15ක සේවා කාලයක් තිබෙන අතර, අවුරුදු 45දී විශ්‍රාම යෑමට නියම කර තිබෙනවා. නමුත් මේ පනත් තුන යටතේ ගෙනන නව නියෝග අනුව සිද්ධ වෙන්න යන්නේ, බලාපොරොත්තු වෙන්නේ සහ යෝජනා කරලා තිබෙන්නේ අධිකාරිලත් කාන්තා නිලධාරින්ට අවුරුදු 20ක සේවා කාලයක් සමඟ වයස් සීමාව අවුරුදු 55 වනකල් දීර්ඝ කරන එක. ඒ වාගේම සෙසු නිලධාරින් සඳහා අවුරුදු 15ක්ව තිබුණු සේවා කාලය අවුරුදු 22 දක්වා දීර්ඝ කරලා, වයස අවුරුදු 55 වෙනකල් වයස් සීමාවත් දීර්ඝ කරන එක. එවිට මේ දෙගොල්ලන්ටම අවශ්‍ය පරිදි විශ්‍රාම යෑමට ඒ හැකියාව තිබෙනවා. ඒ වාගේම ත්‍රිවිධ හමුදාවේ, එනම් යුද, ගුවන්, නාවික හමුදාපතිවරුන්ගේ අභිමතය පරිදි රටේ, දේශයේ සහ රාජකාරිමය අවශ්‍යතාව මත, ආයතනයේ අවශ්‍යතාව මත මොවුන්ව වයස අවුරුදු 60 දක්වා සේවයේ තියා ගන්න පුළුවන් වන විධියට මේකෙන් යෝජනා කරලා තිබෙනවා. යුද, ගුවන්, නාවික හමුදා සේවාවල සිටින කාන්තා නිලධාරින් ගත්තොත්, ඒ කාන්තා නිලධාරින් විවිධ වෘත්තීය අංශවලින්, ක්ෂේත්‍රවලින් නිපුණත්වයක් ලබා ගෙන ඒ හමුදාවල සාමාන්‍ය රාජකාරි, පොදු රාජකාරිවලට අමතරව රාජකාරි කරනවා. විශේෂයෙන් වෛද්‍ය ක්ෂේත්‍රය, ඉංජිනේරු ක්ෂේත්‍රය, තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය, ඒ වාගේම පාලන සහ හට කාර්ය සම්පාදක, නීති, ගිණුම් කටයුතු, ලිපිකරු ක්ෂේත්‍රය සහ පොදු විවිධ වෘත්තීන්වල රාජකාරිවල නියැළී සිටිනවා. දැන් මේ යෝජනාවෙන් විශේෂ වූ ප්‍රතිලාභ ආයතනික

[ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා]

වශයෙන්, ව්‍යුහාත්මක වශයෙන්, ප්‍රගමණය වශයෙන්, මේ සේවාවල වෘත්තීමයභාවය වශයෙන් විශේෂිත වූ ඉහළ නැංවීමක් ප්‍රතිඵලදායක වශයෙන්, කාර්යක්ෂමතාව අතින් අපි බලාපොරොත්තු වෙනවා. ඒ අනුව තමයි මේ යෝජනාව අපි ඉදිරිපත් කරලා තිබෙන්නේ.

විශේෂයෙන් ත්‍රිවිධ හමුදාවට අයත් නිලධාරින් වයස අවුරුදු 45න්, එහෙම නැත්නම් සේවා කාලය සෙසු නිලධාරින්ගේ නම් අවුරුදු 15කින්, අධිකාරි ලත් නිලධාරින්ගේ නම් අවුරුදු 20කින් විශ්‍රාම යනකොට ඔවුන් හොඳ නිපුණත්වයකින් සිටින මොහොතක තමයි ඔවුන්ට විශ්‍රාම යාමට සිද්ධ වෙන්නේ. ඔවුන් මෙතෙර සහ එතෙර විශේෂිත වූ පුහුණුවීම්වලට යවනවා. ඒ ඒ වෘත්තීමය ක්ෂේත්‍රයන්වල හොඳ නිපුණත්වයක් ලබා ගැනීම සඳහා කාලානුරූපිව ඒ පුහුණුවීම් ඔවුන්ට ලබා දෙනවා. ඒ අයවලුන් අවුරුදු 15ක හෝ අවුරුදු 20ක, එහෙම නැත්නම් වයස අවුරුදු 45ක වාගේ සීමාවට එනකොට විශ්‍රාම යනවා. එතකොට ආයතනික වශයෙන් රට, දේශය, මහජනතාව වෙනුවෙන්, මහජන ආරක්ෂාව වෙනුවෙන්, ජාතික ආරක්ෂාව වෙනුවෙන් සේවය ලබා දෙන්න පුළුවන් හැකියාව අපේ ත්‍රිවිධ හමුදා සේවයට අහිමි වෙන බවයි අපේ විශ්වාසය. ඒ අනුව ඔවුන්ගෙන් තවත් විශේෂිත වූ වැදගත් සේවාවන් ලබා ගැනීම සඳහා තමයි අපි මේ යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන්නේ. ගරු කථානායකතුමනි, ඒ වාගේම මොවුන්ට පුහුණුව ලබා දෙන්න; මොවුන්ගේ හැකියාවන් වැඩිදියුණු කරන්න අපේ රජය විශේෂ මුදලක් වියදම් කරනවා. මෙතෙර සහ එතෙර පාඨමාලාවලට ඔවුන්ව යොමු කරලා ඔවුන්ගේ පුහුණු නිපුණත්වය වර්ධනය කිරීම සඳහා ඒ විවිධ ක්ෂේත්‍රවලට මුදල් වියදම් කරනවා. ඉතින් මොවුන් අඩු සේවා කාලයකින් විශ්‍රාම යැම අපරාධයක්. මොකද, එවිට ඔවුන්ගේ කාර්යක්ෂමභාවය, ඒ වාගේම ව්‍යුහාත්මක වශයෙන් ගත්තාම මේ සේවාවල තිබෙන වෘත්තීමයභාවයට අඩුවක් වෙනවා කියන එකයි අපේ විශ්වාසය.

ගරු කථානායකතුමනි, කාන්තා බලඇණිවල, බලකායන්වල සේවයේ නියුතු නිලධාරින් වසර ගණනාවකට පෙර මේ රටේ තිබිච්ච ඒ මහා යුද ව්‍යසනයේදී විශේෂිත වූ කැපවීම් කරන ලද නිලධාරින්. ඒ වාගේම සෙසු නිලධාරිනුත් ජාතික ආරක්ෂාව වෙනුවෙන්, මේ රටේ ඒකීයභාවය ස්ථාපිත කිරීම වෙනුවෙන් උතුරු, නැගෙනහිර සහ ලංකාව පුරාම විශේෂ රාජකාරින් කරපු කොටසක්. ඒ අය විශ්‍රාම ගිහිල්ලා දැනටත් මේ රටේ අවශ්‍යතා වෙනුවෙන් ඒ නිපුණත්වයන් හා ඒ අත්දැකීම් තුළින් විවිධ ක්ෂේත්‍රවල පෞද්ගලික මට්ටමින් කටයුතු සිද්ධ කරනවා. පසුගිය "දිට්වා" සුළි කුණාටුව වෙලාවේත් ඒ කාන්තා නිලධාරින් විශාල මෙහෙවරක් කළා. ඔවුන්ගේ ගෙවල්, ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් පැත්තක තියලා හමුදාවේ බලඇණි, ඒකක විවිධ මට්ටමින් ඒ ස්ථානවලට ගිහිල්ලා, විවිධ දිස්ත්‍රික්කවලට ගිහිල්ලා, පීඩාවට පත් වෙච්ච මහජනතාව වෙනුවෙන් උදේ, දිවා, රෑ නොබලා ඒ කටයුතු සිද්ධ කළා කියන එකත් මේ අවස්ථාවේදී කිව යුතුයි.

දැනට මේ සේවයේ සිටින අයවලුන් ගත්තොත්, එකළොස් දහස් ගණනක් නිලධාරින් සහ සෙසු නිලධාරින් සිටිනවා. ඒ වාගේම උතුරු, නැගෙනහිර පැවති ඒ අවාසනාවන්ත යුද සමයේ රාජකාරියේ යෙදී සිටියදී මියගිය සංඛ්‍යාව 53ක් වෙනවා.

ඒ වාගේම ජාතික තලයේ සහ ජාත්‍යන්තර තලයේ ක්‍රීඩා ක්ෂේත්‍රයට මේ කාන්තා බලඇණිවල සේවය කරන ත්‍රිවිධ හමුදාවේම සාමාජිකාවන් විශේෂිත වූ දායකත්වයක් ලබා දීලා තිබෙනවා. දැනට සේවයේ සිටින 140දෙනෙකු ජාතික තලයේ පදක්කම් දිනා ගත් අය වෙනවා. මේ අය ඉතාම ශක්තිමත්, දැඩි කැපවීමකින් වැඩ කරන, අත්දැකීම් බහුල අය. මේ නියෝග යටතේ අපි ගෙනැල්ලා තිබෙන විධියට ඒ අයගේ සේවා කාලය තවදුරටත් දීර්ඝ කර ගැනීම, ඔවුන්ගේ විශ්‍රාම යන වයස් සීමාව තවදුරටත් දීර්ඝ කිරීම තුළින් ආයතනික වෘත්තීයභාවය වැඩි කර ගැනීමටත්, අපේ රටටත් ජාතියටත් වැදගත් වන මේ ආයතන තුනේ; සේවා තුනේ - යුද, ගුවන් සහ නාවික හමුදාවල - කාර්යක්ෂමතාව වැඩි කර ගැනීමටත් විශේෂයෙන්ම හැකි වෙනවා කියලා අපි මේ අවස්ථාවේදී කියන්නට ඕනෑ.

ඒ වාගේම වැඩ කටයුතු සම්පාදනය කරද්දී ස්ත්‍රී පුරුෂ භේදයක් නැතිව සැලකිලිමත් විය යුතුයි කියලා ව්‍යවස්ථානුකූල ප්‍රවේශයකුත් ලබා දීලා තිබෙනවා. අපේ රජයේ, ජාතික ජන බලවේගය ප්‍රතිපත්ති වශයෙනුත් ස්ත්‍රී පුරුෂ භේදයක් නැතිව කටයුතු කරලා තිබෙනවා. මේ නියෝග අනුව ත්‍රිවිධ හමුදාවේ විශ්‍රාම ගැන්වීමට තිබෙන ප්‍රතිපත්ති එක හා සමාන වෙනවා කියන එකත් මේ අවස්ථාවේදී කිව යුතුයි.

එක්සත් ජාතීන්ගේ සාම සාධක රාජකාරිවලට යොමු වෙලා සිටින කාන්තා බලඇණිවල සේවය කරන නිලධාරිනියන් සහ සෙසු නිලයන් අපේ දේශයේ ආර්ථිකයටත් විශේෂිත වූ දායකත්වයක් ලබා දෙන බවත් මතක් කර සිටිනවා. යුද හමුදාව, නාවික හමුදාව සහ ගුවන් හමුදාව වෙනුවෙන් කරලා තිබෙන මේ සංශෝධන ඉතාම කාලානුරූපයි. මේ අවස්ථාවේදී ඒවා ඉතාම වැදගත්. මේ හරහා ත්‍රිවිධ හමුදාවේ සේවය කරන නිලධාරිනියන්ට සහ සෙසු නිලයන්ට උසස්වීම් ලබාගෙන තවත් ඉහළ තනතුරුවලට ගිහිල්ලා, තමන්ගේ වෘත්තීයභාවය තවත් වැඩි කර ගැනීමට හැකි වෙන බව අපි විශ්වාස කරනවා. අපේ ආරක්ෂක ඇමතිවරයා වශයෙන් ගරු ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තුවේදීත් දැන්වූවා, 2030 වන විට අපේ ත්‍රිවිධ හමුදාව ප්‍රතිසංස්කරණයකට ලක් කරනවා කියලා. ඉදිරියේදී ඇති විය හැකි කුමන හෝ තර්ජනවලට මුහුණ දීම සඳහාත්, වෘත්තීයභාවයෙන් උසස්, තාක්ෂණික මට්ටමෙන් උසස් සහ අත්දැකීම් බහුල හමුදාවක් නිර්මාණය කිරීම සඳහාත්. ඒ සඳහා මේ නියෝග සම්මත කර ගැනීම මහඟු පිටුවහලක් වෙනවා.

ගරු කථානායකතුමනි, "දිට්වා" සුළි කුණාටුවෙන් පස්සේ ඇති වුණු බලපෑම හමුවේ අත්‍යවශ්‍ය සේවා තවදුරටත් විධිමත්ව, නිසියාකාරව පවත්වාගෙන යාම සඳහා අත්‍යවශ්‍ය කොමසාරිස් ජනරාල්තුමාගේ මැදිහත්වීම විශේෂයෙන් අවශ්‍ය වෙනවා. දැනට පවත්වාගෙන යන "Rebuilding Sri Lanka" වැඩසටහන බිම් මට්ටමේ, ග්‍රාම නිලධාරි මට්ටමේ සිට ජාතික තලය දක්වා ඉතාම හොඳින් විධිමත්ව කරගෙන යාමේ අවශ්‍යතාව නිසා තමයි අපි මේ හදිසි අවස්ථා නියෝග තවත් දින 30කින්, නැත්නම් තවත් මාසයකින් දීර්ඝ කිරීමට ඉල්ලා සිටින්නේ. මොකද, අපට විදේශවලින් උපකරණ ලැබිලා තිබෙනවා, පාලම් ලැබිලා තිබෙනවා. ඒ පාලම් ඉතාම ඉක්මනින් නිසි පරිදි අවශ්‍යතා අනුව ඉදි කළ යුතුයි. ඒවාට අවශ්‍ය රාජ්‍ය සේවකයන් සහ විශේෂ වෘත්තීයභාවයක් සහිත ත්‍රිවිධ හමුදා ඉංජිනේරු බලකා සම්බන්ධ කර ගැනීමේ අවශ්‍යතාව තිබෙනවා. ජන ජීවිතය යථා තත්ත්වයට පත් කර ගැනීමට නොහැකි වූ, පීඩාවට පත් ජනතාව සුරක්ෂිත මධ්‍යස්ථාන 20කට වැඩි ප්‍රමාණයක තවමත් සිටිනවා. ඔවුන් වෙනුවෙන් අත්‍යවශ්‍ය සේවා නිසි පරිදි ලබා දීමේ අවශ්‍යතාවත් තිබෙනවා. ලෝක අර්බුදය හමුවේ බලපෑම් ඇති වෙලා තිබෙන්නේ යුද වැදිලා තිබෙන රටවලට පමණක් නොවෙයි; මැද පෙර දිග රටවලට පමණක් නොවෙයි. ඒ අනුව අත්‍යවශ්‍ය සේවා නිසි පරිදි කරගෙන යාම සඳහා හදිසි අවස්ථා රෙගුලාසි තවදුරටත් දික් කර ගැනීම කාලෝචිතයි කියන යෝජනාව කරමින්, මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Next, the Hon. Chaminda Wijesiri. You have eight minutes.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

[පූ.භා. 11.36]

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දිනයේ යුද්ධ හමුදා පනත යටතේ නියෝග කිහිපයක්, නාවික හමුදා පනත යටතේ නියෝග කිහිපයක්, ගුවන් හමුදා පනත යටතේ නියෝග කිහිපයක් වාගේම හදිසි නීතිය දීර්ඝ කිරීම පිළිබඳ විවාදයට තමයි අපි මේ සම්බන්ධ වන්නේ. එක පැත්තකින්, සොල්දාදුවන් රණ විරුවන් බවට පත් වෙලා මේ ආණ්ඩුව යටතේ රණ විරුවන් ඇගැයීමට ලක් කරමින්, ඔවුන්ගේ අවශ්‍යතා, ඕනෑ එපාකම් ඉටු කරන්න කටයුතු කරනවා කියන කාරණය මේ ආණ්ඩුවේ අයගේ කටවල්වලින්ම අහන්න ලැබීම ගැන සතුටු වනවා. ඉතිහාසය පුරාම රණ විරුවන්ට සොල්දාදුවෝ කියමින්, ඔවුන් විවේචනය කරමින් කටයුතු කළා. මගේ කථාව ආරම්භ කරන්න කලින් මම යම් කාරණයක් කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද උදේ ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයකට පිළිතුරු ලබා දෙමින් බලශක්ති ඇමතිවරයා කිව්වා, Trident Chemphar Limited එක ලියාපදිංචි සමාගමක් කියලා. ගරු ඇමතිතුමනි, ඔබතුමා මේක අහගන්න. ජාතික විගණන කාර්යාලය මඟින් ඉදිරිපත් කර තිබෙන 2025/2026 වාරය සඳහා ගල් අඟුරු ප්‍රසම්පාදනය පිළිබඳ විශේෂ විගණන වාර්තාවේ පිටු අංක 102හි 6.1.3 ඡේදයේ මෙසේ සඳහන් වනවා:

> "ඒ අනුව 2025/2026 කාලපරිච්ඡේදය සඳහා ලක්විජය බලාගාරය සඳහා ගල්අඟුරු මෙ.ටො මිලියන 1.5ක් සැපයීමට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලද Trident Chemphar Limited සමාගම 2025 අගෝස්තු 18 එනම් ලංසු කැඳවන දින වන විට නියමිත පරිදි ලියාපදිංචි ගාස්තු ගෙවා සමාගමෙහි ලියාපදිංචි නොවූ සැපයුම්කරුවකු බව විගණනයේදී නිරීක්ෂණය වූ අතර මෙම සැපයුම්කරුද ඇතුළත්ව. ඉතා දීර්ඝ ඇගයීම් ක්‍රියාපටිපාටියක් මඟින් සුදුසුකම් ලත් සැපයුම්කරුවන් තෝරා ගෙන තිබියදී හා ඉතා තරගකාරි අවස්ථාවක ඉහත 5.4.3.2.1 (vi) හි දැක්වෙන පරිදි ලියාපදිංචි ගාස්තු ගෙවීමේ වැදගත්කම අවධාරණය කර තිබියදීත් විධිමත් පරිදි ලියාපදිංචි ගාස්තු ගෙවා ලියාපදිංචිය සම්පූර්ණ කිරීමට අපොහොසත් වූ සැපයුම්කරුවෙකු වෙත අවස්ථාව ලබා දී තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය."

ගරු ඇමතිතුමනි, ඒ කියන්නේ විගණකාධිපතිවරියට නිරීක්ෂණය වෙලා තිබෙනවා, මේ නිශ්චිත වෙලාවේ, නිශ්චිත දිනයේදී ඔබතුමා කොන්ත්‍රාත්තුව ලබා දීපු මේ සමාගම ලියාපදිංචි වෙලා නැහැ කියලා. අපි දන්නේ නැහැ, ඔබතුමා උදේ කරපු ප්‍රකාශයයි, විගණකාධිපතිතුමියගේ මේ ප්‍රකාශයයි දෙකක් ද කියන කාරණය. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක නොවෙයි බරපතළ කාරණය.

ඊළඟට මෙහි සඳහන් වනවා, ප්‍රමාද වෙලා තමයි ලියාපදිංචියට අදාළ ලේඛන විද්‍යුත් තැපෑලෙන් එවලා තිබෙන්නේ කියලා. එහෙම ප්‍රමාද වෙලා එවන කොට එය අගෝස්තු 22වැනි දා වෙලා තිබෙනවා. ඒ වාගේම ලියාපදිංචිය තහවුරු කරන්න තවත් සමාගම් ඉල්ලා තිබියදී, ඒවාට අවස්ථාව ලබා දීලා නැහැ කියන කාරණයත් තිබෙනවා. මේකෙන් තේරෙනවා නේ, මොකක්ද මේ වෙලා තිබෙන්නේ කියලා. මේ Trident Chemphar Limited එක මුලින් ලියාපදිංචි වෙලා නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හැබැයි, පසුව ලියාපදිංචි වෙලා තිබෙනවා. එවැනි අවස්ථාවකට ඉඩ දෙන්න කියලා තවත් සමාගම් ඉල්ලන කොට, ඒකට අවස්ථාව දීලා නැහැ. ඒ නිසා මේකෙන් පැහැදිලිව පෙනෙනවා, මේක වංචාවක්, තමන්ට ඕනෑ, තමන්ට ගැළපෙන මේ ආයතනයටම මේක ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා කියන එක.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොලීසිය භාර මහජන ආරක්ෂක ඇමතිතුමා ගරු සභාවේ ඉන්නවා. එතුමාටත් අදාළ වන යෝජනා සම්මතයකුත් අද සම්මත වනවා. ඔබතුමා ඇතුළු මේ 159දෙනාටම රෙදි ඇඳගෙන අවුරුද්දට ගමට යන්න පුළුවන් හොඳම අවස්ථාව තමයි, ඔය තුන්වැනි පුටුවේ ඉන්න, මහ දවාලේ කරපු මේ දැවැන්ත,- *[බාධා කිරීම්]* ඒ ඇමතිවරයා කනෙන් ඇදලා හිරේ දමන එක. මම අහනවා, ඒක කරන්න ඔබතුමාට පුළුවන්ද කියලා. එහෙම බැහැ. මේ, හොරු අල්ලන්න ආපු උදවිය. හැබැයි, විගණකාධිපතිවරිය පෙන්වා තිබෙන මේ මහ දවාලේ කරපු දැවැන්ත මූල්‍ය වංචාව ගැන දැන දැනත් ඔබ ඒක පිරිසිදු කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කරුමය කියන්නේ, අපි මේවා කිව්වාම මේ ආණ්ඩුවේ ඉන්නවා,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

*[බාධා කිරීම්]* පව්, මම කියන්නේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා මේ කුණු ටික, මේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

එක්කෝ මුහුණු ආවරණයක් දාගෙන හරි මේවා හෝදන්න කියලායි.

ගරු හර්ෂණ නානායක්කාර ඇමතිතුමනි, එතුමන්ලා කියනවා, ජනාධිපතිතුමා ආවාම අපි භයයි ලු. අපි භය නැහැ. එතුමාට කථා කරන්න ඉඩ දීලා අපි බලාගෙන ඉන්නේ ඇයි? එතුමාගේ කථාවේදී පෙර කියමන් සහ දැන් කියමන් දෙකම එකතු කරලා මුහුණුපොතේ දමන කොට කාටද ලජ්ජාව? තමුන්නාන්සේලාට. ජනාධිපතිතුමා විපක්ෂයේ ඉන්නකොට කියපු දේවල් හා දැන් ආණ්ඩුවේ ඉඳගෙන මෙතැනට ඇවිල්ලා පැයක් තුළ කියවන දේවල්, ඒ කියන්නේ එදා කියපු ඒවා හා දැන් කියන ඒවා මුහුණුපොතේ දමන කොට අපි කෑ ගහන්න ඕනෑ නැහැ. අපි ජනාධිපතිවරයාට බාධා කරන්න ඕනෑ නැහැ. අපට වෙන්න ඕනෑ ජනාධිපතිතුමා හැමදාම පාර්ලිමේන්තු එන එක. මොකද, අවුරුදු 76ක් මේ රටේ ජනතාවට කියපු බොරු ටික, බොරුයි කියලා ඔප්පු වෙන්නේ ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා කිව්වාට පස්සේ තමයි. ඒ නිසා කවුරු හරි හිතාගෙන ඉන්නවා නම්, අනුර කුමාර මහත්මයා මෙතැනට ඇවිල්ලා කෑ ගහන කොට අපි මේ නිහඬව ඉන්නේ එතුමාට තිබෙන භයට කියලා, ඒක එහෙම නොවෙයි, එතුමාගේ නොහැකියාව, එතුමාගේ බොරු ටික, එතුමාගේ කටින්ම එළිවෙන නිසායි අපි නිහඬව ඉන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

[ගරු චමින්ද විජේසිරි මහතා]

දැන් මෙතැන තිබෙන ප්‍රශ්නය මේකයි. එදාත් පුටුවට ගහලා, මේසයට ගහලා කිව්වා, නඩු දමනවා කියලා. නඩු දමා අය කර ගන්නවා කිව්වා. විගණකාධිපතිවරිය කියනවා, මේ umpire sample එක පරීක්ෂා කරන්න තිබුණු අවස්ථාව මහ හැර කටයුතු කර තිබෙනවා කියලා. මේකෙන් මොකක්ද වෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? මේ ගනුදෙනුවේදී මේ ආයතනය ගෙනැල්ලා තිබෙන්නේ බාල ගල් අඟුරුද, නැද්ද කියන කාරණය බලාගන්න තිබුණු ඊළඟ අවස්ථාව තමයි, umpire sample එක පරීක්ෂා කිරීම. ඒක මඟ හැරලා තිබෙනවා. ඒක කර තිබෙන්නේ හිතාමතා. නඩු දමනවා කියන කාරණය දැන් ඔබතුමන්ලා කිව්වාට, නඩු දමා අය කරගන්න බැරි තැනට ඔබතුමන්ලා විසින්ම තත්ත්වය හදාගෙන තිබෙන නිසා, ජනාධිපතිතුමා මේසයට ගහලා හයියෙන් කිව්වාට ඒ කාරණයෙනුත් තමුන්නාන්සේලා බැහැර වෙලා. අන්න ඒකයි අපි කියන්නේ, මේ ගනුදෙනුවේදී දැවැන්ත වංචාවක් සිදු වෙලා තිබෙනවා කියන එක, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අපි අහන්නේ මේකයි. ඔබේ වරමට හිමි, ඔබේ වරමේ බලාපොරොත්තු ද ඔබ මේ ඉටු කරන්නේ? මම හිතන විධියට ඔබට, ඔබේ ජනාධිපතිවරයාට, ඔබේ ආණ්ඩුවට කියපු විධියට ඒ කාරණා ඉටු කරන්න තිබුණා, මේ විගණන වාර්තාව තුළ තිබෙන කාරණා සියල්ල පිළිබඳව දැන්වත් තේරුම් යනවා නම්. ගරු ඇමතිතුමනි, තමන්ගේ වෘත්තිය පවා බිල්ලට තබා ඇවිත් ජාතික ජන බලවේගය නියෝජනය කරන මේ අහිංසක, අසරණ උගතුන්ට, වියතුන්ට, බුද්ධිමතුන්ට - මේ රට බේරා ගන්න ආවාය කියන මේ උදවියට - හෙට අවස්ථාවක් තිබෙනවා, විශ්වාස භංගය නිසා. මේ විගණන වාර්තාවේ තිබෙන කාරණා රටේ මහජනතාව දැන් කියවා ඇත්තේ. ඒ සියලු කාරණා ඔප්පු වෙලා, හෙළි වෙලා තිබියදී මේ උදවියට රෙද්දක් ඇඳගෙන ගමට ගිහිල්ලා කියන්න පුළුවන්ද, "අපි අපේ වෘත්තිය අතහැර රට බේරාගන්න ගියා" කියලා? එහෙම නැත්නම් ගල් අඟුරු වංචාව කරපු කුමාරව බේරා ගන්නවා කියන කාරණයද කියන්න වෙන්නේ? තමුන්නාන්සේලාට ඔය අර්බුදය තිබෙනවා.

ඉතිහාසය පුරා පැවති සමහර ආණ්ඩුවල තිබුණු වැරදි ඒ කාලයේ හිටපු මන්ත්‍රීවරුන් ඒ ආණ්ඩුවලට ඇඟිල්ල දිගු කර පෙන්වා දී තිබෙනවා. අපේ හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමන්ලා නොබියව ඒ කාලයේ පැවති සමහර ආණ්ඩුවල තිබුණු වැරදි පෙන්වා දීලා ඒවා නිවැරදි කරගන්න උත්සාහ කළා. හැබැයි අපට පෙනෙන්නේ නැහැ, ජාතික ජන බලවේගයේ උගතුන්, වියතුන් එහෙම කරන බවක්. මේක වංචාවක්, හොරකමක් කියලා දැනගෙන ඇවිල්ලා අගේට තමන්ගේ තනතුර, තමන්ගේ උගත්කම පාවිච්චි කරලා, මේවා පිරිසිදු කරලා රටේ ජනතාවට කියන්න හදනවා, මේවා හොරකම් නොවෙයි, වංචා නොවෙයි, දූෂණ නොවෙයි කියලා. හැබැයි, විගණකාධිපතිතුමිය කියනවා, මේක මහ දවාලේ කරපු දැවැන්ත වංචාවක් කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Chaminda Wijesiri, your time is up.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඉක්මනින් කථාව අවසන් කරනවා.

බරපතළම කාරණය මෙයයි. දැන් මේ අය හදිසි මිලදී ගැනීම් යටතේ මෙට්‍රික් ටොන් ලක්ෂ තුනක් ගේන්න හදනවා. මේ මෙට්‍රික් ටොන් ලක්ෂ තුන ගෙන්වන්න දෙන සමාගම සම්බන්ධව විගණනයෙන් කියා තිබෙන්නේ කුමක්ද? අවශ්‍ය කැලරි ප්‍රමාණයට අඩුවෙන් ලබා දෙන, ඒ කියන්නේ එක හොරකමක් කරලා ඉවරයි. ඒ හොරකම අතරතුර තවත් මෙට්‍රික් ටොන් ලක්ෂ තුනක් ගෙන්වන්න දෙන්න හදන්නේ පිළිගෙන නැති, ඒ වාගේම ලියාපදිංචිය නැති, ඒ වාගේම නිශ්චිත ප්‍රමිතියෙන් තොර - ගෙන්වා තිබෙන බාල ගල් අඟුරුවලටත් වඩා - බාල ගල් අඟුරු ගෙන්වන සමාගමකට. එතකොට හොරකම් දෙකයි. එක හොරකමක් කරලා එය එළිවෙලා තිබියදී නැවත මෙම සමාගමෙන් ටෙන්ඩර් කැඳවා තිබෙන්නේ ගල් අඟුරු ලබා දීමට එම සමාගම නුසුදුසුයි කියද්දීමයි.

අපි අහන්නේ මේකයි. අපි කියන නිසා නොවෙයි, විගණකාධිපතිතුමිය කියන නිසාවත් මේ ගැන අවධානය යොමු කරන්න. ඒ නුසුදුසු සමාගමට හදිසි මිලදී ගැනීම් සඳහා ටෙන්ඩර් එක ලබා දීමට තමුන්නාන්සේලා කටයුතු කරනවා. මෙහෙම කරන්නේ වෙන මොකුත් නිසා නොවෙයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බාල ගල් අඟුරු ගෙනැල්ලා ඩීසල් බලාගාරත් පවත්වා ගෙන යනවා. ඒ දෙකෙන්ම ගසා කන වැඩ පිළිවෙළක්, හොරකමක් මේ ජාතික ජන බලවේගයේ උගතුන්, වියතුන් පාවිච්චි කරලා මේ ඉදිරි පෙළේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

නැවතත් කරනවාය කියන කාරණය තමයි මට කියන්න තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

බොහොම ස්තුතියි.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Minister?

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා පැනයක් යොමු කළා, ඩොලර් 5,000 ගෙවීමේ ප්‍රමාදයක් ගැන. විපක්ෂ නායකතුමා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ යොමු කරන ලද ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේදී මම මේ සභාවට ඒ සම්බන්ධයෙන් පැහැදිලි උත්තරයක් දුන්නා. ඒ අනුව, 2025.08.18වැනි දින ගල් අඟුරු සමාගමේ ගිණුමට ඩොලර් 5,000ක තැන්පත් කිරීමක් කර තිබෙනවා. ඒක banks හරහා එනකොට විනිමය අනුපාතය අනුව ඩොලර් 4,980ක් විධියට තැන්පත් වෙලා තිබෙන්නේ. එතැන ඩොලර් 20ක් අඩු වෙලා තිබෙනවා. ඒකත් 2025.08.22වන දා වනකොට තැන්පත් කර තිබෙනවා. 2025.08.14වන දා වනකොට Cabinet Appointed Tender Board එකෙන් මෙම සැපයුම්කරු සුදුසුකම් ලබා තිබෙනවා කියලා පැහැදිලිව, ලිඛිතව දැනුම් දෙමින්, "දැන් ඔබ ඒ සඳහා සුදුසුයි" කියලා දන්වා තිබෙනවා. ඊට පසුව කොන්දේසි අනුව තිබෙන්නේ එසේ දැනුම් දුන් විගස මේ ඩොලර් 5,000 තැන්පත් කරන්න ඕනෑය කියන කාරණයයි. ඒ හැරෙන්න දින

වකවානුවක් නැහැ. හැබැයි, ඊළඟ ලංසු කැඳවීමට - bidding එකට - ප්‍රථම එම මුදල ගෙවන්න ඕනෑ. ඒ අනුව ඊළඟ ලංසු කැඳවීමට ප්‍රථම මේ කටයුත්ත කර තිබෙනවා. ඒ කියන්නේ, ලංසුව ලබා දීමට ප්‍රථම ඩොලර් 5,000 ගෙවීම සම්පූර්ණ කරන්න ඕනෑය කියා තමයි කොන්දේසිවල තිබෙන්නේ. ඒ අනුව එම කටයුතු කර තිබෙනවා. මම හිතන විධියට, ඒක හරියට වුණාද, නැද්ද කියලා COPE එකේදී නිරීක්ෂණය කරගන්න පුළුවන් වෙයි. එම නිසා මේ නිරීක්ෂණ සියයට 100ක්ම තීරණ හෝ චෝදනා වෙන්න විධියක් නැහැ. ඒ අනුව එම නිරීක්ෂණයට පැහැදිලිවම අපි පිළිතුරක් දුන්නා. ඒක තමයි නැවතත් අපි කිව්වේ. මොකද, ලංසු ලේඛන ඉදිරිපත් කරන විට ලියාපදිංචි ගාස්තුව ගෙවා තිබෙන්න ඕනෑ. ඒක තමයි කොන්දේසිය. ඒක අනිවාර්යයෙන්ම කර තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister, that is an adequate clarification.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා, මිනිත්තු භාගයක් දෙන්නම්. පොඩි clarification එකක් විතරක් කරන්න; debate එකකට යන්න බැහැ. Clarification එකක් කරගන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු ඇමතිතුමනි, අපි දන්නා විධියට ලියාපදිංචි සමාගම්වලට පමණක් මේක දෙන්න තමයි නිවේදනය දැම්මේ. එතකොට ඒක තමයි පළමුවෙනි කොන්දේසිය. ඒ කියන්නේ, ලියාපදිංචි සමාගම් පමණයි මේකට කැඳවිය හැක්කේ. තමුන්නාන්සේලා 2025.08.18වැනි දා වෙනකොට දන්නවා, මේ සමාගම ලියාපදිංචි වෙලා නැහැ කියලා. ඒ නිවේදනයේ දාලා 18වැනි දා ඒ සමාගම මේ ටෙන්ඩරය ඉල්ලුම් කළාම එය ලියාපදිංචි නොවුණු සමාගමක් කියලා දැනගෙනත් ඒක දුන්නාට පසුව ලියාපදිංචිය නැහැ කියලා තවත් සමාගම් ඒ ටෙන්ඩරය ඉල්ලුම් කරනකොට ඒවාට ඒක නොදෙන්නත් හේතුව මොකක්ද කියලා කියන්නකෝ, ගරු ඇමතිතුමනි.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
2025.08.14වැනි දා වෙනකොට,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister, we are not going into a debate on this. You just clarify it within 15 seconds, please.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
2025.08.14වැනි දා වෙනකොට Tender Board එක විසින් ලිඛිතව දැනුම් දී තිබෙනවා, මේ සැපයුම්කරු ලියාපදිංචි වෙලා තිබෙනවාය කියලා. එතකොට ලියාපදිංචි වීමට ප්‍රථම ඩොලර් 5,000 ගෙවන්න ඕනෑ නැහැ. එහෙම කොන්දේසියක් මේකේ නැහැ. ලියාපදිංචි වීමෙන් පසුව තමයි ඒ මුදල ගෙවන්න ඕනෑ. ලියාපදිංචි වීම 2025.08.14වැනි දා කරලා තිබෙනවා. *[බාධා කිරීමක්]* නැහැ, මෙහෙමයි. දින වකවානු එක්ක කථා කරන්න, ගරු මන්ත්‍රීතුමනි. *[බාධා කිරීමක්]* නිකම් කරුණු කිව්වාට වැඩක් නැහැ. 2025.08.14වැනි දා වෙනකොට මේ සැපයුම්කරු ලියාපදිංචි වෙලා තිබෙන්නේ. එතකොට ඔහුට eligibility එක තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Ananda Wijepala, please. You have 13 minutes.

[පූ.භා. 11.49]

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනා සම්මතය අනුව හදිසි නීතිය දීර්ඝ කිරීම පිළිබඳව වාගේම යුද්ධ හමුදා පනත, නාවික හමුදා පනත සහ ගුවන් හමුදා පනත යටතේ ගෙනෙන නියෝග අනුව ඒවායේ වගන්ති කිහිපයක් සංශෝධනය කිරීම සම්බන්ධයෙනුත් කථා කරනවා. මුලින්ම, මේ විවාදයේදී අදහස් දක්වන්න මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම ත්‍රිවිධ හමුදාවට අදාළ වන පනත්වල වගන්ති කිහිපයක් සංශෝධනය කිරීමට ඉදිරිපත් කිරීම හරහා ත්‍රිවිධ හමුදාවට සුවිශේෂී වාසි කිහිපයක් සැලසෙනවා. ඒ අනුව විශේෂයෙන් යුද හමුදා සේවය ඇතුළු ත්‍රිවිධ හමුදාවේ කාන්තා නිලධාරිනියන්ගෙන් සමන්විත අනෙකුත් සියලු නිලධාරීන්ගේ පුහුණුව සඳහා යන වියදම යම් ප්‍රමාණයකට ඉතුරු කර ගැනීමට හැකියාවක් ලැබෙනවා. මොකද, මෙහිදී වයස් කාණ්ඩ ප්‍රමාණයත් සංශෝධනය කර තිබෙනවා. ඒ අනුව කාන්තා නිලධාරිනියන්ව තවදුරටත් සේවයේ නියුක්ත කරවා ගැනීමට ඔවුන්ට ඉඩකඩ ලැබෙනවා. විශේෂයෙන්ම ත්‍රිවිධ හමුදාවට නවක නිලධාරිනියන් පුහුණු කිරීම වෙනුවෙන් විශාල පිරිවැයක් දරනවා. ඒ පිරිවැය අවම කර ගැනීම සඳහා මේ මඟින් ඉඩකඩ සැලසෙනවා. යුද හමුදාවට, නාවික හමුදාවට, ගුවන් හමුදාවට - ත්‍රිවිධ හමුදාවට - නිපුණතාවක්, දක්ෂතාවක්, හැකියාවක් තිබෙන නිලධාරිනියන්ගෙන් අමතර වසර 5ක සේවාවක් ඉදිරියටත් ලබා ගැනීමට මේ හරහා හැකියාව ලැබෙනවා. ඒ අනුව සේවා පළපුරුද්දක් සහිත නිලධාරීන් වාගේම කාර්යක්ෂම සේවාවක් ත්‍රිවිධ හමුදාවට ලැබෙනවා මෙන්ම නවක නිලධාරීන් පුහුණු කරලා ගෙනෙන්න යන වියදමෙන් යම් ප්‍රමාණයක් අඩු වෙනවා. ඒ වාගේම, විශේෂයෙන්ම ත්‍රිවිධ හමුදාවට වෘත්තීය නිපුණතා, දක්ෂතා තිබෙන නිලධාරිනියන්ගේ සේවය ලබා ගැනීම මෙහිදී විශේෂ අවස්ථාවක් හැටියට දකින්න පුළුවන්. ඒ වාගේම ක්‍රීඩා කෞශල්‍යය පැත්තෙනුත් ගත්තාම, ඒ සඳහා පුහුණුකාරිනියන්ගේ හිඟතාවක් තිබෙනවා. මේවා සමනය කර ගැනීමටත් මෙම අවස්ථාව ප්‍රයෝජනවත් වෙනවා. විශේෂයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙනුත් සහතික කර තිබෙන ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ සමානාත්මතාව අද ගෙනෙන මේ නියෝග හරහා තවදුරටත් ස්ථාපිත වෙනවා. ඒ, මෙමඟින් පිරිමි නිලධාරීන්ට තිබුණු වයස් සීමාවන්ම කාන්තා නිලධාරිනියන්ට සලසා දීම හරහායි.

[ගරු ආනන්ද විජේපාල මහතා]

විශේෂයෙන්ම මහජන ආරක්ෂක ආඥාපනතේ විධිවිධාන අනුව හදිසි නීතිය තවදුරටත් දීර්ඝ කිරීමේ අවශ්‍යතාව අද වනකොට පැන නැඟිලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊට හේතුව ඔබතුමාත් දන්නවා. පසුගිය නොවැම්බර් 27වැනි දා ඇති වුණු "දිට්වා" සුළි කුණාටුව නිසා ඇති වුණු ආපදා තත්ත්වය හේතුවෙන් විශාල පිරිසක් පීඩාවට පත් වුණා. විශේෂයෙන් ලක්ෂ 22කට අධික ජනතාවක් එයින් පීඩාවට පත් වුණා. ඔවුන් නැවත පදිංචි කිරීම සහ යථාවත් කිරීමේ කාර්යය තවදුරටත් සිද්ධ වෙමින් පවතිනවා. මේ කාර්යයන් වඩාත් සක්‍රියව, ශක්තිමත්ව, කාර්යක්ෂමව සිදු කර ගැනීම සඳහාත්, මේ සේවාවල නියුතු නිලධාරින්ගේ සේවාව පහසු කිරීම සඳහාත් මේ පනතේ විධිවිධාන තවදුරටත් අවශ්‍යව පවතිනවා. විශේෂයෙන් අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයාගේ කාර්යභාරය තවදුරටත් පවත්වා ගැනීම අවශ්‍ය වෙනවා. හදිසි නීති රෙගුලාසි හරහා සමහර නියෝග ක්‍රියාත්මක වෙලා තිබෙනවා. විශේෂයෙන් "දිට්වා" සුළි කුණාටුව නිසා ඇති වූ ආපදා තත්ත්වයට සහන සැලසීම සඳහා විදේශීය වශයෙන් ලැබෙන ආධාර උපකාර සඳහා විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද ඉවත් කරලා, ඒ භාණ්ඩ මේ රටට ගෙන්වා ගැනීම සඳහාත් මේ හදිසි නීති රෙගුලාසි උපයෝගි වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා කිව්වා වාගේම ඔබතුමාත් දන්නවා, තවමත් සුරක්ෂා මධ්‍යස්ථාන 29ක් පවත්වාගෙන යන බව. ඒවායේ යම් පිරිසක් ඉන්නවා. ඔවුන් නැවත පදිංචි කිරීමේ කාර්යය ඉෂ්ට කරන්න තිබෙනවා. "දිට්වා" සුළි කුණාටුව නිසා ඇති වුණු ආපදා තත්ත්වයට ඍජුව මුහුණ දීම සඳහා රජයක් හැටියට අපි ගෙන යන ඉතාම ශක්තිමත් වැඩ පිළිවෙළ ගරු ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයට පත් කළා. එම වැඩකටයුතු කාර්යක්ෂමව සිදු වෙමින් පවතිනවා. විශේෂයෙන්ම රුපියල් 25,000 දීමනාව සහ රුපියල් 50,000 දීමනාව, කෘෂි කාර්මික වගාවන්ට සිදු වුණු හානි පූරණය කිරීම, අපනයන කෘෂිකර්ම ක්ෂේත්‍රය, ධීවර ක්ෂේත්‍රය, සත්ව පාලන ක්ෂේත්‍රය ඇතුළු ඒ සියල්ලටම ගරු ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළ පරිදිම ආධාර මුදල් කඩිනමින් ලබා දෙමින් ඉන්නවා. ඒවා වඩාත් කාර්යක්ෂම කරන්න මේ අවස්ථාවේදී මෙම හදිසි නීති රෙගුලාසි උපයෝගි වෙලා තිබෙනවා.

විශේෂයෙන් නිවාස වාගේ වැඩ පිළිවෙළක් ක්ෂණිකව ක්‍රියාත්මක කරන්න බැහැ. ඔවුන් සඳහා සුදුසු ඉඩම් තෝරා ගැනීම සහ ඔවුන් සිටි ස්ථානවලම නැවත පදිංචි කිරීම ගැන සොයා බැලිය යුතුයි. එහි සුවිශේෂත්වයක් තිබෙනවා. අපේ රජයේ විශේෂත්වය තමයි එම වැඩසටහන පැලැස්තර විසඳුමක් නොවී තිරසාර විසඳුමක් බවට පරිවර්තනය කිරීම. තිරසාරතාව එම වැඩසටහන තුළ තිබෙනවා. අපි විශේෂයෙන්ම NBRI එක හරහා සහතිකයක් ලබාගෙන නාය යෑමට ගොදුරු නොවන ස්ථාන තෝරා ගැනීම කෙරෙහි අවධානය යොමු කරලා තිබෙනවා. ඒ ගැන විශේෂ අවධානය යොමු කරලා තිබෙන්නේ ජන ජීවිත සුරක්ෂා කිරීම සඳහායි. නැවත එවැනි ආපදා තත්ත්වයකට මුහුණ නොදෙන ස්ථානයක ඔවුන් පදිංචි කිරීමේ අවශ්‍යතාව තමයි අපට තිබෙන්නේ. එම නිසා තමයි විශේෂයෙන්ම ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය - NBRI එක - හරහා සුදුසු ස්ථාන හඳුනා ගන්නේ. අවදානම්, මැදි අවදානම් සහ අධි අවදානම් කලාප හඳුනාගෙන ඔවුන් සුදුසු ස්ථානවල නැවත පදිංචි කිරීමේ වැඩසටහන මේ වනකොට ක්‍රියාත්මක වෙමින් පවතිනවා.

පූර්ණ හානියට පත් වූ නිවාස 5,866ක් ඇති බව හඳුනාගෙන තිබෙනවා. ඒ පවුල් 5,866 වහාම පදිංචි කරන්න අවශ්‍ය මූලික පියවර අපි අරගෙන තිබෙනවා. පූර්ණ හානි වුණු නිවසක් වෙනුවෙන් රුපියල් ලක්ෂ 50ක ආධාරයක් ලබා දෙනවා. එහි පළමු වාරිකය විධියට රුපියල් ලක්ෂ 20ක් ලබා දෙනවා. එම ආධාර මුදල් ලබා දීම අපි ආරම්භ කරලා තිබෙන්නේ. සමහර අයට ඉඩම් තෝරා ගැනීමේදී ගැටලු පැන නැඟිලා තිබෙනවා. එම ගැටලු විසඳා ගනිමින් කාර්යක්ෂමව එම වැඩ පිළිවෙළ දියත් වෙලා තිබෙනවා. මම හිතන විධියට, ඉතිහාසයේ කිසිම රජයක් ආපදා තත්ත්වයකදී නොකළ ආකාරයේ සහන වැඩ පිළිවෙළක් "දිට්වා" සුළි කුණාටුව පැවති අවස්ථාවේදී අපේ රජය විසින් ක්‍රියාත්මක කළා වාගේම එම වැඩ පිළිවෙළ ජනතාවට සහන සැලසෙන ආකාරයෙන් ශක්තිමත්ව ක්‍රියාත්මක කරන්නත් පියවර අරගෙන තිබෙනවා. නමුත්, හැම වෙලාවේදීම විපක්ෂයේ සමහර පිරිස් ඒවාට එරෙහිව යම් යම් ප්‍රකාශ අවස්ථාවාදී විධියට සිදු කරනවා. විපක්ෂයට සාධනීය විවේචනයක් කර ගන්න බැරි වුණාම අපි ප්‍රකාශයට පත් කරලා තිබෙන යම් වැඩ පිළිවෙළක් පිළිබඳව වාගේම මහ ජනයාට සහන සැපයෙන, මහ ජනයාට වඩා සාධනීය ලෙස බලපාන කාරණා ඇත්තටම පටු විධියට විග්‍රහ කරමින් විවේචනය කිරීමක් සිදු කරන බව තමයි අපට දකින්න ලැබෙන්නේ. නමුත්, අපි අත්‍යවශ්‍ය සේවා පවත්වා ගැනීම ශක්තිමත්ව සිදු කරනවා. ඔවුන්ගේ ජන ජීවිතයට කිසිදු පීඩාවක් ඇති වෙන්න අපි ඉඩ දෙන්නේ නැහැ.

"දිට්වා" සුළි කුණාටුව රට අභ්‍යන්තරයේ ඇති වුණු ස්වාභාවික ව්‍යසනයක්. එම ව්‍යසනය වෙලාවේදී මෙන්ම පශ්චාත් ආපදා අවධියේදීත් ඒක හොඳින් කළමනාකරණය කර ගැනීම සඳහා ගත හැකි සෑම පියවරක්ම ආණ්ඩුව විසින් ගත්තා. ජන ජීවිත ගැන සුවිශේෂ අවධානය යොමු කළා. ඔවුන් නැවත පදිංචි කිරීම, ප්‍රතිෂ්ඨානගත කිරීම කියන කාරණා සඳහා ශක්තිමත් සැලැස්මක් සකස් කරලා තිබෙනවා. ඒ සඳහා මූල්‍ය පහසුකම් සපයන්න මුදල් වෙන් කරලා තිබෙනවා. විශේෂයෙන් රුපියල් බිලියන 500ක් ඒ වෙනුවෙන් වෙන් කරලා තිබෙනවා, 2026 අය වැය ලේඛනයට පරිබාහිරව. ඒක ප්‍රබල කාරණාවක්. මේ රටේ ජන ජීවිත පීඩාවට පත් වන හැම අවස්ථාවකදීම ඔවුන් සුරක්ෂා කිරීම වෙනුවෙන් අපි මැදිහත් වෙලා තිබෙනවා. ඒ වෙනුවෙන් අපි කටයුතු කරමින් ඉන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ විතරක් නොවෙයි, මැද පෙරදිග පවතින යුද තත්ත්වය හේතුවෙන් අපි යම් යම් සේවා ශක්තිමත්ව පවත්වාගෙන යන්න අවශ්‍යයි. දැන් ඉන්ධන අර්බුදයක් ඇති වෙලා තිබෙනවා. කලාපීය බොහෝ රටවලට ඒ ඉන්ධන අර්බුදය බලපා තිබෙනවා. ඉන්ධන අර්බුදය නිසා විදුලි බලය සම්බන්ධයෙනුත් අර්බුද නිර්මාණය වෙලා තිබෙනවා. සමහර විට ගෑස් මිල ගණන් ඉහළ යාමත් සිදු වෙයි. මොකද, ලෝක වෙළෙඳ පොළේ මිල ගණන් ඉහළ යනකොට ඊට සාපේක්ෂව අපේ භාණ්ඩ හා සේවාවල මිල ගණන් ඉහළ යාම සාමාන්‍ය තත්ත්වයක්. හැබැයි, විපක්ෂයේ සමහර කණ්ඩායම් මිල ගණන් ඉහළ යාම පවා දකින්නේ ඇත්තටම පටු, ද්වේෂ සහගත විධියට. නමුත්, ජනතාව මත පීඩාවක් පැටවෙනකොට ඉස්සෙල්ලාම අපි තමයි කලබල වෙන්නේ. ජනතාවට යම් පීඩාවක් දැනෙන හැම වෙලාවේදීම අපි ජනතාවගේ පැත්ත ගන්නවා. ඒ නිසා තමයි ගරු ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවටම ඇවිල්ලා මැද පෙරදිග තිබෙන අර්බුදකාරී තත්ත්වය හමුවේ ඇති වන ගැටලුව කළමනාකරණය කරන්න රට තුළ ගත හැකි පියවර රාශියක් පිළිබඳව මේ ගරු සභාවට කරුණු අනාවරණය කළේ. විශේෂයෙන් ඉලක්කගත කණ්ඩායම් තෝරා බේරා ගෙන ඔවුන්ගේ ජන ජීවිතය ශක්තිමත් කිරීම අවශ්‍ය වනවා. අඩු ආදායම්ලාභී පවුල් තෝරා ගැනීමේදී යම් අඩුපාඩු තිබුණා වුණත්, දැනට තිබෙන පද්ධතිය තුළ ඉන්න අස්වැසුමලාභී පවුල් සඳහා ලබා දෙන දීමනාව ඉදිරි මාස කිහිපය තුළ වැඩි කරලා ලබා දෙන්න අපි කටයුතු කර තිබෙනවා. ඒ වාගේ ඉලක්කගත කණ්ඩායම් වෙනුවෙන්, පීඩාවට පත් වන කණ්ඩායම් වෙනුවෙන් මැදිහත් වීම රජයේ වගකීමක්කොට සලකමින් ඒ කාරණා අපි මේ වනකොට ඉෂ්ට කරලා තිබෙනවා.

ඒ වාගේම ධීවර ජනතාවට - බහුදින ධීවර යාත්‍රා ඇතුළු - සහන සැලසීමේ වැඩසටහනක් ඒ තුළම තිබුණා. ඒ වාගේම ඒකක 90 දක්වා පාවිච්චි කරන විදුලි පාරිභෝගිකයන්ට සහන සැලසීම තිබෙනවා. මොකද, අඩු ආදායම් ලබන පවුල් තමයි යම් අර්බුදයකදී පීඩාවට පත් වෙන්නේ. මේ ඉලක්කගත කණ්ඩායම් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් මේ වන විට රජයක් හැටියට ගත හැකි සෑම තීන්දුවක්ම අපි අරගෙන තිබෙනවා. මේ අර්බුදය කළමනාකරණය කර ගන්න රට තුළ ගත හැකි ඉහළම විසඳුම්, එළදායී විසඳුම් සියල්ල අරගෙන තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය දවසක ඉන්ධන මිල ඉහළ ගියත් ඒ ඉහළ යන ඉන්ධන මිල තුළ විශේෂයෙන් ඩීසල් ලීටරයකට රුපියල් 100ක සහනාධාරයක් රජය දරමින් ඉන්නවා. පෙට්‍රල් ලීටරයකට රුපියල් 20ක සහනාධාරයක් දරමින් ඉන්නවා. මේ තුළ රටේ සමස්ත ජනතාවට යම් පීඩාවක් වන එක වළක්වා ගැනීම සඳහා කටයුතු කරනවා. මේ වාගේ අර්බුදකාරී තත්ත්වයන්වලදී ජනතාව පීඩාවට පත් වෙන එක අනුමත කරන්න බැරි වුණත්, රජයක් හැටියට ඒක කළමනාකරණය කරන්න අපට හැකියාවක් තිබෙනවා. විශේෂයෙන්ම එහෙම හැකියාවක් අපි ලබා ගත්තේ අපි බලයට පත් වෙනකොට තිබුණු ඒ බංකොලොත්, බිඳ වැටුණු ආර්ථිකය නැවත ශක්තිමත් කරලා, යථාවත් කරලා වසරක් වැනි කාලයක් තුළ දමපු පදනම නිසායි. එවැනි පදනමක් දාලා නොතිබෙන්න "දිට්වා" සුළි කුණාටුව තුළත්, මැද පෙරදිග කලාපයේ යුද තත්ත්වය හේතුවෙන් ඇති වෙලා තිබෙන මේ අර්බුදයන් හේතුවෙන් රට තුළට බලපාන මිල උච්චාවචනයෙන් ඇති වෙන පීඩාවන් වළක්වා ගැනීමටත් හැකියාව ලැබෙන්නේ නැහැ. හැකියාව ලැබුණේම වසරක් වැනි කෙටි කාලයක් තුළ දැවැන්ත ආර්ථික ස්ථාවරත්වයක් ගොඩනඟා ගැනීම හේතුවෙනුයි.

රුපියල් බිලියන 500ක් එදා "දිට්වා" සුළි කුණාටුවට අදාළව සහන සැලසීම සඳහා වෙන් කළා වාගේම, අර්බුදයක් පවතින මේ අවස්ථාවේ පීඩාවට පත් වෙච්ච ඉලක්කගත කණ්ඩායම වෙනුවෙන් යම් මිල සහනයක් ලබා දීම සඳහා බිලියන 100ක් වෙන් කරන්න අපිට හැකියාව ලැබිලා තිබෙනවා. ඒ සියලු හැකියාවන් ලැබුණේ ආර්ථික වශයෙන් ශක්තිමත් පදනමක් අවුරුද්දක් වැනි කෙටි කාලයක් තුළ දමා ගැනීමට අපට පුළුවන් වුණු නිසායි. හැබැයි, ජාත්‍යන්තර වශයෙන් ඇති වෙලා තිබෙන මේ තත්ත්වය හේතුවෙන් ඉහළ යන මිල ගණන් සම්බන්ධයෙන් විපක්ෂයේ අය දරන අදහස් හා විවේචන බැලුවාම, මේ රටේ සාමාන්‍ය මිනිස්සුන්ට තේරෙන දේවත් විපක්ෂයේ සමහර අයට තේරෙන්නේ නැහැ කියලා තමයි අපිට කියන්න තිබෙන්නේ. මොකද, මේ මිල ගණන් කලාපයේ සියලු රටවලට බලපා තිබෙනවා. මේ මිලෙහි උච්චාවචනය ඉදිරියටත් සිද්ධ වෙන්න තිබෙනවා. අපිට පුළුවන් වෙලා තිබෙන්නේ මේක කළමනාකරණය කරන්නයි. ඒ කළමනාකරණය කරන කාර්යය අපි දිගින් දිගටම කරනවා. අපි ජනතාවගේ පැත්තේ හිටගෙන ඉන්නවා. ජනතාවාදී ආණ්ඩුවක් හැටියට හිතමින් ඉදිරියටත් අපි කටයුතු කරනවා. මොකද, අපි දන්නවා ජනතාව පීඩාවට පත් වෙන අවස්ථාවලදී ඒ වෙනුවෙන් මැදිහත් වෙන්න අවශ්‍යයි කියලා. ඒ නිසා තමයි ජනතාවාදීව හිතලා මතලා මේ සමස්ත ආර්ථික කළමනාකරණ ක්‍රියාවලියට අප යොමු වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන් මට කියන්න තිබෙන්නේ මේකයි. "දිට්වා" සුළි කුණාටුව වේවා, රටෙන් පරිබාහිරව සිදු වන වෙනත් වෙනත් සිද්ධීන් වේවා, ඒවා හරහා ජනතාවට යම් පීඩාවක් සිදුවන්නේ ද, ඒ සියලු පීඩාවන් වැළැක්වීම සඳහා ගත හැකි උපරිම ක්‍රියාමාර්ග ගන්න ජාතික ජන බලවේගය රජය කිසිසේත්ම පසුබට වන්නේ නැහැ.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Kaveenthiran Kodeeswaran. You have eight minutes.

[பி.ப. 12.02]

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, பொதுமக்கள் பாதுகாப்புக் கட்டளைச் சட்டத்தின் கீழான தீர்மானம், தரைப்படைச் சடத்தின் கீழான ஒழுங்குவிதிகள் போன்ற முக்கிய விடயங்கள் பற்றி இன்றைய தினம் இச்சபையில் கருத்துரையாடப்படுகின்றன. GMOA எனப்படுகின்ற அரச வைத்திய அதிகாரிகள் சங்கத்தினரால் நடாத்தப்படுகின்ற பணிப்பகிஷ்கரிப்பு இன்று நாட்டில் பாரியதொரு பிரச்சினையாகக் காணப்படுகின்றது. பொது மக்களுக்கு குறிப்பாக, ஏழை மக்களுக்குப் பாதிப்பை ஏற்படுத்துகின்ற ஒரு செயற்பாடாகவே நாங்கள் இதனைப் பார்க்கின்றோம். இந்தச் செயற்பாடானது, எங்களது மக்களுடைய உயிருடனும் வாழ்க்கையுடனும் விளையாடுகின்ற ஒரு செயற்பாடாகத்தான் பார்க்கப்படுகின்றது. அரச வைத்திய அதிகாரிகள் தங்களுக்குத் தேவையான விடயங்களை சுகாதார அமைச்சினூடாகப் பெற்றுக்கொள்ள முடியும். எனினும், அவர்கள் பொது மக்களைப் பகடைக்காயாக வைத்து தங்களது தேவைகளை நிறைவேற்றிக்கொள்ள முனைவதை நாங்கள் வன்மையாகக் கண்டிக்கின்றோம். அவர்கள் பொது மக்களைக் கேடயமாக வைத்துப் போராடுவதை நிறுத்திவிட்டு, தங்களுக்குத் தேவையானவற்றை சுகாதார அமைச்சரிடமோ அல்லது அரசாங்கத்திடமோ அழுத்தங்களைக் கொடுத்துப் பெற்றுக் கொள்ள வேண்டும்.

இன்று இந்த நாட்டில் இருக்கின்ற நோயாளிகள் மிகவும் பாதிப்புக்குள்ளாகி இருக்கின்றார்கள். அவர்கள் தங்களது உயிரைக் கையில் பிடித்துக்கொண்டு செல்கின்ற நிலைமை காணப்படுகின்றது. மாதத்துக்கு ஒரு முறை 'கிளினிக்' சேவைக்கு வருகின்றவர்கள், அச்சேவையைப் பெற்றுக் கொள்ள முடியாமல் திரும்பிச் செல்கின்ற நிலை காணப்படுகின்றது. குறிப்பாக, இன்று நாட்டில் இருக்கின்ற பொருளாதார நெருக்கடி, எரிபொருள் தட்டுப்பாடு என்பவற்றுக்கு மத்தியிலும் பல கிலோமீற்றர் தூரம் பயணித்து வைத்தியசாலைக்கு வரும் ஏழை மக்கள் அந்தச் சேவையைப் பெற்றுக்கொள்ள முடியாமல் திரும்பிச் செல்கின்ற துர்ப்பாக்கிய நிலை காணப்படுகின்றது. எனவேதான் நாங்கள் GMOAஇன் இந்தச் செயற்பாட்டை வன்மையாகக் கண்டிக்கின்றோம்.

கடந்த வருடம் திருக்கோவில் ஆதார வைத்தியசாலையில் ஓர் உயிர் அநியாயமாகப் பறிபோனது. அதற்குக் காரணம், GMOA மேற்கொண்ட தவறான செயற்பாடுதான். இதற்கு யார் பொறுப்புக்கூற வேண்டும்? அவர்கள் அரசாங்கத்தின் செயற்பாடுகளில் அல்லது சுகாதார அமைச்சின் செயற்பாடு களில் மூக்கை நுழைக்கத் தேவையில்லை. தேவையென்றால், அவர்களுக்கு ஆலோசனை வழங்குவதற்கான செயற்பாட்டை முன்னெடுக்க வேண்டுமென இந்தச் சபையினூடாகக் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

மட்டக்களப்பு போதனா வைத்தியசாலையில் இருக்கின்ற radiotherapy இயந்திரம் பழுதடைந்த நிலையில் இருக்கின்றது. இதனால் cancer patients சிகிச்சை பெற முடியாத ஒரு துர்ப்பாக்கிய நிலை காணப்படுகின்றது. இந்த இயந்திரம்

[ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා]

கடந்த மாதம் பழுதடைந்து இருக்கின்றது. எனினும், அது தற்போது வரை சீர்செய்யப்படாமல் இருக்கின்றது. தூர இடங்களிலிருந்து வருகை தரும் நோயாளிகளால் இந்த சிகிச்சையைப் பெற்றுக்கொள்ளக்கூடிய நிலைமை இல்லாமையால் அவர்களது உயிர் ஊசலாடிக்கொண்டு இருக்கின்றது. இந்த இக்கட்டான கால கட்டத்தில் கொழும்புக்கோ அல்லது கண்டிக்கோ சென்று அவர்களால் சிகிச்சை பெற்றுக்கொள்ள முடியாது. ஏனெனில், அவர்களுக்கு அங்கு செல்வதற்கான வசதியென்பது மிகவும் குறைவாகவே இருக்கின்றது. தற்பொழுது, இச்சபையில் கௌரவ சுகாதார அமைச்சர் அவர்கள் இருக்கிறார். மட்டக்களப்பு போதனா வைத்தியசாலையிலுள்ள அந்த radiotherapy இயந்திரத்தை உடனடியாகச் சீர்செய்து கொடுக்குமாறு நான் மிகத் தாழ்மையாகக் கேட்டுக் கொள்கின்றேன்.

எதிர்காலத்தில் மின் கட்டணம் 53 சதவீதத்தால் உயர்த்தப்படுவதற்கான சாத்தியக்கூறு கூடுதலாகக் காணப்படுகின்றது. என்ன காரணத்துக்காக நுகர்வோர்மீது இந்தச் சுமை சுமத்தப்படப் போகின்றது என்ற கேள்வி எழுகின்றது. மின்சார சபையில் சீரான நிருவாகக் கட்டமைப்பு மற்றும் சரியான முகாமைத்துவம் இல்லாத காரணத்தால்தான் இந்தச் சுமையை மக்கள்மீது சுமத்த முனைகிறார்கள். எனவே, இதன் முகாமைத்துவத்தைச் சீர்செய்து, நுகர்வோர்மீது அந்தச் சுமையைச் சுமத்துவதிலிருந்து தவிர்ந்துகொள்ள வேண்டுமென இந்தச் சபையூடாகக் கேட்டுக் கொள்கின்றேன்.

அம்பாறை மாவட்டத்தின் ஆலையடிவேம்பு பிரதேசத்தில் இருக்கின்ற அக்கரைப்பற்று, இராமகிருஷ்ண மிஷன் கல்லூரியானது இம்முறை க.பொ.த. உயர் தரப் பரீட்சையில் மிகச் சிறந்த பெறுபேறுகளைப் பெற்றிருக்கிறது. மிகவும் வசதியற்ற நிலையில் அந்தப் பாடசாலை இருந்தாலும், இன்று 6 பேரை மருத்துவ பீடத்துக்கும் பொறியியற் பீடம் உட்பட ஏனைய பீடங்களுக்கு 80க்கும் மேற்பட்டவர்களையும் அனுப்பி இருக்கின்றது. ரமேஷ் தேசித் என்பவர் உயிரியல் விஞ்ஞானப் பிரிவில் மாவட்ட மட்டத்தில் முதலாவது இடத்தையும், தேசிய மட்டத்தில் 42ஆவது இடத்தையும் பெற்று மருத்துவ பீடத்துக்குத் தெரிவாகி இருக்கிறார். அதுமாத்திரமன்றி, திருக்கோவில் கல்வி வலயம் கிழக்கு மாகாணத்தில் மூன்றாவது இடத்தைப் பெற்றிருக்கிறது. இது பாராட்டுக்குரிய விடயமாகும்.

அத்தியாவசிய சேவையூடாக மக்களின் அடிப்படைத் தேவைகளை நிறைவேற்ற வேண்டியது அரசின் அடிப்படைக் கடமையாகும். அதற்காக அவசரகாலச் சட்டத்தை நீடிப்பதை எங்களால் ஏற்றுக்கொள்ள முடியாது. இப்போது NPP அரசாங்கத்தில் உள்ள சிலர் கடந்த காலங்களில் அவசரகாலச் சட்டத்தை எதிர்த்தார்கள். தற்பொழுது அவர்களே அவசரகாலச் சட்டத்தைத் தொடர்ந்து நீடிக்கிறார்கள். இதனை நாங்கள் ஏற்றுக்கொள்ளவில்லை; முற்றுமுழுதாக எதிர்க்கின்றோம். 'தித்வா' புயல், ஏனைய விடயங்கள் என்று நீங்கள் அவசரகாலச் சட்டத்தை நீடித்துக்கொண்டு செல்கின்றீர்கள். ஈரானில் அல்லது இஸ்ரேலில் நடக்கின்ற பிரச்சினையை வைத்து, இலங்கையில் அவசரகாலச் சட்டத்தை நீடிப்பதை எங்களால் ஏற்றுக்கொள்ள முடியாது என்பதை இந்த இடத்தில் கூறி, எனது உரையை முடித்துக் கொள்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Sunil Watagala. You have 11 minutes.

[අ.භා. 12.10]

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විවාදයට සම්බන්ධ වන වෙලාවේ විශේෂයෙන් විපක්ෂයට යම් පිළිතුරක් දීගෙන ගියොත් හොඳයි කියලා මට කල්පනා වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සභාව අවලස්සන කරන, මේ සභාව යම් යම් වචනවලින් අවලස්සන කරන මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක් ඉන්නවා. විශේෂයෙන්ම විපක්ෂයේ කීප දෙනෙක් නුසුදුසුයි කියලා හිතන වචන හැම දාමත් පාවිච්චි කරනවා. මොකක්ද චමින්ද විජේසිරි මන්ත්‍රීවරයා කිව්වේ? ආණ්ඩු පක්ෂයේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඉන්නවා කියලා කිව්වා. මොකක්ද ඒ කථාව, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? එවැනි චෝදනා අපේ ආණ්ඩු පක්ෂය වෙත එල්ල කරපු කෙනා කවුද? ඒ කථා කරපු කෙනා තමයි

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඒ කථා කරපු කෙනා තමයි තමන්ගේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ප්‍රජාතන්ත්‍රවාදයයි එදා ඒ චික්කේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කියමනක් තිබෙනවා "කක්කුස්සියක් ගිලපු එකා අත්තම්මාට පූං එකක් ගියාම 'බුදු අම්මෝ!' කියලා කෑ ගහනවා" කියලා.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

අපේ පැත්තට ඇඟිල්ල දිගු කරලා කියනවා ඉන්නවා කියලා -

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Hon. Deputy Speaker, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
What is your point of Order, Hon. (Dr.) Harsha de Silva?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කියලා මන්ත්‍රී කෙනෙකුට කියන එක එච්චර සුදුසු නැහැ. කරුණාකරලා එය හැන්සාඩ් වාර්තාවෙන් අයින් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. 'මේ සභාව වචනවලින් අවලස්සන නොකළ යුතුයි' කියන එක දෙපැත්තටම පොදු වෙන්න ඕනෑ. ඒ නිසා

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කියලා මන්ත්‍රීවරයෙකුට සඳහන් කරපු එක වැරැදියි, ගරු නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමා එහෙම කියන්න එපා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Harsha de Silva, all unparliamentary words will be removed.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Thank you, Sir.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Sunil Watagala, you may continue.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම නම් ආණ්ඩුව පැත්තට කරපු චෝදනා ගැනත් හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා හිතන්න ඕනෑ. අපේ පැත්තට කියන කොට

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Leader of the House?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ස්තුතිවන්ත වෙනවා ඔබතුමා unparliamentary words අයින් කරන්න කියපු එක ගැන. නමුත් මා ඒ සම්බන්ධයෙන් කාරණයක් දැනගන්න කැමැතියි. මේ සභාවේ ඉතාම කැත විධියට කථා කරන විපක්ෂයේ මන්ත්‍රීවරුන් දෙතුන් දෙනෙක් ඉන්නවා. ඒ අය කොයි තරම් නම් කැත විධියටද කථා කරන්නේ? නමුත්, ඔබතුමන්ලා ඒ වෙලාවට කිසිම unparliamentary කථාවක් කියන්නේ නැහැ නේ. *[බාධා කිරීමක්]* ඔබතුමාගේ අවස්ථාව නොවෙයි නේ, මන්ත්‍රීතුමා. මම නේ වෙලාව ගත්තේ. ආණ්ඩුව පැත්තේ මන්ත්‍රීවරියන්ට කැත වචනයෙන් කථා කරනවා, විපක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරු. ලේකම් මණ්ඩලය අහක බලාගෙන ඉන්නවා, ඒවා සම්බන්ධයෙන්. එක වචනයක්- *[බාධා කිරීමක්]* නැහැ, මම කියන්නේ මේකයි. විරුද්ධ පාර්ශ්වයේ වම් පැත්තේ වාඩි වෙලා ඉන්නවා එවැනි මන්ත්‍රීවරයෙක්. මම එතුමාගේ නම කියන්න යන්නේ නැහැ. එතුමා හැම දාම කුණු කථා කියනවා. ඒ සම්බන්ධයෙන් ඔබතුමන්ලා මොනවාද කරන්නේ?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Leader of the House, all such unparliamentary words will be removed.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
නැහැ, නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනිවාර්යයෙන්ම පරීක්ෂණයක් කරලා ඒවාට දඬුවම් දෙන්න ඕනෑ. ඒ සඳහා ඔබතුමන්ලාට ස්ථාවර නියෝගවල ඇති තරම් බලතල තිබෙනවා. ඔබතුමන්ලා ඒවා ක්‍රියාත්මක කරන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Leader of the House, I shall bring it to the notice of the Hon. Speaker.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
නැහැ, නැහැ, this is serious. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා දන්නවා අපි ආණ්ඩු පක්ෂය විනයගරුකව පවත්වාගෙන යන බව. මෙතැන අන්තිම වාචාල විධියට,

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

විධියට කථා කරන විපක්ෂයේ මන්ත්‍රීවරු දෙතුන්දෙනෙක් ඉන්නවා. ඒක තමයි ඇත්ත. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා ඒක දන්නවා. ඔබතුමන්ලා ඒ සම්බන්ධයෙන් කිසි දෙයක් කරන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණය සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අසූ ගණන්වල ඉඳලා කොච්චර නම් සඳහන්ව තිබෙනවාද? ස්ථාවර නියෝග 82 (2) (අ) යටතේ මෙසේ සඳහන්ව තිබෙනවා:

[ගරු බිමල් රත්නායක මහතා]

"යම් මන්ත්‍රීවරයකු විසින් දිගින් දිගටම අයෝග්‍ය ලෙස හැසිරෙන බව හෝ ස්ථාවර නියෝග උල්ලංඝනය කරමින් කටයුතු කරනු ලබන බව කථානායකවරයාගේ මතය වන්නේ නම්, පාර්ලිමේන්තුවේ කටයුතු පිළිබඳව සජීවී විකාශය වහාම අත්හිටුවනු ලබන ලෙස නියෝග කිරීමට කථානායකවරයාට හැකි ය."

මේ විධියට, දිගට දිගට සඳහන් වෙනවා ඔබතුමන්ලාට ගන්න පුළුවන් ක්‍රියාමාර්ග. ඔබතුමන්ලා ඒවා කරන්නේ නැහැ. මෙතැන තිබෙන වනචර තත්ත්වය වෙනස් කරන්න මහ ලේකම් මණ්ඩලයෙන් කිසිම සහයෝගයක්, කිසිම බලපෑමක් හෝ උපදේශයක් ලැබෙනවා කියලා මම හිතන්නේ නැහැ. අද පාර්ලිමේන්තුව විහිලුවක් වෙලා තිබෙන්නේ, මෙතැන

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

තුන් හතරදෙනෙකුට භය වෙලා කථානායකතුමායි, නියෝජ්‍ය කථානායකතුමායි, මූලාසනයට එන අනෙක් අයයි කටයුතු කරන්නේ නැති නිසා. ඒක තමයි ඇත්ත.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ඔබතුමන්ලාට ගරු කරනවා, ඔබතුමන්ලා ආණ්ඩු පක්ෂයෙන් පත් වුණු මේ පාර්ලිමේන්තුවේ ප්‍රධාන පුද්ගලයන් ලෙස. නමුත්, මේ කටයුතුවල සීමාවක් තිබෙනවා. සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා කියපු එක නොවෙයි මම කියන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා බලන්න, 77වැනි ස්ථාවර නියෝගයේ ඉඳලා ඉස්සරහට මොනවාද තිබෙන්නේ කියලා. ඔබතුමන්ලා මේවා සම්බන්ධයෙන් මොනවාද කරන්නේ? දැන් ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කියපු නිසා ඔබතුමා කියනවා, ඒ unparliamentary words අයින් කරනවා කියලා. ඔබතුමා බලන්නකෝ, සමහර මන්ත්‍රීවරු මේ සභාව කොච්චර නම් කැත කරනවාද කියලා. මම ඔබතුමාට නිසි ගෞරවය ඇතිවයි මේ කියන්නේ. 77 වැනි ස්ථාවර නියෝගයෙන් පටන් ගත්තාම, 78, 79 යන ස්ථාවර නියෝගත් බලන්න. 79 (1) හි මෙහෙම තිබෙනවා:

"බරපතළ ලෙස විනය විරෝධීව හැසිරෙන මන්ත්‍රීවරයකුට එදින රැස්වීමේ ඉතිරි කොටස අවසන් වන තෙක් පාර්ලිමේන්තුවෙන් වහා ම ඉවත් වන ලෙස කථානායකවරයා විසින් නියෝග කරනු ලැබිය යුතු අතර, ..."

මේ වාගේ කොපමණ නම් අවස්ථා ස්ථාවර නියෝගවල තිබෙනවාද? ලේකම් මණ්ඩලය එක වචනයක් කියනවාද ඒ ගැන? ඇත්තටම මම මෙහෙම කථා කරන්න නැඟිටින්නේ නැහැ. ඔබතුමා ලබා දුන්න නියෝගය අපි පිළිගන්නවා. හැබැයි, ඒක කාටත් සාධාරණ වෙන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඔබතුමාගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා, පසුගිය අවුරුද්දක කාලයේ මේ සභාවේ සිදු වුණු දේවල් අධීක්ෂණය කරන්න කියලා. අධීක්ෂණය කරලා දඬුවම් දෙන්න. Unparliamentary words ඉවත් කිරීම විතරක් නොවෙයි. මේ නිසා මේ පාර්ලිමේන්තුව නැරඹීමට එන ළමයි කොතරම් අපහසුතාවට ලක් වෙනවාද? ඊයේ මෙතැන එක මන්ත්‍රීවරයෙක් unparliamentary words කථා කළා. මම හිතන විධියට ඒ ගැන තමයි සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා උත්තර දෙන්න පටන් ගත්තේ. ඒ මන්ත්‍රීවරයා මොනවාද කිව්වේ කියලා ඔබතුමා අහන්න. ඒකයි මම ඔබතුමාට කිව්වේ. මේක reaction එකක්. එහෙම නැතුව මේක අපේ action එක නොවෙයි. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා ඒක දන්නවා. ඒ වාගේ කටයුතු කරන අය ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාගේ ආසනයට ඉදිරියෙනුත් ඉන්නවා, එතුමාගේ වම් පැත්තේත් ඉන්නවා, පිටුපසත් ඉන්නවා. ඒ ඔක්කෝම විපක්ෂයේ මන්ත්‍රීවරු. ඕනෑ නම් අපට නම් වශයෙන් කියන්නත් පුළුවන්. මම truely මේක කියන්නේ. ඇත්තටම ඔබතුමා සාධාරණ ලෙස කල්පනා කරලා බලන්න. මෙතැන ඉන්න අයගෙන් ඒ විධියට කටයුතු කරන්නේ කවුද? බැරිම තැන තමයි මම මේ කථා කරන්නේ. මට මේ tone එක එන්නේත් ඒ නිසායි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. කොහොම වුණත් මම ඔබතුමාට නිසි ගෞරවය ඇතුවයි මේ කථා කරන්නේ. මේ පාර්ලිමේන්තුව තුළ 77වැනි ස්ථාවර නියෝගය කඩලා නැද්ද? කඩලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නමුත්, ඔබතුමන්ලා මොකුත්ම කරලා නැහැ. මන්ත්‍රීතුමියලාට කුණුහරුපයෙන් බණිනවා හැමදාම. මොනවාද ඔබතුමන්ලා කරලා තිබෙන්නේ? මොනවාද ලේකම් මණ්ඩලය කරලා තිබෙන්නේ?

ඊයේ එක මන්ත්‍රීවරයෙක් නැඟිටලා අන්තිම නරක විධියට කථා කළා. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, ඒ ඔබතුමාගේ පේළිය කෙළවරේ සිටින මන්ත්‍රීවරයෙක්. අපි ඔබතුමාට ගරු කරනවා. ඔබතුමා පාර්ලිමේන්තුවට විශාල සේවයක් කරන මන්ත්‍රීවරයෙක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමන්ලාට බලයක් තිබෙනවා නේ. ඒ බලය ක්‍රියාත්මක කරන්න. මේක චණ්ඩින්ගේ, මදාවියන්ගේ බලයට යටත් වුණු පාර්ලිමේන්තුවක් වෙන්න දෙන්න එපා. මන්ත්‍රීවරියන් නැඟිටින්න භයයි කථා කරන්න. ඔබතුමන්ලා එතුමියන්ලා ආරක්ෂා කළ යුතුව තිබෙනවා. එතුමියන්ලා කථානායකතුමාටයි, ඔබතුමාටයි ලියුමක් දුන්නා. මොකක්ද ඔබතුමන්ලා කළේ? මන්ත්‍රීවරියන්ට හිරිහැර වන ආකාරයට කථා කරනවා කියලා එතුමියන්ලා ලියුමක් භාර දුන්නා. ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට තමයි එවැනි දෙයක් කළේ. නමුත් මොකක්ද ඔබතුමන්ලා කළේ? ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, ඔබතුමාත් මේ ගැන දන්නවා ඇති. ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් ඇමතිතුමියගේ මූලිකත්වයෙන් සම්පූර්ණ පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන් කණ්ඩායම ගිහිල්ලා ගරු කථානායකතුමාට ලියුමක් භාර දුන්නා. ඔබතුමන්ලා ඒ සඳහා action ගන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. (Dr.) Harsha de Silva?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හැටියට අපි සියලුදෙනා ඒ ගරුත්වය රකින්න ඕනෑ. මේ ඉන්නේ ජනතා ඡන්දයෙන් තේරී පත්වෙලා ආපු ජනතා නියෝජිතයෝ. අපි දැනගන්න ඕනෑ කොහොමද කථා කරන්නේ කියලා. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්නකෝ. මමත් කාලයක් මේ පාර්ලිමේන්තුවේ ඉඳලා තිබෙනවා. අපි එක දවසක්වත් මේ පාර්ලිමේන්තුව තුළ කැත වචනයක් පාවිච්චි කරලා නැහැ. අපි කිසි දවසක කිසිදු මන්ත්‍රීවරයෙකුට පෞද්ගලිකව පහර දීලා නැහැ. එක්

වතාවක්වත් එහෙම කරලා නැහැ. අපි විවේචනය කරමු, ප්‍රතිපත්ති. පුද්ගලයන්ට පහර ගහන්න එපා. ඒක අපේ basic fundamental එකක්. ගරු බිමල් රත්නායක ඇමතිතුමා කියපු කාරණයත් එක්ක මම එකඟ වෙනවා. මේ නිවැරදි වීම එක පැත්තකින් විතරක් නොවෙයි, දෙපැත්තෙන්ම කෙරෙන්න ඕනෑ. එදා ඔබතුමන්ලාගේ senior ඇමතිවරයෙක් කරපු දේ බලන්න. ඒවා වැරැදියි. So, what I am saying is, I agree that අපි හැමෝටම මේකේ responsibility එකක් තිබෙන බව. අපේ පැත්තටත් අපි මේ ගැන කථා කරන්නම්; ඔබතුමන්ලාගේ පැත්තට ඔබතුමන්ලා කථා කරන්න. අපි මේ කටයුතු ලස්සනට කරගෙන යමු.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Now, I will have my say, Hon. Leader of the House and Hon. (Dr.) Harsha de Silva. I had, on previous occasions, too, called upon the Members and informed them that their words would be expunged from Hansard even without any Member of any side of the House objecting to it. I have done that even for the Government side as well as for the Opposition. I think while I was in this seat, I had done my best to ensure decency and decorum in debates in this House.

Hon. Sunil Watagala, you may continue.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාගේ අදහසට මම ගරු කරනවා. හැබැයි, මම ඊටත් වඩා ගරු කරනවා, මීටත් කලින් අපේ මන්ත්‍රීවරියන්ට කියපු වචනවලදී එතුමා නැඟිට්ටා නම්. ඒත් වැසිකිළි කථාවක් කිව්වේ. අපේ කොට්ටහච්චි මන්ත්‍රීතුමිය ඇඳගෙන ඉන්න වස්ත්‍රය ගැන එක මන්ත්‍රීවරයෙක් මෙතැන ඉඳන් කථා වෙනවා. අපට මේවා බලාගෙන ඉන්න බැහැ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මම දන්නේ නැහැ, එයා කාට කිව්වාද, මොකක්ද කියලා. ඒක මට අදාළ නැහැ. මට ඇඟිල්ල දිගු කරන්න එපා.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
නැහැ, නැහැ. ඔබතුමාට ඇඟිල්ල දිගු කළේ නැහැ. ඔබතුමාත් එක්ක වාදයක් නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Harsha de Silva, he has not implied anything to you.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපි මේ විවාදය පවත්වන්නේ හදිසි අවස්ථා රෙගුලාසි දීර්ඝ කර ගැනීමට සහ තවත් අණපනත් කිහිපයක් සම්මත කරගැනීමට. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂය විශේෂයෙන් බලාගෙන ඉන්නවා පෝලිම් ඇති වෙයි කියලා. විපක්ෂයේ ඇතැම් අය - ඇතැම් අය හොඳේ - බලාගෙන ඉන්නවා, දේශගුණය හරි කාලගුණය හරි වෙනස් වෙලා මොකක් හරි වෙලා මිනිසුන් පාරට ගන්න පුළුවන් අවස්ථාවක් තිබෙනවාද කියලා. මම කියන්නේ මේකයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි මේ හදිසි අවස්ථා රෙගුලාසි පාවිච්චි කරලා ප්‍රජාතන්ත්‍රවාදයට හෝ මිනිසුන්ගේ සිවිල් අයිතිවාසිකම්වලට මේ දක්වා කවදාවත් කිසිදු බලපෑමක් ඇති කරලා නැහැ. "දිට්වා" සුළි කුණාටුවට අදාළව සහ දැනට තිබෙන යුද්ධමය වාතාවරණයට අදාළව සාමාන්‍ය ජනයාට පහසුකම් සැලසීමේ අර්ථයෙන් අත්‍යවශ්‍ය සේවා කොමසාරිස්වරයාගේ කටයුතු සඳහා තමයි අපි මේ හදිසි අවස්ථා රෙගුලාසි දීර්ඝ කරගැනීමට අවශ්‍ය යැයි කියන්නේ. එහෙම නැතිව, ඉතිහාසයේදී වාගේ පටු අවස්ථාවාදයට අපි මේ හදිසි අවස්ථා රෙගුලාසි පාවිච්චි කරන්නේ නැහැ. ඉතිහාසයේ මේ හදිසි අවස්ථා රෙගුලාසි පාවිච්චි කරලා තිබෙන්නේ පටු අවස්ථාවාදයට; දේශපාලන පළිගැනීම්වලට. හැබැයි, වත්මන් ආණ්ඩුව අභීත ආදර්ශයක් දීලා තිබෙනවා. නීතියේ බලයට යටත් කරලා අපි හදිසි අවස්ථා රෙගුලාසි නියෝග පාවිච්චි කරලා තිබෙනවා.

දැන් සමහර උදවිය අපට කියන්නේ මොකක්ද? දින වකවානු නම් කරනවා, අහවල් දවසෙන් පස්සේ මේ ආණ්ඩුව කෙළවර වෙනවා කියලා. දැන් ඒ කියපු දින වකවානු පාස් වෙලා, ඉදිරි දිනය හැටියට දෙසැම්බර් මාසයේ දිනයක් කියලා තිබෙනවා, මම හිතන විධියට, විපක්ෂ නායකතුමා ද කොහේද. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එවැනි අවස්ථා උදාවෙන්නේ කොහොමද? රටක ආර්ථික පරිහානියක් ඇති වෙලා ආර්ථිකය කළමනාකරණය කරගන්න බැරි වුණොත් ආණ්ඩුව දාලා යන්න වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි බලයට එනකොට තිබුණු ආර්ථිකය නොවෙයි දැන් තිබෙන්නේ. ලෝකයට ණය වෙච්ච ආර්ථිකයක් සහිත ආණ්ඩුවක් තමයි අපට ලබා දුන්නේ. ඒ කියන්නේ මහ භාණ්ඩාගාරයේ රුපියල් සංචිත හින්දලා, ඩොලර් සංචිත හින්දලා තමයි අපට ආර්ථිකය භාර දුන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ දෙවැනි අය වැය ලේඛනය එනකොට ජනාධිපතිවරයා ප්‍රකාශයට පත් කළා, අපට ප්‍රමාණවත් තරම් රුපියල් තිබෙනවා, ප්‍රමාණවත් තරම් ඩොලර් තිබෙනවා කියලා. අපි ඒ මට්ටමට අද ආර්ථිකය අරගෙන ඇවිත් තිබෙනවා. අපි දන්නවා, ගමේ මනුස්සයාට තවම ඒක දැනිලා නැතිව ඇති කියලා. නමුත් මධ්‍යම ආණ්ඩුවේ වැඩ පිළිවෙළ පහළට ගෙන යන ක්‍රමය අපි සකස් කරලා තිබෙනවා. ඒ අනුව අපේ යන්ත්‍රණය දැන් ගමේ ක්‍රියාත්මක වෙන්න පටන් අරගෙන තිබෙනවා. ඒක හින්දා ආර්ථිකය කඩා වැටෙයි කියන පුරෝකථන මත මේ ආණ්ඩුව වැටෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනෙක් කාරණය මේකයි. අපට පැහැදිලි දේශපාලන සදාචාරයක් නඩත්තු කරගන්න බැරි වුණොත්, අපට ආණ්ඩුවත් දාලා යන්න වෙයි. අපේ ජන වරම ඇතුළේ තිබෙන්නේ මොකක්ද? දේශපාලන සදාචාරය කියන කථාව. අපි අනෙක් කණ්ඩායම්වලට වඩා වෙනස් කියලා පෙන්වලා තිබෙනවා. ඒගොල්ලන් උත්සාහ කරනවා, "ඔයගොල්ලනුත් කළුයි, අපිත් කළුයි" කියලා කියන්න; ඒගොල්ලන්ගේ ඇඟෙත් ජරාව, අපේ ඇඟෙත් ජරාව කියලා කියන්න. හැබැයි, අපි ඒ ගොඩට වැටිලා නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ආණ්ඩු පක්ෂයක් විධියට අපි පැහැදිලි දේශපාලන සදාචාරයක් නඩත්තු කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අපි ජන වරම ඇතුළේ කියපු කාරණා තුළත් ඒ දේශපාලන සදාචාරය රැකලා තිබෙනවා. ජන වරම ඇතුළේ අපි යමක් අපේක්ෂා කළාද, අණ පනත් මඟින් ඒ දේශපාලන සදාචාරය

[ගරු නීතිඥ සුනිල් වටගල මහතා]

රැකලා තිබෙනවා. අපට අවශ්‍ය වෙන්නේ කුමක්ද? පුරවැසියා භුක්ති විඳින වරප්‍රසාද සහ මහජන නියෝජිතයා භුක්ති විඳින වරප්‍රසාද අතර අතීතයේ දැවැන්ත පරතරයක් තිබුණා. ඒ පරතරය අඩු කරන්න අපි කටයුතු කරලා තිබෙනවා. නමුත් මහජන නියෝජිතයෙකුට සේවය සපයන්න අවශ්‍ය පහසුකම් ටික දීලා තිබෙනවා. අසීමාන්තික වරප්‍රසාද අපි අහෝසි කරලා තිබෙනවා. විශ්‍රාමික ජනාධිපතිවරුන් භුක්ති විඳපු අනිසි වරප්‍රසාද අපි පනතක් මඟින් ඉවත් කළා. ඊට පස්සේ මන්ත්‍රී විශ්‍රාම වැටුප වැනි දේවල් අපි පනතක් මඟින් අහෝසි කළා. මන්ත්‍රී විශ්‍රාම වැටුප අහෝසි කරනකොට සමහරු කළු ගඟේ පනිනවා කිව්වා, බෙල්ලේ වැල දාගන්නවා කිව්වා. අපි ඇහුවේ නැහැ. අපි ඒවාට අණ පනත් ගෙනැල්ලා, ඊට අදාළ සාධාරණය ජනතාවට ඉටු කරලා තිබෙනවා. අපි පුරවැසියා සහ මන්ත්‍රීවරයා - මහජන නියෝජිතයා - භුක්ති විඳින වරප්‍රසාද අතර පරතරය අවම මට්ටමට ගෙනෙන්න කටයුතු කරමින් ඉන්නවා. ඒක තමයි දේශපාලන සදාචාරය කියන්නේ. ඒක නිසා අපි විපක්ෂයට කියනවා, ඔයගොල්ලන්ට කවදා හෝ ආණ්ඩු බලයක් ගන්න ඕනෑ නම් අපට වඩා හොඳ වෙන්න කියලා. ඒක නේ, අපේ දේශපාලන නායකයෝ කියන්නේ. ඒක නිසා දේශපාලන සදාචාරයේ වැහැරීමක් පදනම් කරගෙන මේ ආණ්ඩුව බිඳ වැටෙන්නේ නැහැ. කාට හෝ සිහින දැක දැක ඉන්න පුළුවන්. ඊට එහා ගිය තත්ත්වයක් අපේ ආණ්ඩුව යටතේ තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතිවාදය සහ ආගම්වාදය කරපින්නාගෙන ඇවිල්ලා ඒ මඟින් ආණ්ඩුවක් වැටෙන්න පුළුවන්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනාධිපතිවරණයේදීත්, පාර්ලිමේන්තු මහ මැතිවරණයේදීත් ආගම සම්බන්ධ කරලා අපට නොකිව්වේ මොනවාද? ඒ ආගමට සම්බන්ධ කරලා කළ හැම විවේචනයකටම අපි මේ වෙනකොට භාවිතාවෙන් උත්තර දීලා තිබෙනවා. අවුරුද්දයි මාස ගණනක් යනකොට අපි භාවිතාවෙන් උත්තර දීලා තිබෙනවා ආගමට, ජාතියට ගරු කරන ආණ්ඩුවක් මේ තිබෙන්නේ කියන එක. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ සටන් පාඨය තමයි, "අසමඟිය වෙනුවට ජාතික සමඟිය" කියන එක. වත්මන් ආණ්ඩුව ජාතික සමඟියට - සිංහල, ද්‍රවිඩ, මුස්ලිම්, බර්ගර්, මැලේ කියන සියලු ජාතිකත්වයට - ගරු කරනවා. ඒක නිසා අපි හැම දෙයක් ගැනම කල්පනා කරන්නේ ජාතික සමඟිය ඉස්සරහින් තියලා. ආයෙත් කැලණියේ නයි ගෙනැල්ලා, කොත්තු රොටී ගෙනැල්ලා, වෙන වෙන දේවල් පාවිච්චි කරලා, ජාතික අසමඟිය, එහෙම නැත්නම් ආගම්වාදය වපුරලා ආපසු බලයට එන්න කවුරු හෝ හිතාගෙන ඉන්නවා නම්, ඒවාට කවදාකවත් ඉඩක් ලැබෙන්නේ නැහැ. අපේ සටන් පාඨය "ජාතික සමඟිය". "ජාතික සමඟිය" කියන සටන් පාඨයත් එක්ක තමයි වත්මන් ආණ්ඩුව ඉන්නේ. එහෙම නම් මේගොල්ලන්ට කිසිසේත්ම අදාළ නැති කාරණා, ඒ කියන්නේ ආර්ථිකය, දේශපාලන සංස්කෘතිය, ජාතිවාදය හෝ ආගම්වාදය වැපිරීමෙන් මේ ආණ්ඩුව බිඳ වැට්ටීමේ ක්‍රියාවලියකට යන්න බැහැ. ඒ නිසා නිකම් බොරු ප්‍රයත්න දරන්න එපා. අපි -වත්මන් ආණ්ඩුව- රටේ නීතියට යටත්ව හරි පැහැදිලිව කටයුතු කරමින් සිටිනවා. නීතියට ගරු කරලා, නීතියට යටත් ආණ්ඩුවක් ලෙස අපි කටයුතු කරමින් සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාවේදී හදිසි නීතිය පිළිබඳ විවාදයේදී හදිසි නීතිය දීර්ඝ කරන්න ඉල්ලන්නේ ඒ යටතේ රටේ පොදු ජනයාට යම් අත්‍යවශ්‍ය කටයුතු ප්‍රමාණයක් ඉෂ්ට කර දෙන්නයි. අත්‍යවශ්‍ය සේවා කොමසාරිස්වරයාට එවැනි බලයක් අවශ්‍යයි. මොකද, "දිට්වා" සුළි කුණාටුවේ හානිපූරණ තත්ත්වය අපට කළමනාකරණය කරගන්න පුළුවන් වුණා. නමුත්, තවදුරටත් ඒ සම්බන්ධව ඉටු කළ යුතු යම් කටයුතු ප්‍රමාණයක් තිබෙනවා.

ඊට අමතරව, අපි අපේක්ෂා නොකරපු යුදමය වාතාවරණයකට මුහුණ පාන්න සිද්ධ වුණා. ඒ මැද පෙරදිග යුදමය වාතාවරණය අපේ බලශක්ති අර්බුදයට බලපා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බලශක්තියත් එක්ක ගැට ගැහිච්ච ඒ කරුණු, කාරණා ප්‍රමාණයකට අපට මැදිහත් වෙන්න සිද්ධ වෙලා තිබෙනවා. මෙන්න මේ කරුණු කාරණා ප්‍රමාණය පදනම් කරගෙන තමයි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Sunil Watagala, your time is up now.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
මට තව පොඩි වේලාවක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

විශේෂයෙන්ම කාටත් පේනවා ඇති, Freedom House ආයතනයේ දේශපාලන තත්ත්ව දර්ශකයට අනුව අපේ රට 58වැනි ස්ථානයේ සිට 63වැනි ස්ථානය දක්වා වැඩි කරගෙන තිබෙන ආකාරය. ඊට අමතරව දූෂණ සංජානන දර්ශකයට අනුව 2024දී රටවල් 180ක් අතරින් අපි හිටියේ 121වැනි ස්ථානයේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2025 වෙනකොට අපි ඒක 107වැනි ස්ථානය දක්වා අරගෙන ඇවිල්ලා තිබෙනවා. ස්ථාන 14ක් අපි පසු කරලා තිබෙනවා. ඒක නිසා දූෂණ සංජානන දර්ශකයේ අපි 107වැනි ස්ථානයට ඇවිල්ලා තිබෙනවා. මේක තමයි යහපත් ආණ්ඩුකරණය කියන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒක නිසා අපි තර්කවලට උත්තර දෙමු. එහෙම නැතිව මඩ අවලාදවලට උත්තර දෙන්න අපි ලෑස්ති නැහැ කියන එකත් මම කියන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ස්තූතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! The ongoing Proceedings of the House shall stay suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියගේ [ගරු හේමාලි වීරසේකර මහත්මිය] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ස්ථාවර නියෝග 91(උ), (ඌ), (එ) යටතේ සහ ස්ථාවර නියෝග 86(අ) යටතේ තමයි මම අවස්ථාව ඉල්ලන්නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
හොඳයි, ඔබතුමාගේ රීති ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, වටගල නියෝජ්‍ය ඇමතිවරයා මගේ නම සඳහන් කරලා කතන්දරයක් කියා තිබෙනවා. මම එදාත් කිව්වා, ඒක ඔප්පු කර ගන්න බැරි නම්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාගේ නම සඳහන් කරලා තිබෙනවා ද?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඔව්, නම සඳහන් කර තිබෙනවා. ඔබතුමිය ඒක අහන්න. මගේ නම සඳහන් කරලා තිබෙනවා. ඒකයි මම නැඟිට්ටේ. ඔබතුමිය ඒ වෙලාවේ මූලාසනයේ හිටියේ නැහැ නේ. ඕනෑ නම් මම ඒ recording එක දාන්නම්. ඒකයි මේ කථා කරන්නේ. මම ඒ recording එක බලලා නේ ආවේ. අපට කොන්ද තිබෙන නිසා තමයි මේ ආවේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඊළඟ එක තමයි ස්ථාවර නියෝග 77 අනුව

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මුලසුනේ ඔබතුමන්ලාට තර්ජනය කරනවා. හැබැයි, ස්ථාවර නියෝග 77ට අනුව කථානායකට යම් මන්ත්‍රීවරයෙක් නම් කරන්න පුළුවන්. හැබැයි, යෝජනා ස්ථිරත්වයෙන් තමයි ඒ මන්ත්‍රීවරයාට දඬුවම් කරන්නේ. ඔබතුමියගේවත්, කථානායකගේවත් නොවෙයි වැරැද්ද. සභානායකගේ වැරැද්ද.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, -

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
පොඩ්ඩක් ඉන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මට විනාඩි 3ක් තිබෙනවා. සභානායක මේ රීති දන්නේ නැහැ. මේ පාර්ලිමේන්තුවේ කථානායක, සභානායක කියලා අපි දන්නවා. ඒ වාගේම තව එකක් කිව්වා, මන්ත්‍රීතුමියන්ලාට,-

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, විනාඩියක් පමණයි ඔබතුමාට තිබෙන්නේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
නැහැ, මම රීති 3ක් යටතේ කථා කරන්නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
රීතියෙන් රීතිය විනාඩිය ගණනේ දෙන්න බැහැ නේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
රීතියකට විනාඩියයි කියලා තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
හරි, point එක තේරුණා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මට පොඩි කාලයක් දෙන්න. Point එක තේරුණා කියලා කියන්නේ නැතිව මට කථා කරන්න කාලය දෙන්න. මට මේක කියලා අවසන් කරන්න දෙන්න. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට කථා කරන්න ඕනෑ තරම් අවස්ථාව දෙනවා. *[බාධා කිරීමක්]* ඒක නිසා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

සිනමන් ලයිෆ් කෝටි 50ක ඉන්න මිනිස්සු අපට චරිත සහතික දෙන්න එන්න එපා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මෙතුමාගේ කථාව තුළ තිබෙන අනවශ්‍ය වචන කරුණාකර හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න.

ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා. 1.02]

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට විනාඩි 15ක කාලයක් තිබුණා. ඒ විනාඩි 15ක කාලය දැන් තමයි පටන් ගත්තේ.

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ අවස්ථාවේදී මම මේ කාරණයත් කියන්න ඕනෑ. බොහොම හොඳයි, හුණු ටිකක් ගාලා, paint කරලා ඊයේ කොළඹ ප්‍රධාන බස් නැවතුම්පොළ ආණ්ඩුව විවෘත කළා. හැබැයි, ආණ්ඩුවේ අප්පච්චිලාගේ මොළ තමයි මොළ. බස් නැවතුම්පොළ පොඩ්ඩක් එහෙන් මෙහෙන් repair කරලා විවෘත කළා. මොකද, හෙට-අනිද්දාට ලංකාව වටේ ඉන්න මිනිස්සු මේ බස් නැවතුම්පොළට එනවා නේ. ඒ මිනිස්සු බස්වල නැඟලා යනකොට මාලිමාව බස් නැවතුම්පොළ හැදුවා කියලා තමයි දැන් මේ ප්‍රචාරය දෙන්න යන්නේ. කමක් නැහැ, ඒ බස් නැවතුම්පොළ හැදුවා. ඒ බස් නැවතුම්පොළ හැදුවාට, මම ආණ්ඩුවට මේ කාරණයත් කියන්න ඕනෑ.

මේ වන විට උඩරට දුම්රිය මාර්ගයට හානි වෙලා මාස 6ක් විතර වනවා. එදා නාවලපිටියේ හිරවුණු කෝච්චියක් තවම එතැන දිරනවා. කෝච්චි එන්ජින් ටික, කෝච්චි ටික පේරාදෙණියේත් එහෙමම නැවතිලා. තවම පාලම හදාගන්න බැරි වුණා. එම නිසා උඩරට දුම්රිය මාර්ගයේ දුම්රිය ධාවනය තවම පටන්ගන්න බැරි වුණා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සුනාමි ව්‍යසනය වෙලාවේදී තෙල්වත්ත දුම්රිය ස්ථානයේ ඉඳන් දකුණට තිබුණු දුම්රිය මාර්ගය මාස දෙකෙන් අපේ ආණ්ඩුව හැදුවා. තවම ඔයගොල්ලන්ට උඩරට දුම්රිය මාර්ගය හදාගන්න බැරි වුණා. ඒ ගැනත් මේ වෙලාවේදී මම කියන්න ඕනෑ.

ඊළඟට, පොලීසිය භාර මහජන ආරක්ෂක ඇමතිවරයාගේ විෂයයට අදාළව තමයි අද මේ හදිසි නීතිය දීර්ඝ කිරීමේ විවාදය යන්නේ. නියෝජ්‍ය ඇමතිතුමාත් සභාවේ ඉන්නවා. ඇමතිතුමනි, මේ රටේ දේශීය ව්‍යාපාරිකයෝ, දේශීය කර්මාන්තකරුවෝ, දේශීය සම්පත් ආරක්ෂා කර ගන්න ඕනෑ. හැම දෙයකදීම වෙන රටකට අත වනන්න එපා. ඉස්සෙල්ලා අපේ රටේ දේවල් ආරක්ෂා කරන්න.

හොඳම වැඩේ කියන්නේ, කැබිනට් අනුමැතිය ආවාම පොලීසියේ රාළහාමිලාට සපත්තු 50,000ක් දෙන්න ලංකාවේ ව්‍යාපාරිකයෙක් සූදානම් වෙලා හිටියා. ඒකට ටෙන්ඩර් එකක් දැම්මේ නැහැ. ඔයගොල්ලන් මොකද කළේ? ඔයගොල්ලන් පොලීසියට සපත්තු ගත්තේ නැහැ. රුපියල් 7,000 ගණනේ වවුචරයක් දැම්මා. මහත්තයෝ, රුපියල් 7,000 ගණනේ වවුචරයක් දැම්මාම පොලීසියේ රාළහාමිලා සපත්තු ගන්නේ නැහැ. ඒ මනුස්සයා ඒ මුදලින් ගන්නවා, ගෑස් එකක්. නැත්නම් විදුලි බිල ගෙවනවා. නැත්නම් වෙන වැඩක් කර ගන්නවා, මේ ආර්ථික ප්‍රශ්න හින්දා. පොලීසියේ සියයට 5ක්වත් සපත්තු ගත්තේ නැහැ. මොකද වුණේ? පොලීසියේ අය පරණ සපත්තු දෙක ආයෙත් පොලිෂ් කරලා දමනවා. මොකක්ද ඒ වැඩේ? අර මනුස්සයා ආර්ථික වශයෙන් වැටුණා. කරපු දෙයක් නැහැ.

ඒ එක්කම මේ ළඟදී මා එක්ක සාකච්ඡාවකට ආවා, මේ රටේ ඉන්න ඉහළ පෙළේ ව්‍යාපාරික මහත්මියක්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. එතුමිය කියනවා, දැන් VAT එක ගහනවා, SVAT එක ගෙවන්න ආණ්ඩුව බැඳිලා ඉන්නවා, හැබැයි ඒ SVAT එක ගන්න එක අපහසුයි කියලා. වෙනදා දින 45න් ආණ්ඩුව දෙන SVAT එක දින 90ක් ගිහිල්ලාත් දැන් ගන්න බැහැ. ඊට අමතරව නිලධාරින්ට යටිතල පහසුකම් පවා දෙන්න ඕනෑය කියලා ඒ කාන්තාවම මට කියනවා. යටිතල පහසුකම් කිව්වේ මම මේ වෙන පැත්තකටයි. ඒ, මොනවාද? සල්ලිත් ඉල්ලනවාලු, තමන්ගේ SVAT එක නිදහස් කර ගන්න. ඒ නිසා මම කියන්නේ, යුද්ධයකට මුවාවෙලා නොවෙයි ආණ්ඩුවක් කරන්න ඕනෑ. යුද්ධය වෙලාවේ යුද්ධයෙන් මතුවන ප්‍රශ්න වෙනයි. හැබැයි, ආණ්ඩුව හිතලා වැඩ කරන්න ඕනෑ සුළු සුළු ප්‍රශ්න තිබෙනවා.

ඒ එක්කම දැන් බලන්න, නියෝජ්‍ය ඇමතිවරු දෙදෙනෙක් සභාවේ ඉන්නවා. ඔබතුමන්ලා දෙපළ ඉස්සරහ මම මේක කියන්නේ. බලන්න, HS code එකෙන් භාණ්ඩ 2,600ක් ගෙන්වනවා. ඔබතුමන්ලා මේවා කල්පනා කරන්න. HS code එක යටතේ නොයෙක් භාණ්ඩ 2,600ක් මේ රටට ගෙන්වනවා. මේක හෙණ ගහන අපරාධයක්, නියෝජ්‍ය ඇමතිතුමා. මේවා කරන්න දෙන්න එපා. කණ්ඩායම් රැස්වීමේදී හරි ඔයගොල්ලන් මේවාට විරුද්ධ වෙන්න. මොකද, මේ 2,600ම සෙස් බද්ද අයින් කළොත් මොකද වෙන්නේ? මේ බද්ද හතර පාරකට අයින් කරන්න ඔබතුමන්ලා තීරණය කරලා තිබෙනවා. සෙස් බද්ද අයින් කළොත්, හෙණ ගහන අපරාධයක් සිද්ධ වනවා.

මම උදාහරණයක් කියන්නම්, ඇමතිතුමන්ලා අහගන්න. එළවලු, පලතුරු හැමදේම පිට රටින් එන්න පටන් ගන්නවා. උදාහරණයක් හැටියට කිව්වොත්, කොමඩු ගෙඩියත් ඉන්දියාවෙන් හරි වෙන රටකින් හරි අපට එනවා. අපේ මිනිසුන්ට කොමඩු ගෙඩියක්වත් හදාගන්න වෙන්නේ නැහැ. කුකුළු මස් ටික, මාළු ටික හැම දෙයක්ම එතකොට පිට රටින් එනවා. මේ HS code එක යටතේ භාණ්ඩ 2,600ක් වර්ග කරලා තිබෙනවා. ඉතින් මේක ලොකු ප්‍රශ්නයක්. කර්මාන්ත ඇමතිතුමා අයින් වන්න ඕනෑ; හරි නම් කර්මාන්ත ඇමතිතුමා ඉල්ලා අස් වන්න ඕනෑ. මම කර්මාන්ත ඇමති නම්, ඉල්ලා අස් වනවා. වැඩිය ඕනෑ නැහැ, කොමඩු, එළවලු, බිත්තර වාගේ ගොඩක් දේවල් පිට රටින් ගේන්න පටන් ගන්නවා. ඉතින් මම ඔබතුමන්ලාට කියන්නේ මේවා ගැන සොයා බලන්න කියලායි.

ඊළඟට, මහජන ආරක්ෂක අමාත්‍යාංශය යටතේ නේද පාස්පෝර්ට් ඔෆිස් එක තිබෙන්නේ? හරියට පාස්පෝර්ට් එකක් දෙන්න බැහැ. හරියට Identity Card number එකක් දෙන්නකෝ. අපි වෙන වැඩ කරන එක නවත්වමුකෝ. ඔබතුමන්ලාගෙන් මිනිස්සු ඉල්ලන්නේ නැහැ, රන්දෙණිගල, වික්ටෝරියා වාගේ ලොකු projects කරන්න කියලා. තවම Identity Card එක හරියට දෙන්න බැරි වුණා. ඒ වාගේම පාස්පෝර්ට් එක හරියට දී ගන්නකෝ. එහෙම නැත්නම් number plates ටික දෙන්නකෝ. දෙවිහාමුදුරුවනේ, ලංකාවට ඔබතුමන්ලා වාහන ගෙනැල්ලා රුපියල් බිලියන ගණන් හොයාගත්තා. ඒකට කමක් නැහැ කියමුකෝ. දැන් ඒ හැම වාහනයකම අව්ධිමත් විධියට තමයි නොම්මරය ගහලා තිබෙන්නේ. වාහන නොම්මර ටික හරියට දෙන්නකෝ. ආණ්ඩුවට වාහන නොම්මර ටිකවත් හරියට දෙන්න බැහැ. මේ සෙස් බද්දෙන් මොකද වෙන්නේ දන්නවාද? ලංකාවේ මිනිහෙකුට හතු ටිකක්වත් හදන්න හම්බ වෙන්නේ නැහැ. මොකද, හතු පැකට් එකත් පිට රටින් එන්න පටන් ගන්නවා.

ඔබතුමන්ලා මේ ප්‍රශ්නයට උත්තරයක් දෙනවා නම් මේක අහගන්න. අපි ඇමෙරිකානු ඩොලර් බිලියන 7ක බඩු ගන්නවා, ඉන්දියාවෙන්. ඇමෙරිකානු ඩොලර් 6ක බඩු ගන්නවා අවුරුද්දට, චීනයෙන්. මේ හෙණ ගහන අපරාධ කරන්න එපා. මොකද, මේ රටේ සිටින මිලියන ගණනක් වන මිනිස්සුන්ගේ සල්ලි මේවාට වැය වන්නේ. මේ වනකොට ගාමන්ට් වැහෙනවා. ලබන මැයි මාසයේ 1වැනි දා වනකොට තුල්හිරියේ ගාමන්ට් එකක් වහලා යනවාය කියලා ඊයේ දැනුම් දීලා තිබෙනවා. මේ විධියට අද ගාමන්ට් වැහෙනවා. දැන් මේක ලොකු ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා.

ඊළඟ කාරණය මෙයයි. විදේශ සේවා නියුක්ති කාර්යාංශය ළඟ "කපුටන්" ඉන්නවා නේ. අපේ ආණ්ඩුවලත් "කපුටන්" හිටියා. දැන් විදේශ සේවා නියුක්ති කාර්යාංශය ළඟ මාලිමාවේ "කපුටන්" ඉන්නවා. මාලිමාවේ "කපුටන්" දැන් එතැන කැරකෙනවා. ඒගොල්ලන් මොනවාද කරන්නේ? මොකක් හරි පෙත්සමක් ගහලා අර ඒජන්සිකාරයන්ගේ පර්මිට් එක cancel කරලා, ටික දවසක් යනකොට අර "කපුටන්" ගිහිල්ලා කීය කීය හරි අරගෙන ඒජන්සිකාරයන්ට ආපසු පර්මිට් එක හදලා දෙනවා.

සවුදි අරාබියට කම්කරුවන්, ගෘහ සේවිකාවන්, මේසන්ලා විධියට යන්න කැමති අය දැන් ඉංග්‍රීසි paper එකකට පිළිතුරු ලියන්න ඕනෑ. සවුදි අරාබියට යන්න නම් ඒ අය ඉංග්‍රීසි ප්‍රශ්න පත්‍රයකට පිළිතුරු ලියන්න ඕනෑ. ඒ ක්‍රමය බංග්ලාදේශයට, වෙන රටවලට ආවාම ඒ මිනිස්සු ඒක ප්‍රතික්ෂේප කළා. රියාල් 1,000 දෙන්නේ; රියාල් 1,000ක්. රියාල් 1,000ක් කියන්නේ, ලංකාවේ මුදලින් රුපියල් 85,000යි. අපේ රටට එන දේවල් අපි නැති කර ගන්නවා. අපේ ආණ්ඩුව තිබුණු කාලයේ විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ දවසකට 450ක් රක්ෂණ ආවරණය සඳහා ලියාපදිංචි වුණු ප්‍රමාණය අද වනකොට 15ට අඩු වෙලා තිබෙනවා. විදේශ රටවල රැකියාවලට යන ප්‍රමාණය ශීඝ්‍රයෙන් අඩු වෙනවා. ඕනෑ නම් ඔට්ටුවක් දාලා විදේශ රැකියා ඇමතිතුමාට ඕනෑම වේදිකාවකට එන්න කියන්න, අපි මුහුණට මුහුණ කථා කරලා තර්කානුකූලව ඒ කාරණා පෙන්වන්නම්.

පොලීසිය භාර ඇමතිතුමනි, 2021දී ගැසට් එකක් ගහලා පොලීසියට කාන්තා නිලධාරිනියන් බඳවා ගන්න සම්මුඛ පරීක්ෂණත් - interviews - තිබුණා. අන්තිමට මොකක්ද වුණේ? ඒ විභාගය අවලංගු කරලා 2026දී ආපසු ගැසට් එකක් ගහලා තිබෙනවා. ඒ නිසා 2021දී විභාගයට ඉදිරිපත් වෙච්ච ළමයි ඔක්කෝම ගෙදර. ඇයි, ඒ? ඒ අයට වයස වැඩියි; ඒ අයට දැන් අවුරුදු 25ට වඩා වැඩියි. අවුරුදු 25 පැන්න ගමන් අර ළමයින්ට ආපසු විභාගයට apply කරන්න බැහැ. මේගොල්ලන් SIලාගේ වැඩකුත් ඒ විධියටම කළා. SIලාටත් වයස වැඩි නිසා විභාගයට ඉල්ලුම් කරන්න බැරි වුණා. දැන් ASPලාගේ විභාගයක් පවත්වා තිබෙනවා. පොලීසිය භාර ඇමතිතුමා දැන් සභාවේ ඉන්නවා. ඔබතුමා ASP විභාගය නැවත තියන්න හදනවා. මොකටද ආපසු විභාගයක් තියන්නේ? විභාග දෙපාර්තමේන්තුව කියලා තිබෙනවා, මේ අවුරුද්දේ විභාගය තියන්න බැහැ කියලා. ඒකට මොකක්ද කියලා තිබෙන්නේ? දැන් ASPලා ටික දෙනෙක් බඳවාගෙන තිබෙනවා. විභාගය සමත් වෙච්ච ASPලා ටික ඉන්නවා. ඒ නිසා ආපසු විභාග තියන්නේ මොකටද? දැනට තිබෙන list එකෙන්ම ඒ අය බඳවා ගන්න කෝ. ASPලාගේ ප්‍රශ්නය ගැන තමයි මම ඒ කිව්වේ. *[බාධා කිරීමක්]* උත්තර පසුව දෙන්න.

ඊළඟ කාරණය මේකයි. විෂය භාර ඇමතිතුමනි, කටුනායක සිට මත්තල දක්වා Expressway එකේ හදිසියකට ගිනි නිවන්න ආදී හැම දෙයකටම STF එකේ 130ක් ඉන්නවා. STF එකේ ඉන්න 130න්, දැන් 30ක් අයින් කරලා. STF එකට ඒ කටයුත්ත කරන්න නොදී STF එක එතැනින් අයින් කරලා ඒකත් වෙන කොම්පැනියකට දෙන්නයි හදන්නේ. මේවා දිහා බලන්න. යුද්ධය, යුද්ධය කියමින් යුද්ධය කරට දමා ගන්න එපා. යුද්ධය කියමින් හැම එකක්ම කරට දමා ගන්න ඕනෑ නැහැ. දැන් ප්‍රශ්න ගොඩක් තිබෙනවා. එම නිසා මම මේ වෙලාවේදී කියන්නේ මේ ආණ්ඩුව ලෙහෙසියෙන් විසඳා ගන්න පුළුවන් පොඩි පොඩි ප්‍රශ්න තිබියදී දැන් ලොකු ලොකු ප්‍රශ්න බොරුවට කරේ දමාගෙන ඉන්නවාය කියන එකයි. මේ ප්‍රශ්න විසඳා ගන්න ඕනෑ.

ඒ වාගේම මම මේ අවස්ථාවේදී කියන්න ඕනෑ, කර්මාන්තකරුවෝ මේ වනවිට ලොකු අමාරුවක වැටී ඉන්න බව. සෙස් බද්ද නිසා මම හිතන්නේ කර්මාන්තකරුවන්ට ලොකු ප්‍රශ්නයක් ඇවිල්ලා තිබෙනවා.

මම දවසක් කිව්වා, Motor Traffic Department එකේ කොමසාරිස්ගේ ප්‍රශ්නයක් ගැන; ඒ වාගේම මීට මාස 3කට කලින් මම කිව්වා, Motor Traffic Department එකේ කොමසාරිස් නොම්මර මාරු කරලා බට් කරනවාය කියලා. මම එහෙම කියලා හරියටම ගත වුණේ මාස 3යි. මම ඒ ගැන කියනකොට මේ සභාවේ හිටපු කවුරුවත් ඒවා ගණන් ගත්තේ නැහැ. හැබැයි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙන් ඔහුව අල්ලපු නිසා ඔහු දැන් රිමාන්ඩ් වෙලා ඉන්නවා. මම ඒ ගැන කියනකොට මට හිනා වුණා.

ඒ එක්කම ගෑස් සම්බන්ධව අපි ගනිමු. දැන් ඔක්කෝම ගල් අඟුරු ගැන නේ කථා කරන්නේ. ගල් අඟුරු, ගල් අඟුරු කියනවා. ජනාධිපතිතුමා කිව්වා, ගල් අඟුරු කාලා බලලා නැහැ කියලා. සමහරු ගල් අඟුරු බීලා බලලා නැහැ කිව්වා. හැබැයි, මම මේ වෙලාවේදී කියන්නේ ගල් අඟුරු ගැන නොවෙයි, ගෑස් ගැන. මම දෙසැම්බර් 18වැනි දා කිව්වා, ගෑස් නැති වෙනවා, ගෑස් හිඟයක් ඇති වෙනවා කියලා. හැබැයි, එතකොට විජිත හේරත් ඇමතිතුමා කිව්වා, අපි ඩොලර් ශත 15ක් අඩුවෙන් තමයි ගෑස් ගත්තේ, අපි රජයට වාසියක් කර ගත්තා, ගෑස් නිසා අපට වාසියක් ලැබුණා කියලා. ඒ වෙලාවේදී ගෑස් රුපියල් 3,500ට, රුපියල් 4,000ට තිබුණා නම් ඒ ගණනටම දෙන්න තිබුණා නේ, අඩුවෙන් ටෙන්ඩර් එකක් දාලා ගත්තා නම්. අඩුවෙන් ටෙන්ඩර් එකකට දුන්නාට පස්සේත් මේ මාසය ඇතුළත ගෑස් මිල රුපියල් 1,000කින් වැඩි වුණා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. එහෙම නම් අඩු ටෙන්ඩරයට දෙන්නේ මොකටද? තිබුණු ටෙන්ඩරයටම දීලා නිකම් ඉන්න තිබුණා නේ. ගෑස් ගන්න ගිය වියදමෙන් ලොකු ප්‍රමාණයක් අඩු වුණා.

මේ අවස්ථාවේදී සභාවේ පොලීසිය භාර ඇමතිතුමා ඉන්නවා. කැකිරාවේ ඉන්න කාන්තා පොලිස් නිලධාරිනියන් තන්තිරිමලයට මාරු කරනවා. මෙහෙමයි, කාන්තාවන්ට පොඩි විශේෂත්වයක් දෙන්න ඕනෑ. ඒ අයට ළමයින්ට කිරි දෙන්න තිබෙනවා, ළමයි බලා ගන්න තිබෙනවා. අපේ ජාතිය හදන්න නම් කාන්තාවන් ළමයි හදන්න ඕනෑ. ඒ වාගේම ඒ අයව අපි ආරක්ෂා කර ගන්න ඕනෑ. දැන් කාන්තා පොලිස් නිලධාරිනියන්ව මාරු කරනවා. කාන්තා පොලිස් නිලධාරිනියන් බඳවා ගන්න ගැසට් එකක් ගහලා, interview කරලා, ඒ අයව training එකකට විතරයි යවන්න තිබුණේ. ඒක කරන්න තිබියදී දැන් වෙන වෙන වැඩ කරනවා. දැන් ආපසු විභාග තියනවා. ඒ වාගේ ගොඩක් ප්‍රශ්න තිබෙනවා. මේ ආණ්ඩුව නිකම් බල්ලාට දමලා කථා කිරීමේ අරමුණක් අපි ළඟ නැහැ. අපි හැම වෙලාවේදීම බලන්නේ අපට එන තොරතුරු ගැන කථා කරන්නයි.

විදුලිබල මණ්ඩලය සමාගම්වලට බෙදලා ඒවායේ වැඩ කරපු මිනිස්සුන්ට අයින් වෙන්න, වන්දි දෙනවා කිව්වා. නමුත්, ඒ වන්දි තවම ලබා දීලා නැහැ. ඒ මිනිස්සු දැන් අයින් වෙන්න බලාගෙන ඉන්නවා. ඒ මිනිස්සු බලාගෙන ඉන්නවා, එහෙම අයින් වුණාට පස්සේ ලැබෙන වන්දියෙන් මොකක් හරි දෙයක් කර ගන්න.

තවත් කාරණයක් මට කියන්න තිබෙනවා. මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රජයට අයත් අක්කර 6ක ඉඩමක් දැනට කල්පිටිය ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරියක් වන ජින්නත් බේබි විසින් ජස්ටින් කුමාර ගැලිසන් යන අයට විකුණා තිබෙනවා. හැබැයි, ඒකට ප්‍රාදේශීය ලේකම් විරුද්ධ වෙලා තිබෙනවා. ප්‍රාදේශීය ලේකම්ගේ අත්සනින් යුතු ලේඛනයක් තිබෙනවා. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරියක් අක්කර 6ක ඉඩමක් විකුණා තිබෙනවා. මම එම ලේඛනය මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

අපි මේ වාගේ දේවල් කියනකොට ආණ්ඩුවේ ඉන්න අයගේ හිත රිදෙනවා. හැබැයි, ආණ්ඩුවේ ඉන්න අයගේ හිත රිදුණාට කියන්න ඕනෑ දේවල් ටික අපිත් කියන්න ඕනෑ.

තවත් කාරණයක් මම කියන්න ඕනෑ. ඔය බලශක්ති ඇමතිතුමාම මුතුරාජවෙල ඉඳලා ගුවන් තොටුපළ දක්වා ගුවන් යානා සඳහා ඉන්ධන ගෙනෙන්න අලුතින් නළ පද්ධතියක් හදනවා. ඒ ඉදි කරන ලද නළ පද්ධතිය සඳහා ටෙන්ඩර්

---

** **පුස්තකාලයේ තබා ඇත.***
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

කැඳෙව්වාම ආයතන තුනක් ටෙන්ඩර් භාර දීලා තිබෙනවා. මෙම ව්‍යාපෘතිය මීට පෙරත් ටෙන්ඩර් කරලා තිබුණා. ඒ අවස්ථාවේදී China Petroleum Pipeline Engineering Co. Limited එක ඉදිරිපත් වුණත් ඒක ප්‍රතික්ෂේප වෙලා තිබෙනවා. ගිය සැරේ ප්‍රතික්ෂේප වුණු අයටම ආපසු බලශක්ති ඇමතිතුමා මේ ටෙන්ඩරයත් දෙන්න හදනවා. "සන්තෝසම්" කියලා එකක් තිබෙනවා. දෙමළෙන් කියන්නේ "සන්තෝසම්" කියලා. එහෙම ගන්න එකට කියනවා, "සන්තෝසම් ඉල්ලනවා" කියලා. මේ හදන්නේත් සන්තෝසම් ගන්න. අපි මේවා කියනකොට ආණ්ඩුව අපිට කියනවා, අපි බොරු කියනවා, අපි මෙහෙම කරනවා, අපි අර විධියට කියනවා කියලා. අපි මේවා කියන්නේ නැත්නම් කවුද මේ සභාවට ඇවිල්ලා මේ ගැන කියන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි?

ඊළඟට, ගරු උපදේශකවරු ගැනත් මම කියන්න ඕනෑ. ගරු උපදේශකවරු මේ රටට විශාල සේවාවක් කරනවා. ඒ මිනිස්සුන්ගේ වැටුප් විෂමතාවක් තිබෙනවා. ඒ වැටුප් විෂමතාව විසඳන්න මේ ආණ්ඩුව තවම වැඩ පිළිවෙළක් හදලා නැහැ. තවම මේ ආණ්ඩුව වැඩ කරන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. වැඩක් කරන්නේ නැතුව බොරු කරමින් ඉන්නවා. ආණ්ඩුවකට හැමදාම බොරු කරමින් ඉන්න බැහැ. හැබැයි, කවදා හරි බොරුව හෙළි වන බව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමිට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)
Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 92. (2) (අ) වෙත මම අවධානය යොමු කරන්න කැමැතියි. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පාර්ලිමේන්තුවේ සභා ගර්භයේ කටයුතුත්, පාර්ලිමේන්තු පරිශ්‍රයේ කාරක සභා කටයුතුත් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග මත පදනම් වෙලා තමයි සිදු කරන්න ඕනෑ.

නමුත්, අද උදේ 10.30ට පාර්ලිමේන්තුවේදී පැවැත්වුණා, යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව. එහි සභාපති වන්නේ ගරු මරික්කාර් මන්ත්‍රීතුමා. එම ආංශික අධීක්ෂණ කාරක සභාවට කැඳවා තිබුණා, එල්.ටී.එල්. සමාගමේත්, බලශක්ති අමාත්‍යාංශයේත්, නව විදුලි සමාගම් හතරෙහිත් නිලධාරින්. Agenda එකේ තිබුණේ මේ සම්බන්ධයෙන් ඔවුන්ගේ අනාගත වැඩ පිළිවෙළ පිළිබඳවයි. නමුත්, ඔවුන් ඒ agenda එකෙන් පිට ආයතන 2ක නිලධාරින් කැඳවා තිබුණා. ඒක මේ පාර්ලිමේන්තුවේ කටයුතුවලට පටහැනියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. එම කාරක සභාවට ගල් අඟුරු සමාගමේ නිලධාරිනුත්, ගල් අඟුරු plant එකේ නිලධාරිනුත්, ලක්විජය බලාගාරයේ නිලධාරිනුත් කැඳවා තිබුණා. ඒ, agenda එකෙන් පිට. ඒ නිසා මේ සම්බන්ධයෙන් වුණු කටයුතු පිළිබඳව අපි විරෝධය පළ කළා. ඒක පාර්ලිමේන්තු සම්ප්‍රදායයට මුළුමනින්ම පටහැනියි. ඒ නිසා ගරු කථානායකතුමා විසින් ඒ සම්බන්ධයෙන් වහාම පරීක්ෂණයක් පවත්වා මේ කාරක සභාවල ස්වාධීනත්වය පවත්වා ගෙන යාම සඳහා කටයුතු කරන්න කියලා මම කාරුණිකව ඉල්ලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඒ සම්බන්ධයෙන් ගරු කථානායකතුමාගේ අවධානයට යොමු කරවන්නම්.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ස්ථාවර නියෝග 92. (2) (ආ) යටතේ කියලා දෙන්න, රීති ප්‍රශ්නයක් මතු කිරීමේදී විනාඩියයි කථා කරන්න පුළුවන් කියලා. මෙතැන පැය ගණනක් කථා කර කර ඉන්නවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 1.19]

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்று இந்தச் சபையில் மிகவும் முக்கியமானதொரு விடயம் விவாதிக்கப்படுகின்றது. குறிப்பாக, அவசரகால நிலையை மேலும் ஒரு மாத காலத்துக்கு நீடிப்பதற்கான பிரேரணை முன்வைக்கப்பட்டு இருக்கின்றது. இது தொடர்பாக ஒருசில கருத்துகளைக் கூறலாமென நினைக்கின்றேன். இந்த அவசரகால நிலை பிரகடனப்படுத்தப்படுவதற்குக் காரணமாக இருந்தது வேறு எதுவுமல்ல, 'தித்வா' புயலால் ஏற்பட்ட அனர்த்த நிலைமைதான். அந்த அனர்த்த நிலைமையிலிருந்து நாட்டையும் மக்களையும் மீட்டெடுக்க வேண்டிய தேவையிருந்தது. அதனால்தான் இந்த அவசரகால நிலை கடந்த நவம்பர் மாதம் 28ஆம் திகதி அமுல்படுத்தப்பட்டது.

கிழக்கு மாகாணத்தைச் சேர்ந்த பாராளுமன்ற உறுப்பினர் ஒருவர், பாராளுமன்ற சிறப்புரிமைகளைப் பயன்படுத்தி இச்சபையில் மிக மோசமான கருத்துகளை முன்வைத்து வருகிறார். இந்த நாட்டில் யுத்தம் முடிந்து 17 வருடங்களாகின்றது. அதற்கு முன்னர், 30 வருடங்களாக இந்நாடு யுத்தத்தால் பாரிய அழிவுகளைச் சந்தித்தது.

கிட்டத்தட்ட 47 வருடங்களுக்கு முன்னர், எமது நாடு பல்வேறு நெருக்கடிகளைச் சந்தித்தது. அப்போது, தமிழ் மக்கள் அழிக்கப்பட்டார்கள்; அவர்களின் உரிமைகள் பறிக்கப்பட்டன. அதுமாத்திரமன்றி, அவர்களின் பொக்கிஷமாகக் கருதப்பட்ட யாழ். பொது நூலகம் எரித்துச் சாம்பலாக்கப்பட்டதுடன், அங்கிருந்த 97,000 புத்தகங்களும் கொளுத்தப்பட்டன. மேலும், யாழ். மாவட்ட அபிவிருத்தி சபைத் தேர்தலை நடத்தவிடாது மோசடி செய்து, வடக்கு, கிழக்கு இளைஞர், யுவதிகள் ஜனநாயக நீரோட்டத்துக்கு வருவது தடுக்கப்பட்டது. இந்த நிலைமைகள்தான் பின்னர் யுத்தமாகப் பரிணமித்தது. அன்றைய காலகட்டத்தில் யுத்தம் மூர்க்கத்தனமாக நடந்து கொண்டு இருந்தபொழுது, மட்டக்களப்பு மாவட்டத்தைப் பிரதிநிதித்துவம் செய்யும் இந்த நபருடைய தாத்தாவும் சரி, அப்பாவும் சரி, தமிழ் மக்களைக் கொன்றொழித்த, தமிழ் இளைஞர்களைச் சிறைவைத்த, தமிழ் யுவதிகளை மானபங்கப்படுத்திய நபர்களோடு கூட்டுச் சேர்ந்துகொண்டு இருந்தார்கள்.

இந்தச் சபையில் ராஜபக்ஷ குடும்பத்தைச் சேர்ந்தவர்கள் இருக்கிறார்கள். குறிப்பாக, ராஜபக்ஷவின் மகன் இருக்கிறார். தமிழ் மக்களுக்கு எதிரான குழுக்கள் ராஜபக்ஷவின் மகன்களால் உருவாக்கப்பட்டன. தமிழ் இளைஞர்கள் உட்பட தமிழ் மக்களை வேட்டையாடும் குழுக்கள் இருந்தன. அந்தக் குழுக்களோடு சேர்ந்து தமிழ் மக்களை வேட்டையாடிய நபர், இன்றைக்கு நீலிக்கண்ணீர் வடிக்கின்ற நபராக மாறியிருக்கிறார். இவ்வாறான நபர்களுக்கு நாங்கள் ஒன்றைச் சொல்லிக்கொள்ள வேண்டும். இவ்வாறு தொடர்ந்து பேசுவதன்மூலம், மீண்டும் இனவெறியைத் தூண்டுவதன்மூலம் தமிழ் மக்கள் மத்தியில் தங்களது இருப்பைத் தக்கவைத்துக் கொள்ள முடியுமென அவர்கள் நினைக்கலாம். நான் சொல்கின்றேன், முடியாது என்று.

கடந்த உள்ளூராட்சி மன்றத் தேர்தலின்போதும்கூட, கடுமையாக இனவாதத்தைப் பேசி மக்களைச் சூடேற்றினார்கள். தமிழ் மக்களுடைய உரிமைகள், காணிகள், சொத்துக்கள் என அனைத்தும் பறிமுதல் செய்யப்படும் என்ற பயத்தை ஏற்படுத்தி, அதன்மூலம் தங்களுடைய இருப்பைத் தக்கவைத்துக் கொள்ளலாமென நினைத்தார்கள். அன்றிருந்த யாழ்ப்பாணமோ, மட்டக்களப்போ, அம்பாறையோ, திருகோணமலையோ இன்று இல்லை என்பது எங்கள் எல்லோருக்கும் தெரியும்! அவை முற்றிலும் மாறியிருக்கின்றன. வன்னிப் பிரதேசத்தை எடுத்துக்கொண்டாலும் சரி, மலையகப் பிரதேசத்தை எடுத்துக்கொண்டாலும் சரி, அவை அவசரகாலச் சட்டம் மற்றும் பயங்கரவாதத் தடுப்புச் சட்டம் போன்ற சட்டங்களால் கூடுதலாகப் பாதிக்கப்பட்ட மக்கள் இருக்கின்ற பிரதேசங்களாகும்.

மட்டக்களப்பு மாவட்டத்தைப் பிரதிநிதித்துவம் செய்யும் குறித்த நபர், இன்றைக்கு கொழும்பில் சுத்துமாத்து வேலைகளைச் செய்துகொண்டு இருக்கின்ற நபரோடு சேர்ந்திருக்கிறார். யாழ்ப்பாணத்துக்கு வரும்பொழுது வேட்டியோடும் கொழும்பில் coat suit உடனும் இருப்பவர், இங்கிருக்கின்ற சிங்கள நபர்களோடு சேர்ந்து செயற்படுகிறார்; தனது பிள்ளைகளுக்குச் சிங்களவர்களைத் திருமணம் செய்துகொடுத்து சொகுசாக வாழ்கிறார். ஆனால், அங்கு சென்று தமிழ் மக்கள் மத்தியில் மீண்டும் இனவெறியைத் தூண்டுகிறார்; வெறியாட்டம் ஆடுகிறார்; சுத்துமாத்து வேலைகளைச் செய்கிறார். அந்த நபருக்கும் மட்டக்களப்பைப் பிரதிநிதித்துவம் செய்கின்ற நபருக்கும் நாங்கள் சொல்லிக் கொள்வது என்னவெனில், உங்களுடைய கபட நாடகம் இனியும் செல்லுபடியாகாது என்பதைத்தான்.

கடந்த காலங்களில் அவசரகாலச் சட்டம் நிறைவேற்றப் படும் பொழுது, நானும் இந்தப் பாராளுமன்றத்தில் இருந்தேன். கௌரவ செல்வம் அடைக்கலநாதன் அவர்களும் இருந்தார். நாங்கள் எல்லோரும் சேர்ந்து அதனை எதிர்த்தோம் என்பது உண்மை! ஒவ்வொரு முறையும் இந்தப் பாராளுமன்றத்தில் அவசரகாலச் சட்டம் நிறைவேற்றப்பட்ட பிறகு, அடுத்த நாளிலிருந்தே இந்த நாட்டில் தமிழ் இளைஞர்கள் வேட்டையாடப் படுவார்கள்; தமிழ் யுவதிகள் மானபங்கப்படுத்தப் படுவார்கள். இது எங்களுடைய கௌரவ இராதாகிருஷ்ணன் அவர்களுக்கும் தெரியும்!

விசேடமாக, கிழக்கு மாகாணத்தில் எல்லோராலும் பேசப்பட்ட ஒரு பெண்மணிதான் கோணேஸ்வரி! கோணேஸ்வரியின் கொலை என்பது படுமோசமான கொலை! அந்தக் கொலையைச் செய்த பாவிகளோடு இன்றைக்கு மட்டக்களப்பு மாவட்டத்தைப் பிரதிநிதித்துவம் செய்கின்ற குறித்த நபர் இணைந்துகொண்டு எங்கள் மீதும், எங்களுடைய அரசாங்கத்தின்மீதும் சேறுபூசலாமென நினைக்கின்றார். யாழ்ப்பாணத்தில் கோணேஸ்வரிபோல எங்களுடைய பிரதேசத்தில் கிரிசாந்தி குமாரசாமி இருந்தார். அவரைச் சித்திரவதை செய்து படுகொலை செய்தது மாத்திரமல்ல, அவருடைய குடும்பத்தையும் கூண்டோடு அழித்தார்கள். அந்த நபர்களோடு சேர்ந்திருந்து, அவர்களுடைய கட்சியில் அங்கம்வகித்து பிரதான புள்ளியாக இருந்த நபர், இன்றைக்கு இங்கு வந்து தமிழ் மக்களுக்காகக் குரல்கொடுப்பதாகக் கூறுகின்றார். அது இனியும் செல்லுபடியாகாது என்பதைக் கூறிக் கொள்கின்றோம்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இந்த இடத்தில் ஒரு விடயத்தைக் குறிப்பிட்டாக வேண்டும். நாங்கள் அவசரகாலச் சட்டத்தைப் பயன்படுத்தியதற்குக் காரணம் வேறு எதுவும் அல்ல, கடந்த வருடம் 'தித்வா' புயலால் ஏற்பட்ட அனர்த்த நிலைமைதான் என்பதை மீண்டும் ஞாபகப்படுத்துகின்றேன். இன்று மத்திய கிழக்கில் நிலவும் யுத்தம் காரணமாக உலகளாவிய ரீதியில் ஏற்பட்டிருக்கின்ற பிரச்சினை பற்றியும் எங்கள் எல்லோருக்கும் தெரியும். நாங்கள் அவசரகாலச் சட்டத்தை நீடிப்பது, இந்தப் பிரச்சினைகளை முகாமைத்துவம் செய்துகொள்வதற்கே தவிர, ஜனநாயகத்தைப் பறிப்பதற்கோ, கருத்துச் சுதந்திரத்தைப் பறிப்பதற்கோ, இந்த நாட்டிலிருக்கின்ற இளைஞர்களை வேட்டையாடுவதற்கோ, கடந்த காலங்களில் போன்று 'வெள்ளை வேனில்' எங்களுடைய இளைஞர்களைக் கடத்திச் செல்வதற்கோ அல்ல என்பதை இந்த இடத்தில் குறிப்பிட்டாக வேண்டும். நாங்கள் ஆட்சியைப் பொறுப்பேற்று 1½ வருடங்களுக்கு மேலாகின்றது. இந்தக் காலப் பகுதியில் அவசரகாலச் சட்டம் மற்றும் பயங்கரவாத தடுப்புச் சட்டத்தைப் பயன்படுத்தி எந்தவொரு சாதாரண குடிமகனும் தண்டிக்கப்படவில்லை.

இன்று இந்த நாட்டையே ஆட்டிப்படைக்கின்ற, இந்த நாட்டுக்குப் பேரழிவை ஏற்படுத்துகின்ற விடயமாக போதைப்பொருள் மாறியிருக்கின்றது என்பது எங்கள் எல்லோருக்கும் தெரியும். போதைப்பொருள் பாவனை காரணமாகவும் போதைப்பொருள் வியாபாரிகளின் மாபியா காரணமாகவும் முழு நாடும் பாதிக்கப்படும் நிலைமை இருந்தது. அதுமாத்திரமன்றி, அது முழு நாட்டையும் காவுகொள்கின்ற நிலைமையும் இருந்தது. அது வடக்கா, கிழக்கா, தெற்கா, மேற்கா என்று அல்ல; தமிழா, சிங்களமா, முஸ்லிமா என்று அல்ல. போதைப்பொருளுக்கு எதிராக நடவடிக்கை எடுப்பதற்கு முன்னர், யாழ்ப்பாணத்தின் ஒருசில

[ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා]

பிரதேசங்களுக்குச் செல்ல முடியாது. அதுமாத்திரமன்றி, அங்கு tuition முடித்துவிட்டு பெண் பிள்ளைகள் வீதியில் சுதந்திரமாகச் செல்ல முடியாது. இவ்வாறான ஒரு நிலைமைதான் அன்று இருந்தது. அப்போது அங்கிருந்த பெற்றோர்கள் எங்களிடம், "ஐயா! முடியுமாக இருந்தால் இந்தக் காடையர் கும்பலிடமிருந்து எங்களுடைய பெண் பிள்ளைகளைக் காப்பாற்றி, சுதந்திரமாக நடமாடுவதற்கு இடமளியுங்கள்; அதற்கான செயற்பாடுகளை முன்னெடுங்கள்!" என்று கேட்டார்கள். இன்றைக்கு அந்தப் பெற்றோர் மிகவும் தெளிவாகக் கூறுகின்றார்கள், "இப்போது எங்களுக்கு மிகவும் சந்தோஷமாகவும் நிம்மதியாகவும் இருக்கின்றது; நிலைமையில் மாற்றம் ஏற்பட்டிருக்கின்றது" என்று.

அன்றைக்கு அங்கு இருந்த காடையர் கும்பல் இன்றைக்கு இல்லை. இதனை எங்களால் இன்றைக்குப் பெருமையாகக் கூறமுடியும். அதுமாத்திரமல்ல, இன்றைக்கு வடக்கில் இருக்கின்ற பொலிஸ் நிலையங்கள் படிப்படியாக மிகவும் நல்லதொரு மாற்றத்தை நோக்கி நகர்கின்றன. இன்னமும் அந்தப் பொலிஸ் நிலையங்களில் இலஞ்சம் வாங்குகின்ற, மோசடி செய்கின்ற நபர்கள் இருக்கின்றார்கள் என்பதை மறுதலிக்க முடியாது. இருந்தபோதிலும்கூட, அங்கிருக்கின்ற பிரதானிகள் அனைவருமே இன்றைக்கு இந்த நிலைமைகளை மாற்றியமைப்பதற்கு ஏதுவான நடவடிக்கைகளை எடுக்கக்கூடிய நல்ல அதிகாரிகளாக மாற்றமடைந்து இருக்கிறார்கள் என்பதை நான் இந்த இடத்தில் குறிப்பிட்டே ஆக வேண்டும்.

அவசரகாலச் சட்டத்தைப் பயன்படுத்தி நாங்கள் மக்களை நசுக்குவதற்கோ, இளைஞர்களை ஒடுக்குவதற்கோ எந்தவிதமான செயற்பாடுகளையும் மேற்கொள்ளவில்லை. நாட்டின் தற்போதைய நிலைமையைக் கருத்திற்கொண்டு, ஜனநாயகத்தைப் பாதுகாப்பதற்கும், நாட்டைக் கட்டியெழுப்பும் பணிகளை முன்னெடுப்பதற்கும் ஏதுவான நடவடிக்கைகளை மேற்கொள்வதற்காகவே நாங்கள் இதனைப் பயன்படுத்துகிறோம் என்பதைக் கூறிக்கொள்கின்றேன். குறிப்பாக, இப்போது ஆட்சி அதிகாரம் இல்லாது போயிருக்கின்ற அரசியல்வாதிகள் மீண்டும் ஆட்சிக்கு வருவதற்காக போலியான குற்றச்சாட்டுகளை முன்வைத்து, இனவாதத்தைத் தூண்டி, மீண்டும் ஆட்சிபீடம் ஏற எத்தனிக்கிறார்கள். அதை ஒருபோதும் எமது நாட்டு மக்கள் அங்கீகரிக்க மாட்டார்கள் என்பதைக் கூறிக்கொண்டு, விடை பெறுகின்றேன். நன்றி, வணக்கம்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු වේලුසාමි රාධක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් ලැබෙනවා.

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
මට විනාඩි 7ක් තිබෙනවා නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
විනාඩි හයයි. කාලය අඩු වෙලා, ගරු මන්ත්‍රීතුමනි.

[பி.ப. 1.31]

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய விவாதத்தில் கலந்துகொண்டு பொதுமக்கள் பாதுகாப்பு சம்பந்தமான ஒருசில விடயங்களைச் சொல்ல ஆசைப்படுகின்றேன். இன்று நாட்டில் பல்வேறு குற்றச் செயல்கள் இடம்பெறுவதை நாங்கள் அவதானிக்கக்கூடியதாக இருக்கின்றது. குறிப்பாக, அதிகளவில் கொலைகள் நாட்டின் பல இடங்களில் நடைபெற்று வருகின்றன.

அமெரிக்காவில் இருப்பதுபோன்று இன்று நமது நாட்டிலும் சர்வசாதாரணமாக துப்பாக்கியோடு திரிகின்ற நபர்களைக் காணக்கூடியதாக இருக்கின்றது. இந்த நபர்கள் அநேகமாக போதைப்பொருள் கடத்துகின்றவர்களுடன் சம்பந்தப்பட்டவர்களாக இருக்கின்றார்கள். இதனால் அவர்கள் தங்களுக்குள் துப்பாக்கிச் சூடுகளை மேற்கொள்வதை நாங்கள் காணக்கூடியதாக இருக்கின்றது. எது எப்படி இருந்தாலும், இப்போது நாட்டில் அதிகமான குற்றச்செயல்கள் நடைபெறுகின்றன. இதன் காரணமாக மக்களுடைய வாழ்க்கை பாதிக்கப்படுகின்றது.

இன்று பல்வேறு இடங்களில் பல்வேறு பிரச்சினைகள் காரணமாக மக்கள் துன்பங்களை அனுபவிக்க வேண்டி இருக்கின்றது. சாதாரணமாக வீதியில் செல்கின்ற ஒருவன், வேறு ஒருவரை நோக்கி நடத்தப்படும் துப்பாக்கிச் சூட்டுக்கு இலக்காகும் நிலை காணப்படுகின்றது. இதனைத் தடுத்து நிறுத்துவதற்கு பொலிஸ் திணைக்களம் உரிய நடவடிக்கைகளை எடுக்க வேண்டும். நீங்கள் எப்படி நாட்டில் இலஞ்ச, ஊழலை ஒழிப்பதற்கு நடவடிக்கை எடுக்கிறீர்களோ, அதேபோன்று குற்றச்செயல்களையும் ஒழிப்பதற்கு நடவடிக்கை எடுக்க வேண்டும். குற்றச்செயல்கள் இருக்கும் வரை மக்களால் தங்களுடைய தொழில்களை நல்ல முறையில் மேற்கொள்ள முடியாத சூழ்நிலை இருக்கும் என்பதை நான் இந்த நேரத்தில் தெரிவித்துக் கொள்கின்றேன்.

நான் கௌரவ அமைச்சர் அவர்களிடம் ஒரு கோரிக்கையை முன்வைக்கின்றேன். பொலிஸ் திணைக்களத்தில் நிலவும் வெற்றிடங்களுக்கு ஆட்சேர்ப்பு நடைபெற இருப்பதாக நான் அறிகின்றேன். இந்த ஆட்சேர்ப்பின்போது மலையக இளைஞர்களுக்கும் வாய்ப்புக் கொடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். கடந்த வாரம் நாங்கள் மாண்புமிகு சனாதிபதி அவர்களுடன் கலந்துரையாடியபோது, இந்த விடயத்தை அவர் ஏற்றுக் கொண்டார். எனவே, பொலிஸ் உத்தியோகத்தர்களாக, பொலிஸ் 'கான்ஸ்டபிள்'களாக மலையக இளைஞர்களையும் உள்வாங்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

அண்மையில் மட்டக்களப்பில் பேராசிரியர் ஒருவர் கடத்திச் செல்லப்பட்டு கொலை செய்யப்பட்டு இருக்கிறார். யாழ்ப்பாணத்திலும் இவ்வாறான பல சம்பவங்கள் நடைபெறுகின்றன. வெறும் தாலிக்கொடிக்காக ஓர் அம்மாவையும் பிள்ளையையும் கொலை செய்து கிணற்றில் வீசிய சம்பவத்தையும் நாங்கள் அறியக்கூடியதாக இருக்கின்றது. இவ்வாறான குற்றச்செயல்களைத் தடுப்பதற்கு உரிய நடவடிக்கை எடுக்கப்பட வேண்டும் என்பதை இந்த நேரத்தில் நான் வலியுறுத்த விரும்புகின்றேன். இனங்களுக்கு இடையில் முரண்பாடுகளைத் தோற்றுவிப்பதாலும் பிரதேசவாதம் பேசுவதாலும் இந்த நாட்டில் மீண்டும் ஒற்றுமை சீர்குலைவதை நாங்கள் அவதானிக்கக்கூடியதாக இருக்கின்றது. எனவே, இந்த நிலைமை மாற வேண்டும்.

இன்று உலக நாடுகளுக்கு இடையில் ஏற்பட்டிருக்கின்ற முரண்பாடு காரணமாக எமது நாட்டு அரசாங்கமும் பல்வேறு சிக்கல்களுக்கு முகங்கொடுக்கவேண்டிய சூழ்நிலை ஏற்பட்டிருக்கின்றது. இந்த நிலையில், இந்திய அரசாங்கம் எமது நாட்டின் நிலைமையைச் சரிசெய்வதற்கு எடுக்கின்ற முயற்சிகளை நாங்கள் நிச்சயமாகப் பாராட்ட வேண்டும். அதேநேரம், அவற்றைச் சரியாகச் செய்வதற்கு நடவடிக்கை எடுக்கப்பட வேண்டும் என்பதையும் நாங்கள் வலியுறுத்துகின்றோம். நாட்டில் டீசல், பெற்றோல் மற்றும் ஏனைய பொருட்களுக்குத் தட்டுப்பாடு ஏற்படாமல் இருப்பதற்கு உரிய நடவடிக்கை எடுக்கப்படல் வேண்டும். குறிப்பாக, மரக்கறிச் செய்கையில் ஈடுபட்டிருக்கின்ற விவசாயிகளுக்கு இப்பொழுது உரம் தட்டுப்பாடாக இருக்கின்றது. நான் நினைக்கின்றேன், மத்திய கிழக்கில் சமாதானம் உருவாகினால் அவர்களுக்கு உரத்தைத் தட்டுப்பாடு இல்லாமல் கொடுக்கலாம் என்று. இல்லாவிட்டால், தட்டுப்பாடு ஏற்படாமல் அவர்களுக்கு உரத்தைக் கொடுப்பதற்குரிய நடவடிக்கைகளை அரசாங்கம் எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, இம்முறை GCE Advanced Level பரீட்சையில் மலையகத்தைச் சேர்ந்த அதிகமான மாணவர்கள் 3 "A"s பெற்றிருக்கிறார்கள். ஒரே பாடசாலையில் இல்லாவிட்டாலும், உதிரியாக ஒவ்வொரு பாடசாலையிலும் மாணவர்கள் 3 "A"s பெற்றிருக்கிறார்கள். அவர்களை நாங்கள் இந்த நேரத்தில் நிச்சயமாகப் பாராட்ட வேண்டும். நான் இந்த நேரத்தில் ஒன்றைச் சொல்லிக்கொள்ள விரும்புகின்றேன். அதாவது, மலையக மக்கள் படிக்காதவர்கள், முட்டாள்கள் என்று சொல்லப்படுகின்ற இந்தக் காலகட்டத்தில், மலையகத்தில் இருக்கின்ற மாணவர்கள் இவ்வாறு பெறுபேறுகளைப் பெற்றிருப்பது வரவேற்கக்கூடிய ஒரு விஷயமாகும். மலையகத்திலும் கிளிநொச்சியிலும் படிக்காதவர்கள்தான் இருக்கிறார்கள் என்று சொன்னவர்களுக்கு இது ஒரு பாடமாக இருக்க வேண்டும். கிளிநொச்சியைச் சேர்ந்த திருக்குமரன் என்ற மாணவன் தேசிய ரீதியிலே கணிதப் பிரிவில் முதலாவது இடத்தைப் பெற்றிருக்கிறார். இப்படியான பெறுபேறுகளைப் பெற்றிருக்கின்ற மாணவர்களைக் கொச்சைப்படுத்தக் கூடாது. எந்தச் சமூகத்தையும் கொச்சைப்படுத்திப் பேசுவது ஏற்றுக்கொள்ள முடியாத ஒரு விஷயம் என்பதைச் சொல்லி, பிரதேசவாதம், மதவாதம், இனவாதம் அற்ற நாடாக இந்த நாட்டை உருவாக்குவதற்கு இந்த அரசாங்கம் நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டு, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චතුරි ගංගානි මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.38]

**ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) எம்.ஏ.சீ.எஸ். சத்துரி கங்கானி)
(The Hon. (Mrs.) M.A.C.S. Chathuri Gangani)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනා සම්මතය, අත්‍යවශ්‍ය මහජන සේවා පනත යටතේ යෝජනා සම්මතය වාගේම ත්‍රිවිධ හමුදා අධිකාරී ලත්, අධිකාරී නොලත් නිලධාරිනියන් හමුදා සේවයෙන් විශ්‍රාම ගැන්වීමේ කාල සීමාවන් සංශෝධනය කිරීමට අදාළව ත්‍රිවිධ හමුදා කාන්තා බලකා නියෝග යාවත්කාලීන කිරීම ගැනත් අද දවසේ විවාදයට භාජන වනවා. අපි දන්නවා, අපේ රටේ ආරක්ෂක අංශ නියෝජනය කරන නිලධාරිනියන් කියන්නේ, තමන්ගේ ජීවිතය ගැනවත් නොසිතා, තමන්ගේ ආදරණීයයන් ගැනවත් නොසිතා මේ රටේ ජනතාව වෙනුවෙන් අනුපමේය මෙහෙවරක්, රාජකාරියට එහා ගිය පුරවැසි යුතුකමක් ඉටු කරන කණ්ඩායමක් බව. පසුගිය කාලයේ අපේ රට තුළ උද්ගත වුණු හදිසි තත්ත්වය තුළ වාගේම පැවැති ත්‍රස්තවාදය තුළත්, එය තුරන් කිරීම වෙනුවෙනුත්, ජාතික ආරක්ෂාව පිළිබඳව කටයුතු කිරීමේදීත් ඒ අයගේ මැදිහත්වීම අපි අවිවාදයෙන්ම, ප්‍රශංසනීය විධියට දකිනවා.

දැනට අපේ රටේ ත්‍රිවිධ හමුදාව තුළ රාජකාරියේ නිරත වෙලා ඉන්න සමස්ත කාන්තා භට පිරිසේ ප්‍රමාණය ගත්තොත්, - නිලධාරි වාගේම සෙසු නිලයන් කියන දෙපාර්ශ්වයම නියෝජනය කරමින් - 12,416ක් වනවා. එතරම් කාන්තා භට පිරිසක් එම සේවයේ නිරත වෙනවා. ඒ නිලධාරිනියන් තමන්ගේ වෘත්තිය තුළ වාගේම විෂය බාහිර කටයුතුවලදීත් ඉතාම ප්‍රශංසනීය විධියට දක්ෂතා පෙන්වපු කණ්ඩායමක්. එයට හොඳම සාක්ෂිය මා කියන්නම්. රාජකාරියේ යෙදී සිටියදී මියගිය සංඛ්‍යාව ගත්තොත්, නිල සහ සෙසු නිලවල නිලධාරිනියන් 55දෙනෙක් මිය ගිහින් තිබෙනවා. ත්‍රස්තවාදී ප්‍රහාර හේතුවෙන් ආබාධිතව ඇති පිරිස 10දෙනෙකු විධියට වාර්තා වෙලා තිබෙනවා. ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා පදක්කම් ලබා ගත් නිලධාරිනියන් සංඛ්‍යාව 147ක් වනවා. ජාතික මට්ටමේ ක්‍රීඩා පදක්කම් දිනාගත් සංඛ්‍යාව 1,441ක් වනවා. විශේෂයෙන්ම වීර පදක්කම් ලබා ගත් නිලධාරිනියන් සංඛ්‍යාව 8දෙනෙක්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දවසේ අනුමැතියට ඉදිරිපත් කර තිබෙන මේ නියෝගවලින් වෙනස්කම් කිපයක් කරන්න අපි බලාපොරොත්තු වන්නේ, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම් කරගෙන වෙනස් කොට සැලකීම කළ නොහැකිය කියන කාරණය වාගේම අපත් ඒක ඉතාම ඉහළ ප්‍රතිපත්තියක් හැටියට සලකමින් ප්‍රතිපත්තිගරුකව ආරක්ෂා කරන දේශපාලන කඳවුරක් වන නිසායි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ත්‍රිවිධ හමුදා නීතිය ගත්තොත්, සේවයෙන් විශ්‍රාම යෑම තීරණය වෙලා තිබෙන්නේ, විශ්‍රාම යෑමේ කාලය තීරණය වෙලා තිබෙන්නේ මෙන්න මේ කියන ස්ත්‍රී-පුරුෂභාවය පදනම් කරගෙනයි. මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ආරක්ෂා කරන, ආරක්ෂා කළ යුතු නීති සංශෝධනයක් තමයි අප අද දවසේ මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඔබතුමිය ඔය අසුනේ සිටියදී මට මේ කථාව කියන්න ලැබීම ඇත්තටම සතුටට කාරණයක්. විශේෂයෙන්ම ගත්තොත්, මේ ගරු පාර්ලිමේන්තුව තමයි මේ රටේ උත්තරීතර ආයතනය. මේ රටේ උත්තරීතර ආයතනයේ මේ සභා ගර්භය ඇතුළේ ඉන්න මන්ත්‍රීවරියන් අද මොන තරම් වාචික හිංසනයට ලක් වෙනවාද? ඇත්තටම අපි ඒකේ සාධනීය කාරණාවක් දකිනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒ කාරණාව මේකයි. මේ රටේ විපක්ෂයේ දේශපාලන කඳවුරට අද වනකොට මේ මන්ත්‍රීවරියන් තමයි අභියෝගයක් වෙලා තිබෙන්නේ. ඇත්තටම මේ දේශපාලන කඳවුර ඇතුළේ මන්ත්‍රීවරියන් වන අප වාගේම මේ දේශපාලන බිමේ ඉන්න කිසිවෙකුත් කොඳු බිඳ ගත්ත අය නොවෙයි. ඒ නිසා මම මතක් කරන්න කැමැතියි, මේක අවසාන අවස්ථාව කර ගන්න කියලා. මොකද, ඉදිරියට මෙවැනි තත්ත්වයක් දකින්න අපි කුමන මොහොතකවත් සූදානම් නැහැ.

[ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය]

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, හමුදා නිල දරන කාන්තාවන් - නිලධාරිනියන් - ස්ත්‍රී පුරුෂභාවය කියන පදනම ඇතුළේ සේවයෙන් විශ්‍රාම ගන්වන්න සිද්ධ වීම නීතිපති දෙපාර්තමේන්තුවේත් නිරීක්ෂණයට ලක් වෙලා තිබෙනවා. ත්‍රිවිධ හමුදාවලට අයත් අධිකාරි ලත්, අධිකාරි නොලත් නිලධාරිනියන් වයස අවුරුදු 45ට එළඹුණාට පස්සේ හෝ වයස අවුරුදු 20ක උපරිම සේවා කාලයක් සම්පූර්ණ කළාට පස්සේ, ඒ කියන්නේ මේ අවස්ථා දෙකෙන් කලින් යෙදෙන ඕනෑම අවස්ථාවක විශ්‍රාම ගැන්වීමට අවස්ථාව යෙදිලා තිබුණා. මේ තත්ත්වය හේතුකොටගෙන ත්‍රිවිධ හමුදාවේ නිලධාරිනියන්ට වයස අවුරුදු 45දී විශ්‍රාම ගැනීමට සිදු වීම නිසා නිල උසස්වීම් නොමැතිව දීර්ඝ කාලයක් එකම නිලයේ ඉඳලා විශ්‍රාම ගන්න සිද්ධ වුණා. උදාහරණයක් විධියට කිව්වොත්, යුද හමුදා නිලධාරිනියන්ට සේවා කාලය ඇතුළේ උපරිමය ලෙස යන්න පුළුවන් මේජර් තනතුර දක්වා විතරයි. ඇත්තටම අපි ඊට වඩා එහා දෙයක් බලාපොරොත්තු වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ත්‍රිවිධ හමුදාවේ සාමාන්‍ය සෙබළියන් වාගේම ජ්‍යෙෂ්ඨ නිලධාරිනියන් දක්වා වෛද්‍ය, ඉංජිනේරු, තොරතුරු තාක්ෂණ, හට කාර්ය සම්පාදනය හා නීති, ලිපිකරු, ගිණුම්කරු වාගේම පොදු විවිධ වෘත්තිවල රාජකාරි කටයුතු කරනවා. මේ අය අම්මලා; සහෝදරියෝ. විශේෂයෙන්ම ආදරණීය සේවාවක්, ගෞරවනීය සේවාවක් මේ රටට ඉටු කරන පිරිසක්. මෙම නිලධාරිනියන් මනා අභිමානයකින්, නිපුණතාවකින් රටට වැඩ කරන්න පුළුවන් සේවා නිපුණතාව, පරිණතභාවය ලබා ගන්න මොහොතේදීම මේ පවතින තත්ත්වය නිසා සේවයෙන් විශ්‍රාම යන්න සිද්ධ වනවා. ඒ වාගේම ඔවුන් පුහුණු කරන්න, ඒ නිලය දක්වා අරගෙන එන්න රජය විශාල වියදමක් දරනවා. හැබැයි, මේ පවතින තත්ත්වය හේතුවෙන් ඒ දරන වියදමට නිසි සේවයක් ඉටු කිරීමට ඒ නිලධාරිනියන්ට ඉඩක් නොලැබීම නිසාම දක්ෂතා හා කාර්යක්ෂමතා තිබෙන හමුදා නිලධාරිනියන් ඉතාම ඉක්මනින් සේවයෙන් ඉවත් වනවා.

මේ තත්ත්වය හේතුවෙන් රජය 2025.02.015 දිනැති අංක 2423/34, 2423/35 සහ 2423/36 දරන අති විශේෂ ගැසට් පත්‍ර යටතේ යුද හමුදා, නාවික හමුදා, ගුවන් හමුදාවේ සේවය කරන නිලධාරිනියන් වයස අවුරුදු 55ට එළඹීමේදී හෝ වසර 20ක උපරිම කාලයක් සේවය සම්පූර්ණ කිරීමෙන් පසු විශ්‍රාම ගැන්වීමේ සීමාව මේ නියෝග යටතේ දීර්ඝ කර තිබෙනවා. ඒ වාගේම කොමිෂන් නොලත් නිලධාරිනියක් නම්, වයස අවුරුදු 45ට එළඹීම හෝ අවුරුදු 22ක කාලයක් සේවය කිරීමෙන් පසු සේවයෙන් විශ්‍රාම ගැනීමට හැකි අවස්ථාව හදලා තිබෙනවා. ඒ වාගේම මේ වනකල් තිබුණු, සේවා කාලය අනුව විශ්‍රාම වැටුප් හිමිකම් ලබා සේවයෙන් අස් වී යෑමේ ක්‍රමය පැවති ආකාරයටම පැවතෙනවා. අපි කරලා තිබෙන්නේ විශ්‍රාම ගැනීමේ කාලයේ වෙනසක් කිරීම විතරයි.

මේ සංශෝධන නිසා නිලධාරිනියන්ට අත් වන ප්‍රගතිය මොකක්ද, වාසිසහගත අවස්ථා මොනවාද කියලා කථා කළොත්, නිල උසස්වීම් ලබා ගැනීමට හැකි වීම නිසා සියලු නිලධාරිනියන්ගේ අභිමානය, චිත්ත ධෛර්යය වර්ධනය වන විධියට ඒ අයගේ රාජකාරිය ඉටු කරන්න පුළුවන් මනා දිරි ගැන්වීමක්, පෞරුෂයක් ගොඩ නැඟෙනවා. ඒ වාගේම තමයි ස්ථිර, දක්ෂ හා පළපුරුදු පිරිසක් තවදුරටත් සේවයේ රැඳී සිටීම මඟින් කාර්යක්ෂමව කටයුතු කිරීමේ හැකියාව ලැබෙනවා.

ඒ විතරක් නොවෙයි, පුහුණු කාර්ය මණ්ඩල අවශ්‍යතාව අවම වීම නිසා ඇත්තටම වියදම් අඩු වෙලා පිරිවැය කළමනාකරණය කර ගන්නත් පුළුවන්කම ලැබෙනවා. ඒ වාගේම විදේශ පාඨමාලා, සාමසාධක රාජකාරි සඳහා යොමුවීමේ ඉඩ ප්‍රස්තාව වැඩි වෙන නිසා ඇත්තටම මේ නිලධාරි මහත්මීන්ට හිටියාට වඩා හොඳ ස්ථානයකට නිලතල ලබා ගැනීමට හැකියාව ලැබෙනවා. විශේෂයෙන්ම ගත්තොත්, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ 1325වන යෝජනාව මඟින් ඉදිරිපත් කර තිබෙන, සාමය හා ආරක්ෂාව සඳහා නායකත්ව භූමිකාව සඳහා කාන්තාවන්ට වැඩි ප්‍රවේශයක් ලබා දිය යුතුයි කියන පිළිගැනීම මේ මඟින් පිළිගැනීමට ලක් කර තිබෙනවා. ඒ වාගේම තමයි ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සහ කාන්තා බලගැන්වීම පිළිබඳ තිරසාර සංවර්ධන ඉලක්කයේ අරමුණු ද මේ මඟින් ඉටු වෙනවාය කියන එක ඇත්තටම මේ මොහොත වෙනකොට ඔප්පු වෙලා හමාරයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි මොන වෘත්තිය ගත්තත්, භාවිතාව ඇතුළේ කාන්තාවන්ට සීමා මායිම් තිබිය යුතු නැහැ. කාන්තාව අධ්‍යාපනය ඇතුළේ හෝ වෘත්තිය ඇතුළේ කොතැනටද යන්නේ කියන එක තීරණය කරන්න නම්, ඇත්තටම නීති රීති ඇතුළේ මෙවැනි පහසුකම් සැපයෙනවා වාගේම, ඔවුන්ට ඒ ඍජු තීන්දු තීරණ ගන්න පුළුවන් රටක් නිර්මාණය කළ යුතුයි. කාන්තාවට ඉන්න පුළුවන් රටක් නිර්මාණය කිරීම තමයි අපේ ප්‍රධාන බලාපොරොත්තුව වෙන්නේ. ඒක නිසා තමයි අද මෙවැනි අණපනත්, කෙටුම්පත් සම්පාදනය කරමින් ප්‍රතිපත්තිගරුක දේශපාලන කාරණාවක් විධියට අපි මේ රටේ කාන්තාවට සමාන අයිතිවාසිකම් හිමි සමාජයක් නිර්මාණය කිරීමට කටයුතු කරන්නේ. ඒ වාගේම ඒ අරමුණ සහිතව මේ දේශපාලන ව්‍යාපාරය දියත් කිරීමටත් බලාපොරොත්තු වෙන්නේ. මෙන්න මේ හේතු නිසා මේ ගැසට් පත්‍රය මඟින් කරන ලද සංශෝධන ඉතාම කාලෝචිත සංශෝධන බව ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අම්ර්තනාදන් අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මගේ නම කියලා ගරු අසිත නිරෝෂණ මන්ත්‍රීතුමා ප්‍රකාශයක් කළා. මට විනාඩියක් දෙන්න, ඒක පැහැදිලි කරන්නම්.

යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිවරයා හැටියට මම අද ලංකා විදුලිබල මණ්ඩලයට අනුබද්ධිත,- *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න කෝ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, අපි ඒ ගැටලුව කථානායකතුමා වෙත යොමු කරලා තිබෙන්නේ.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
පොඩ්ඩක් ඉන්න. මම පැහැදිලි කරන්න ඕනෑ. එතුමා මගේ නම කිව්වා නේ. ඉතින් මට අවස්ථාව දෙන්න.

ඒ අනුව අපි ඒ ආයතනය ගෙන්නුවා. කමිටුවේ සභාපතිවරයා හැටියට මම කමිටුවේ ලේකම්වරයාට සුමාන දෙකකට කලින් වාචිකව උපදෙස් දුන්නා, ලංකා ගල් අඟුරු සමාගමේ ටෙන්ඩර් ක්‍රියාපටිපාටිවලට අදාළ තොරතුරු සහිතව ඒ සමාගම ගෙන්වන්න කියලා. නමුත් ලේකම්වරයාගේ අතපසුවීමකින් ඔවුන්ට එන්න කියලා තිබුණේ නැහැ. හැබැයි, ලියුම යවලා තිබුණා, ඒ තොරතුරු දෙන්න කියලා. 2026.04.02වෙනි දා යවපු ඒ ලියුම මම **සභාගත*** කරනවා.

ඒ අතපසු වීමෙන් පස්සේ මම ඊයේ කථා කරලා ඔවුන් ගෙන්නුවා. නමුත් එතුමන්ලා කැමැති වුණේ නැහැ ඒ ගැන කථා කරන්න. ඒක අජීර්ණ හින්දා ද දන්නේ නැහැ. ඒ අනුව අපි ඒකට ඉඩ දීලා තිබෙනවා, කථා කළේ නැහැ. නමුත් එතුමා මෙතැනට ඇවිල්ලා කියන්නේ වැරදි තොරතුරු,-

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 1.49]

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
நன்றி, கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே! அவசரகாலச் சட்டத்தை மீண்டும் நீடிப்பதற்கான விவாதம் இங்கு நடைபெற்றுக்கொண்டு இருக்கின்றது. அவசரகாலச் சட்டம் எந்தச் சூழ்நிலையில் நிறைவேற்றப்பட்டாலும், எங்களுடைய தமிழீழ விடுதலை இயக்கம் மற்றும் ஜனநாயகத் தேசியக் கூட்டமைப்பு ஆகியன தொடர்ச்சியாக அதை எதிர்க்கும்! பொதுவாக மக்கள் ஆர்ப்பாட்டங்களைச் செய்கின்றபோது இச்சட்டத்தின் மூலமாக அடக்குமுறையைப் பயன்படுத்த வாய்ப்புகள் கூடுதலாக இருக்கின்றது என்பதைச் சொல்லிக்கொள்வதோடு, அதை நாங்கள் எதிர்க்கிறோம் என்பதையும் இங்கு குறிப்பிட விரும்புகின்றோம்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, உயிர்த்த ஞாயிறு தாக்குதல் தொடர்பான விவாதம் இன்று பிற்பகல் 2 மணிக்குப் பிறகு நடைபெற இருப்பதால், அது தொடர்பாக என்னுடைய கருத்தையும் சொல்லலாமென நினைக்கின்றேன். உண்மையிலே, இந்த உயிர்த்த ஞாயிறு தாக்குதல் சம்பந்தமாக அரசு எடுக்கின்ற அத்தனை முயற்சிகளுக்கும் எங்களுடைய ஆதரவு நிச்சயமாக இருக்கும் என்பதை நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன். இந்தத் தாக்குதலோடு சம்பந்தப்பட்ட பலர் கைதுசெய்யப்பட்டு இருக்கிறார்கள். அந்த வகையிலே, உயிர்த்த ஞாயிறு தாக்குதலின்போது மரித்த அந்த ஆத்மாக்களுக்கு ஒரு விடிவைக் கொடுக்க வேண்டுமாக இருந்தால், சம்பந்தப்பட்டவர்கள் யாராக இருந்தாலும் அவர்கள் தண்டிக்கப்பட வேண்டும். அதற்கு எங்களுடைய ஆதரவு என்றைக்கும் இருக்கும் என்பதை நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன். அதுமட்டுமல்லாமல், ஊழலுக்கு எதிராகவும் போதைவஸ்துக்கு எதிராகவும் இந்த அரசு மிகத் துரிதமான நடவடிக்கைகளை மேற்கொண்டு வருகிறது. அந்த வகையிலே, அதற்கு உறுதுணையாக இருக்கின்ற அத்தனை பேருக்கும் எங்களுடைய பாராட்டைத் தெரிவித்துக் கொள்கின்றோம். இந்த விடயங்களிலே அரசாங்கம் ஏதும் தவறுகள் விட்டால் அல்லது அதில் ஏதும் பிரச்சினைகள் இருந்தால் நாங்கள் அவற்றைச் சுட்டிக்காட்டுவோம். ஆனால், இப்படியான விடயங்களுக்கு ஆதரவளிப்பதற்கு நாங்கள் தயங்கமாட்டோம் என்பதை இங்கு குறிப்பிட விரும்புகின்றேன்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, அண்மையில் வெளிவந்த க.பொ.த. உயர் தரப் பரீட்சை பெறுபேறுகளின் அடிப்படையில், மன்னார் மாவட்டத்தில் முதலிடத்தை வகித்த பாடசாலைக்கும், அந்த மாணவச் செல்வங்களுக்கும் இந்த உயரிய சபையில் எனது பாராட்டைத் தெரிவித்துக் கொள்கின்றேன். அந்த வகையில், St. Xavier's Boys' College, Mannarஐச் சேர்ந்த ஏ. சாள்ஸ் என்பவர் உயிரியல் விஞ்ஞானப் பிரிவிலும், இலுப்பைக் கடவை தமிழ் மகா வித்தியாலயத்தைச் சேர்ந்த டி. சுதர்சன் டிதுர்சன் என்பவர் வணிகப் பிரிவிலும் மாவட்ட ரீதியில் முதலாவது இடத்தைப் பெற்றிருக்கிறார்.

பௌதிக விஞ்ஞானப் பிரிவில் பெரிய பண்டிவிரிச்சான் மகா வித்தியாலய மாணவன் குளோடியஸ் கிளாரஸ், கலைப் பிரிவில் முருங்கன் மகா வித்தியாலய மாணவி ஏ. சதுர்சிகா, விஞ்ஞானப் பிரிவில் அடம்பன் மத்திய மகா வித்தியாலய மாணவி சிவலோகநாதன் கருணிக்கா என்போர் மாவட்ட ரீதியில் சிறப்பான பெறுபேறுகளைப் பெற்றிருக்கிறார்கள். கல்வித் திணைக்களத்துக்கும், இந்தப் பாடசாலைகளின் அதிபர்கள், ஆசிரியர்கள் மற்றும் பெற்றோர்களுக்கும் எங்களுடைய பாராட்டுகளைத் தெரிவித்துக் கொள்கிறோம். ஏனென்றால், இந்தப் பாடசாலைகளில் விஞ்ஞானம், கணித பிரிவுகளுக்கான ஆசிரியர்கள் பற்றாக்குறையாக இருந்தாலும்கூட, அவர்கள் முனைப்போடு செயற்பட்டு எங்களுடைய மாவட்டத்தை முன்னுரிமைப்படுத்தி இருக்கிறார்கள். இதேபோல முல்லைத்தீவு, வவுனியா மாவட்டத்தில் உள்ள மாணவர்களும் நல்ல பெறுபேறுகளைப் பெற்றிருக்கிறார்கள். அவர்களுக்கும் எங்களுடைய வாழ்த்துக்களைத் தெரிவித்துக் கொள்கிறோம்.

நேற்றைய தினம் மாண்புமிகு சனாதிபதி அவர்கள் தலைமையில் ஒரு கூட்டம் நடைபெற்றது. அந்தக் கூட்டத்தில், மன்னார் மாவட்டத்தில் முள்ளிக்குளம் பகுதியில் கடற்படையினரின் கட்டுப்பாட்டில் உள்ள அங்குள்ள மக்களின் பூர்வீகக் காணி, வயல் காணி போன்ற விடயங்கள் சம்பந்தமாகக் கதைத்தபொழுது, மாண்புமிகு சனாதிபதி அவர்கள், அதனை மீட்டுக் கொடுக்கின்ற வகையில் கடற்படையினருடன் பேசி, அக்கறையோடு துரித முயற்சி எடுத்ததால், அதில் சில இடங்களைக் கையளிப்பதாகச் சொல்லப்பட்டுள்ளது. அந்த வகையில், இது நடைமுறைப்

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා]

படுத்தப்பட வேண்டும். மன்னார் மாவட்டத்தில் எங்களுடைய தேவாலயங்கள் மற்றும் Bishopக்குச் சொந்தமான காணிகளென இன்னும் பல இடங்கள் விடுவிக்கப்படவேண்டி இருக்கின்றன. அவையும் விடுவிக்கப்பட வேண்டும் என்பது எங்களுடைய கோரிக்கையாக இருக்கின்றது.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, மன்னார் மாவட்டத்தில் இயற்கை அனர்த்தம் காரணமாக மண் குவிந்திருக்கிறது. ஆனால், மன்னார் மாவட்டத்தில் ஒரு கியூப் மண் 75,000 ரூபாய்க்கு விற்கப்படுகின்றது. இயற்கையே எங்களுக்கு மண்ணைத் தந்திருக்கின்றது. இவ்வளவு கூடிய விலைக்கு அதனை விற்பது தடைசெய்யப்பட்டு இருப்பதால், அதனை மாபியாக்களிடமிருந்து பாதுகாத்து, பிரதேச செயலகங்களிடம் ஒப்படைத்து, அந்த விலையைக் குறைத்து 50,000 ரூபாய்க்கு விற்பதற்கான முயற்சியை மேற்கொள்ள வேண்டும் என்ற ஆலோசனையை நான் முன்வைக்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසානයි.

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, எனக்கு ஒரு நிமிடம் தாருங்கள்!

எங்களுடைய கௌரவ அமைச்சர் அவர்கள், சென். லூசியா மகா வித்தியாலய விளையாட்டு மைதானம், சென். யோசப் மகா வித்தியாலய விளையாட்டு மைதானம் ஆகிய இரண்டின்மீதும் தன்னுடைய கவனத்தைச் செலுத்தியிருந்தார். அங்கு ஊழல் நிறைந்திருக்கிறது. கடந்த அரசாங்க காலத்தில் இந்த வேலைத் திட்டங்களின்போது முறைகேடுகள் இடம்பெற்றிருக்கின்றன. அம்மைதானங்களின் வேலைகள் முற்றுப்பெறாத நிலையில் உள்ளன என்பதை நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன். ஆகவே, இந்த விடயத்தில் உடனடியாக நடவடிக்கை எடுக்கப்பட வேண்டும் என்பதைச் சொல்லிக் கொள்கின்றேன்.

இன்னுமொரு கோரிக்கையை இங்குள்ள அமைச்சர்களிடம் விடுக்க விரும்புகின்றேன். தயவுசெய்து, பாராளுமன்றத்துக்கு உள்ளேயும் வெளியிலும் தமிழ் இளைஞர், யுவதிகளுக்கு வேலைவாய்ப்புகளைக் கொடுப்பதற்கு இந்த அரசாங்கம் முயற்சிக்க வேண்டும். ஏனென்றால், கடந்த காலங்களில் போரைச் சாட்டி தமிழ் இளைஞர், யுவதிகளுக்கு இங்கே வேலைசெய்வதற்கான வாய்ப்புகள் மறுக்கப்பட்டன. ஆகவே, இந்த விடயத்தில் அரசாங்கம் தமிழ் இளைஞர், யுவதிகளுக்கு வாய்ப்பளிக்க வேண்டுமெனக் கேட்டு, விடைபெறுகின்றேன்.

நன்றி. வணக்கம்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[பி.ப. 1.56]

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தினம் இந்தச் சபையில் நடைபெறுகின்ற தரைப்படைச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள், கடற்படைச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள், வான்படைச் சட்டம் மற்றும் பொது மக்கள் பாதுகாப்புக் கட்டளைச் சட்டம் என்பவற்றின் கீழான ஒழுங்குவிதிகள் தொடர்பான விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றுவதையிட்டு மகிழ்ச்சியடைகின்றேன். தற்பொழுது, இச்சபையில் கௌரவ பொதுமக்கள் பாதுகாப்பு அமைச்சர் அவர்களும், கௌரவ நீதி அமைச்சர் அவர்களும் இருக்கிறார்கள். இரண்டு பேரும் இணைந்து, இந்த நாட்டில் இனவாதக் கருத்துகளைப் பகிரங்கமாகச் சொல்பவர்களை அடையாளங்கண்டு, அவர்களுக்கு எதிராக நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
Order, please! අද දින සභාවේ කටයුතු අවසන් වන තුරු කාලය දීර්ඝ කර ගැනීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කථා කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
அரசியல் நலனுக்காக இனவாதக் கருத்துகளைப் பகிரங்கமாகக் கூறி, இனங்களுக்கு இடையில் முரண்பாடுகளை ஏற்படுத்துகின்றவர்களுக்கு எதிராகச் சட்ட நடவடிக்கை எடுப்பதற்கான ஒரு பிரேரணையை இந்தப் பாராளுமன்றத்தில் கொண்டுவந்து நிறைவேற்ற வேண்டுமென மேற்குறித்த இந்த இரண்டு அமைச்சர்களிடமும் வேண்டுகோள் விடுக்கின்றேன். ஏனெனில், அண்மைக் காலமாக இனங் களுக்கு இடையிலுள்ள ஒற்றுமையைச் சீர்குலைப்பதற்காக பகிரங்கமாக பாரிய முயற்சிகள் நடைபெற்றுக்கொண்டு இருக்கின்றன. எனவே, இந்த விடயத்தில் நீங்கள் விசேட கவனம் செலுத்த வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, நமது நாட்டின் சனாதிபதி மாண்புமிகு அநுர குமார திஸாநாயக்க அவர்கள், 2025ஆம் ஆண்டு நடைபெற்ற உள்ளூராட்சி மன்றத் தேர்தல் பிரசாரக் கூட்டங்களில், 'ஈஸ்டர்' குண்டுத் தாக்குதலின் பிரதான சூத்திரதாரியை அவ்வாண்டு ஏப்பிரல் 21ஆம் திகதிக்கு முன்னர் நாட்டு மக்களுக்கு வெளிப்படுத்துவதாக பகிரங்கமாக மக்கள் மத்தியில் கூறினார். குறித்த 21ஆம் திகதி வருவதற்கு முன்னர், கௌரவ அமைச்சர் பிமல் ரத்நாயக்க அவர்கள், "சனாதிபதி அவர்கள்

கூறியதுபோன்று 21ஆம் திகதிக்கு முன்னர் 'ஈஸ்டர்' குண்டுத் தாக்குதலின் பிரதான சூத்திரதாரியைச் சொல்ல முடியாது. இன்னும் இரண்டு வாரங்கள் கால அவகாசம் தர வேண்டும்" என்று சொன்னார். ஆனால், இன்றுவரை 'ஈஸ்டர்' குண்டுத் தாக்குதலின் பிரதான சூத்திரதாரி யார் என்பதை சனாதிபதியோ, அரசாங்கமோ, பாதுகாப்பு அமைச்சோ, பொதுமக்கள் பாதுகாப்பு அமைச்சோ, வேறு எந்தவோர் அமைச்சோ தெரிவிக்கவில்லை. இது நாட்டு மக்கள் மத்தியில் பல்வேறு சந்தேகங்களை ஏற்படுத்தி இருக்கின்றன.

'ஈஸ்டர்' குண்டுத் தாக்குதலால் எமது நாட்டில் முஸ்லிம் சமூகத்துடன் இனபேதமன்றி வாழ்ந்துவந்த கிறிஸ்தவ மக்கள் 250க்கும் மேற்பட்டவர்கள் கொலை செய்யப்பட்டதுடன், 500க்கும் மேற்பட்டவர்கள் காயமடைந்தனர். அதேவேளை, எமது நாட்டின் சுதந்திரத்துக்கும் ஐக்கியத்துக்கும் பெரும் தியாகங்களைச் செய்த இலங்கையில் வாழும் முஸ்லிம் சமூகம் பெரும் பாதிப்புக்கு உள்ளானது. குறிப்பாக, இலங்கை ஜமாஅத்தே இஸ்லாமி இயக்கத்தின் தலைவர் அஷ்ஷெய்க் ரஷீட் ஹஜ்ஜுல் அக்பர் அவர்கள் கைது செய்யப்பட்டார். எமது முஸ்லிம் சமூகத்தின் உரிமைகளை நீதிமன்றில் நியாயப்படுத்துவதற்காக தைரியமாகப் போராடிவந்த சட்டத்தரணி ஹிஜாஸ் ஹிஸ்புல்லாஹ் அவர்கள் கைது செய்யப்பட்டார். இளம் எழுத்தாளரான அஹ்னப் ஜெஸீம் அநீதியான முறையில் கைது செய்யப்பட்டார். எமது மார்க்கத் தலைவர்களும் சமூக சேவையில் ஈடுபட்டவர்களும் கைது செய்யப்பட்டனர். அகில இலங்கை மக்கள் காங்கிரஸ் தலைவர் றிஸாட் பதியுதீன் அவர்கள் இரவு நேரத்தில் கைது செய்யப்பட்டார். வைத்தியர் ஷாபி அவர்கள் அநியாயமாகக் கைது செய்யப்பட்டு, தடுத்து வைக்கப்பட்டு விசாரிக்கப் பட்டார். எமது மார்க்கத் தலைவர்கள் அடிமைப் படுத்தப்பட்டனர். இலங்கையில் அமைந்துள்ள பள்ளிவாசல்களுக்குள் நாய்களுடன் பாதுகாப்புப் படையினரும் இனவாதிகளும் உள்நுழைந்தனர். அவர்கள் அங்குள்ள புனித அல்-குர்ஆனுக்கும் ஹதீஸ் புத்தகங்களுக்கும் மதிப்பளிக்காமல் எங்களுடைய புனித மார்க்கத்தை அவமானப்படுத்தினர்.

இலங்கையில் நடாத்தப்பட்ட இக்கொடூரமான குண்டுத் தாக்குதலை இலங்கையில் வாழும் முஸ்லிம் சமூகம் முழுமையாகக் கண்டித்தது. சில இனவாதிகள் இக்குண்டுத் தாக்குதலைப் பயன்படுத்தி ஒட்டுமொத்த முஸ்லிம் சமூகத்தையும் இக்குண்டுத் தாக்குதலுடன் தொடர்புபடுத்தி, நீண்ட காலமாக ஒற்றுமையுடன் வாழ்ந்துவந்த கத்தோலிக்க, கிறிஸ்தவ, சிங்கள மக்களையும் பிரித்து, இன ஒற்றுமையைக் குலைக்கும் வகையில் முஸ்லிம் சமூகத்துக்கு எதிரான இனவாதச் செயற்பாடுகளில் ஈடுபட்டனர். 'ஈஸ்டர்' குண்டுத் தாக்குதலால் பெரும் உயிரிழப்பை இலங்கையில் வாழும் கிறிஸ்தவ சமூகம் சந்தித்தது. இதன் பின்விளைவை இலங்கையில் வாழும் முஸ்லிம் சமூகம் எதிர்கொண்டது. இத்தாக்குதலின் பின்னர், இலங்கையில் வாழும் முஸ்லிம் மக்களுக்கு எதிரான அரசியல், கலாசார, பொருளாதார ஒதுக்குதல்கள் அரச மட்டம் தொடங்கி சமூக மட்டம்வரை வியாபித்திருந்தன.

நமது நாட்டில் JVPஇனர் ஆயுதம் ஏந்திப் போராடினார்கள். இலங்கை இராணுவத்தால் சுட்டுக்கொலை செய்யப்பட்ட JVPஇனரின் சடலங்களை இலங்கை அரசாங்கம் அன்று JVPஇனரின் உறவினர்களிடம் ஒப்படைத்தது. வடக்கு, கிழக்கு மாகாணங்களில் விடுதலைப் புலிகள் இயக்கத்தினர் இலங்கை இராணுவத்தால் சுட்டுக் கொல்லப்பட்டனர். அவ்வாறு சுட்டுக்கொல்லப்பட்ட விடுதலைப் புலிகள் இயக்கத்தினரின் சடலங்களை அவர்களின் குடும்பத்தினரிடம் இலங்கை இராணுவத்தினர் ஒப்படைத்தனர். ஆனால், 'ஈஸ்டர்' குண்டுத் தாக்குதலை மேற்கொண்டவர்களின் ஜனாஸாக்களை இலங்கை இராணுவத்திடமிருந்து யாரும் பாரமெடுத்து நல்லடக்கம் செய்யக் கூடாதென அகில இலங்கை ஜம்இயத்துல் உலமா சபை முஸ்லிம் சமூகத்திடம் பகிரங்கமாக வேண்டுகோள் விடுத்தது. இந்த வேண்டுகோளுக்கு இணங்க, முஸ்லிம் சமூகம் இறுதிவரைக்கும் அந்த ஜனாஸாக்களைப் பாரமெடுக்கவில்லை என்ற வரலாற்றை நாம் மறந்துவிடக் கூடாது.

முன்னாள் சனாதிபதிகளான மைத்திரிபால சிறிசேன, கோட்டாபய ராஜபக்ஷ, ரணில் விக்கிரமசிங்ஹ ஆகியோர், 'ஈஸ்டர்' குண்டுத் தாக்குதலின் சூத்திரதாரிகளைச் சட்டத்தின் முன் கொண்டுவராமல் அவர்களைப் பாதுகாத்து வந்தனர். 2024ஆம் ஆண்டு சனாதிபதித் தேர்தலின்போது, 'ஈஸ்டர்' குண்டுத் தாக்குதலின் சூத்திரதாரிகள் அனைவரையும் கண்டறிந்து சட்டத்தின்முன் நிறுத்துவோமென தேசிய மக்கள் சக்தி அரசாங்கமும் அதன் தலைமையும் நாட்டு மக்களுக்குப் பகிரங்கமாக வாக்குறுதி அளித்தது. இந்த குண்டுத் தாக்குதலால் பாதிக்கப்பட்ட கிறிஸ்தவ, முஸ்லிம் மக்கள் மட்டுமல்ல, முழு நாட்டு மக்களுமே இதன் உண்மைத் தன்மை வெளிப்படுத்தப்பட வேண்டுமென எதிர்பார்த்து இருக்கின்றனர். இதனால் பாதிக்கப்பட்ட மக்களுக்கு நீதியும், இந்த அழிவைத் திட்டமிட்டு நிகழ்த்தியவர்கள் மற்றும் மறைமுகமாக இருந்தவர்களுக்கு தண்டணையும் பெற்றுக் கொடுக்கப்பட வேண்டுமென மக்கள் எதிர்பார்த்துக்கொண்டு இருக்கின்றனர்.

இந்த குண்டுத் தாக்குதலின் சூத்திரதாரி யாரென தனக்குத் தெரியும் எனவும், சனாதிபதி அவர்களிடம் தன்னை அழைத்துச் சென்றால், அது தொடர்பான முழு விபரங்களையும் தெரிவிப்பேன் எனவும் ஞானசார தேரர் பகிரங்கமாகத் தெரிவித்துள்ளார். 'ஈஸ்டர்' குண்டுத் தாக்குதல் தொடர்பில் இதுவரை ஐந்து விசாரணைக் குழுக்கள் நியமிக்கப்பட்டுள்ள போதிலும், அந்தக் குழுக்களின் அறிக்கைகள் இதுவரை நாட்டு மக்களுக்கு வெளிப்படுத்தப்படவில்லை. இதனால் இக்குண்டுத் தாக்குதல் தொடர்பான விசாரணைகளில் சந்தேகம் நிலவுவதாக நமது நாட்டு மக்கள் தெரிவிக்கின்றனர். 'ஈஸ்டர்' குண்டுத் தாக்குதலின் பின்னணியை அறிவதிலும், பிரதான சூத்திரதாரிகளை அடையாளங்கண்டு சட்டத்தின்முன் நிறுத்துவதிலும், சனாதிபதி அநுர குமார திஸாநாயக்க தலைமையிலான இந்த அரசாங்கம் நியாயமான முறையில் நடந்துகொள்ள வேண்டுமென மக்கள் சார்பில் நாங்கள் கேட்டுக்கொள்கின்றோம்.

அரசின் சுயாதீன விசாரணைப் பொறிமுறையைத் திட்டமிட்ட வகையில் திசைதிருப்பும் நோக்கில் திரிபுபடுத்திய விடயங்களை உள்ளடக்கிய புத்தகங்களை வெளியிடும் உதய கம்மன்பில மற்றும் இனவாதக் கருத்துகளைக் கக்கும் சரத் வீரசேகர போன்றவர்களுக்கு எதிராக அரசாங்கம் சட்ட நடவடிக்கை எடுக்க வேண்டுமென நான் மக்கள் சார்பில் கேட்டுக் கொள்கின்றேன். ஏனெனில், இவர்கள் பகிரங்கமாக முஸ்லிம் சமூகத்தை மீண்டும் ஓர் இனவாதச் சூழலுக்குள் தள்ளும் நடவடிக்கைகளில் ஈடுபட்டு வருகின்றனர். "உயிர்த்த ஞாயிறு தின தாக்குதலின் பிரதான சூத்திரதாரியை தேடிச் செல்லல்" எனும் தலைப்பிலான புத்தக வெளியீட்டு விழா உதய கம்மன்பிலவின் ஏற்பாட்டில் கொழும்பில் நடைபெற்றது. இந்த நிகழ்வில் முன்னாள் சனாதிபதிகளான மஹிந்த ராஜபக்ஷ, மைத்திரிபால சிறிசேன, கோட்டாபய ராஜபக்ஷ, எங்களுடைய எதிர்க்கட்சித் தலைவர் கௌரவ சஜித் பிரேமதாஸ, எதிர்க்கட்சிப் பாராளுமன்ற உறுப்பினர்கள், அரசியல் தலைவர்கள் எனப் பலரும் கலந்து கொண்டார்கள். கடந்த இரண்டு சனாதிபதித் தேர்தல்களில் கௌரவ சஜித்

[ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා]

பிரேமதாஸ அவர்களுக்கு வடக்கு, கிழக்கு மாகாணங்களில் வாழும் தமிழ், முஸ்லிம் மக்கள் பெரும்பான்மையாக வாக்களித்தனர். எனவே, கௌரவ சஜித் பிரேமதாஸ அவர்கள் வடக்கு, கிழக்கில் வாழ்கின்ற தமிழ், முஸ்லிம் மக்களுடைய உணர்வுகளை மதித்துச் செயற்பட வேண்டுமென நான் இந்தச் சந்தர்ப்பத்தில் வேண்டுகோள் விடுக்கின்றேன்.

கர்தினால் மெல்கம் ரஞ்சித் ஆண்டகை அவர்கள் 'ஈஸ்டர்' குண்டுத் தாக்குதல் தொடர்பான விடயத்தில் தொடர்ச்சியாக அழுத்தங்களைக் கொடுத்து வருகின்றார். இந்தத் தாக்குதல் நடைபெற்று ஏழு வருடங்கள் கடந்துள்ள நிலையிலும், மாறி மாறி ஆட்சிக்கு வந்த அரசாங்கங்கள் இத்தாக்குதல் தொடர்பில் உரிய விசாரணைகளை நடத்தவில்லை. இதனால் கர்தினால் மெல்கம் ரஞ்சித் ஆண்டகை அவர்கள் பெரும் அதிருப்தியை வெளிப்படுத்தி வருவதோடு, சர்வதேச விசாரணையின் அவசியத்தையும் வலியுறுத்தி இருக்கிறார். அவர் ஐக்கிய நாடுகள் மனித உரிமைகள் பேரவைக்குச் சென்றும் நீதி கோரியிருக்கிறார். இந்த நிலையில், ஆட்சிக்கு வந்துள்ள தேசிய மக்கள் சக்தி அரசாங்கமானது உயிர்த்த ஞாயிறு தின தாக்குதல் தொடர்பில் நீதியான விசாரணைகளை நடாத்தி, சம்பந்தப்பட்டவர்களைச் சட்டத்தின்முன் நிறுத்த வேண்டு மெனக் கேட்டு, விடை பெறுகின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු හර්ෂණ නානායක්කාර අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.05]

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මා දීර්ඝ වශයෙන් කරුණු දක්වන්නේ නැහැ, මම විනාඩි 10ම ගන්නේත් නැහැ. මොකද, අපට ඡන්දයකට යන්න තිබෙනවා.

විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් අද විවිධ කරුණු දැක්වූවා. සමහර මන්ත්‍රීවරුන් මේ විවාදයේදී අදහස් දැක්වූවා, පාස්කු ප්‍රහාරය ගැන. ඒ කියන්නේ මේ විවාදය කෙරෙන්නේ මොකක් ගැනද කියලාවත් ලොකු අවබෝධයක් ඔවුන්ට නැහැ. පාස්කු ප්‍රහාරය ගැන විවාදය තිබෙන්නේ මීට පස්සේ, මේ වෙලාවේ යන්නේ වෙනත් විවාදයක්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කෙසේ හෝ වේවා අද දිනයේදී යුද්ධ හමුදා පනත යටතේ 2026.03.17වෙනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුව තිබෙනවා, ඒ වාගේම නාවික හමුදා පනත යටතේ නියෝග අනුමත කළ යුතුව තිබෙනවා, ඒ වාගේම ගුවන් හමුදා පනත යටතේ නියෝග ද අනුමත කළ යුතුව තිබෙනවා. ඊළඟට, මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් ඉහත කී ආඥාපනතේ II වැනි කොටසේ විධිවිධාන 2026 මාර්තු 28 වැනි දින සිට ශ්‍රී ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක කරමින් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතුව තිබෙනවා සහ අත්‍යවශ්‍ය මහජන සේවා පනත යටතේ යෝජනා සම්මතය අනුමත කළ යුතුව තිබෙනවා. මේ සියල්ල සාකච්ඡා කිරීම සඳහා කැඳවන ලද විවාදයේදී තමයි මම මේ ඉතා කෙටි කරුණු දැක්වීම මේ සභාවට ඉදිරිපත් කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි හදිසි අවස්ථා රෙගුලාසි, එහෙම නැත්නම් මහජන ආරක්ෂක ආඥාපනත යටතේ වන යෝජනාව ඉස්සෙල්ලාම ඉදිරිපත් කරනු ලැබුවේ "දිට්වා" සුළි කුණාටුවෙන් පසුවයි. එසේ ඉදිරිපත් කරනු ලැබුවේ ඒ මොහොත වන විට තිබුණු තත්ත්වයන් යටතේ ජනාධිපතිවරයාට, බලය ලත් අමාත්‍යවරුන්ට, අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයාට සහ නම් කරන ලද අනෙකුත් නිලධාරීන්ට තාවකාලික ලෙස බලතල ලබා දීමටත්, රාජ්‍ය ආයතන හා සේවා සපයන්නන්ට නියෝග නිකුත් කිරීමේ බලය ලබා ගැනීමටත්, අවශ්‍ය සහයෝගය සහ තොරතුරු ලබා දීම සහ ඉන්ධන, ආහාර, විදුලිය, ජලය වැනි අත්‍යවශ්‍ය සේවා හා භාණ්ඩ බෙදා හැරීම හදිසි අවස්ථා තත්ත්වය ක්‍රියාත්මක වන කාලය තුළ බාධාවකින් තොරව පවත්වා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීමටයි. එහි වඩාත්ම වැදගත් අංගය වූයේ අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා.

මේ නිශ්චිත මොහොතේදී අප ඇයි නැවත එහි දිගුවක් ඉල්ලන්නේ? මක්නිසාද, - අපේ ආනන්ද විජේපාල ඇමතිතුමාත් කිව්වා - රටක් වශයෙන් ඉතාම සාර්ථක ලෙස "දිට්වා" ආපදා තත්ත්වයෙන් එළියට එන්න ආණ්ඩුව සමත් වුණා, අපි රටත් සමඟ එකට එළියට ආවා. එහිදී සම්පත් බෙදා හැරීමේදී, ජනතාවට උදවු කිරීමේදී අත්‍යවශ්‍ය මහජන සේවා පනත යටතේ ගෙන එන ලද යෝජනා සම්මතය අපට වැදගත් වුණා. නමුත්, තවමත් සුරක්ෂා මධ්‍යස්ථානවල යම් පිරිසක් සිටිනවා. ඔවුන්ට සහන සපයන්නට ඕනෑ. ගෙවල් හැදීම සිද්ධ වනවා; ඒවා කරන්නට ඕනෑ. ඒ නිසා තවත් මාසයක කාලයකට හදිසි අවස්ථා රෙගුලාසි සහ අත්‍යවශ්‍ය මහජන සේවා පනත යටතේ යෝජනා සම්මතය දිගු කිරීමට තමයි අනුමැතිය ඉල්ලන්නේ.

අද මේකට ඡන්දයක් ඉල්ල? මීට කලින් මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනා සම්මතය, හදිසි නීති තත්ත්වයන් පාවිච්චි කළේම ජනතාව මර්දනය කරන්න, ජනතාව පාලනය කරන්න සහ ඔවුන්ගේ භාෂණයේ නිදහස විනාශ කරන්න. මට ඇහුණා, ගරු මන්ත්‍රීවරයෙකුත් එය කියනවා. නමුත්, ඒ රෙගුලාසිම අපේ රජය පාවිච්චි කරලා තිබෙන්නේ ජනතාවට උදවු කරන්න, සහන සපයන්න. මොකද, අපි කලින් තිබුණු ආණ්ඩුවල හිටපු අය වාගේ නොවෙයි. ඒ නිසා මම නම් හිතන විධියට, මේවාට Division එකක් කැඳවන්න අවශ්‍යත් නැහැ. නමුත්, ඒක ඔවුන්ගේ අයිතිය.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "Freedom in the World 2026" වාර්තාව එළි දක්වා තිබෙනවා. එහිදී ඔවුන් බලනවා, ගෝලීය වශයෙන් දේශපාලන අයිතිවාසිකම්, සිවිල් නිදහස සම්බන්ධයෙන්. භාෂණයේ නිදහස, මාධ්‍ය නිදහස ආදී මේ සියල්ල සම්බන්ධයෙන්ම බලා කියනවා, 2024ට සාපේක්ෂව 2025දී ලකුණු 5ක කැපී පෙනෙන වර්ධනයක් ශ්‍රී ලංකාව අත්පත් කර ගන්න සමත් වී තිබෙන බව. ඔවුන් කියනවා, අවුරුදු 20ක් එක දිගටම ගෝලීය නිදහස, ගෝලීය භාෂණ නිදහස, මානව නිදහස උල්ලංඝණය වන අවස්ථාවකදී ලංකාව ඒ දර්ශකයේ ඉහළට යන බව, මිනිසුන්ගේ භාෂා නිදහස, අදහස් ඉදිරිපත් කිරීම අතින්. ඒකෙන් පෙන්නුම් කරන්නේ මොකක්ද? ඒකෙන් පෙන්නුම් කරන්නේ අපේ ආණ්ඩුව මානව හිමිකම්වලට, නීතියේ විධානයේ ආධිපත්‍යයට දීලා තිබෙන මුල් තැනයි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
Order, please! මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇත.

*අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. SPEAKER took the Chair.*

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, 2024 ජනාධිපතිවරණයේදී තිබුණු විනිවිදභාවය, ප්‍රචණ්ඩ ක්‍රියා අවම වීම, දූෂණයට එරෙහිව කටයුතු කිරීමට ගෙන ඇති පියවර, ඒ වාගේම ජාතික හා ආගමික ප්‍රවර්ධනය සඳහා, සංහිඳියාව සඳහා ගෙන ඇති පියවර ආදී මේ සියල්ල මඟින් "Freedom in the World 2026"හි අපි තැන් පහකින් උඩට එනවා. ඒ කියන්නේ, අපේ රජය මේ හදිසි අවස්ථා රෙගුලාසි ගෙනාවාට මේ කිසිදු නිදහසකට හානි වන ආකාරයට අපි එය ගෙනාවේ නැහැ.

ඒ වාගේම, "දිට්වා" සුළි කුණාටුවෙන් පසුව ඇති වුණු තත්ත්වයට අමතරව තවමත් හදිසි තත්ත්වයක් යම් ප්‍රමාණයකට තිබෙනවා. අපි දන්නවා, ගෝලීය වශයෙන් ඉරානය සහ ඇමෙරිකාව අතර ඇති වුණු ගැටුමෙන් ලෝකයේ සැපයුම් ජාලයට ලොකු බලපෑම් ඇති කරලා තිබෙන බව. ඒ වාගේම ඉන්ධන, ගෑස් ආදී සියල්ලේ මිල වැඩි වෙලා තිබෙනවා. ගෝලීය වශයෙන් හැම රටක්ම අර්බුදකාරී තත්ත්වයකට මුහුණ දීලා තිබෙනවා. ඒ අර්බුදකාරී තත්ත්වය ඉදිරියේදී කෙසේ වර්ධනය වෙයිද කියන්න අපට හැකියාවක් නැහැ. මොකද, මේ අවස්ථාවේදී සටන් විරාමයක් - ceasefire එකක් - තිබුණත්, එය ඉතාම බිඳෙන සුළු - fragile - මට්ටමක තිබෙන්නේ. මක්නිසාද, ඒ ceasefire එක announce කිරීමෙන් පසුවත් යම් ප්‍රහාර සිද්ධ වෙලා තිබෙනවා; යම් තර්ජනාත්මක දේවල් සිද්ධ වෙනවා. ඒ නිසා ඉදිරියේදී එන තත්ත්වයන් සියල්ලට මුහුණ දෙමින් අපි ගමන් කරන්නට ඕනෑ. අපි වෙනත් ආණ්ඩු වාගේ නොවෙයි. අපට කම්පනයක් තිබෙනවා. ගෑස් මිල වැඩි වීම නිසා ජනතාවට දරා ගන්න අපහසු තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඉන්ධන මිල වැඩි වීම නිසා ජනතාවට දරා ගන්න අපහසු තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. නමුත්, ඒ සියල්ලම සිද්ධ වෙන්නේ ගෝලීයව වන නිසා අපට රජයක් වශයෙන් කරන්න පුළුවන් වෙන්නේ ඉතාම සැලසුම් සහගතව ජනතාවට එන පීඩාව අවම කිරීම සඳහා වැඩ කටයුතු කිරීමයි.

ඔබතුමන්ලා දන්නවා, "දිට්වා" සුළි කුණාටුව ඇති වුණු වෙලාවේදී අපි රුපියල් බිලියන 500ක් වැය කරලා ඒ ආපදාවට පත් ජනතාවට සහන ලබා දුන් බව. අපි "දිට්වා" සුළි කුණාටුවෙන් පසුව වන්දි ලබා දුන් ආකාරය පිළිබඳව ගත්තොත්, ඓතිහාසිකව කිසිම රජයක් ඒ තරම් ක්‍රමවත්ව වන්දි ගෙව්වේ නැහැ. ගෙදර හදා ගන්න රුපියල් ලක්ෂ 50ක්, ඉඩමක් ඕනෑ නම් රුපියල් ලක්ෂ 50ක්, මිය ගිය අයගේ පවුල්වලට රුපියල් ලක්ෂ 10ක් යනාදී වශයෙන් අපි වන්දි ගෙව්වා. බදු මුදල් එකතු කරලා අපි ඒ දේ සිද්ධ කළා. ජනතාවට දෙන්න පුළුවන් උපරිම සහන ටික අපි ලබා දුන්නා. ඒ එකක්වත් මුදල් අච්චු ගහලා හෝ ණය අරගෙන කළා නොවෙයි. මේ නිශ්චිත මොහොතේදීත් ගරු ජනාධිපතිතුමා විසින් ඉලක්කගත ප්‍රජාවට - හැමෝටම නොවෙයි - සහනයක් දෙන්න රුපියල් බිලියන 100ක පැකේජයක් අනුමත කරලා තිබෙනවා. ඉන්ධන මිල ඉහළ යැමත්, පවතින වියළි කාලගුණික තත්ත්වයත් හේතුවෙන් විදුලිය ජනනය කිරීම සඳහා තාප බලාගාර යෙදවීම වෙනුවෙන් දැරීමට සිදු වන අමතර පිරිවැය විදුලි පාරිභෝගිකයන් වෙත විතැන් කිරීම වෙනුවට ඒකක 90ට අඩු විදුලි පාරිභෝගිකයන්හට සහනයක් ලබා දීමට හැකි වන පරිදි අදාළ අමතර පිරිවැය මාස තුනක කාලයක් රජය විසින් දරනවා. ඒ කියන්නේ මොකක්ද? අපි මේ එන හැම බරක්ම මිනිස්සු මත පටවනවා නොවෙයි. ඒකෙන් කොටසක් රජය භාර ගන්නවා. ඒකට තමයි ඒ රුපියල් බිලියන 100 වෙන් කරනු ලැබුවේ.

ඒ වාගේම අපි දන්නවා, ඉලක්කගත ප්‍රජාවන් අතුරින් ධීවර කර්මාන්තයේ යෙදෙන එක් දින ධීවර යාත්‍රාවක් වෙනුවෙන් දිනකට ඉන්ධන ලීටර 25ක් බැගින් මසකට උපරිම දින 25ක් දක්වා ඉන්ධන ලීටරයකට රුපියල් 50ක් බැගින් වූ සහනාධාරයක් මාස තුනක කාලයක් ලබා දෙන බව. ඉදිරි මාස තුන තුළ ධීවර කර්මාන්තයේ යෙදෙන බහුදින ධීවර යාත්‍රාවක් සඳහා රුපියල් 150,000ක එකවර ගෙවනු ලබන දීමනාවක් ලබා දෙනවා. මේ සියල්ලම අපේ ජනාධිපතිවරයා විසින් ගෝලීය සැපයුම් ජාලය අඩාළ වීම නිසා ඇති වන ප්‍රශ්නවලට මුහුණ දීම පිණිස ජනතාවට ලබා දෙන සහන. සත්‍ය වශයෙන්ම කියනවා නම්, හරි විධියට පෙට්‍රල් ලීටරයක් විකුණනවා නම් එහි මිල රුපියල් 625ට වඩා වැඩියි. ඩීසල් ලීටරයක මිල රුපියල් 600ට වඩා වැඩියි. නමුත්, රජය විසින් එහි යම් කොටසක් දරා ගෙන මේ ගණන්වලට මේවා ලබා දෙනවා.

අපි පොහොර සහනාධාරය ඉහළ නංවා තිබෙනවා. දැනට හෙක්ටෙයාරයකට රුපියල් 25,000ක් වශයෙන් ලබා දෙන පොහොර සහනාධාරය යල කන්නය සඳහා රුපියල් 30,000 දක්වා ඉහළ නැංවීම සහ කුඹුරුවල වගා කරනු ලබන අතිරේක භෝග සඳහා දැනට ලබා දෙන හෙක්ටෙයාරයකට රුපියල් 15,000ක් වන පොහොර සහනාධාරය යල කන්නය සඳහා රුපියල් 18,000 දක්වා ඉහළ නංවා තිබෙනවා.

ඒ වාගේම අස්වැසුම ප්‍රතිලාභී කණ්ඩායම් සඳහා රුපියල් 7,500ක මුදලක් අන්ත දිළිඳු කාණ්ඩයේ පවුලක් වෙත ලබා දෙනවා. *[බාධා කිරීමක්]* 2026 අප්‍රේල් මාසය සඳහා රුපියල් 5,000ක මුදලක් දුප්පත් කාණ්ඩයේ පවුලක් වෙත ලබා දෙනවා. රුපියල් 2,500ක මුදලක් සංක්‍රාන්ති පවුලක් වෙත ලබා දෙනවා. මම මේ කිව්වේ අප්‍රේල් මාසයට විතරක් ලබා දෙන සහන. මොකද, අපි ඉලක්කගතව මේ ආධාර ලබා දෙනවා. මනුස්සයෙකුට උදවු කරනවා කියනකොටත් කෑ ගහන, ඇඹරෙන විපක්ෂයක් නම් ඉන්නේ, එහෙම රටකට ආයේ කවර කථාද?

කෙසේ හෝ වේවා, මා මේ පෙන්නුම් කළේ ගෝලීයව තිබෙන ගැටලුවකට අපි මුහුණ දීමේදී ඇති වන තත්ත්වය පිළිබඳවයි. මොකද, දැන් මේ රටේ තෙල් අර්බුදයක් මතු වෙන්නේ අපි භාණ්ඩාගාරය සුද්ද කරපු නිසා නොවෙයි, මැද පෙරදිග පවතින යුද්ධය නිසායි. 2022දී ගෝඨාභයගේ කාලයේ පෝලිම් ආවා. මොකද, භාණ්ඩාගාරය සුද්දයි, නැව් ආවාට ගෙවන්න සල්ලි තිබුණේ නැහැ. දැන් ගෙවන්න සල්ලි තිබෙනවා. නමුත්, නැව් එන්නේ නැහැ; නැව් ආවත් මිල වැඩියි. ඒ නිසා අපිත් කම්පනයකට පත් වෙනවා. මොකද, ගෑස් මිල ටිකක් වැඩි බව අපි දන්නවා. පෙට්‍රල් මිල වැඩියි. නමුත්, ඒකෙන් කොටසක් රජය දරා ගෙන තමයි මේ වැඩේ කරන්නේ. මොකද, අපි ජනතාව වෙනුවෙන් පෙනී සිටින අය.

ගරු කථානායකතුමනි, ඒකටත් හරියන්න අපට විපක්ෂයක් ඉන්නවා. මිනිහෙකුට හෙණ ගහලා හරි කමක් නැහැ, රට විනාශ වෙලා හරි කමක් නැහැ, ඔටුන්න තමන්ගේ ඔඩොක්කුවට වැටෙනවා නම් වෙන මුකුත් ඕනෑ නැහැ. ඇත්තටම මේක විපක්ෂයක් නොවෙයි, විපත්තියක්. ඒගොල්ලන් බලාගෙන ඉන්නේ මිනිස්සුන්ට කරදර වෙලා, හිරිහැර වෙලා, පෝලිම් එනවා දකින්නයි. එතකොට කට්ටියට බොහොම සන්තෝෂයි. අත් දෙක අඹරවාගෙන, "ආ, අපි කිව්වා ඔන්න ආණ්ඩුව වැටෙනවා, මෙන්න

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

වැටෙනවා" කියනවා. ඇත්තවශයෙන්ම අපි මේ විපක්ෂයෙන් ඉල්ලා සිටින්නේ අඩුම ගණනේ මානව දයාව පොඩ්ඩක් ප්‍රගුණ කරන්න, මිනිස්සුන්ට කරදර වෙනකොට උදවු කරන්න කියන එකයි. උදවු කරන්න බැරි නම් ඒ විධියට බලය ගන්න හිතා ගෙන ඉන්න එපා. ඉස්සෙල්ලා ප්‍රතිපත්තියක් තියා ගන්න, AIවලින් හරි කමක් නැහැ. මට කියන්න තිබෙන්නේ එච්චරයි, ගරු කථානායකතුමනි.

ස්තුතියි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## නාවික හමුදා පනත: නියෝග
## கடற்படைச் சட்டம்: ஒழுங்குவிதிகள்
## NAVY ACT: REGULATIONS

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "(358 අධිකාරය වූ) නාවික හමුදා පනතේ 161 වගන්තිය යටතේ ආරක්ෂක අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 පෙබරවාරි 15 දිනැති අංක 2423/35 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.03.17 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.
>
> (අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ගුවන් හමුදා පනත: නියෝග
## வான்படைச் சட்டம்: ஒழுங்குவிதிகள்
## AIR FORCE ACT: REGULATIONS

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "(359 අධිකාරය වූ) ගුවන් හමුදා පනතේ 29 සහ 155 වගන්ති යටතේ ආරක්ෂක අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 පෙබරවාරි 15 දිනැති අංක 2423/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.03.17 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.
>
> (අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## මහජන ආරක්ෂක ආඥාපනත: යෝජනා සම්මතය
## பொதுமக்கள் பாதுகாப்புக் கட்டளைச் சட்டம்: தீர்மானம்
## PUBLIC SECURITY ORDINANCE: RESOLUTION

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "1959 අංක 8 දරන පනතින් ද, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 6 දරන පනතින් සහ 1988 අංක 28 දරන පනතින් ද සංශෝධිත (40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් ඉහත කී ආඥාපනතේ II වැනි කොටසේ විධිවිධාන 2026 මාර්තු 28 වැනි දින සිට ශ්‍රී ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක කරමින් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය."

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

න්‍යාය පත්‍රයේ විෂය අංක 4, මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනා සම්මතය අනුමත කිරීමට සභාව එකඟද?

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Sir, we would like to call for a Division on the Extension of the Emergency Regulations.

*බෙදුම් සීනුව නාද වී අවසන් වුණාට පසු -*
*பிரிவுமணி ஒலித்து ஓய்ந்த பின் -*
*At the conclusion of the Division Bell -*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දැන් ඡන්දය ප්‍රකාශ කිරීමේ අවස්ථාව.

න්‍යාය පත්‍රයේ විෂය අංක 4, මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනා සම්මතය, සම්මත කිරීමට පක්ෂ මන්ත්‍රීවරුන් කොළ පැහැති බොත්තමත්, විරුද්ධ මන්ත්‍රීවරුන් රතු පැහැති බොත්තමත්, ඡන්දය දීමෙන් වැළකී සිටින මන්ත්‍රීවරුන් කහ පැහැති බොත්තමත් භාවිත කර ඡන්දය ප්‍රකාශ කළ හැකියි.

ගරු මන්ත්‍රීවරුනි, දැන් ඡන්දය දීම ආරම්භ කරන්න.

***මේ අවස්ථාවේදී ඡන්දය දීම ආරම්භ කෙරිණි.***
*(இச்சந்தர்ப்பத்தில் வாக்கெடுப்பு ஆரம்பமானது.)*
*(At this stage, the Voting commenced.)*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, ඔබගේ ඡන්දය ඩිජිටල් පුවරුවේ නිවැරදිව සටහන් වී ඇත්දැයි බලන්න.

මගේ දකුණු අත පැත්තේ ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ ගරු මන්ත්‍රීවරු ඉන්නවා නම් කරුණාකර නැඟී සිට දන්වන්න.

**ගරු (මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා (විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) கிரிஷாந்த அபேசேன - விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சர்)
(The Hon. (Prof.) Chrishantha Abeysena - Minister of Science and Technology)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ක්‍රිෂාන්ත අබේසේන ඇමතිතුමනි, ඔබතුමා ඡන්දය ප්‍රකාශ කරන්නේ පක්ෂවද, විපක්ෂවද?

**ගරු (මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) கிரிஷாந்த அபேசேன)
(The Hon. (Prof.) Chrishantha Abeysena)
පක්ෂයි.

**ගරු එරංග ගුණසේකර මහතා (නාගරික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எரங்க குணசேகர - நகர அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Eranga Gunasekara - Deputy Minister of Urban Development)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු එරංග ගුණසේකර නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා ඡන්දය ප්‍රකාශ කරන්නේ පක්ෂවද, විපක්ෂවද?

**ගරු එරංග ගුණසේකර මහතා**
(மாண்புமிகு எரங்க குணசேகர)
(The Hon. Eranga Gunasekara)
පක්ෂයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මගේ දකුණු අත පැත්තේ ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ වෙනත් ගරු මන්ත්‍රීවරු සිටිනවාද? සියලු දෙනාම ඡන්දය ප්‍රකාශ කර අවසන්ද?

මගේ වම් අත පැත්තේ ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ ගරු මන්ත්‍රීවරු ඉන්නවා නම් කරුණාකර නැඟී සිට දන්වන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමනි, ඔබතුමා ඡන්දය ප්‍රකාශ කරන්නේ පක්ෂවද, විපක්ෂවද?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
විරුද්ධයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ ආසනයේ අංකය කීයද, ගරු මන්ත්‍රීතුමා?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
අංකය 23.

**ගරු බී. ආරියවංශ මහතා**
(மாண்புமிகு பி. ஆரியவங்ஷ)
(The Hon. B. Ariyawansha)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බී. ආරියවංශ මන්ත්‍රීතුමනි, ඔබතුමා ඡන්දය ප්‍රකාශ කරන්නේ පක්ෂවද, විපක්ෂවද? ඔබතුමාගේ ආසනයේ අංකය කීයද?

**ගරු බී. ආරියවංශ මහතා**
(மாண்புமிகு பி. ஆரியவங்ஷ)
(The Hon. B. Ariyawansha)
මගේ අංකය 48. මම විරුද්ධයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මගේ වම් අත පැත්තේ ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ වෙනත් ගරු මන්ත්‍රීවරු සිටිනවාද?

කිසිවෙකු නොමැති බවයි පෙනෙන්නේ.
ඡන්දය ප්‍රකාශ කිරීමේ කාලය දැන් අවසානයි.

***ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව-***
*வாக்கெடுப்பின் பின் -*
*On conclusion of the Voting -*

***මේ අවස්ථාවේදී පහත සඳහන් නම් සභා ගර්භයේ ඇති ඩිජිටල් පුවරුවේ ප්‍රදර්ශනය කෙරිණි.***

*(இவ்வேளையில், கீழ்வரும் பெயர்கள் சபாமண்டபத்திலுள்ள டிஜிற்றல் திரையில் காண்பிக்கப்பட்டது.)*

*(At this stage, the following names appeared on the digital screen in the Chamber.)*

***විද්‍යුත් ඡන්ද විමසීම අනුව පහත දැක්වෙන පරිදි - පක්ෂව 135; විරුද්ධව 25; වැළකී සිටි 0 යනුවෙන් බෙදුණේය.***

*இலத்திரனியல் வாக்கெடுப்பு முறைக்கிணங்க பாராளுமன்றம் பிரிந்தது: சார்பாக 135; எதிராக 25; விலகியிருந்தோர் 0.*

*According to Electronic Voting, Parliament divided: Ayes 135; Noes 25; Abstain 0.*

| | |
|---|---|
| G 001. K.V. Samantha Viddyarathna | Yes |
| G 004. Vijitha Herath | Yes |
| G 005. Nalinda Jayathissa | Yes |
| G 006. Bimal Rathnayake | Yes |
| G 007. Harini Amarasuriya | Yes |
| G 009. Ramalingam Chandrasekar | Yes |
| G 013. Anil Jayantha | Yes |
| G 014. Harshana Nanayakkara | Yes |
| G 015. Dammika Patabendi | Yes |
| G 016. Saroja Savithri Paulraj | Yes |
| G 017. Ananda Wijepala | Yes |
| G 018. Hiniduma Sunil Senevi | Yes |
| G 019. Sunil Kumara Gamage | Yes |
| G 020. Kumara Jayakody | Yes |
| G 021. Rizvie Salih | Yes |
| G 022. Anura Karunathilaka | Yes |
| G 023. Upali Pannilage | Yes |
| G 024. Susil Ranasinghe | Yes |
| G 025. Nihal Galappaththi | Yes |
| G 026. Nihal Abeysinghe | Yes |
| G 028. Wasantha Piyathissa | Yes |
| G 029. Gamagedara Dissanayake | Yes |
| G 030. R.M. Jayawardhana | Yes |
| G 031. Sunil Watagala | Yes |
| G 033. Mahinda Jayasinghe | Yes |
| G 034. Chathuranga Abeysinghe | Yes |
| G 036. Upali Samarasingha | Yes |
| G 037. T.B. Sarath | Yes |
| G 038. Nalin Hewage | Yes |
| G 039. Prasanna Gunasena | Yes |
| G 040. Anton Jayakody | Yes |
| G 041. Hemali Weerasekara | Yes |
| G 043. Ruwan Ranasinghe | Yes |
| G 044. Muneer Mulaffer | Yes |
| G 045. Hansaka Wijemuni | Yes |
| G 046. Eranga Weeraratne | Yes |
| G 047. Namal Sudarshana | Yes |
| G 048. P. Ruwan Senarath | Yes |
| G 049. Madhura Senevirathna | Yes |
| G 050. Arun Hemachandra | Yes |
| G 051. Janitha Ruwan Kodithuwakku | Yes |
| G 052. Aruna Jayasekera | Yes |
| G 053. Sugath Thilakaratne | Yes |
| G 054. Kaushalya Ariyarathne | Yes |
| G 056. Aravinda Senarath | Yes |
| G 057. Dinindu Saman | Yes |
| G 058. Nishantha Jayaweera | Yes |
| G 059. Asoka Ranwala | Yes |
| G 060. Lakshman Nipuna Arachchi | Yes |
| G 061. Gayan Janaka | Yes |
| G 062. Najith Indika | Yes |
| G 063. Lakmali Hemachandra | Yes |
| G 064. Samanmali Gunasingha | Yes |
| G 065. R.M. Gamini Rathnayake | Yes |
| G 066. Manjula Suraweera Arachchi | Yes |
| G 067. K. Ilankumaran | Yes |
| G 068. Shantha Pathma Kumara Subasingha | Yes |
| G 069. Ajith Agalakada | Yes |
| G 070. Sagarika Athauda | Yes |
| G 071. Roshan Akmeemana | Yes |
| G 072. U. P. Abeywickrama | Yes |
| G 073. L.M. Abeywickrama | Yes |
| G 074. M.K.M. Aslam | Yes |
| G 075. Asitha Niroshana Egoda Vithana | Yes |
| G 077. Krishnan Kalaichelvi | Yes |
| G 078. Upul Kithsiri | Yes |
| G 079. Wasantha Pushpa Kumara | Yes |
| G 080. Chaminda Lalith Kumara | Yes |
| G 081. Sarath Kumara | Yes |
| G 082. Nilanthi Kottahachchi | Yes |
| G 083. M.A.C.S. Chathuri Gangani | Yes |
| G 084. Darmapriya Wijesinghe | Yes |
| G 085. Thilanka U. Gamage | Yes |
| G 086. Nilusha Lakmali Gamage | Yes |
| G 087. Ajantha Gammeddage | Yes |
| G 088. Ajith Gihan | Yes |
| G 089. Jagath Gunawardana | Yes |
| G 090. Aboobucker Athambawa | Yes |
| G 091. Ruwanthilaka Jayakody | Yes |
| G 092. Thushari Jayasingha | Yes |
| G 093. T.K. Jayasundara | Yes |
| G 094. Mayilvaganam Jegatheeswaran | Yes |
| G 095. Rajeevan Jeyachandramoorthy | Yes |
| G 096. Sellaththamby Thilaganathan | Yes |
| G 097. Sugath Wasantha de Silva | Yes |
| G 098. Anushka Thilakarathne | Yes |
| G 100. Thanura Dissanayake | Yes |

| | |
|---|---|
| G 101. Dharmapriya Dissanayake | Yes |
| G 102. Sujeewa Dissanayake | Yes |
| G 103. Kanthasamy Prabu | Yes |
| G 106. Aruna Panagoda | Yes |
| G 108. Nishantha Perera | Yes |
| G 109. Stepni Fernando | Yes |
| G 111. Lal Premanath | Yes |
| G 112. Nanda Bandara | Yes |
| G 113. Padmasiri Bandara | Yes |
| G 114. Ravindra Bandara | Yes |
| G 115. Sudath Balagalla | Yes |
| G 116. Sri Bavanandarajah | Yes |
| O 005. Rauff Hakeem | No |
| O 008. Sajith Premadasa | No |
| O 014. Amirthanathan Adaikkalanathan | No |
| O 016. Ramanathan Archchuna | No |
| O 018. Dilith Jayaweera | No |
| O 019. Sivagnanam Shritharan | No |
| O 020. Shanakiyan Rajaputhran Rasamanickam | No |
| O 021. Dayasiri Jayasekara | No |
| O 022. Harsha de Silva | No |
| O 024. Sujeewa Senasinghe | No |
| O 027. J. C. Alawathuwala | No |
| O 032. Sujith Sanjaya Perera | No |
| O 033. S.M. Marikkar | No |
| O 036. Rohini Kumari Wijerathna | No |
| O 039. Kaveenthiran Kodeeswaran | No |
| O 040. Gnanamuththu Srineshan | No |
| O 042. Mujibur Rahman | No |
| O 043. Waruna Liyanage | No |
| O 046. W.H.M. Dharmasena | No |
| O 050. Chathura Galappaththi | No |
| O 053. Anuradha Jayaratne | No |
| O 054. Chamara Sampath Dasanayake | No |
| O 059. Kathiravelu Shanmugam Kugathasan | No |
| O 060. Thurairasa Ravikaran | No |
| O 065. E. M. Basnayaka | Yes |
| O 066. Wijesiri Basnayake | Yes |
| O 067. S. Sandaruwan Madarasinghe | Yes |
| O 068. Prageeth Madhuranga | Yes |
| O 069. Jagath Manuwarna | Yes |
| O 070. Ruwan Mapalagama | Yes |
| O 071. Nandana Millagala | Yes |
| O 072. Riyas Farook | Yes |
| O 080. Pathmanathan Sathiyalingam | No |
| O 081. Danushka Ranganath | Yes |
| O 083. Sunil Rathnasiri | Yes |
| O 084. Manjula Sugath Rathnayaka | Yes |
| O 085. A.M.M.M. Rathwaththe | Yes |
| O 086. Manoj Rajapaksha | Yes |
| O 087. Sunil Rajapaksha | Yes |
| O 089. Deepthi Wasalage | Yes |
| O 090. Kanchana Welipitiya | Yes |
| O 091. R. G. Wijerathna | Yes |
| O 092. Nishantha Samaraweera | Yes |
| O 093. Priyantha Wijerathna | Yes |
| O 094. Ruwan Wijeweera | Yes |
| O 095. Lasith Bhashana Gamage | Yes |
| O 098. Fasmin Sharif | Yes |
| O 100. Ambika Samivel | Yes |
| O 101. Dewananda Suraweera | Yes |
| O 102. Chandana Sooriyaarachchi | Yes |
| O 103. G.D. Sooriyabandara | Yes |
| O 104. Kitnan Selvaraj | Yes |
| O 105. Janaka Senarathna | Yes |
| O 106. Chandima Hettiaratchi | Yes |
| O 107. Champika Hettiarachchi | Yes |
| O 108. Dinesh Hemantha | Yes |
| O 109. Geetha Herath | Yes |
| O 112. Ashoka Gunasena | Yes |
| O 113. Nandana Pathmakumara | Yes |
| O 114. Sunil Biyanwila | Yes |
| O 115. Samantha Ranasingha | Yes |

Electronic Voting Results

**Participants:**

| | |
|---|---|
| Present | 160 |

**Votes:**

| | |
|---|---|
| Yes | 135 |
| No | 25 |
| Abstain | 0 |

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

විද්‍යුත් ඡන්ද විමසීම අනුව පක්ෂව ඡන්ද 135යි; විරුද්ධව ඡන්ද 25යි; ඡන්දය දීමෙන් වැළකී සිටි සංඛ්‍යාව 0යි.

නැඟී සිට පක්ෂව ඡන්දය දුන් සංඛ්‍යාව 02යි. ඒ අනුව පක්ෂව ලබා දුන් මුළු ඡන්ද සංඛ්‍යාව 137යි.

නැඟී සිට විරුද්ධව ඡන්දය දුන් සංඛ්‍යාව 02යි. ඒ අනුව විරුද්ධව ලබා දුන් මුළු ඡන්ද සංඛ්‍යාව 27යි.

ඒ අනුව, අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 4, මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනා සම්මතය, වැඩි ඡන්ද 110කින් සම්මත වූ බව මෙම ගරු සභාවට දන්වනු කැමැත්තෙමි.

න්‍යාය පත්‍රයේ විෂය අංක 5, අනුමත කිරීම සඳහා ඉදිරිපත් කිරීම. ගරු සභානායකතුමා.

## අත්‍යවශ්‍ය මහජන සේවා පනත: යෝජනා සම්මතය
## அத்தியாவசிய பொதுச் சேவைகள் சட்டம்: தீர்மானம்
ESSENTIAL PUBLIC SERVICES ACT: RESOLUTION

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "1979 අංක 61 දරන අත්‍යාවශ්‍ය මහජන සේවා පනතේ 2 වන වගන්තිය ප්‍රකාරව ජනාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල අනුව, 2026 මාර්තු 28 දිනැති අංක 2481/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ හා එහි උපලේඛනයෙහි පළ කරනු ලැබ, 2026.04.07 දින ඉදිරිපත් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒ අනුව අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1, 2, 3 සහ 5 යථා පරිදි සම්මත වුණු බව ප්‍රකාශ කරමි.

## කල්තැබීම
## ஒத்திவைப்பு
ADJOURNMENT

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා.

## 2019 අප්‍රේල් 21වන දින පාස්කු ඉරිදා ප්‍රහාරය
2019 ஏப்பிரல் 21 இடம்பெற்ற உயிர்த்த ஞாயிறு தாக்குதல்
EASTER SUNDAY ATTACK ON 21ST APRIL, 2019

[අ.භා. 2.29]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "2019 අප්‍රේල් 21 වැනි දින සිදු වූ පාස්කු ඉරුදින ම්ලේච්ඡ ප්‍රහාරයට වසර හතක් ගතවී ඇත. පත් වූ සෑම ආණ්ඩුවකින්ම මෙම ප්‍රහාරයේ මහ මොළකරු අත්අඩංගුවට ගන්නා බවට ප්‍රතිඥා දෙනු ලැබුවද, අද දක්වා එම ප්‍රතිඥා ඉටු නොකිරීම පිළිබඳව කනගාටුවට පත් වෙමි. මෙම ම්ලේච්ඡ ප්‍රහාරය පිළිබඳ සිදු කළ ජනාධිපති කොමිෂන් සභා විමර්ශන වාර්තා ගබඩාවලට හා පුස්තකාලවලට පමණක් සීමා වීම නිසා යුක්තිය ඉටුවීමේ ගමන් මඟ තවමත් දේශපාලන ප්‍රචාරණ උපක්‍රමවල ගොදුරු බවට පත්ව ඇත.
>
> එබැවින්, සත්‍ය හෙළිකර ගැනීම සඳහා මෙතෙක් සිදු කළ සියලු පරීක්ෂණ වාර්තා මහජන පරිශීලනයට ලබා දීමටත්, ස්වාධීන හා විනිවිද භාවයෙන් වින්දිතයන්ට සාධාරණය ඉටු කිරීමටත් උත්සුක විය යුතු බවට මෙම සභාවට යෝජනා කරමි."

ගරු කථානායකතුමනි, මම විශේෂයෙන්ම මතක් කරන්න කැමැතියි, පාස්කු ඉරුදින ප්‍රහාරය පිළිබඳව අප අවස්ථා ගණනාවකදී අපේ අදහස්, අපේ යෝජනා, අප විශ්වාස කරන දේ ඉදිරිපත් කර තිබෙන බව. මා පෞද්ගලිකවම 2023 සැප්තැම්බර් 22වන දා, 2024 අප්‍රේල් 24වන දා සහ 2025 ජූලි 09වන දා මේ සභාවට කරුණු ඉදිරිපත් කරමින් පැහැදිලි ස්ථාවරයක හිටියා. එදාත්, අදත්, හෙට දවසේත් අපේ ඒ ස්ථාවරයේ කිසිදු වෙනසක් නැහැ කියන එක මේ අවස්ථාවේ මම කියනවා. පාස්කු ඉරුදින ප්‍රහාරයට ලක් වුණු, ජීවිත අහිමි වුණු, ඒ වාගේම ශරීරයේ අවයව අහිමි වුණු, නෑදෑ, හිතමිතුරන් සහ පවුලේ සාමාජිකයන් අහිමි වුණු සියලුදෙනාටම සාධාරණත්වය ඉෂ්ට කිරීම තමයි අප කළ යුතුව තිබෙන්නේ. වේලාසනින්ම දේශපාලනික වශයෙන් හෝ වෙනත් ආකාරයකින් තමතමන්ට හිතෙන ආකාරයේ වාසිදායක මතයක් ගොඩනඟලා තමන්ගේ දේශපාලන මතය ශක්තිමත් කරන, එහෙම නැත්නම් දේශපාලන නායකයන් ශක්තිමත් කරන තොරතුරු, කරුණු කාරණා ඉදිරිපත් කරලා නිගමනවලට එළඹීම අපි තරයේ ප්‍රතික්ෂේප කරනවා. ඒක නොවෙයි විපතට පත් වුණු ජනතාවගේ බලාපොරොත්තුව. ඒ අයගේ බලාපොරොත්තුව, අපේත් බලාපොරොත්තුව සත්‍යය කුමක්ද, ඇත්ත වශයෙන්ම සිද්ධ වුණේ මොකක්ද, ඒ ත්‍රස්ත ප්‍රහාරය පිටුපස හිටියේ කවුද, ඒ ත්‍රස්ත ප්‍රහාරය පිටුපස හිටපු මහ මොළකරුවන් හෝ මහ මොළකරුවා කවුරුන්ද කියා හෙළිදරුව් කර ගැනීමයි. ඒ සත්‍යය රටට හෙළිදරව් කරලා ඒ ම්ලේච්ඡ ප්‍රහාරයට සම්බන්ධ වුණු සියලුදෙනා නීතිය හමුවට ගෙනැවිල්ලා ඒ අයට දැඩි දඬුවම් පැමිණවිය යුතුය යන්න අපේ ස්ථාවරයයි. ඒ ස්ථාවරය අද හැන්සාඩ්ගත වෙලා තිබෙනවා. ඒ ස්ථාවරයේ කිසිදු වෙනසක් නැහැ. ඇත්ත වශයෙන්ම, ඇත්ත හොයා ගන්නට නම් කරන්නා වූ මේ සියලු පරීක්ෂණ විනිවිදභාවයෙන් යුක්ත වන්නට ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

*අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and THE HON. DEPUTY SPEAKER took the Chair.*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඇත්ත වශයෙන්ම සත්‍ය සොයන්නට නම් වගකීම, වගවීම, විනිවිදභාවය සුරක්ෂිත කරන පරීක්ෂණ ක්‍රමවේදයකට යන්නට ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා අපි විශ්වාස කරනවා, දේශීය පරීක්ෂණ කටයුතු ක්‍රියාත්මක වන අතරතුර විශේෂයෙන්ම Scotland Yard, FBI වැනි ජාත්‍යන්තර ආරක්ෂක සංවිධානත් මේකට එකතු කර ගැනීම ඉතාම වැදගත් කියලා. අපි එදා ප්‍රකාශ කළේත් යම් යම් සිදුවීම් තිබෙනවා, සැක කටයුතු කාරණා තිබෙනවා, ඒවා ගැන විමර්ශනය කරලා සත්‍ය හෙළිදරව් කරන්න කියන කාරණාවයි. 2018 වවුනතිව්වල පොලිස් නිලධාරින් දෙදෙනෙකු මැරුවා. සමහරෙක් කියනවා, ඒ මිනීමරු ක්‍රියාව අජන්තන් කියන පුද්ගලයෙක් කළා කියලා. එය එල්ටීටීඊය පිට දමලා කථා කරනවා. ඉතින්, මොකක්ද ඇත්ත කථාව? මොකක්ද සත්‍යය? අපට එය දැන ගන්න අවශ්‍යයි. අපි කියනවා, ඒ ගැන විමර්ශනය කරන්න, ඒ ගැන පරීක්ෂා කරන්න, ඒකේ ඇත්ත රටට හෙළිදරව් කරන්න කියලා.

දෙසැම්බර් 05වන දා, දෙසැම්බර් 08වන දා, දෙසැම්බර් 13වන දා, ජනවාරි 04වන දා විවිධ බුද්ධි අංශ වාර්තාවලින් කියනවා, ඒක කළේ එල්ටීටීඊ එක කියලා. ඒක ඇත්තද? ඒක බොරුද? අපට අවශ්‍යයි, ඇත්ත දැන ගන්න. මොකක්ද සත්‍යය? ඒ වාගේම අපි දැන ගන්න කැමැතියි, වවුනතිව් පොලිස් නිලධාරින්ගේ මරණ සිද්ධ කළ ආයුධය හමු වුණාද කියලා. හමු වුණා නම්, කොහෙන්ද එය හමු වුණේ? ඒ ගැන පරීක්ෂා කරන්න; ඒ ගැන සොයා බලන්න; ඒකේ සත්‍යය සොයා බලන්න. අපට අවශ්‍ය, සත්‍යය යි. පූර්ව නිගමනවලට ගිහිල්ලා අපට කැමැති දේ, අප දරන දේශපාලන මතය තහවුරු කර ගැනීම සඳහා පරීක්ෂණ වැරැදි ආකාරයට ක්‍රියාත්මක කිරීම නොව, ඒවා විනිවිදභාවයෙන් යුක්තව ක්‍රියාත්මක කිරීමයි අපට අවශ්‍ය. ඒ නීච ත්‍රස්ත ප්‍රහාරයෙන් පසුව විශේෂයෙන්ම Federal Bureau of Investigation - FBI එක - එය investigate කරන්නට දායකත්වයක් දුන්නා; computers, telephones, telephone calls, disks, CDs ආදි ඔක්කෝම පරිශීලනය කරලා. FBI එකට අහු වෙනවා, IP address එකක්. ඒ IP address එක හරහා හඳුනා ගන්නවා වැඩිම වාර ගණනක් සහරාන් එක්ක කථා කරලා තිබෙන telephone සම්බන්ධතාවක්. IP address එක තිබෙන telephone එකක් හඳුනා ගන්නවා. කාගේද ඒ IP address එක? කාගේද ඒ telephone එක? අපි එහි ඇත්ත නැත්ත දන්නේ නැහැ. හැබැයි සමහරු කියනවා, එය සහරාන් එක්ක වැඩිම දුරකථන ඇමතුම් ප්‍රමාණයකින් කථා කරපු IP address එකයි කියලා. සමහරු කියනවා, ඒ බුද්ධි අංශයේ සමහරු ලු. අපට දැන ගන්න ඕනෑ ඇත්ත. අපට තොරතුරු ලැබිලා තිබෙනවා, ඒක විභාග කරන්න යනකොට SP දර්ශිකාට බලපෑම් කළාලු, විවිධ බුද්ධි අංශවල ප්‍රධානීන්, "මේක investigate කරන්න එපා, මේක බොහොම සංවේදී කාරණාවක්" කියලා. මේවායේ ඇත්ත නැත්ත අපි දන්නේ නැහැ. අපට දැනගන්න ඕනෑ මේ කථාවල ඇත්ත නැත්ත. මොකක්ද සත්‍යය? ඒක හොයන්න ඕනෑ පළිගැනීමේ අරමුණින් නොව, මේ කාරණය දේශපාලනීකරණයට ලක් කරලා නොව විනිවිදභාවයෙන් යුක්තවයි.

ඒ වාගේම අපට අහන්න ලැබිලා තිබෙනවා, පොඩි සහරාන් කියන පුද්ගලයාත් එක්ක සම්බන්ධ වුණා කියලා, "සොනික් සොනික්". ඒ "සොනික් සොනික්" කියන කෙනාගේ IP address එක හොයාගෙන යනකොට, "සොනික් සොනික්" කියන්නේ, අපේ බුද්ධි අංශවලට සම්බන්ධ පුද්ගලයෙක්ලු. කථාවක් තිබෙනවා, ඒ IP address එක තිබෙන telephone chip එක අරගෙන තිබෙන්නේ ඒ බුද්ධි අංශ පුද්ගලයාගේ හිතවතිය හරහායි කියලා. ඒත්, පොලිසියේ සේවය කරන කෙනෙක්. මොකක්ද ඒවායේ ඇත්ත? ඒක ඇත්තද? ඒක බොරුද? මොකක්ද සත්‍යය? අපට දැන ගන්න ඕනෑ ඇත්ත. ඇත්ත සොයා ගන්න ඒ පිළිබඳව පරීක්ෂා කරන්න. ඒ වාගේම අපට ආරංචියි ඒ "සොනික් සොනික්" පොඩි සහරාන් එක්ක කථා කරපු ඒවා පිළිබඳව හොයා බලන්න, පරීක්ෂණ කරන්න කටයුතු කරන කොට බලපෑම් ආවා කියලා. ඒක විමර්ශනය කරන්න එපා කිව්වාලු. ඒක බොහොම සංවේදීයි කිව්වාලු. ඒක ඇත්තද? එහෙම බලපෑම් සිදු වුණාද? මේ ඇත්ත අපි දැන ගන්නට ඕනෑ. මේ සත්‍ය අපි දැන ගන්නට ඕනෑ. ඒ වාගේම ටාජ් සමුද්‍රා එක blast කරන්න හිටපු ජමීල් කියන ත්‍රස්තවාදියා ඒ බෝම්බය පුපුරවා ගන්නේ නැතිව ට්‍රොපිකල් ඉන් හෝටලයට යනවා. ඊට පෙර ඔහු පල්ලියකට යන්න උත්සාහ කරනවා. එතැනදී ඒ ආරක්ෂක නිලධාරියාට සැකයක් ඇති වෙලා විපරම් කරලා බලකොට දුරකථන සංවාදයක් ඇති වෙලා තිබෙනවා ලු මේ ජමීල් කියන පුද්ගලයාගේ බිරිඳත් සමඟ, තරහා වෙලා ආවා කියලා. මේ ඔක්කෝම කථා. ඒ වෙනකොට බුද්ධි අංශයේ නිලධාරින් ඒ ජමීල්ගේ ගෙදර ගිහිල්ලා හිටියා ලු. "හිටියා ලු". මොකක්ද ඇත්ත? මේක සත්‍යයක්ද? මේක අසත්‍යයක්ද? අපි කියන්නේ මේකයි. මේ හැම දෙයක්ම විමර්ශනය කරන්න. සත්‍ය හොයලා බලන්න. පාස්කු ප්‍රහාරයෙන් ජීවිත අහිමි වුණු, අවයව අහිමි වුණු පවුලේ සාමාජිකයන් - අම්මලා, තාත්තලා, සහෝදර-සහෝදරියන් - හැම දෙනාගේම බලාපොරොත්තුව ඇත්ත හොයන එක.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අපි දැන ගන්න කැමතියි විශේෂයෙන්ම අර ජමීල්ගේ නිවසට ගියාය කියන බුද්ධි අංශයේ නිලධාරින් භාවිත කරපු ඒ telephones ගැන යම් පරීක්ෂණයක් කරලා තිබෙනවා. ඒ පරීක්ෂණය කරනකොට ඒක බෞද්ධාලෝක මාවතේ address එකකට සම්බන්ධයිලු. තවදුරටත් කියනවා, ලසන්ත වික්‍රමතුංගගේ ඝාතනයට, කීත් නොයාර්ට, උපාලි තෙන්නකෝන්ට එල්ල කළ ප්‍රහාරවලට ඒ telephones පාවිච්චි කරලාලු, ඒවාට සම්බන්ධතාවක් තිබෙනවා කියලා. මේවා කථා. මේවා 2021 ඉඳලා අපට ලැබුණු තොරතුරු අනුව මේ පාර්ලිමේන්තුවේ කරපු කථා. අපි ඒ හැම වෙලාවකම කිව්වේ මේ කරුණු කාරණා සොයා බලා සත්‍යය මොකක්ද කියලා රටට හෙළිදරව් කරන්න කියලායි.

ඔය ට්‍රොපිකල් ඉන් හෝටලයේ හිටපු ජමීල් කියන ත්‍රස්තවාදියාගේ සහෝදරයා හිතවත්වූ මහීල් ඩූල් කියන පොලිස් නිලධාරියා සමඟ. ඔහුට කියනවාලු, තමන්ගේ මේ සහෝදරයා අන්තවාදී මත පළ කරනවා. ඒ නිසා මොකක් හරි පියවරක් ගන්න, මොකක්ද, මේ වෙන්න යන්නේ කියන එක ගැන කථා කරන්න කියලා. ඇත්තද මේක? එහෙම දෙයක් තිබෙනවාද? මොකක්ද සත්‍යය? අපට ඇත්ත දැන ගන්න අවශ්‍යයි. ඇත්ත දැන ගන්න නම් විනිවිදභාවයෙන් යුක්ත වූ පරීක්ෂණ අවශ්‍යයි. තමන්ගේ තරහකාරයන් ඉලක්ක කරගෙන, පෞද්ගලික තරහාමරහ බේරා ගැනීමේ වැඩ පිළිවෙළක් නොවෙයි අපට අවශ්‍ය. මේ පාස්කු ප්‍රහාරයට සම්බන්ධ ත්‍රස්තවාදී ව්‍යායාමය පිටුපස හිටපු මොළකරුවන්, මහ මොළකරුවන්, පුද්ගල කණ්ඩායම් අපි පිරිසිදුව අවබෝධ කර ගන්නට ඕනෑ. ඒ සත්‍යය අවබෝධ කර ගැනීමයි අපේ බලාපොරොත්තුව. ඉතින් මේ සත්‍යය සොයා ගන්න නම් මේවා ගැන විමර්ශනය කරන්න.

අපි අහලා තිබෙනවා සයින්දමර්දු blast එක ගැන. සයින්දමර්දු blast එකේදී weapon එකක් අහු වුණාලු. ඒ weapon එක issue කරලා තිබෙන්නේ 2008දී එරාවූර් පොලිසියේ ආදම් ලෙබ්බෙ කියන පුද්ගලයාටලු. අපට තොරතුරු ඉදිරිපත් කෙරෙනවා මේ ආදම් ලෙබ්බෙට issue කරපු weapon එකෙන් තමයි අර වවුනතිව් පොලිස් ඝාතනය සිදු කර තිබෙන්නේ කියලා. ඒක ඇත්තද? මොකක්ද ඒකේ සත්‍යය? අපට අවශ්‍ය සත්‍ය. මේ හැම දෙයක් පිළිබඳවම විවෘත මනසකින් අපි ඇත්ත හොයන්න ඕනෑ. ඒ වාගේම විශේෂයෙන්ම මේ පාස්කු ප්‍රහාරයට අදාළ ලොකු

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

සාධකයක් යැයි කියන සාරා ජස්මින් කියලා කෙනෙක් ඉන්නවාලු. එහෙම කෙනෙක් ඉන්නවාද? එහෙම ඉන්නවා නම් එයා කවුද? එතකොට, අර blast එකේදී 16දෙනෙක් නැති වෙලා තිබෙනවා. DNA පරීක්ෂණ 3ක් කරලා තිබෙනවා. පළමු DNA පරීක්ෂණයේත් කියනවා, එහෙම කෙනෙක් නැහැ කියලා. දෙවැනි DNA පරීක්ෂණයේත් කියනවා, එහෙම කෙනෙක් නැහැ කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Sajith Premadasa, you have exhausted the time allotted to you.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

තුන්වැනි DNA පරීක්ෂණයෙන් කියනවා, එහෙම කෙනෙක් ඉන්නවා කියලා. එතකොට මේ DNA පරීක්ෂණ පැවැත්වූයේ යම්කිසි පූර්ව නිගමනයට ඇවිල්ලාද? හොයලා බලන්න මේවා ගැන. ඒවා පරීක්ෂා කරන්න. පුද්ගලයෝ කේන්ද්‍ර කරගෙන, දේශපාලන තරහමරහකම් කේන්ද්‍ර කරගෙන නොවෙයි, යුක්තිය ඉෂ්ට කිරීමේ අධිෂ්ඨානයෙන්, සත්‍යය සොයා ගැනීමේ අධිෂ්ඨානයෙන් ඒවා ගැන සොයන්න ඕනෑ.

ඒ වාගේම අපි අහලා තිබෙනවා, ගැලනිගම exit එකටත් ලොරියක් එනවාලු. V8 එකක් ඒ පස්සෙන් එනවාලු. Double Cab එකක් ඉස්සරහින් එනවාලු. ඒ වෙලාවේ පොලීසියේ උසස් නිලධාරියෙක් ගැලනිගම exit එකේ ඉන්න පොලිස් නිලධාරියාට නියෝගයක් දෙනවාලු, ඒ ලොරිය release කරන්න කියලා. ඒක log සටහනේ තිබෙනවාලු. ඒක ඇත්ත ද? එහෙම log සටහනක් තිබෙනවාද? එහෙම නියෝගයක් දුන්නාද? සමහරු අනුමාන කරනවා, ඒ තමයි බෝම්බ ලොරිය කියලා. මොකද බෝම්බය assemble කළාය කියන්නේ පානදුරේ ලු. මොකක්ද මේකේ ඇත්ත? මොකක්ද මේකේ සත්‍යය? දැන් මෙච්චර කල් විජිත් මලල්ගොඩ කමිටුව, ජනක් ද සිල්වා කොමිෂන් සභාව, පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව, එස්.අයි. ඉමාම් කමිටුව, ඒ.එන්.ජේ ද අල්විස් කමිටුව පරීක්ෂණ කළා. දැනුත් පරීක්ෂණ කරගෙන යනවා. මේවායේ ඇත්ත මොකක්ද? මේ ඇත්ත අපි දැන ගන්නට ඕනෑ.

විශේෂයෙන්ම මේ සිද්ධිය වෙන කාලයේ වර්තමාන ආරක්ෂක නියෝජ්‍ය ඇමතිවරයා නැගෙනහිර පළාතේ ආඥාපති. මොකක්ද ඔහු කළේ? මොකක්ද ඔහුගේ රාජකාරිය? මොකක්ද ඔහුගේ වගකීම? ඔහු රාජකාරිය ඉෂ්ට කළාද, පැහැර හැරියාද? හොයන්න ඇත්ත. මොකක්ද සත්‍යය? ඊට පස්සේ අපට ආරංචි වෙනවා, ඔය සහරාන් කියන නීච ත්‍රස්තයාගේ භාර්යාව කටඋත්තර දෙනවාලු; හාදියා කියන තැනැත්තිය. සහරාන් කථා කරනවාලු Threema app එකෙන් අබූහින්ද් කියන පුද්ගලයෙක් එක්ක. ඒක ඇත්තක්ද? ඒක බොරුවක්ද? ඒක කට කථාවක්ද? එහෙම කථා කරන කොට හාදියාට සහරාන් කියනවා ලු, කාමරයෙන් පිටවෙන්න කියලා. මොකක්ද සත්‍යය? මේවා විමර්ශනය කරන්න. මේ හැම දෙයක් පිළිබඳව හොයලා බලන්න. ඒ වාගේම විදේශ බුද්ධි අංශවලින් අවස්ථා ගණනාවකදී අපේ රටේ බුද්ධි අංශ දැනුවත් කරනවා, මෙහෙම ප්‍රහාරයක් සිදු වීමේ අවදානමක් තිබෙනවා කියලා. එහෙම සිදු වුණාද? මොකක්ද ඒකේ ඇත්ත? එහෙම සිදු වුණා නම් මොකක්ද අරගෙන තිබෙන පියවර? මේ හැම කාරණාවක් පිළිබඳව අපි ඇත්ත හොයලා බලන්නට ඕනෑ. ඒ වාගේම, ජනතා විමුක්ති පෙරමුණේ ජාතික ලැයිස්තුවේ හිටපු ඉබ්‍රාහිම්ගේ පුත්තු දෙන්නෙක් suicide bombersලා දෙන්නෙක්. එතකොට මොකක්ද එතැන තිබෙන සම්බන්ධතාව? ඉබ්‍රාහිම් කියන පුද්ගලයා නීච ත්‍රස්තවාදීන්ට මුල්‍යා පහසුකම් ලබා දුන්නාය කියනවා. ඒවා විමර්ශනය කරන්න. ඒවා හොයලා බලන්න. ඒ පිළිබඳ සත්‍යය හෙළිදරව් කරන්න.

පැහැදිලිව මම මේ කාරණය කියන්න කැමැතියි. අපේ ස්ථාවරය කිසිම දවසක වෙනස් වෙලා නැහැ. මම අද මේ කියපු හැම කාරණාවක්ම 2023 සැප්තැම්බර් 22, 2024 අප්‍රේල් 24, 2025 ජූලි 09 මේ පාර්ලිමේන්තු සභාවේම කරපු හෙළිදරව් කිරීම්. ඕනෑ නම් හැන්සාඩ් වාර්තා කියවලා බලන්න. කිසි වෙනසක් නැහැ. දේශපාලන වෙනස්කම් වුණා කියලා ආණ්ඩු පක්ෂයද, විපක්ෂයද, වෙනත් පාර්ශ්වයකද කියන ඒ දෘෂ්ටිකෝණවලින් මේ බරපතළ ප්‍රශ්නය දිහා අපට බලන්න බැහැ.

පැහැදිලිවම මම එක දෙයක් කියන්න කැමැතියි. එක කාලයක් තිබුණා, මේ ත්‍රස්ත ප්‍රහාරයේ මහ මොළකරුවන් හැටියට මේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් නම් කළ. එක් වතාවක් කිව්වා, රිසාඩ් බදියුදීන් තමයි මහ මොළකරු කියලා. තව වතාවක් කිව්වා, හිජාස් හිස්බුල්ලා නීතිඥතුමා තමයි මහ මොළකරු කියලා. දැන් කියනවා මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා පරීක්ෂණවලට විරුද්ධ වුණා, ඒ නීතිඥතුමාව බේරා ගත්තා කියලා. ඒවා ඇත්තද, බොරුද කියලා සොයා බලන්න. කිසිදාක එහෙම දෙයක් සිදුවෙලා නැහැයි කියලා අපි විශ්වාස කරනවා. ඒක අපේ විශ්වාසය. ඒක කියන්න අපි භය නැහැ. එකක් හොඳට මතක තබා ගන්න. මේ ජන සමාජයේ විවිධ ආගම් අදහන අය, විවිධ ජන කොට්ඨාස, විවිධ සමාජ කොටස් හිතන ආකාරය පදනම් කරගෙන අපි මේ පාස්කු ඉරුදින ප්‍රහාරය ගැන මත පළ කරන්නේ නැහැ. දේශපාලන වාසිය මොකක්ද, දේශපාලන අවාසිය මොකක්ද කියන දේවල් ගැන හිතලා කථා කරන්න අපි කිසිසේත්ම සූදානම් නැහැ. මොකද, මේ නීච ත්‍රස්ත ප්‍රහාරයේ මහ මොළකරුවෝ කවුද කියන එක සොයා ගැනීම තමයි අවංකවම අපේ පිවිතුරු බලාපොරොත්තුව.

මේකේ මහ මොළකරුවෝ ඉන්නවාය කියන එක දැන් හැමෝම පිළිගෙන තිබෙනවා. අද ඊයේ නොවෙයි, ඡන්දයක් ඉදිරියේදී ඒක වැඩියෙන්ම කියැවෙනවා. පාස්කු ඉරු දින ප්‍රහාරයෙන් පස්සේ හැමෝම ඒක කිව්වා. ඇත්තටම මේ ප්‍රහාරය පිටුපස වෙනත් හස්තයක් තිබුණාය කියන කාරණය හැමෝම පිළිගන්නවා. ඒකත් සොයන්න, ඒකත් පරීක්ෂා කරලා බලන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැබැයි මම එකක් කියන්න කැමැතියි. ඇත්ත වශයෙන්ම මේ පරීක්ෂණ පිළිබඳව ජනතා විශ්වාසය පළුදු වෙලා තිබෙන්නේ, මේ සම්බන්ධයෙන් සිදු වුණු ක්‍රියාදාමයන් සියල්ලක්ම නිසායි. එම නිසා FBI, Scotland Yard වැනි ආයතන, එහෙමත් නැත්නම් වෙනත් ප්‍රවීණ ආරක්ෂක ආයතන මේ පරීක්ෂණවලට සම්බන්ධ කරගෙන විනිවිදභාවයෙන් යුක්ත වූ පරීක්ෂණ පැවැත්වීම අතිශයින්ම වැදගත්. තමන්ට තරහමරහකම් තිබුණා කියලා පුද්ගලයෝ ඉලක්ක කර ගන්නේ නැතුව, කණ්ඩායම් ඉලක්ක කර ගන්නේ නැතුව, වගකීමක් තිබෙන, වගවීමක් තිබෙන රජයක් හැටියට මේ රටේ පාස්කු දින ප්‍රහාරයෙන් විපතට පත් වුණු ඒ අහිංසක මිනිසුන්ගේ පවුල්වලට දෙයියන්ගේ නාමයෙන් සාධාරණත්වය ඉෂ්ට කරන්න. මේක දේශපාලනීකරණයට ලක් කිරීමෙන් ඉවත් කරලා, විවෘත මනසකින් සත්‍ය දත්ත දිහා බලා, සත්‍යය පසුපස හඹා ගිහිල්ලා හෙළිදරව් කිරීම වැදගත් වෙනවා. ඒ වාගේම මේ නීච ත්‍රස්තවාදී ක්‍රියාවට සම්බන්ධ සියලුදෙනාට ලබා දිය හැකි ඉහළම දඬුවම ලබා දෙන්නට කටයුතු කරන්නය කියා යෝජනා කරමින්, මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Mujibur Rahuman to second the Motion. You have 12 minutes.

[අ.භා. 2.54]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම මරණ 270කට වැඩි ප්‍රමාණයක් සිදු කරමින්, විශාල දේපළ හානියක් සිදු වුණු පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරයට අවුරුදු 7කට ආසන්න කාලයක් ගතවන මේ වෙලාවේ, එම සිද්ධිය සම්බන්ධයෙන් පවත්වනු ලබන මෙම විවාදයේදී අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

අපි සියලුදෙනාම දන්නවා, මේ බෝම්බ ප්‍රහාරයෙන් පස්සේ මේ සමාජය තුළ විවිධ මත ඇති වුණු බව. ඒත් එක්කම, සහරාන්ගේ කණ්ඩායම සම්බන්ධයෙන් නොයෙකුත් ආකාරයේ මත මේ සමාජය තුළ පළ වුණා. සහරාන්ගේ ත්‍රස්ත ක්‍රියාව නිසා මේ රටේ මුස්ලිම් සමාජයටත් විශාල කළු පැල්ලමක් ඇති වුණු බව අපි දන්නවා. සහරාන්ගේ මේ ත්‍රස්තවාදී ක්‍රියාව නිසා මුස්ලිම් සමාජයේ ඉතිහාසයටත් විශාල කළු පැල්ලමක් ඇති වුණාය කියන එක අපි සියලුදෙනාම පිළිගන්නවා. ඒ නිසාම තමයි මේ සම්බන්ධයෙන් පරීක්ෂණ ගණනාවක් ඉදිරියට යනකොට කරුණු ගණනාවක් හෙළිදරව් වුණේ. එසේ කරුණු හෙළිදරව් වීමත් එක්කම, මෙවැනි විශාල ප්‍රහාරයක් කරන්න සහරාන්ගේ කණ්ඩායමට කාගෙන් හෝ උදව් පදව් ලැබී තිබෙනවාද, ඔහුට උදව් ලබා දෙන්න යම් කණ්ඩායමක් ඔහුගේ පිටුපස සිටියාද කියන කාරණය විශාල විවාදයක් බවට පත් වුණා. විශේෂයෙන්ම අපි දන්නවා, ජනාධිපති කොමිෂන් සභා වාර්තාව හරහා ඒකට සාක්ෂි ලබා දුන් පුද්ගලයෝ බොහෝ කරුණු හෙළිදරව් කර තිබුණු බව. මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් DIG රවී සෙනෙවිරත්න මැතිතුමා ජනාධිපති කොමිෂන් සභාවට ඇවිත් කිව්වා, ඔය සහරාන්ට උඩින් කෙනෙක් හිටියා කියලා. ඔහු කොළයක යම් කෙනෙකුගේ නමක් පවා ලියලා ජනාධිපති කොමිෂන් සභාවට දුන්නා. අපි දන්නේ නැහැ, ඒ කාගේ නමද කියලා.

ඒවාගේම හිටපු නීතිපති දප්පුල ද ලිවේරා මැතිතුමා කිව්වා, "මේක කුමන්ත්‍රණකාරී ප්‍රහාරයක්, කුමන්ත්‍රණකාරී වැඩ පිළිවෙළක්" කියලා. එතුමා එහෙම කියලා පසුගිය කාලයේ හැංගිලා හිටියා. මොකද, එතුමාව අත්අඩංගුවට ගන්න උත්සාහ කළා. අන්තිමට එතුමා අභියාචනාධිකරණයට ගිහිල්ලා රිට් ආඥාවකුත් ගත්තා, එතුමාව අත්අඩංගුවට ගන්නවාට විරුද්ධව. මොකද, එතුමා මෙය කුමන්ත්‍රණයක් කියලා කිව්ව නිසා.

ඊළඟට, සහරාන්ගේ බිරිඳ හාදියා ජනාධිපති කොමිෂන් සභාවට ලබා දුන් කටඋත්තරේ කියනවා, සහරාන් ඉන්දියාවේ හිටපු පුද්ගලයෙක් එක්ක නිතර නිතර කථා කළා කියලා. ඇයත් එහෙම කටඋත්තර දීලා තිබෙනවා.

ඊළඟට, SIS ප්‍රධානියා වන නිලන්ත ජයවර්ධන මහත්මයාත් ජනාධිපති කොමිෂන් සභාව ඉදිරියට ගිහිල්ලා කියනවා, සහරාන්ට මේ ප්‍රහාරය ඉක්මනින් එල්ල කිරීමට පෙළඹවීම කළේ ඉන්දියාවේ හිටපු අබු හින්ද් කියලා. ඔහු ඒක පැහැදිලිව කියලා තිබෙනවා. මේ කථා දිහා බලනකොට අපට පෙනෙනවා, එදා අපි සියලු දෙනාම පිළිගත් විධියට සහරාන්ව මෙහෙයවපු කණ්ඩායමක් ඉන්න පුළුවන් කියන එක. ජනාධිපති කොමිෂන් සභාව ඉදිරියේ ලබා දුන් සාක්ෂිවල මම කියපු මේ නම් ටික විතරක් නොවෙයි, ඊට එහා ගිය තව නම් විශාල ප්‍රමාණයක් තිබෙනවා යම් යම් කරුණු හෙළිදරව් කරලා. ඒ කණ්ඩායමත් හොයන්න ඕනෑ කියලා මේ රටේ විවාදයක් ඇති වුණු බව අපි දන්නවා. සහරාන්ට උදවු කරපු යම් කණ්ඩායමක් ඉන්නවා නම්, ඒ කණ්ඩායම හඳුනාගෙන ඔවුන්ව නීතිය ඉදිරියට ගෙනැවිත් ඔවුනුත් අපරාධකරුවන් හැටියට සලකන්න ඕනෑ කියලා විවාදයක් ඇති වුණා. මොකද, ඔවුන් නිදැල්ලේ සිටීම මේ රටේ ජාතික ආරක්ෂාවට තර්ජනයක්. ඒ නිසා තමයි අපිත් කිව්වේ, මේක හොයන්න කියලා.

2019 ජනාධිපතිවරණයේ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ campaign එකේ ප්‍රධාන සටන් පාඨය මොකක්ද? එයා කතෝලික සභාවට පොරොන්දුවක් වුණා. මහ මොළකරු අල්ලනවා කියලා තමයි ගෝඨාභය රාජපක්ෂ 2019 බලය ගත්තේ. ඊළඟට එයා ආණ්ඩුවක් හැදුවා. කාවද මහ මොළකරු කියලා ඒගොල්ලන් හැඳින්වූවේ? ඒගොල්ලන් මහ මොළකරු කියලා හැඳින්වූවා, රිසාඩ් බදියුදීන්ව, රියාද් බදියුදීන්ව. හිජාස් හිස්බුල්ලාවත් අත් අඩංගුවට ගත්තා. එහෙම කරලා ඒගොල්ලන් කිව්වා, මේ ගොල්ලන් තමයි මහ මොළකරුවන් කියලා. අන්තිමට මොකද වුණේ? අවසානයේ උසාවියේදී රිසාඩ් බදියුදීන්ට සහ රියාද් බදියුදීන්ට දාපු චෝදනා ඔප්පු කරගන්න බැරිව ඒගොල්ලන්ගේ නඩුව නීතිපති දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා අස්කරගත්තා. දැන් හිජාස් හිස්බුල්ලාගේ නඩුව විතරක් යනවා. ඒ නඩුවත් ඉතාම දුර්වල මට්ටමක තිබෙන්නේ.

එහෙම නම් එදා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ඡන්ද campaign එකේදීත් ඒක පිළිගත්තා. දැන් මොකද වෙලා තිබෙන්නේ? එදා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ඡන්ද campaign එකේ හිටපු උදවිය දැන් කියනවා, මහ මොළකරුවෙක් නැහැ කියලා. ඒක තේ ප්‍රශ්නය වෙලා තිබෙන්නේ. ඒගොල්ලන් දැන් කියනවා, "මහ මොළකරුවෙක් නැහැ. මේක සහරාන්ගෙන් ඉවර කරමු" කියලා. මම ඒ අදහසට විරුද්ධ අදහසක් කියනකොට, මම මහ මොළකරු වෙනවා. හරිද? මම ත්‍රස්තවාදියා වෙනවා. ඒ කියන්නේ මොකක්ද? ඒ කියන්නේ මට කථා කරන්න එපා කියන එක නේ. ඒගොල්ලන් මොකක්ද කියන්නේ? ඒගොල්ලන් කියනවා, ඒගොල්ලන්ගේ සිහිනය දකින්න ඒගොල්ලන්ට ඉඩ අරින්න කියලා. ඒක නේ ඔය කියන්නේ. ඉතින්, මම ඒකට විරුද්ධව දිගින් දිගටම කථා කරනකොට කියනවා, අපි ත්‍රස්තවාදීන් කියලා. ඇයි ඒ? මම මුස්ලිම් වීම නිසාම මාව පටලවන්න හදනවා, සහරාන් එක්ක. සහරාන්ව මෙහෙයවපු යම් කණ්ඩායමක් ඉන්නවා කිව්වේ මම විතරක් නොවෙයි. මේ රටේ හුඟක් දේශපාලනඥයන් ඒක කිව්වා. මේ රටේ පාර්ලිමේන්තුවේ ඉන්න අයත්, එළියේ ඉන්න අයත් කිව්වා. ගියවර ඡන්දය දිනලා පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඇමතිකම් දරපු අයත් කිව්වා. නමුත් ඒගොල්ලන් ගැන කථා කරන්නේ නැහැ. මම මුස්ලිම් නිසා මාව සහරාන් එක්ක සම්බන්ධ කරන්න බලනවා. එහෙම නම් මම කියන්න ඕනෑ, මේක සහරාන්ගෙන් ඉවර කරන්න කියලා. අපට එහෙම සම්බන්ධකම් තිබෙනවා නම්, මේ පරීක්ෂණ ඉදිරියට යන එක ගැන අපි බය වෙන්න එපායැ. අපි කියනවා, මේක සොයන්න කියලා. සහරාන්ට උදවු කරපු තව මුස්ලිම් අය ඉන්නවා නම්, සිංහල අය ඉන්නවා නම්, ද්‍රවිඩ අය ඉන්නවා නම් සොයන්න. නමුත් ඒගොල්ලන් කියනවා, "නැහැ, නැහැ, සොයන්න එපා" කියලා.

අපි මුස්ලිම් වෙලාත් කියනවා, හොයන්න කියලා. ඒගොල්ලන් කියනවා, "නැහැ, නැහැ, හොයන්න ඕනෑ නැහැ, මේක සහරාන්ගෙන් ඉවර කරමු" කියලා. එතකොට අපට පෙනෙනවා, ඇත්තටම සහරාන්ට උදවු කරන්නේ කවුද කියලා. මොකද, මේ ප්‍රශ්නයේදී ගොඩක් බැට කාපු මිනිස්සු, අපි. මේකෙදි අපි වින්දිතයෝ වුණා. අපි මේ සමාජයේ අසරණ වුණා. අපේ ළමයින්ට පාසලට යන්න බැරි වුණා. මගේ ළමයාගේ පාසල වෙනස් කළා. මම මේ කථාව භය නැතිව කියනවා. අපිත් එක්ක පාර්ලිමේන්තුවේ හිටපු මන්ත්‍රීවරුන් මේ රෙස්ටුරන්ට් එකේ කෑම කන්න අපිත් එක්ක වාඩිවුණේ නැහැ. ඒ තරම් අපෙන් ඈත් වෙලා

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

හිටියා. එහෙම අපි දුක් වින්දා. මුළු මුස්ලිම් සමාජයම දුක් වින්දා. එදා මුස්ලිම් අයට පාරේ බැහැලා යන්න බැරි වුණා. තමන් විශ්වාස කරන ඇඳුම් ඇඳගෙන යන්න බැරි වුණා. එහෙම කාලයක් තිබුණා. අන්න ඒ කාලයම අපි දුක් වින්දා. ඒ හින්දා තමයි අපි තවම කෑ ගහන්නේ. සහරාන්ට කවුරු හරි උදවු කරලා තිබෙනවා නම්, සහරාන්ව කවුරු හරි මෙහෙයවා තිබෙනවා නම්, ඒ සියලුදෙනාම අධිකරණය ඉදිරියට ගේන්න ඕනෑ. එහෙම නැතිව අපේ කටවල් වහලා, අපි ත්‍රස්තවාදීන් කියලා අපි හය කරලා මේක යටපත් කරන්න දෙන්න බැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒක තේරුම් ගන්න ඕනෑ. ඊගොල්ලන්ගේ අදහසට ප්‍රතිවිරුද්ධ අදහසක් අපි කියපු ගමන් අපේ කටවල් වහන්න යූටියුබ් නාළිකාවල ඉන්න උදවිය විශාල ප්‍රමාණයක් දාලා ත්‍රස්තවාදීන් හැටියට අපි උලුප්පන්න හදනවා. ඊගොල්ලන් මේ රටේ අවුරුදු දෙකහමාරක් බලයේ හිටියා. ඒ අය අපව පරීක්ෂා කළා. මගේ telephone එක හැමදාම හෙව්වා. මගේ telephone එකට කථා කරපු මිනිස්සුන්ව CID එකට ගෙනාවා. ඔවුන් ගෙන්වා ඇහුවා, මා එක්ක මොනවාද සාකච්ඡා කළේ කියලා. මගේ ගෙදර ඉස්සරහට බුද්ධි අංශයෙන් යෙදෙව්වා. මම යන යන තැන්වලට බුද්ධි අංශයෙන් ආවා. එහෙම පරීක්ෂාවට ලක්වෙලා තමයි අපි මේ ඉන්නේ. නිකම් නොවෙයි.

ගෝඨාභය රාජපක්ෂ මේ රටේ ජනාධිපති වෙලා ඉන්න කාලයේ, රනිල් වික්‍රමසිංහ මේ රටේ ජනාධිපති වෙලා ඉන්න කාලයේ බුද්ධි අංශයේ ප්‍රධානියා කවුද? සුරේෂ් සලේ තමයි බුද්ධි අංශයේ ප්‍රධානියා. සුරේෂ් සලේ අපිව නිකම් අතහරියි ද? මේ ප්‍රහාරයට අපේ දශමයක හරි සම්බන්ධකමක් තිබුණා නම් අපිව අරගෙන ගිහිල්ලා එල්ලලා ඇති. අපි විශ්වාස කරන අපේ ආගම දහම උඩ ඒ දෙවියන් වහන්සේ අපිව බේරාගත්තා. අපේ වාසනාවකට ඒ ප්‍රහාරයට සම්බන්ධ කිසිම කෙනෙක් එක්ක අපේ කිසිදු සම්බන්ධයක් තිබුණේ නැහැ. ඒ සම්බන්ධව අපි දැනුවත් වෙලා හිටියේත් නැහැ. ඒ හින්දා අනෙක් අයටත් වැඩිය අපට මේක ගැන හොයන්න වුවමනාවක් තිබෙනවා. මොකද, අපි ඒකේ වින්දිතයෝ. අපි ඒකේ වින්දිතයෝ නිසා අපට ඒ අයිතිය තිබෙනවා. ඒ අයිතියට බාධා කරන්න එපා. ඒ අයිතිය යටපත් කරන්න එන්න එපා. ඒ අයිතියට අපි කථා කරනකොට අපට නොයෙකුත් ආකාරයේ මඩ ගහලා, තර්ජනය කරලා, අපහාස කරලා, අපේ කටවල් වහන්න හිතන්න එපා. අපේ කටවල් අපි එහෙම වහන්නේත් නැහැ. ඒක මතක තියාගන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට ඉතා වැදගත් සිද්ධිය මේකයි. අබුබකර් කියන කලවංචිකුඩියේ හිටපු CI අත්අඩංගුවට ගන්නවා, 2020.07.13වැනි දා. අබුබකර්ව අත්අඩංගුවට ගන්නේ මොකටද? අබුබකර්ව අත්අඩංගුවට ගන්නවා, සාරා ජස්මින්ව අරගෙන ගියා කියලා. ඊළඟට, අබුබකර් අවුරුදු 3ක් හිරේ තියාගෙන හිටියා. ඔහුව අවුරුදු 3ක් හිරේ තියාගෙන ඉඳලා මඩකලපුව අධිකරණයේදී නිදොස් කොට නිදහස් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Mujibur Rahuman, you have two more minutes.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මට තව ටිකක් කාලය අවශ්‍යයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අබුබකර්ට එල්ල කරපු චෝදනාව බොරුයි කියලා ඔහු නිදහස් කරනවා. එතකොට අබුබකර් නිදහස් වෙලා එනවා. ඔහුට රස්සාව නැති වෙනවා. 2024දී ඔහු නිදොස්කොට නිදහස් කරනවා. ඔහු නිදහස් වෙලා ඇවිල්ලා දැන් අවුරුදු 2ක් වෙනවා, ගරු ඇමතිතුමනි. නමුත්, තවම අබුබකර්ගේ රස්සාව දුන්නේ නැහැ. ලජ්ජයි. බොරු චෝදනාවක් දාලා ඔහුව ඇතුළට දානවා, සාරා ජස්මින්ව පැන්නුවයි කියලා. ඒක කුමන්ත්‍රණයක්. ඒ චෝදනාව දාපු පොලිස් නිලධාරියා අද කෝ? අද ඔහු ඇමෙරිකාවේ ඉන්නවා. ඔහු ගෙන්වන්න. ඔහු ගෙන්වා අහන්න, අබුබකර්ව මේකට පටලවන්න කියලා ඔහුට උපදෙස් දුන්නේ කවුද කියලා. අන්න කුමන්ත්‍රණකාරයෝ. Green Card අරගෙන ඔහු අද ඇමෙරිකාවේ ඉන්නවා. ඔබතුමන්ලා ඔහු ගෙන්වන්න. ගෙන්වා අහන්න, අබුබකර්ව මේකට පටලවන්න උපදෙස් දුන්නේ කවුද කියලා. දැන් අවුරුදු දෙකක් තිස්සේ ඒ පවුලම පාරට වැටිලා තිබෙනවා, රස්සාවල් නැහැ. ගරු ආනන්ද විජේපාල ඇමතිතුමනි, ඉක්මනට එතුමාගේ රස්සාව දෙන්න. Arrears එකත් දෙන්න. මේක අපරාධයක්. බොරුවට චෝදනා දාලා අවුරුදු 3ක් ඇතුළේ තියාගෙන හිටපු ඔහුව නිදහස් වෙලා දැන් අවුරුදු දෙකක් වෙනවා. තමුන්නාන්සේලාට තවම බැරි වුණා, ඒ අසාධාරණයට ලක් වෙච්ච අබුබකර්ට රස්සාව දෙන්න. ඒක කරන්න, ගරු ඇමතිතුමනි.

ඊළඟ කාරණාව තමයි, මේ සාරා ජස්මින්ගේ ප්‍රශ්නය. මේ සාරා ජස්මින්ගේ ප්‍රශ්නයේදී දැන් අලුත් තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. සාරා ජස්මින් මැරිලා, මැරිලා කියලා පිරිසක් දැන් කියනවා නේ. දැන් ඇමතිතුමාත් කිව්වා, එහෙම එකක් නැහැ; ඒ පරීක්ෂාව අනුව පෙනෙනවා සාරා ජස්මින්ගේ මැරිලා නැහැ කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සාරා ජස්මින් 2019 අප්‍රේල් මාසයේ 26වැනි දා සායින්දමරුදුවලදී පැනගන්නවා. එතකොට ඒ ප්‍රදේශය භාරව හිටියේ ASP Herath. මේ ASP Herath පසුගිය සතියේ පත්තරේකට interview එකක් දුන්නා. ඒ interview එකේදි ඔහු කියන්නේ මොකක්ද? ඒ පත්තරේ පළ කරන ලද ලිපියේ පිටපතක් මා ළඟ තිබෙනවා. මා එය **සභාගත*** කරනවා.

හිටපු ASP Herath ඒ interview එකේදි කියනවා, සාරා ජස්මින් මැරුණේ නැහැ කියලා. ඔහු කියනවා, එදා ඊගොල්ලන්ට තොරතුරක් ආවා, ඊගොල්ලන් සායින්දමරුදුවල ඒ ගෙදර ළඟට ගියා, එතැනට ගියාම එතැන හමුදාවෙන් හිටියා, ඒ පාලමෙන් එහාට ඊගොල්ලන්ට යන්න දුන්නේ නැහැ, එතැනදි විශාල බෝම්බ සද්දයක් ඇහුණා, පිපිරීමක් වුණා, ත්‍රී වීලර් එකක් ආවා, ත්‍රී වීලර් එක නවත්වන්නේ නැතිව යන්න හැදුවා, හමුදාවෙන් ඒකට වෙඩි තැබුවා, ඊළඟට එතැනින් motorbike එකක් high speed එකෙන් ගියා, ඒ motorbike එක නවත්වාගන්න එතැන හිටපු කවුරුවත් උත්සාහ කළේ නැහැ කියලා. ඊළඟට, ඔහු තවත් විශේෂ දෙයක් කියනවා. ඔහු කියනවා, එදා - අප්‍රේල් මාසයේ 26වැනි දා - සායින්දමරුදුවල සහරාන්ලාගේ කණ්ඩායම හිටපු ගෙදරට යනකොට තමුන්නාන්සේලාගේ ආරක්ෂක නියෝජ්‍ය ඇමති - එදා නැහෙනහිර පළාත භාරව හිටපු ආඥාපති මේජර් ජෙනරාල් අරුණ ජයසේකරත් - හිටියා කියලා. අරුණ ජයසේකර හිටියේ කොතැනද? අරුණ ජයසේකර ඉඳලා තිබෙන්නේ සහරාන්ගේ කණ්ඩායම හිටපු ගෙවල් ළඟ සිට මීටර් 150ක් එහායින්. මේවා කියන්නේ කවුද? හේරත් තමයි කියන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

නැඟෙනහිර පළාත භාරව හිටපු ආඥාපති හැටියට අරුණ ජයසේකර එදා එතැන හිටියා නම් ඔහු නොදැන ඉන්න විධියක් නැහැ, සාරා ජස්මින් කොහේටද ගියේ කියලා. අද එතුමා ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ ආරක්ෂක නියෝජ්‍ය ඇමති; එදා නැඟෙනහිර පළාතේ හිටපු ආඥාපති. ඒ ආඥාපති නොදැන ඉන්න විධියක් නැහැ, සාරා කොහෙද ගියේ කියලා. එදා එතුමා එතැන ඉඳලා තිබෙනවා නේ. එහෙනම් එදා ඒ motorbike එකේ සාරාව අරගෙන ගියේ කවුද? ඒක අරුණ ජයසේකර නියෝජ්‍ය ඇමතිතුමා දන්නවා. මම විශ්වාස කරන්නේ නැහැ, එතුමා ඒක දන්නේ නැහැ කියලා. එතුමා දන්නවා, සාරාව පැන්නුවේ කවුද කියලා. අවාසනාවකට අපි දන්නේ නැහැ, තමුන්නාන්සේලාගේ ජාතික ජන බලවේගයට අරුණ ජයසේකර ඇතුළත් වෙලා අන්තිමට ආරක්ෂක නියෝජ්‍ය ඇමතිත් වනතුරු. ඒක කොහොම වුණාද කියලා අපි දන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කථාව අවසාන කරනවා, මට තත්පර කිහිපයක් දෙන්න.

ජනාධිපතිතුමා කිව්වා, රාජ්‍යය විසින් රාජ්‍යය පරීක්ෂාවට ලක් වෙන්න ඕනෑ කියලා. රාජ්‍යය විසින් රාජ්‍යය පරීක්ෂාවට ලක් වෙන්න නම් මොකක්ද වෙන්න ඕනෑ? එදා බෝම්බය පිපිරුණු අවස්ථාවේ ඒ රාජ්‍යයේ කොටස්කාරයෙක් හැටියට හිටපු නැඟෙනහිර භාර ආඥාපති අද තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ නියෝජ්‍ය ආරක්ෂක ඇමති වෙලා ඉන්නවා. මේ පරීක්ෂණ සාධාරණව ඉදිරියට ගෙනයන්න නම් අනිවාර්යයෙන්ම එතුමා මේ තනතුරෙන් අයින් වෙන්න ඕනෑ. එතුමා මේ තනතුරෙන් අයින් වුණොත් විතරයි මේ පරීක්ෂණවල සාධාරණත්වය පිළිබඳව අපට විශ්වාසයක් ඇති කරගන්න පුළුවන් වන්නේ. මොකද, එදා මේකේ කොටස්කාරයෙක් හැටියට එතුමා හිටියා. ඒ කාරණය මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Ananda Wijepala. You have 22 minutes.

[අ.භා. 3.09]

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපි මේ විවාද කරන පාස්කු ඉරිදා ප්‍රහාරයට ලබන 21වැනි දා වන විට අවුරුදු 7ක් සම්පූර්ණ වනවා. පසුගිය කාලය පුරාවටම මේ සභාව තුළ මේ සම්බන්ධයෙන් 12 වතාවක් විවාද කරලා තිබෙනවා. අද මේ පවත්වන්නේ 13 වැනි විවාදය. මේ වනකොට මේ සම්බන්ධයෙන් අධිකරණයේ නඩු විශාල ප්‍රමාණයක් විභාග වනවා. ඒ වාගේම 13 වැනි වතාවටත් සභාව කල් තැබීමේ යෝජනාවක් ලෙස මෙය අද දින ගරු විපක්ෂ නායකතුමා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. ඒ කවර කාරණයක් නිසාද කියලා මම දන්නේ නැහැ. මම දැක්කා, එතුමා මහ මොළකරු ගැන විමසුවා, සත්‍යය හෙළි කරන්න කිව්වා. අපි දැක්කා, පසුගිය දවසක මහ මොළකරු හොයාගෙන ගිහිල්ලා වාඩි වෙලා හිටපු බව. මහ මොළකරු හොයාගෙන ගිහිල්ලා හිටියා. හම්බ වුණේ නැද්ද දන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සම්බන්ධව අධිකරණයේ නඩු විශාල ප්‍රමාණයක් විභාග වන නිසා මට මේ සභාවට සමහර කාරණා හෙළි කරන්න හැකියාවක් නැහැ. ඊට අමතරව තවත් විමර්ශනයකුත් මේ සම්බන්ධව සිද්ධ වනවා. මේක හුදෙකලා සිද්ධියක් නොවෙයි. මේක සිද්ධි දාමයක්. පාස්කු ඉරිදා ප්‍රහාරයට පෙරාතුව සිද්ධි සහ පාස්කු ඉරිදා දිනයේ පිපිරීමට පසුව ඇති වුණු සිද්ධියක් සම්බන්ධවත් මේ විමර්ශන ඔස්සේ මේ වනකොට අධිකරණ ක්‍රියාමාර්ග රාශියක් අරගෙන තිබෙනවා.

ඊට පරිබාහිරව දීර්ඝ කාලයක් තිස්සේ මේ සමාජය, මේ පාර්ලිමේන්තුව ඇතුළු මේ රටේ කවුරුත් මේ ප්‍රහාරය සම්බන්ධයෙන් සැක පහළ කළා. මේ ප්‍රහාරය යම් කුමන්ත්‍රණයක ප්‍රතිඵලයක්ද කියන එක පිළිබඳව සමාජයට ප්‍රශ්නාර්ථයක් තිබුණා. මේ සභාව තුළ මේ සම්බන්ධයෙන් මීට පෙරත් විවාද කර තිබෙනවා. අද දින 13වන වතාවටත් මේ පිළිබඳව විවාදය සිදු කරනවා. හැබැයි, අපි බොහොම සීමාසහිතව තොරතුරු ඉදිරිපත් කරන්නම්, මේ සම්බන්ධයෙන් අධිකරණයේ විභාග වන නඩු විශාල ප්‍රමාණයක් තිබෙන නිසා. ඒ පාර්ශ්වයෙනුත් writ පෙත්සම් සහ FR පෙත්සම් ගොනු කරලා තිබෙනවා. ඊට අමතරව මේ සිද්ධි දාමය සම්බන්ධයෙන් එක් එක් අධිකරණවල නඩු විභාග වෙනවා. තවත් නඩුවක් කොළඹ මහාධිකරණයේ විභාග වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2019.04.21වැනි දින පැය 08.45ත් - 09.12ත් අතර බෝම්බ 6ක්ද, දෙමටගොඩ මහවිල උද්‍යානයේ පැය 13.37ට බෝම්බයක් සහ දෙහිවල ට්‍රොපිකල් ඉන් හෝටලයේදී පැය 14.37ට බෝම්බයක් යනාදී වශයෙන් ස්වයං ඝාතක බෝම්බ 8ක් පිපිරුණා. මේ සිදුවීම් මාලාව කාත්තන්කුඩි හි පදිංචිව සිටි සහරාන් හෂීම් නමැති අයෙකු ඇතුළු කණ්ඩායමක් විසින් සිදු කළ බවට හෙළි වෙලා තිබෙනවා. මේ පිළිබඳව දීර්ඝ වශයෙන් කරන ලද පොලිස් විමර්ශනවලදී 2019.04.21වන දින සිදු වූ පාස්කු ඉරු දින ප්‍රහාරය හුදකලා සිදුවීමක් නොවන බවත්, එය 2017 සිට සැලසුම් සහගතව දියත් කරන ලද කුමන්ත්‍රණයක් බවත් මේ වනකොට හෙළි වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒක කුමන්ත්‍රණයක්. මෙය 2017 අවුරුද්දේ සිට සැලසුම් කරලා, ක්‍රම ක්‍රමයෙන් ක්‍රියාත්මක කරලා මේ සිද්ධිය දක්වා ගෙන ආපු කුමන්ත්‍රණයක් බවයි දැනට කරන ලද විමර්ශනවලින් අනාවරණය වෙන්නේ.

2018.11.30වන දින වවුනතිව් පොලිස් නිලධාරින්ගේ ඝාතනය, 2018.12.22 සහ 2018.12.23වන දින මාවනැල්ලේ බුදු පිළිමවලට එල්ල වූ ප්‍රහාරය, 2019.01.16වන දින වනාතවිල්ලුව ප්‍රදේශයේ රහසිගත කඳවුරක තිබී සොයා ගන්නා ලද ඩෙටනේටර් ඇතුළු පුපුරණ ද්‍රව්‍ය සමඟ සැකකරුවන් 4දෙනෙකු අත්අඩංගුවට ගැනීම, 2019.03.10වන දින මාවනැල්ල ප්‍රදේශයේදී තස්ලිම් නැමති පුද්ගලයාට වෙඩි තැබීම, 2019.04.16වන දින මඩකලපුව කාත්තන්කුඩි පාලමුන ප්‍රදේශයේ යතුරු පැදියක් පුපුරුවා හැරීම, 2019.04.21වන දින පාස්කු ඉරිදා ප්‍රහාරය එකම කණ්ඩායමක, එකිනෙක හා දාමගතව සිදු වූ සිදුවීම් මාලාවක් බව නිරීක්ෂණය කිරීමේදී සහ විමර්ශන ආශ්‍රයෙන් පැහැදිලි වෙනවා. ඒ පිළිබඳව විමර්ශන ආරම්භ කර තිබෙනවා. ඒ විමර්ශනවලට අනුව පාස්කු ඉරු දින ප්‍රහාරයට පෙරාතුව සිදු වුණු වවුනතිව් පොලිස් ස්ථානයට

[ගරු ආනන්ද විජේපාල මහතා]

අනුයුක්තව සේවය කරපු පොලිස් නිලධාරීන්ගේ ඝාතනය, වනාතවිල්ලුව ලැක්ටෝ වත්තේ තිබී පුපුරණ ද්‍රව්‍ය සොයා ගැනීම, මාවනැල්ල ප්‍රදේශයේ මොහොමඩ් තස්ලිම් නමැත්තා ඝාතනය කිරීමට තැත් කිරීම හා කාත්තන්කුඩි ප්‍රදේශයේ යතුරු පැදියක් පුපුරුවා හැරීම සම්බන්ධයෙන් නීතිපති උපදෙස් මත අධිකරණ කටයුතු මේ වෙනකොට ආරම්භ කර තිබෙනවා. මාවනැල්ල ප්‍රදේශයේ බුදු පිළිම විනාශ කිරීමට අදාළ නඩුව කෑගල්ල ත්‍රිපුද්ගල මහාධිකරණය විසින් විභාග කර, චූදිතයින් 13දෙනෙකුට දඬුවම් පමුණුවා තිබෙනවා. කරුණු එසේ තිබියදී 2023 සැප්තැම්බර් 06වන දින අසාද් මවුලානා නමැති අයෙකු විසින් පාස්කු ඉරු දින ප්‍රහාරය පිළිබඳව හෙළි නොවූ කරුණු "Channel 4" නාළිකාවට අනාවරණය කර තිබුණා. මේ සම්බන්ධයෙන් සමාජ හා සාමයික කේන්ද්‍රයේ විධායක අධ්‍යක්ෂ රොහාන් සිල්වා පියතුමා විසින් 2024.10.11වන දින සිදු කරන ලද පැමිණිල්ලකට අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නව විමර්ශනයක්ද ආරම්භ කර තිබෙනවා.

පාස්කු ඉරු දින ප්‍රහාරයට පෙරාතුව සිදුවීම් රාශියක් සිද්ධ වුණා, ඒ පිළිබඳව විමර්ශන සිදු කරලා අධිකරණ ක්‍රියාමාර්ග ගෙන තිබෙනවා කියලා අපි කිව්වා. පාස්කු ඉරු දින ප්‍රහාරය සම්බන්ධයෙන් මේ වෙනකොට කොළඹ මහාධිකරණයේ දිනපතා අධිකරණ ක්‍රියාමාර්ග ගනිමින් තිබෙනවා. හැබැයි, වත්මන් රජය බලයට පත් වුණාට පස්සේ මේ සිද්ධිය කුමන්ත්‍රණයක ප්‍රතිඵලයක් හැටියට සිදු වුණේද යන්න පිළිබඳව සොයා බැලීමේ විමර්ශනය අපි ආරම්භ කරලා තිබෙනවා. ඒ විමර්ශනයේ ප්‍රතිඵලයක් ලෙස 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත ප්‍රකාරව යසිල්බාවා ජෙගීල් පාස්, අංක 77, සර් රාසික් ෆරීඩ් මාවත, කාත්තන්කුඩි 4 සහ සුවඳ රාළ සුදු නිලමේගේ සරත් සමන්ත, අංක 131, කිරි වෙහෙර පාර, ලාහුගල, පොතුවිල් යන ප්‍රදේශවල අය අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාරගත කර තිබෙනවා. ඔවුන් අත්අඩංගුවට ගත්තේ වවුනතිව් පොලිස් නිලධාරීන් දෙදෙනා ඝාතනය කිරීමේ සිදුවීමේ විමර්ශනවලට බාධා කිරීම සහ නොමඟ යැවීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් හෙළි වූ කාරණා අනුවයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වවුනතිව් පොලිස් මුරපොළේ සිටි පොලිස් නිලධාරීන් දෙදෙනාගේ ඝාතනය සම්බන්ධයෙන් ඒ කාලයේ විමර්ශනයක් කර තිබුණා. අපි දන්නවා, පාස්කු ඉරු දින ප්‍රහාරය සිද්ධ වුණේ රනිල් වික්‍රමසිංහ - මෛත්‍රීපාල යහපාලන ආණ්ඩුව කාලයේදී බව. ඒ අවස්ථාවේදී සජිත් ප්‍රේමදාස මහතා සංස්කෘතික කටයුතු ඇමතිතුමා වශයෙන් කටයුතු කළා. ඒ විමර්ශනයේදී මේක පුනරුත්ථාපනය වූ එල්ටීටීඊ සාමාජිකයන්, නැත්නම් ex-LTTE cadresලා විසින් සිදු කළ බවට අනාවරණය වෙලා ඔවුන් අත්අඩංගුවට අරගෙන තිබුණා. කන්නන් නොහොත් අජන්තන් 2018.12.03වන දා වවුනතිව් පොලිස් ස්ථානය විසින් සැකපිට අත්අඩංගුවට ගත්තා. ඊට අමතරව කිලිනොච්චියේ පදිංචි රාසනායගම් සර්වනාදන් මහත්මයා අත්අඩංගුවට අරගෙන තිබුණා. පසු කාලයක ඔවුන් නිදහස් කරලා තිබුණා. හැබැයි, අපි බලයට පත් වුණාට පසුව මේ පිළිබඳව ලැබුණු තොරතුරු ඔස්සේ විමර්ශනයක් සිදු කළා. ඒ අනුව අපි මේ වෙනකොට හෙළි කරගෙන තිබෙනවා, ඒ පොලිස් නිලධාරීන් දෙදෙනාගේ ඝාතන හිටපු එල්ටීටීඊ සාමාජිකයන් විසින් සිදු නොකළ බවත්, එම ඝාතන සිදු කර තිබෙන්නේ සහරාන් හෂීම්ගේ කණ්ඩායමක් විසින් බවත්. එදා වවුනතිව් පොලිස් මුරපොළේ සිටි පොලිස් නිලධාරීන් දෙදෙනාගේ ඝාතනයේ ඇත්ත චූදිතයන් අත්අඩංගුවට ගන්න හැකි වුණා නම්; 2018 දෙසැම්බර් මාසයේ සිදු වූ සිදුවීම නිවැරදි ලෙස විමර්ශනය කර සහරාන් ඇතුළු සැබෑ චූදිතයන් අත්අඩංගුවට ගත්තා නම්, විමර්ශන නොමඟ යවා නොතිබුණා නම්, අප්‍රේල් 21වැනි දා පාස්කු ප්‍රහාරය සිද්ධ වෙන්නේ නැහැ. හැබැයි විමර්ශනවලින් පැහැදිලි වෙනවා, සහරාන් ඇතුළු පිරිස එයින් මුදා හැර එල්ටීටීඊ සංවිධානයේ පුනරුත්ථාපනය වූ දෙදෙනෙක් ඒකට සම්බන්ධ බවට චෝදනා කර සිරගත කළ බව. ඒක විමර්ශන නොමඟ යැවීමට සිදු කළ කාර්යයක් බව පැහැදිලියි.

මෙහිදී තවත් කාරණයක් මම ප්‍රකාශ කරන්න ඕනෑ. මේ විමර්ශනය පැවැත්වෙන අතරතුර 2019.04.26වැනි දින මොහොමඩ් සරීෆ් ආදම් ලෙබ්බෙ නොහොත් "ගෆූර් මාමා" යන අය කාත්තන්කුඩි පොලිස් ස්ථානය විසින් මහජන සහාය ඇතුව අත්අඩංගුවට ගෙන, එදිනම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සැකකරු භාරගෙන, නිදහස් කර තිබෙනවා. නමුත්, අපි බලයට පත් වුණාට පසුව මේ සම්බන්ධයෙන් විමර්ශන ආරම්භ කළා. ඒ විමර්ශනවල ප්‍රතිඵලයක් හැටියට මොහොමඩ් සරීෆ් ආදම් ලෙබ්බෙ නොහොත් ගෆූර් මාමා යන සැකකරුගේ ප්‍රකාශ අනුව ඒ පොලිස් නිලධාරීන් දෙදෙනා සතුව තිබූ එක රිවෝල්වරයක් නින්තවූර් ප්‍රදේශයේ තිබීද, තවත් රිවෝල්වරයක් වනාතවිල්ලුව ප්‍රදේශයේ තිබීද සොයා ගත්තා.

ගරු විපක්ෂ නායකතුමා ඇහුවා, ආයුධ සොයා ගත්තාද කියලා. අපි ඒ ආයුධ දෙක සොයා ගෙන තිබෙනවා. ඒ රිවෝල්වර් දෙකම මියගිය නිලධාරීන් සතු ගිනි අවි බවත්, ඒ වාගේම වනාතවිල්ලුවේ තිබී මොහොමඩ් සරීෆ් ආදම් ලෙබ්බෙ නොහොත් "ගෆූර් මාමා",- *[බාධා කිරීමක්]* ඊට අමතරව වනාතවිල්ලුව ප්‍රදේශයේ තිබී පිහි දෙකක් සොයා ගෙන තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විධියට වවුනතිව් පොලිස් නිලධාරීන් දෙදෙනාගේ ඝාතනය සම්බන්ධයෙන් විමර්ශනය නිවැරදි දිශානතියට යොමු කර දැනට අත්අඩංගුවට ගෙන ඇති පුද්ගලයන්ට විරුද්ධව මඩකලපුව මහාධිකරණයේ කරුණු වාර්තා කර අධිකරණ ක්‍රියාමාර්ග ගෙන තිබෙනවා. එදා ඒ විමර්ශන නිවැරදි ලෙස සිද්ධ වුණා නම් පාස්කු ඉරු දින ප්‍රහාරය සිද්ධ වෙන්නේ නැහැ. ඒ සිද්ධියට වගකිව යුත්තේ සහරාන් ඇතුළු කණ්ඩායම බව මේ වෙනකොට අනාවරණය වෙලා තිබෙනවා. ඒ විමර්ශන සියල්ල නොමඟ යවන්න ඒ වෙලාවේදී කටයුතු කර තිබුණා.

ඒ වාගේම ඉහත විමර්ශන ආශ්‍රයෙන් සාක්ෂි සටහන් කර ගත්තාට පස්සේ පාස්කු ඉරු දින ප්‍රහාරය සම්බන්ධව කුමන්ත්‍රණය සහ ඊට ආධාර අනුබල දීම සම්බන්ධයෙන් 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අනුව මේ වනකොට තුවාන් සුරේෂ් සලේ අත්අඩංගුවට අරගෙන තිබෙනවා. හැබැයි, මීට පෙරාතුව මොහු පාස්කු ඉරු දින ප්‍රහාරයේ නඩු විභාගයේ සාක්ෂි ලැයිස්තුවේ පළමුවැනි සාක්ෂිකරු විධියට නම් කර තිබෙනවා. විශේෂයෙන් 2024.10.11වන දින කරන ලද පැමිණිල්ලකට අනුව අපි මේ වනකොට අදාළ සැකකරු අත්අඩංගුවට ගෙන තිබෙනවා.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මේ සම්බන්ධව අභියාචනාධිකරණයේ අංක CA/WRIT/870/2025 සහ CA/ WRIT/232/2026 යටතේ රිට් ආඥාවක් ඉල්ලා මේ වන විට නඩු දෙකක් ගොනු කර තිබෙනවා. මේ කරුණු අධිකරණයේ පවතින නඩුවලට බාධාවක් නොවන පරිදි තමයි පරිශීලනය කරන්න වෙලා තිබෙන්නේ. විශේෂයෙන් යුද හමුදා බුද්ධි අධ්‍යක්ෂවරයකු වශයෙන් සහ රාජ්‍ය බුද්ධි සේවාවේ හිටපු අධ්‍යක්ෂකවරයකු වශයෙන් කටයුතු කර ඇති විශ්‍රාමික මේජර් ජෙනරාල් තුවාන් සුරේෂ් සලේ යන අය පාස්කු ඉරු දින ප්‍රහාරයට පූර්වයෙන් ඉස්ලාම් අන්තවාදීන්ගේ සාහසික ක්‍රියා පිළිබඳව දැන සිටිමින් ඒවා වැළැක්වීමට හා හෙළිදරව් වීම ඕනෑකමින් වළක්වා ඇති බවත්, පාස්කු ප්‍රහාරය සිදුවීමට අවකාශය සලස්වා ඇති බවටත්, පාස්කු ප්‍රහාරයෙන් පසු පාස්කු ප්‍රහාරය මෙහෙය වූ පුද්ගලයන් පාර්ශ්ව කණ්ඩායම් හෙළිදරව් වීම වැළැක්වීමට සෘජු හා වක්‍රාකාරයෙන්

කටයුතු කර ඇති බවටත්, ඒ අනුව පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් කුමන්ත්‍රණය හා ආධාර අනුබල දීමට කටයුතු කර ඇති බැවින් එවැනි නීති විරෝධී ක්‍රියාකාරකමට සම්බන්ධ වූ හෝ ප්‍රවේදිතාවක් දක්වන්නේ යැයි සාධාරණ යුක්ති සහගතව සැක කරනු ලැබීමට අදාළව කරුණු වාර්තා වීමෙන් පසුව ඔහුව අත්අඩංගුවට ගෙන තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 14වැනි වතාවටයි පාස්කු ඉරු දින ප්‍රහාරය සම්බන්ධ විවාදය අද පවත්වන්නේ. මේ සෑම විවාදයකදීම පාස්කු ඉරු දින ප්‍රහාරයේ කුමන්ත්‍රණය සහ මහ මොළකරු පිළිබඳව පරීක්ෂණ කළ යුතු බව අවධාරණය කරනවා, විපක්ෂයේ පක්ෂ වාගේම ඒ වෙලාවේ විපක්ෂයේ හිටපු අයත්, ආණ්ඩු පක්ෂයේ හිටපු අයත්. සෑම කථිකයෙකුම ඒක අවධාරණය කර තිබෙනවා. එසේම "අබුහින්ද්" නැමති චරිතයක් පිළිබඳ කරුණු කාරණා මතු කර තිබෙනවා. මේ අවස්ථාවෙත් ඒ කරුණු මතු වුණා. එහෙත් මීට පෙර පැවති කිසිදු රජයක් මහ මොළකරු හෝ මේ කුමන්ත්‍රණය පිළිබඳව පරීක්ෂණයක් පවත්වලා නැහැ. එහෙම කරලා නැහැ.

එසේම 2022 වර්ෂයේ පැවති රජය මහ මොළකරු පිළිබඳ පරීක්ෂණ කරනවා වෙනුවට පාස්කු ඉරු දින ප්‍රහාරය පිළිබඳ විමර්ශන පවත්වමින් සිටි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ඇතුළු නිලධාරින් 22ක් කිසිදු හේතුවක් නොමැතිව සී සී කඩ මාරු කර යවා තිබුණා. ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. 2019.04.21වැනි දින ගරු විපක්ෂ නායකතුමන්ලා බලයේ ඉන්නකොට තමයි මේ සිද්ධිය සිද්ධ වුණේ. ඒ අය මේ කුමන්ත්‍රණය හෝ මහ මොළකරු ගැන කිසිම විමර්ශනයක් කළේ නැහැ. පසුගිය දවසක මහ මොළකරු හොයාගෙන ගිහිල්ලා තිබුණා. ගෝඨාභය රාජපක්ෂ අවුරුදු 2යි මාස 8ක් බලයේ හිටියත් ඒ සම්බන්ධයෙන් කිසිවක් කළේ නැහැ. රනිල් වික්‍රමසිංහ මහත්මයා අවුරුදු 2යි මාස 3ක් බලයේ හිටියත් ඒ සම්බන්ධයෙන් කිසි ක්‍රියාමාර්ගයක් ගත්තේ නැහැ. දැන් එයාලාගේ ගෝල බාලයෝ ඇවිල්ලා මහ ලොකුවට බෙරිහන් දෙනවා. හැබැයි, අපි ඒ සම්බන්ධයෙන් ජාතික ජන බලවේගය ආණ්ඩුව හැටියට නිසි ක්‍රියාමාර්ග අරගෙන, නිසි දිශානතියට සියලු විමර්ශන මෙහෙයවමින් ඉන්නවා. ඒ සියල්ල අද මට මේ සභාවේ හෙළි කිරීමට හැකියාවක් නැහැ. කෙසේ වුවත්, අපි නිවැරදි දිශානතියට මේ විමර්ශන මෙහෙයවනවා.

ගරු විපක්ෂ නායකතුමා කිව්වා මේකට Scotland Yard එක ගෙන්වන්න කියලා. මේ විමර්ශනවලට ඒ අය සම්බන්ධ වෙලා හිටියා. Scotland Yard එක සම්බන්ධ වෙලා හිටියා; FBI, Australian Federal Police සම්බන්ධ වෙලා හිටියා; INTERPOL සම්බන්ධ වෙලා හිටියා. මේ සියලු දෙනා සම්බන්ධ වෙලා හිටියා. හැබැයි, අද අපි පොරොන්දු වූ පරිදිම මේ විමර්ශන නිවැරදි දිශානතියකට ගෙනැල්ලා තිබෙනවා. ගෝඨාභය රාජපක්ෂ මහත්මයා ජනාධිපති වෙලා පැය 48යි ගියේ. මොකක්ද, කරපු පළමු කාර්යය? CID එකේ ශානි අබේසේකර ඇතුළු 30දෙනෙක් මාරු කර යැව්වා. ඒ විතරක් නොවෙයි, CID එකේ 704දෙනෙකුට නීති විරෝධී ලෙස ගුවන් ගමන් තහනමක් පැනෙව්වා. කිසිදු අධිකරණ ක්‍රියාමාර්ගයක් නැතුව CID එකේ සේවය කරපු 704කට travel ban එකක් දැම්මා. ඒක තමයි ගෝඨාභය ඇවිල්ලා පැය 48ක් ඇතුළත කරපු කාර්යය. එහෙම තමයි මේ විමර්ශනවලට බාධා කරලා තිබෙන්නේ. එහෙම ගෝලයෝ දැන් පොත් එළි දක්වනවා, මහ මොළකරු සොයන්න. විපක්ෂ නායකතුමා එතැන ගිහිල්ලා මහ මොළකරු සොයාගෙන අද අපෙන් අහනවා, මහ මොළකරු, මේ කුමන්ත්‍රණය ගැන හෙළිදරවු කළේ නැද්ද කියලා. මම කියන්නේ- *[බාධා කිරීම්]* එහෙම ආශීර්වාද කළාට කමක් නැහැ. නමුත් අපි මේක නිවැරදි දිශානතියට අරගෙන ගිහිල්ලා මේකේ ඇත්ත විමර්ශනයක් කරන්න කිසිසේත්ම පසුබට වෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඊළඟට, CID එකේ නිලධාරින් 704ට ගුවන් ගමන් තහනම දැමීම සම්බන්ධයෙන් අපි විමර්ශනයක් කළා. විමර්ශනයක් කරලා ඒ සම්බන්ධයෙන් නියෝජ්‍ය පොලිස්පතිවරයෙක් අත්අඩංගුවට ගත්තා. අත්අඩංගුවට ගත්තා විතරක් නොවෙයි, ඔහු සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ග ගන්න කටයුතු කරනවා. එහෙම අනීතික ලෙස රාජකාරි කරන්න හැකියාවක් නැහැ. නීත්‍යනුකූලව රාජකාරි කරන කිසිම නිලධාරියෙකුට බාධා කරන්න අපි ඉඩ දෙන්නේ නැහැ. බාධා කරපු ඒවා සම්බන්ධයෙනුත් අපි විමර්ශන කරනවා; අධිකරණය ඉදිරියට ගේනවා; නීතිය ඉදිරියට ගෙනැල්ලා නීත්‍යනුකූලව දඬුවම් පමුණුවනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගෝඨාභය රාජපක්ෂලා මේ විමර්ශන මෙහෙයවූයේ ඒ ආකාරයෙන්. එහෙම කරපු අය දැන් කෑ මොර දෙනවා. මම කියන්නේ මේක ජනතාව නොමඟ යවන්න කරන දෙයක් කියායි. ඒ සිදුවීම වෙලා අවුරුදු 7 සම්පූර්ණ වන අප්‍රේල් 21වන දා වෙනකොට ඒකෙන් ජනතාවට වෙනත් පණිවුඩයක් දෙන්න හදනවා. එක පැත්තකින් යනවා, ගම්මන්පිලගේ පොත එළි දක්වන තැනට. ඊළඟට මෙහේ ඇවිල්ලා විවාදයක් ඉල්ලනවා, අවුරුදු 7 සම්පූර්ණ වෙනකොට, අපි තමයි ජනතාව වෙනුවෙන් පෙනී සිටින්නේ කියලා. මෙහි ඇත්ත කථාව ඒක නොවෙයි. ජනතාව නොමඟ යවනවා. හැබැයි, ජනතාව මෝඩ නැහැ මේ සමහර දේශපාලකයන් ඉදිරිපත් කරන කාරණා පිටිපස්සේ යන්න. නිවැරදි විමර්ශනයක් වෙනවා. ඒ පිළිබඳව ජනතාවට විශ්වාසයක් තිබෙනවා. කිසිලෙසකින්වත් ආයේ මේ රටේ ජාතිවාදයක් ඇති වෙන්න අපි ඉඩ තියන්නේ නැහැ. කිසිදු ජාතිවාදයකට අපි යට වෙන්නෙත් නැහැ. කිසිදු කුමන්ත්‍රණයකට ඉඩකඩත් නැහැ. ඒ හින්දා මේ කුමන්ත්‍රණ සියල්ල එළියට ගේන්න ඕනෑ සහ ඔවුන්ට විරුද්ධව නිසි ක්‍රියාමාර්ග ගන්නත් අපේ ආණ්ඩුව කිසිවිටෙකත් පසුබට වෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන් ඔබ දන්නවා, 2022 වර්ෂයේ පැවති රජය මහ මොළකරු පිළිබඳ පරීක්ෂණ කරනවා වෙනුවට විමර්ශන පවත්වමින් හිටපු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින් අර විදියට මාරු කරලා යැවූ බව. ඒ කාලයේ හිජාස් හිස්බුල්ලා නැමැති නීතිඥවරයෙක් අත්අඩංගුවට අරගෙන ඔහු මහ මොළකරු කියලා ඔය ගම්මන්පිල මහත්තයලා හිටපු ආණ්ඩුව හඳුන්වා දුන්නා. දැන් අර විදියට ඇවිල්ලා, වෙනත් කථාවක් කියනවා. හැබැයි, මේ පසුගිය 2026.03.31වන දා පොතක් එළි දක්වලා සහරාන් මහ මොළකරු බව ප්‍රකාශයට පත් කරනවා. උදය ගම්මන්පිල මහතාගේ පොතේ මහ මොළකරු වශයෙන් හඳුන්වා ඇත්තේ සහරාන්. නමුත් හිජාස් හිස්බුල්ලා අත්අඩංගුවට ගත් සමයේ එවකට පැවති රජයේ උදය ගම්මන්පිල කැබිනට් ඇමතිවරයෙක් හැටියට හිටියා. මම හිතන්නේ නැවත අලුතෙන් ඉදිරිපත් කළේ දුර්වල පිටපතක් සහිත නාට්‍යයක් බව තමයි මට මේ වෙලාවේ කියන්න තිබෙන්නේ. මම නම් හිතන්නේ සජිත් ප්‍රේමදාස මහත්තයා විශේෂයෙන්ම මේ විවාදය යොදා ගෙන තිබෙන්නේ, ඔය පොත එළි දැක්වීමේ උත්සවයට එතුමා ගියා; ඒ ගියාට පස්සේ ඇති වෙන දේශපාලන අවුල මඟ හරවා ගන්න දරන උත්සාහයක් හැටියටයි. ඒක තමයි එතුමාගේ කරුණු දැක්වීමේදී මට ඒත්තු ගියේ.

ඒ ප්‍රහාරය පිළිබඳ විමර්ශන අපි දැන් නිවැරැදි දිශානතියට යොමු කර තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිවැරැදි විමර්ශන පිළිබඳව සියලු කාරණා අපි අධිකරණයට වාර්තා කරලා තිබෙනවා. එසේම නැඟෙනහිර විශ්වවිද්‍යාලයේ උපකුලපතිව හිටපු මහාචාර්ය ශිවසුබ්‍රමනියම් රවීන්ද්‍රනාත් පැහැරගෙන ගොස් ඝාතනය කිරීමට අදාළව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෑතකදී අත් අඩංගුවට ගත්තා, හිටපු අමාත්‍ය සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහත්මයා නොහොත් පිල්ලෙයාන්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister, your time is up.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
මට තවත් විනාඩියක කාලයක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඔහු මේ වනකොට රක්ෂිත බන්ධනාගාරගත කරලා තිබෙනවා. ඔහු පාස්කු ඉරිදා ප්‍රහාරය පිළිබඳව පූර්ව දැනුවත්භාවයකින් හිටපු බවට මේ වනකොට කරුණු අනාවරණය වෙලා තිබෙනවා. ඒ විමර්ශනත් නිවැරැදිව සිද්ධ වෙනවා. පාස්කු ඉරිදා ප්‍රහාරයේ ස්වයං ඝාතක කණ්ඩායමේ නායක ලෙස කටයුතු කළ සහරාන් හෂීම්ට ඉහළින් සිට ඔහුව මෙහෙයවූ පුද්ගලයෙකු හෝ කණ්ඩායමක් සිටින බවට තොරතුරු අනාවරණය වෙලා තිබෙනවා. මේ වනකොට සාක්ෂිවලින් ඒ තොරතුරු අනාවරණය වෙලා තිබෙනවා. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඒ පිළිබඳව විමර්ශනය කරනවා. ඒ සම්බන්ධයෙන් හෙළි වී ඇති සංවේදී කරුණු මේ අවස්ථාවේදී මේ ගරු සභාවට හෙළිදරවු කිරීමට හැකියාවක් නැහැ, අධිකරණ කටයුතුවලට බාධාවක් වන බැවින්. නමුත්, විමර්ශනයේ ප්‍රගතිය කාලානුරූපව අධිකරණයට වාර්තා කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම මේ රටේ ජනතාවටත්, මේ පාර්ලිමේන්තුවටත් අපි සහතිකයක් දෙනවා නිවැරැදිව මේ විමර්ශනය කරනවා කියලා. පුද්ගල තරාතිරම අපට අදාළ නැහැ. අපි විද්‍යාත්මකව විමර්ශන සිද්ධ කරනවා, තාක්ෂණික තොරතුරු ආශ්‍රයෙන් විමර්ශන සිද්ධ කරනවා, සාක්ෂි ආශ්‍රයෙන් විමර්ශන සිද්ධ කරනවා. මේ රටේ විශාල ජන පීඩාවක් ඇති කළ, ජන ඝාතනයක් කළ ඒ ප්‍රහාරය සම්බන්ධයෙන් පූර්ණ, නිවැරැදි විමර්ශනයක් කරනවා.

පාස්කු ඉරු දින ප්‍රහාරයෙන් විශේෂයෙන් සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව 270 ගණනක් මිය ගියා; විදේශීය ජාතිකයෝ 46දෙනෙක් මිය ගියා; 500 ගණනක් තුවාල ලැබුවා. ඒ ප්‍රහාරය හේතුවෙන් ආර්ථිකයට විශාල හානියක් සිද්ධ වුණා, ජාතීන් අතර අසමඟිය විශාල වශයෙන් ව්‍යාප්ත වුණා. මේ සියල්ල සිදු කරපු ඒ දැවැන්ත ප්‍රහාරය, අපේ රටට කැළැලක් ගෙනා ඒ ප්‍රහාරය පිළිබඳව නිවැරැදි තොරතුරු මේ සමාජයටත්, මේ පාර්ලිමේන්තුවටත් අනාගතයේදී හෙළි කරන්න පොරොන්දු වෙනවා. ඒ වාගේම, එහි මහ මොළකරුවන් වාගේම එයට වග කිව යුතු සියලුදෙනා නීතියේ රැහැනට හසු කර ගන්නා බවට සහතික වෙමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam. You have eight minutes.

[අ.භා. 3.34]

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොලීසිය භාර අමාත්‍යවරයාගේ කථාවෙන් පස්සේ මට කථා කරන්න ලැබීම ගැන ඇත්ත වශයෙන්ම මම සතුටු වෙනවා.

විශේෂයෙන්ම පාස්කු ඉරිදා ප්‍රහාරය පිළිබඳව පරීක්ෂණ කරගෙන යන මේ ආණ්ඩුවට මම ඇත්තටම සුබ පතනවා. මොකද, විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරුත් පිළිගන්න ඕනෑ අපි මේ පාර්ලිමේන්තුවේදී ඒ පිළිබඳව කොච්චර බෙරිහන් දීලා කෑ ගැහුවත් 2020 ආණ්ඩුව කාලයේ ඒ පිළිබඳව සාධාරණ පරීක්ෂණයක් සිදු වුණේ නැහැ වාගේම සිදු වන බව පෙනුණේත් නැහැ කියන එක. ඒක නිසා පක්ෂ, පාට භේදයකින් තොරව මේ අවස්ථාවේදී ඒ පරීක්ෂණ කරන එක පිළිබඳව මම ඇත්ත වශයෙන්ම ආණ්ඩුවට ස්තුතිවන්ත වෙනවා. මොකද, මේ රට තුළ සුරේෂ් සලේ වාගේ පුද්ගලයෙක් අත්අඩංගුවට ගනීද, ඒක වෙන්නේ නැති කාරණයක් නේද කියන විශ්වාසයක් තිබුණේ. එසේ තිබියදීත් ඔහුව අත්අඩංගුවට අරගෙන පරීක්ෂණ කරගෙන යාම පිළිබඳව සත්‍ය වශයෙන්ම මගේ ප්‍රසාදය පළ කරනවා. ඒ සඳහා අපට දෙන්න පුළුවන් උපරිම සහයෝගය පසුගිය කාලයේත් අපි දීලා තිබෙනවා, මින් ඉදිරියටත් සහයෝගය ලබා දෙන බව කියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ දවස්වල මාතෘකාව තමයි පාස්කු ඉරිදා ප්‍රහාරය පිළිබඳව ලියපු පොත. ගරු ඇමතිතුමාත් සභාවේ ඉන්න නිසා කාරණා කීපයක් මම එතුමාගේ අවධානයට යොමු කරන්නම්. 2021-2022 කාලයේදී මේ වාගේම පොතක් පිල්ලෙයාන් ලිව්වා. පිල්ලෙයාන් ලියපු ඒ පොත 'வேட்கை' කියන නමින් දෙමළ භාෂාවෙන් ලිව්වේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ ඉන්න ඕනෑම පුද්ගලයෙක් දන්නවා, පිල්ලෙයාන් කියන්නේ පොතක් ලියන්න පුළුවන් තත්ත්වයේ මනුස්සයෙක්ද නැද්ද කියලා. මම ඒක වගකීමෙන් කියන්නේ, ඒ පොත ලිව්වේ රොහාන් ගුණරත්න කියන පුද්ගලයා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රොහාන් ගුණරත්න කියන පුද්ගලයා පිළිබඳව ඔබතුමන්ලා ඕනෑම කෙනෙකුට Google එකෙන් බලන්න පුළුවන්. එතුමා, "Professor of Security Studies at a technological university" ලු. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම නම් දන්නේ නැහැ, Security Studies, technological university එකක උගන්වන්නේ කොහොමද කියලා. ගරු ඇමතිතුමනි, ඒ පිළිබඳව ඔබතුමා යටතේ විශේෂ කමිටුවක් පත් කරලා, ඔබතුමා විශේෂ පරීක්ෂණයක් කරන්න. පිල්ලෙයාන්ට ඒ පොත ලියන්න රොහාන් ගුණරත්නට ඒ තොරතුරු ලබා දුන්නු පුද්ගලයා මම ඔබතුමා වෙත යොමු කරන්නම්. එතුමාගෙන් තොරතුරු ටික අරගෙන ඔහු පොත ලියනවා; පිල්ලෙයාන් ඒක එළි දක්වනවා.

දැන් මේ සම්බන්ධයෙන් අලුත් පොතක් ගම්මන්පිල හිටපු මන්ත්‍රීතුමා ලියලා තිබෙනවා කියනවා. මම ඒ පොත කියෙව්වේත් නැහැ, කියවන්න බලාපොරොත්තු වෙන්නේත් නැහැ. අපට පැහැදිලි සැකයක් තිබෙනවා, ඒ පොත පිළිබඳවත්, මෙන්න මෙවන් පුද්ගලයන් තමයි තොරතුරු දෙන්න ඇත්තේ කියලා. ගරු අමාත්‍යතුමනි, මෙතැන තිබෙන වැදගත්ම කාරණය මෙයයි. මා හිතන විදියට, දැන් Department of Immigration and Emigration තිබෙන තැනට එහා පැත්තේ තමයි පොලීසියේ Head Office එක තිබුණේ. පිල්ලෙයාන් ලියපු පොතේ කරුණු කාරණා ටික රොහාන් ගුණරත්න කියන කෙනාට ලබා දෙන්න ඒ බිල්ඩින් එකේ 7වැනි තට්ටුවට ඒ පුද්ගලයාව එක්කගෙන ගියේ, Tripoli Platoon එකත් එක්ක සම්බන්ධ, Islamic Centre එකත් එක්ක සම්බන්ධ, ඔට්ටමාවඩි ප්‍රදේශයේ හිටපු කලීල් නැමති පුද්ගලයා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට පෙරත් අපි කියලා තිබෙනවා, කලීල්, පොලිස් ෆායිස්, ඒ වාගේම සමඩ් කියන පුද්ගලයා සහ 2009න් පස්සේ එරාවූර් ප්‍රදේශය භාරව හිටපු ඉස්මායිල් ඉෂාක් කියන පුද්ගලයා ගැන. ඒ කලීල් කියන පුද්ගලයා 2015-2018 කාලය තුළ පිල්ලෙයාන් සමඟ එකට සිරගත වෙලා හිටියේ. ඒ කාරණය මම මෙතැනදී කියන්න ඕනෑ.

ගරු අමාත්‍යතුමනි, ජනාධිපතිවරයාගේ මට්ටමින් පාස්කු ඉරු දින ප්‍රහාරය පිළිබඳව පරීක්ෂණ හරියට කරන්න ඕනෑ කියලා උනන්දු වන බව කිව්වත්, පොලිසියේ ඉන්න සියලුදෙනාටම මම සහතික දෙන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මොකද, අපට පැහැදිලි සැකයක් තිබෙනවා. පොලිසිය ඇතුළේ ඉන්න යම් කණ්ඩායම් මෙම පරීක්ෂණ නොමඟ යවන්න, එහෙම නැත්නම් මෙම පරීක්ෂණ වැරැදි මාවතේ යවන්න අදටත් උත්සාහයක් දරන බව කියන්න ඕනෑ. මොකද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගියවර පාර්ලිමේන්තුවේදී එක්තරා පුද්ගලයෙකු පිළිබඳව, එනම් ඉස්මායිල් ඉෂාක් කියන පුද්ගලයා පිළිබඳව පාර්ලිමේන්තුවේදී මා සභාගත කරපු documentsවල සඳහන්ව තිබෙනවා. මේ වන විට එම පුද්ගලයා, 2025 සැප්තැම්බර් මාසයේ 04වැනි දා ලංකාවෙන් ගිහිල්ලා තිබෙනවා. ඔහු සෞදි අරාබියාවේ දමාම් කියන ප්‍රදේශයට ගිහිල්ලා තිබෙන්නේ; ඔහු පැනලා ගිහිල්ලා ඉවරයි. මම මේවා වගකීමෙන් කියන්නේ. අපි සාක්ෂි, එහෙම නැත්නම් කරුණු ඉදිරිපත් කරනවා. පොලිසියේ සියලුදෙනා ගැන නොවෙයි, සමහර නිලධාරින් ගැනයි මා කියන්නේ. ඒ පුද්ගලයා මේ වන විට රටින් පැනලා ගිහිල්ලා තිබෙන්නේ. මම මේ සභාවේදී සභාගත කළා, ඔහුට විරුද්ධව තිබෙන චෝදනා පිළිබඳව, ඔහු කළා කියන මරණ පිළිබඳව විස්තර. ෂරිආ නීතිය වෙනුවෙන්- සමහර අය පොලියට මුදල් දුන්නා වාගේ බොරු දේවල් දාලා, බුද්ධි අංශයත් එක්ක සම්බන්ධ වෙලා, අනවශ්‍ය පුද්ගලයින් ඝාතනයට සම්බන්ධ වෙලා, මේ වන විට ඔහු රටින් පැනලා ගිහිල්ලා තිබෙනවා, ගරු ඇමතිතුමනි.

තවත් කාරණාවක් ගැන මම කියන්න ඕනෑ. ඒක නිසා තමයි ගරු ඇමතිතුමනි, මම ඔබතුමා කථා කරන කොට මොකක්ද ඒ නම කියලා ඇහුවේ. මා ළඟ ලියුමක් තිබෙනවා. ඒක ආදම් ලෙබ්බෙ මොහොමඩ් රමීස් කියන පුද්ගලයාගේ ලිපියක්. 2026.03.12 දින තමයි මේ පිළිබඳ පැමිණිල්ල යවලා තිබෙන්නේ. ජනාධිපතිතුමාටයි යවලා තිබෙන්නේ. මෙහි පිටපත් විශාල ගණනක් යවලා තිබෙනවා. මෙතුමා කියන කාරණා ඉතා වැදගත්. ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, 2017-2018 කාලයේදී සාක්ෂි නොමඟ යැව්වා කියලා. ඒක ඇත්ත. මොකද, මේ රමීස් කියන පුද්ගලයා ලියුමක් ලියනවා, රමීස් කියන පුද්ගලයාගේ සහෝදරයා වන ආදම් ලෙබ්බෙ මොහොමඩ් රියාස් ගැන. මේ ඡායාරූපයේ ඉන්නේ ආදම් ලෙබ්බෙ මොහොමඩ් රියාස්, ගරු අමාත්‍යතුමනි. ආදම් ලෙබ්බෙ මොහොමඩ් රියාස් කෝවිල් කුලම් ප්‍රදේශයේදී 2018.04.21 දින වතුරේ ගිල්වලායි මරන්නේ. මේ හමුදා බුද්ධි අංශයේ නිලධාරියෙක්; මේ අයව මරන්නේ- මේ පිළිබඳව පරීක්ෂා කරන්න. ඒ පුද්ගලයාගේ සහෝදරයා මේ පිළිබඳව පරීක්ෂණයක් ඉල්ලා මේ වන විට ලියුමක් ලියනවා. මේ පිළිබඳව පරීක්ෂණයක් ඇයි ඉල්ලන්නේ? එතුමාගේ පැමිණිල්ලේ තිබෙන්නේ මොකක්ද? මෙතුමා සහරාන් හෂීම්ගේ කණ්ඩායමේ, නැඟෙනහිර පළාතේ. එවකට ඒ පළාත භාරව හිටියේ බුද්ධි අංශයේ CO රමේෂ්. ඒ CO රමේෂ් පසු කාලීනව යහ පාලන ආණ්ඩුව සමයේ අත්අඩංගුවට පත් වෙනවා. ඔහු ගෝඨාභය ආණ්ඩුව කාලයේදී ආපහු නිදහස් වෙනවා, Defence Ministry එකට යනවා. ඔහු මහනුවර බොදු බල සේනා කාර්යාලයේත් ඉඳලා තිබෙනවා. මේ ඔක්කොටම සම්බන්ධ පුද්ගලයෙක් මේ රමේෂ් කියන පුද්ගලයා. මම මේ නිලධාරින්ගේ නම් වැඩිය කියන්නේ නැහැ. පොලිසියේ සහ හමුදාවේ බුද්ධි අංශ නිලධාරිනුත් මේක මතක තබා ගන්න. මින් ඉදිරියට, පාස්කු ඉරුදින ප්‍රහාරය සම්බන්ධයෙන් වන පරීක්ෂණවලට බාධා කරලා, අපි ඔබතුමන්ලාගේ නම් මේ පාර්ලිමේන්තුවේදී ඡායාරූප සමඟ කියන තත්ත්වයට ගේන්න එපා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Shanakiyan Rasamanickam, you have two more minutes.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, give me a couple of extra minutes. It is an important matter.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, I do not have any minutes allotted for me. Try to limit your speech to your time allocation.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Okay, Sir.

බලන්න, මේ පින්තූරයේ ඉන්නේ එම්.එස්.එස්. මුබාරක්. මේ පුද්ගලයා 2018.03.10 දින ඝාතනය කරනවා. මොහු කවුද? මොහු තමයි කාත්තන්කුඩිවල සපත්තු ව්‍යාපාරයක් කළේ. Chemical සම්බන්ධ ව්‍යාපාරයක් තිබුණා. මොහු import කළා. මොහුත් ඝාතනය කරනවා. මේවා කවුද කරන්නේ කියලා බලන්න. මේ පින්තූරයේ ඉන්නේ "පලනි වාප්පා" කියන පුද්ගලයා. මේ පුද්ගලයා 08.06.2018 දින ඝාතනය කරනවා. ඇයි? රවුෆ් මවුලවිගේ පල්ලියට සහරාන් හෂීම් ප්‍රහාරයක් එල්ල කරනවා; ගැටුමක් ඇති වෙනවා. සහරාන් හෂීම් තමයි ඒකට සම්බන්ධ කියලා මොහු සාක්ෂි දෙනවා; මොහු ඝාතනය කරනවා. ඒ වෙඩි තබපු තැන ඒ bullet එකේ casing එකවත් හොයා ගන්න බැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පිළිබඳව සමහර සාක්ෂිකරුවන් ගිහිල්ලා Senior DIG මහත්තයා හම්බ වුණාම, - පොලිසි ඇතුළේ සිදුවෙන දේ ගැන මම මේ කියන්නේ - පහළ නිලධාරින් ඒකට තරහයි. මේක නොමඟ යවනවා. ගරු ඇමතිතුමනි, මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න. ඔබතුමන්ලා කොච්චර හොඳට පරීක්ෂා කළත්, අවසානයේ නඩුවට යනකොට සාක්ෂි දෙන්නේ, ඒ නඩුව කරන්නේ, ඒ නඩුවට කරුණු වාර්තා කරන්නේ පොලිසියෙන්. මේ ගැන හරියට කරුණු වාර්තා කළේ නැත්නම්, කරුණු විනාශ කළොත්, කරුණු අයින් කළොත්, ඒ කටයුතු හරියට නොකළොත් නඩුවකට ගියාම එතැනින් එහාට ඒ නඩුව ගෙනියන්න බැරි තත්ත්වයකට පත් වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තව ගොඩක් කාරණා කියන්න තිබුණත් අවසාන වශයෙන් මම තව එක කාරණාවක් කියන්නම්. සාරා ජස්මින්ගේ අම්මා ප්‍රකාශ කරලා තිබෙනවා, තුන්වන වරට ඇයගෙන් DNA පරීක්ෂණයක් කළේ නැහැ කියලා. DNA පරීක්ෂණ තුනක් කළා නම්, කාගෙන් අරගෙනද ඒ පරීක්ෂණය කළේ? සති දෙකකට කලින් සාරා ජස්මින්ගේ ගෙදරට පොලිසියෙන් ගිහින් කියනවා, "ඔයාගේ දුව මැරෙනකොට මාස දෙකක ගැබිනියක්" කියලා. ඇය වළ දැම්මේ හමුදාවෙන් කියලා පොලිස් නිලධාරින් කියන්නේ. ඇමතිතුමා මේ සභාව තුළදී අපට කිව්වා, සාරා ජස්මින් ජීවතුන් අතර ඉන්නවා කියලා. මම දන්නවා, ඇමතිතුමාට ඒ සියලු කාරණා කියන්න බැහැ. හැබැයි, සාරා ජස්මින්ගේ මවට පොලිසියෙන් කියනවා දැන්, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Shanakiyan, your time is up.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
I am winding up, Sir.

මේ හේතු නිසා යම් යම් නිලධාරින් මේ කටයුතු නොමහ යවන්න උත්සාහ කරනවා කියලා දැන් පැහැදිලි සැකයක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොලිසිය භාර ඇමතිතුමා සභාවේ ඉන්න නිසා අවසාන වශයෙන් තව එක කාරණයක් ගැන සඳහන් කරලා මම කථාව අවසන් කරනවා. සුලෝචනා රාමයියා නමැති මාධ්‍යවේදිනිය පසුගිය දවස්වල ඉරානයේ නෞකාවක් ලංකාවට ආපු වෙලාවේ සටහනක් ගන්න එතැනට ගිහින් තිබෙනවා. ඒ අවස්ථාවේදී ඒ මාධ්‍යවේදිනියට පොලීසියේ නිලධාරින් ඉතාම පහත් ලෙස, නින්දිත ලෙස කථා කළා කියලා එතුමිය පැමිණිල්ලක් කරලා තිබෙනවා. මේ පිළිබඳව සොයා බලන්න ඕනෑ. මාධ්‍ය identity card එක දුන්නාට පසුවත් එහෙම කරලා තිබෙනවා. ඒ වෙලාවේ ඇයට කියපු සමහර වචන මේ අවස්ථාවේදී මම කියන්න කැමැති නැහැ. තුට්ටු දෙකේ journalistsලා, රට කෑවේ මේ මාධ්‍යවේදියෝ කියලා තිබෙනවා. මේ, මාධ්‍යවේදීන්ට කථා කරන විධියද? ඊටත් මාධ්‍යවේදිනියකට? ඇය ජාත්‍යන්තර මාධ්‍යවේදියෙක් එක්ක ගිහින් තිබෙන්නේ. මේ විධියට මාධ්‍යවේදිනියකට පොලීසිය හරහා වෙලා තිබෙන මේ අසාධාරණය සම්බන්ධව පරීක්ෂණයක් පවත්වන්න කියාත් ඉල්ලීමක් කරනවා.

ඔබතුමා කිව්වා, "Channel 4" එකේ documentary එක හරහායි පරීක්ෂා කළේ කියලා. "Channel 4" ඊට කලිනුත් documentaries දෙකතුනක් කළා. ඒ පිළිබඳවත් විධිමත් පරීක්ෂණයක් ආරම්භ කරන්න කියලා මේ ආණ්ඩුවෙන් ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Anura Karunathilaka. You have 12 minutes.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Minister?

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමනි, ඔබතුමා අවසාන වශයෙන් සඳහන් කළ මාධ්‍යවේදිනිය සම්බන්ධ කාරණයට අදාළ තොරතුරු අපට එවන්න. අපි ඒ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් කරන්නම්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Anura Karunathilaka, you have 12 minutes and your time starts now.

[අ.භා. 3.44]

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෑත ඉතිහාසයේ සිදු වුණු අතිශය ම්ලේච්ඡ සිදුවීමක් සම්බන්ධයෙන් තමයි අපි අද පාර්ලිමේන්තුව තුළ සාකච්ඡා කරන්නේ. මේ පිළිබඳව අපි විවිධ අවස්ථාවල මේ පාර්ලිමේන්තුව තුළ සාකච්ඡා කළා. විශේෂයෙන්ම මේ වාගේ සිදුවීමක් පිළිබඳව හොයනකොට සහ සාකච්ඡා කරනකොට වැදගත් වන්නේ, ඒ වාගේ අමානුෂික, ම්ලේච්ඡ සිදුවීම් නැවත නැවත ඇති නොවීම සඳහා ගත යුතු පියවර සහ ගත හැකි පියවර පිළිබඳව වන සාකච්ඡාවක් පැවැත්වීම සහ එවන් සිදුවීමක් නැවත සිදු නොවෙන්න අපි සමාජයක් හැටියට, රටක් හැටියට කටයුතු කර තිබෙනවාද කියන කාරණයයි.

අපි දන්නවා, මේ සිදුවීම සිදුවුණු පසුබිම තුළ ජාතික ආරක්ෂාව පිළිබඳව භීතිය ඇති කරමින් ඒ හරහා බලයට පැමිණීමේ වුවමනාවෙන් කටයුතු කළ කණ්ඩායමක් සිටි බව. ඒ අය මේ සිදුවීම සැලසුම්සහගතව කළාද කියන සැකය සමාජය තුළ තිබෙනවා. ඒ වාගේම ඒ පිළිබඳව සාකච්ඡා වෙනවා. ඇත්තටම අන්න ඒ වාගේ ජාතික ආරක්ෂාව පිළිබඳ භීතියක් ඇති කරන්න පුළුවන් විධියේ සමාජ වටපිටාවක් ඇති වෙන්න නම්, ඒ සඳහා පසුබිමක් තිබෙන්න ඕනෑ. අපි දන්නවා, මුලින් සමහර කණ්ඩායම් උත්සාහ කළේ LTTE එක නැවත වරක් කටයුතු ආරම්භ කරලා තිබෙනවා කියන එකට මුවාවෙලා එය ජාතික ආරක්ෂාවට අභියෝගයක් කියන එක මුල් කරගෙන බලයට පැමිණීම සඳහා දේශපාලන කටයුතු කරන්නයි. නමුත් ඒක එච්චර සාර්ථක වුණේ නැහැ. ඒ වෙනුවට ඊට පස්සේ ඒගොල්ලෝ උත්සාහ කළා, විශේෂයෙන් ලෝකය තුළත්, දේශීය වශයෙනුත් ඉතා කුඩා කණ්ඩායම් හැටියට වැඩ කටයුතු කරපු Al-Qaeda, ISIS වාගේ ජාත්‍යන්තර වශයෙන් ක්‍රියාත්මක වන සමහර ආගමික අන්තවාදී කණ්ඩායම්වලට තිබිච්ච පසුබිම භාවිත කරලා බලය ලබා ගැනීම සඳහා සැලසුම්සහගතව කටයුතු කරන්න. අපි දන්නවා, 2008දී මුම්බායි නගරයේ ඇති වෙච්ච ප්‍රහාරය, 2015දී පැරිස් නගරය තුළ ඇති වෙච්ච ප්‍රහාර වාගේ ජාත්‍යන්තර සිදුවීම් හරහා ඇති වෙච්ච සමාජ කතිකාව, ඒ වාගේම සමහර රටවල ඇති වෙලා තිබෙන කථාබහ මේ සඳහා වන වටපිටාව නිර්මාණය කළ බව. අන්න ඒ වටපිටාව පාවිච්චි කරලා බලය ලබා ගැනීම සඳහා මෙන්න මේ ආගමික අන්තවාදයට ප්‍රතිපක්ෂ ලෙස, විකල්ප ප්‍රතිපක්ෂ ලෙස ජාතිවාදී, ආගම්වාදී දේශපාලනය තුළ කටයුතු කරන්න අවස්ථාව හදාගත්තා. එහෙම නම්, අපි මේ ගැන කල්පනා කරලා බලන්න ඕනෑ. අන්ත ආගම්වාදී, අන්ත ජාතිවාදී දේශපාලන ව්‍යාපාරයක් හරහා බලය ලැබෙන්නේ නැතිවෙන්න නම්, බලය ලබා ගැනීමේ මාවත හෙළි පෙහෙළි කරගන්න බැරි වෙන්න නම්, ඒ සඳහා තිබෙන වටපිටාව, සමාජ පසුබිම නැති වෙන්න ඕනෑ. ඒ සඳහා වැදගත් වන කාරණයක් තමයි ජාතික එකමුතුව. ජාතීන් අතර තිබෙන අන්‍යෝන්‍ය විශ්වාසය, සමගිය, අවබෝධය වැඩි වෙනවා නම්, ඒක වර්ධනය වෙනවා නම් කිසිම කණ්ඩායමක් කොයිතරම් උත්සාහ කළත් ඒ වාගේ අන්ත ජාතිවාදී දේශපාලනයක්, අන්ත ආගම්වාදී දේශපාලනයක් හරහා බලය ලබා ගන්න පුළුවන් වර්ධනයක් ඔවුන්ට අත්පත් කරගන්න බැහැ.

අපි දන්නවා, ලංකාව විවිධ ආගමික විශ්වාස සහිත මිනිස්සු ජීවත් වෙන රටක් බව. ඒ නිසා තමන්ගේ ආගම පිළිබඳව වාගේම අනෙකාගේ ආගම පිළිබඳවත් හැඟීමක්, ඒ වාගේම කිසියම් විධියක ගෞරවයක් තිබෙනවා නම්, අන්න ඒ ආගමික සංහිඳියාව තිබෙනවා නම් කිසිම කණ්ඩායමකට අවස්ථාව ලැබෙන්නේ නැහැ, ආගමික අන්තවාදය තුළින් වෛරය පතුරුවන්න. ඒ වාගේම, මිනිස්සුන්ගේ මානසික වටිනාකම් පිළිබඳ සමාජය තුළ

හැඟීමක් තිබෙනවා නම්, අපේ මේ ශ්‍රී ලංකාව කියලා කියන්නේ ශ්‍රී ලාංකිකයන් හැටියට ජීවත් වෙන්න පුළුවන් රටක් කියන හැඟීම සියලුදෙනා තුළම ඇති වෙනවා නම් ඒ වටපිටාව තුළ අර වාගේ අන්තවාදී කණ්ඩායම්වලට අවස්ථාව හැදෙන්නේ නැහැ. මම හිතනවා, ජාතික ජන බලවේගය හැටියට අපි ඔන්න ඔය කරුණු මුල් කරගෙන ජාතික එකමුතුව හදන්න, ආගමික සංහිඳියාව හදන්න, වෛරයට සහ අන්තවාදයට විරුද්ධව කටයුතු කරන්න මේ වෙනකොට වැඩ කරලා තිබෙනවා කියලා. ඒ වාගේම, කිසිම ජන කණ්ඩායමකට, ආගමික විශ්වාසයක් තිබෙන කිසිම කණ්ඩායමකට එරෙහිව රාජ්‍ය මැදිහත් වෙලා කටයුතු කරනවාය කියන හැඟීම ඇති නොවන විධියට කටයුතු කරන්න ජාතික ජන බලවේගය ආණ්ඩුව හැටියට අපි කටයුතු කරලා තිබෙනවා.

මට මතකයි, මේ සිදුවීම වුණාට පස්සේ විශේෂයෙන් ජාතීන් අතර ගැටුම්, ආගමික කණ්ඩායම් අතර ගැටුම් දක්වා මේ සිදුවීම වර්ධනය නොවෙන්න ජාතික ජන බලවේගයේ අපි ඒ කාලයේ බලයේ හිටියේ නැති වුණත්, "අපි මිනිස්සු" කියලා ජාතික සමඟි කතිකාවක් ආරම්භ කළ ආකාරය. රට පුරාම මෙන්න මේ ආගමික සංහිඳියාව ඇති කරන්න, ජාතික සමඟිය ඇති කරන්න අපි කටයුතු කළා, බලය නැති කාලයේත්. විශේෂයෙන්ම මම කලිනුත් සඳහන් කළා වාගේ අපි බලය ලබාගත්ත මොහොතේ ඉඳලා සෑම ජන කණ්ඩායමකටම ඔවුන් ජීවත් වෙන රටේ ගෞරවනීය ලෙස ජීවත් වෙන්න අවස්ථාව තිබෙනවාය කියන එක, ඒ වාගේම රාජ්‍යයේ පිරිසක් හැටියට ජීවත් වෙන්න ඒ සියලු ජන කණ්ඩායම්වලට අවස්ථාව තිබෙනවාය කියන ඒ පණිවුඩය මුළු රට පුරාම ගෙනයන්න කටයුතු කර තිබෙනවා. ඒ අර්ථයෙන් ගත්තාම ජාතික හා ආගමික සමානාත්මතාව සුරකින්න, විශේෂයෙන් රාජ්‍ය පාලනයේදී කිසිම ජාතිකත්වයකට හෝ ආගමික කණ්ඩායමකට වෙනස් විධියට නොසලකන්න, නීතිය සියල්ලට සමානව ක්‍රියාත්මක කිරීමට අපි කටයුතු කරලා තිබෙනවා. නැවත ජාතිවාදී ලෙස, ආගම්වාදී ලෙස කටයුතු කිරීමට මිනිස්සු නොපෙළඹෙන විධියට ඒ හරහා අවශ්‍ය කටයුතු සිදු කර තිබෙනවා. එම නිසා ආගම්වාදය සහ ජාතිවාදය පදනම් කරගෙන නැවත බලයට ඒම සඳහා පාර කපා ගන්න කුමන කණ්ඩායම් උත්සාහ කළත්, අද වනකොට අපේ ලංකාවේ ජනතාව ඒ වාගේ පැත්තකට යොමු නොවන්න තරම් අවබෝධයෙන් කටයුතු කරනවා කියලා මා විශ්වාස කරනවා.

ඊළඟට වැදගත් වන කාරණය තමයි, ඒ වාගේ සිදුවීම් නැවත වරක් නොවන්න පසුබිම හදනවා වාගේම, එම සිදුවීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් කරලා එයට වගකිව යුතු අයට දඬුවම් ලබා දීම. ඒ සඳහා ස්වාධීන, විධිමත් පරීක්ෂණයක් සිදු වනවා. ඒ වාගේම සමාජයට දැනෙන්න ඕනෑ, දැන් මේ සිදු කෙරෙන පරීක්ෂණ විධිමත්ව සහ ස්වාධීනව සිදු වනවා කියන එක. මට කලින් කථා කළ මන්ත්‍රීතුමාත් එය සඳහන් කළා. විපක්ෂයේ මන්ත්‍රීවරයකු වුවත්, පරීක්ෂණ කටයුතු දැන් නිවැරදි විධියට විධිමත්ව, ඉක්මනින් සිදු වනවා කියන එක ගැන එතුමාටත් විශ්වාසයක් තිබෙනවා. එහිදී වැදගත් වන කාරණය තමයි ජාතික ජන බලවේගයේ ආණ්ඩුව යටතේ නැවත පරීක්ෂණ ආරම්භ වෙලා තිබෙනවා; කලින් පැවැති පරීක්ෂණය පිළිබඳව ජනතාව අතර, විශේෂයෙන් කිතුණු ප්‍රජාව අතර තිබුණු අවිශ්වාසය නැති කරලා දැන් විධිමත් පරීක්ෂණයක් සිද්ධ වනවාය කියන විශ්වාසය; ඒ මහජන විශ්වාසය ඇති කරන්න ආණ්ඩුව හැටියට කටයුතු කරලා තිබෙනවා කියන එක. ඒ වාගේම එම නිලධාරීන්ට බලපෑමකින් තොරව ස්වාධීනව කටයුතු කර ගැනීම සඳහාත්, එම පරීක්ෂණවල ප්‍රතිඵල ඉතා කාර්යක්ෂමව ලබා ගැනීම සඳහාත් අවස්ථාව හදලා තිබෙනවා.

අපි දන්නවා, එම ප්‍රහාරය පිළිබඳව සොයා බලන්න විවිධ කමිටු පත් කළ බව. ඒවායේ වාර්තා තිබෙනවා; පාර්ලිමේන්තු විශේෂ කමිටු වාර්තාව, ජනාධිපති කොමිෂන් සභා වාර්තාව වාගේ විවිධ කොමිෂන් සභා වාර්තා තිබෙනවා. එම පැරණි වාර්තා සමාලෝචනය කරමින්, නැවත විමර්ශනය කරමින් ඒවායේ සමහර නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා රජයක් හැටියට අවශ්‍ය පියවර ගෙන තිබෙනවා. එයට වගකිව යුතු පුද්ගලයන් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම ආරම්භ කර තිබෙනවා. අපේ ගරු මහජන ආරක්ෂක ඇමතිතුමා කිව්වා, මෙය නීතිය ඉදිරියේ තිබෙන කාරණයක් නිසා සමහර කාරණා ගරු සභාවේ හෙළි කරන්න බැහැ කියලා. නමුත්, ඒ සිදුවීම්වලට සම්බන්ධ, ඒවා ක්‍රියාත්මක කළ පුද්ගලයන්ට සහ ඒවා සැලසුම් කළ පුද්ගලයන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම ආරම්භ කරලා තිබෙනවා. ඒ වාගේම අපේ රටේ බුද්ධි අංශ ආරක්ෂණ පද්ධතිය ප්‍රතිසංස්කරණය කරලා, ඒක ශක්තිමත් කරන්න කටයුතු කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය කාලයේ ආරුගම්බේ ප්‍රදේශයේ සිද්ධියක් ඇති කරන්න සැලසුමක් තිබුණා. හැබැයි, එය ක්‍රියාත්මක වෙන්න කලින් වැළැක්වීම සඳහා අවශ්‍ය පියවර ගන්න පුළුවන්කම ලැබුණේ අපේ රටේ බුද්ධි අංශවල ශක්තිමත්භාවය සහ බුද්ධි අංශ ආරක්ෂණ පද්ධතිය ඉතා නිවැරදි විධියට හා ශක්තිමත්ව ක්‍රියා කරන නිසායි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister, you have only two more minutes.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
මේ කාරණයත් කියලා මම කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ජනතා විශ්වාසය ඇති වෙන්න පරීක්ෂණවල විනිවිදභාවය වැදගත් වනවා. එම පරීක්ෂණ කාර්යක්ෂමව ක්‍රියාත්මක වනවා වාගේම, විනිවිදභාවයෙන් යුතුව ස්වාධීනව සිදු වනවා කියන ජනතා විශ්වාසය ඇති කරලන්නත් අපි රජය හැටියට කටයුතු කරලා තිබෙනවා. හැබැයි, එම සිදුවීම වනකොට බලයේ හිටපු අය අද මේ කල් තැබීමේ විවාදය ඉදිරිපත් කළ කණ්ඩායම අතරේ ඉන්නවා. මේ මොහොතේ ගරු සභාවේ නැති වුවත්, එදා කැබිනට් මණ්ඩලයේ වගකීම් අරගෙන කටයුතු කළ කිහිපදෙනෙක් මේ ඉදිරි පෙළ ඉන්නවා. එවැනි අය අපෙන් අහනවා, ඉරානයේ නැවට ටෝපිඩෝව වදින එක ගැන දැනගෙන හිටියේ නැද්ද කියලා. ටෝපිඩෝවක් එන, නොඑන එක ගැන ඒ රේඩාර් පද්ධතියටත් අහු වුණේ නැත්නම්, අපි වාගේ රජයකට එය දැන ගන්න ලැබෙන්නේ කොහොමද? හැබැයි, මේ වාගේ සිදුවීමක් ඇති වෙනකොට ආණ්ඩු බලයේ හිටපු අය දැන් අපෙන් මේ ගැන අහනවා. නමුත්, ඒ වෙලාවේදී වගකීම් සහගතව කටයුතු කළා නම්, බුද්ධි අංශ වාර්තා පදනම් කර ගනිමින් කැබිනට් මණ්ඩලය වගකීම් සහගතව කටයුතු කළා නම් මෙවැනි ම්ලේච්ඡ අමානුෂික සිදුවීම් අපිට වළක්වා ගත හැකිව තිබුණා. මම හිතන විධියට, සමාජයක් හැටියට සිදු විය යුත්තේ ඉතිහාසය තුළ අපි පාඩම් ඉගෙන ගනිමින් මේ වාගේ අමානුෂික සිදුවීම් නැවත නැවත ඇතිවීම වැළැක්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීමයි. ජාතික ජන බලවේග ආණ්ඩුව හැටියට අපි ඒ පියවර ගනිමින් සිටිනවා, අරගෙන තිබෙනවා කියන කාරණය සඳහන් කරමින්, මා නිහඬ වනවා.

මට කථා කිරීමට කාලය ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Chanaka Madugoda. You have four minutes.

[අ.භා. 3.56]

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මට ලැබිලා තිබුණු විනාඩි හයක කාලය විනාඩි හතරක් වෙලා තිබෙනවා.

අද දවසේ ආදරණීය කතෝලික ජනතාවගේ වැඩිම ප්‍රසාදය දිනා ගෙන පාර්ලිමේන්තු වරම් ලබා ගත් ආණ්ඩුවක් අද මේ පාස්කු ප්‍රහාරය ගැන කථා කරන ආකාරය පිළිබඳව අපිට කිසිසේත්ම සතුටු වෙන්නට බැහැ. පසුගිය ආණ්ඩු මේ පරීක්ෂණ කරපු ආකාරය පිළිබඳව ඇමතිවරයා කිව්වා. එම පරීක්ෂණ සඳහා ගත්ත කාලය පිළිබඳව ඇමතිතුමා කිව්වා. හැබැයි, අද මේ ආණ්ඩුව පත් වෙලා අවුරුදු එකහමාරක් වෙනවා. එතකොට ඒ චෝදනාව මේ ආණ්ඩුවටත් එල්ල කරන්න අපිට සිද්ධ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාස්කු ප්‍රහාරයේ මහ මොළකරු මේ රටට හඳුන්වා දෙනවා කියලා ඔබේ ජනාධිපතිතුමා පසුගිය අවුරුද්දේ අප්‍රේල් 21වෙනි දා ජාතිය අමතමින් කිව්වා අපට මතකයි. නැවත වරක් තවත් අවුරුද්දක් ගත වෙලා තිබෙනවා. ඔබේ ජනාධිපතිවරයා පොරොන්දුවක් දීලා ඒ අවුරුද්දක කාලය ගත වෙනකොට, සුරේෂ් සලේ කියන මේ රටට දැවැන්ත, විශිෂ්ට මෙහෙවරක් කරපු ඒ හමුදා බුද්ධි අංශයේ නිලධාරියා අද ඔබ වූදිතයෙක් බවට පත් කරලා; වූදිතයෙක් කරමින් කටයුතු කරන වෙලාවක්, මේ. හිටපු LTTE ත්‍රස්තවාදීන් මේ රටෙන් තුරන් කරන්න බුද්ධි අංශයේ ප්‍රධානියා විධියට එතුමා කරපු කාර්යභාරය කෘත ගුණ දන්නා මිනිස්සු විධියට අපට කිසි ලෙසකත් අමතක කරන්නට බැහැ කියන එක මම මේ මොහොතේ සිහිපත් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ඔබේ ආණ්ඩුවේ වගකීම් දරන රවි සෙනෙවිරත්න මැතිතුමා, ශානි අබේසේකර මැතිතුමාට පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් චෝදනා එල්ල වෙලා තිබුණා. ශානි අබේසේකර මැතිතුමා සම්බන්ධයෙන් එල්ල වෙලා තිබුණු චෝදනා පිළිබඳව හිටපු අමාත්‍ය උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා ලියපු "පාස්කු ප්‍රහාරයේ මහ මොළකරු සොයා යෑම" කියන පොතේ එතුමා පාස්කු ප්‍රහාරය සිදුවීමට ඉඩ හැරීම පිළිබඳව ගත් පියවර 11ක් සම්බන්ධයෙන් සඳහන් වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාස්කු ප්‍රහාරයේ මහ මොළකරු සොයා යෑම" කියන එම පොත මේ අවස්ථාවේ මා **සභාගත*** කරනවා.

පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් කථා කරනකොට, 2022දී පාස්කු ප්‍රහාරය සිදුවීමට ඉඩ හැරීම පිළිබඳව ශානි අබේසේකර මැතිතුමා සම්බන්ධයෙන් පොලීසිය විමර්ශනයක් පටන් ගත්තා කියන එක ඔබ අපි සියලු දෙනා දන්නවා. මේ ආණ්ඩුව ආවාට පස්සේ ඒ විමර්ශනය කරපු ප්‍රධාන පොලිස් පරීක්ෂක ඉන්දුක ද සිල්වා CID එකෙන් එළියට දැම්මා. හැබැයි, අද ඒවා ගැන කවුරුත් කථා කරන්නේ නැහැ. ඒ විතරක් නොවෙයි. ශානි අබේසේකර මැතිතුමා පිළිබඳව කරපු ඒ සියලු විමර්ශන කටයුතු ඉවත් කළා; අයින් කළා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ පාස්කු ප්‍රහාරයේ ප්‍රධාන සැකකරුවෙක් තමයි CID එකේ ප්‍රධානියා බවට පත් වෙලා අද වන විට කටයුතු කරන්නේ. ඔහු තමයි මේ ප්‍රහාරය සම්බන්ධයෙන් පැමිණිල්ල මෙහෙයවන්නේ. එතකොට අපේ ගම්වල කථාවක් කියනවා, "නඩුත් හාමුදුරුවන්ගේ, බඩුත් හාමුදුරුවන්ගේ" කියලා. අද ඔබේ ආණ්ඩුව සිදු කරමින් තිබෙන්නේ එවැනි ක්‍රියාමාර්ගයක්. විශේෂයෙන් මේ කාරණා පිළිබඳව අපි මේ විධියට කථා කරනකොට, ඔබේ ආණ්ඩුවට මේ පාස්කු ප්‍රහාරය පිළිබඳව සොයන්න සැබෑ වුවමනාවක් තිබෙනවා නම්, මේ පාස්කු ප්‍රහාරය සම්බන්ධව චෝදනා එල්ල වෙච්ච රවි සෙනෙවිරත්න මැතිතුමාව, ශානි අබේසේකර මැතිතුමාව,- අද ඔබේ ආණ්ඩුවේ ආරක්ෂක නියෝජ්‍ය ඇමතිවරයා විධියට කටයුතු කරන අරුණ ජයසේකර මැතිතුමා තමයි එදා නැඟෙනහිර භාර ආඥාපති වශයෙන් කටයුතු කළේ. මොවුන් තිදෙනා මේ වගකීම් දරන පුටුවල තියා ගෙන කරන පාස්කු ප්‍රහාරයේ වැරදිකරුවන්, එහෙම නැත්නම් පාස්කු ප්‍රහාරයේ වගකිවයුත්තන් සොයන එක ගැන අපිට විශ්වාසයක් තබන්න පුළුවන් ද කියන කාරණය අපි මේ ආණ්ඩුවෙන් අහනවා. එදා වූදිතයින් බවට පත් වෙච්ච, එදා ඒ සඳහා චෝදනාවලට ලක් වෙච්ච උදවිය ආණ්ඩුව පැත්තේ තියාගෙන අපට මේ කාරණය කරන්න පුළුවන්ද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, your time is up.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතාම ඉක්මනින් මගේ කථාව අවසන් කරනවා.

අපි හැමෝම අමතක කරලා තිබෙනවා, ඔබතුමන්ලාගේ ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තු වරම් ලබා දෙන්න කටයුතු කරපු මොහොමඩ් ඊබ්‍රහිම් මහතා පිළිබඳව. එතුමා රුපියල් මිලියන 300කට වඩා මේ පාස්කු ප්‍රහාරය වෙනුවෙන් වියදම් කළා කියන එක අප සියලුදෙනාම දන්නා කාරණයක්. ඒක විමර්ශන වාර්තාවල තිබෙනවා. අද ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ, ඔබතුමන්ලාගේ දේශපාලන මතය දරන කෙනෙක් තමයි මොහොමඩ් ඊබ්‍රහිම් කියන්නේ. අද එතුමා මේ චෝදනාවලින් නිදහස් කරන්න ඔබ කටයුතු කරමින් ඉන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාස්කු ප්‍රහාරය සම්බන්ධ ප්‍රශ්නය විසඳීමේ වුවමනාව අප හැමෝටම තිබෙනවා. විපක්ෂයේ මන්ත්‍රීවරුන් මීට පෙර කථා කළා, ඔබතුමන්ලා ගැන විශ්වාසය තියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැබැයි පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් අපට කැමැති කැමැති අයගේ නම් මහ මොළකරුවන් විධියට දමාගෙන එක් එක් දේශපාලන පක්ෂ විධියට, එක් එක් කෙනාට චෝදනා කරමින් ඉන්න එක නොවෙයි වෙන්න ඕනෑ. අප සියලුදෙනාම එකඟයි, පාස්කු ප්‍රහාරයේ සැබෑ වූදිතයින්ට දඬුවම් දෙන එකට. අප සියලුදෙනා එකතු වෙලා අපට ඕනෑ කෙනා පාස්කු ප්‍රහාරයේ මහ මොළකරු කරනවාට වඩා අපි ඇත්තවශයෙන්ම කරන්න ඕනෑ, මේ රටේ මේ මහා ව්‍යසනය කරපු කෙනා, ඒ කණ්ඩායම හොයලා දඬුවම් දීමයි කියන කාරණය ඉතාම ගෞරවයෙන් කියා සිටිමින්, අවස්ථාව ලබා දීම සම්බන්ධව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Sunil Watagala. You have ten minutes.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[අ.භා. 4.01]

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාදුගොඩ මන්ත්‍රීතුමාගේ කථාවෙන් පස්සේ මට නිකම් හිතුණේ මෙයයි. අපි දොරේ සද්දෙත් දන්නවා, බෙරේ සද්දෙත් දන්නවා. දැන් අපෙන් අහනවා, මහ මොළකරු කෝ කියලා. මහ මොළකරුවන්ගේ ආධාරකරුවන් ටිකක් ඊයේ පෙරේදා එළිදැක්වීමක ඉස්සරහ පේළියේ ඉඳගෙන හිටියා. ඒක අපි දැක්කා. මම මේ විමර්ශනවලට බාධාවක් වන විදියට කථා කරන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අකුරු ලියන්න බැරි උදවිය හිටපු ගමන් පොත් ලියනවා. පිල්ලෙයාන් පොතක් ලියලා තිබෙනවා. ෂාණක්කියන් කියපු කථාව හරි. පිල්ලෙයාන් හිටපු ගමන් පොතක් එළිදක්වනවා. මහ බැංකු බැඳුම්කර සිද්ධියට සුජීව සේනසිංහත් පොතක් එළිදක්වනවා. මේ අය ජීවිතේට පොත් ලියලා නැහැ. මේ මොකක්ද වෙන්නේ? උදය ගම්මන්පිල ලියපු පොත මගේ ළඟ තිබෙනවා. පොත් ලියන්නේ නැති උදවිය පොත් ලියන කොට අපි පොඩ්ඩක් හිතන්න ඕනෑ. නීතිඥයෙකු වුණාට ඒ කෙනා උසාවියක නඩුවලට පෙනී සිටින්නේ නැත්නම් ඒ ගැනත් හිතන්න ඕනෑ. හැබැයි, පිල්ලෙයාන්ට විතරක් එක්කෙනෙක් නීතිඥයා වුණා. අපි එතකොට පොඩ්ඩක් කලබල වෙන්න ඕනෑ. තේරුණාද? එම නිසා මේ සම්බන්ධව කෙරෙන විමර්ශනවලට යටත්වයි අපි මේ සියලු කරුණු කියන්නේ. විමර්ශන ඇතුළේ ඉක්මනින් මේ මහ මොළකරු එළියට එනවා. ඒ ගැන ඔයගොල්ලන් කලබල වෙලා ඉන්න බව නම් පෙනෙනවා. ටිකක් කලබල වෙලා ඉන්නේ.

දැන් ශානි ගැන කිව්වා, අපේ රවී සෙනෙවිරත්න ගැන කිව්වා, අරුණ ජයසේකර ගැනත් කිව්වා. මම ඒ ගැන කියන්නම්. ඇයි, ඒ අයට ප්‍රහාර එල්ල කරන්නේ? ඇයි, ඒ අයට මේ චෝදනාව කරන්නේ? අපි දන්නවා, හේතුව. ඔබ දන්නවාද? ඔයගොල්ලන්ගේ ජනාධිපතිවරයා දිවුරුම් දීලා පැය 48ක් යන්න හම්බ වුණේ නැහැ, ශානිව මාරු කළා. ශානි විතරක් නොවෙයි, ශානි ඇතුළු 32ක් මාරු කළා. 704දෙනෙකුට අධිකරණ නියෝග නැතුව ඔයගොල්ලන් travel ban එකක් දැම්මා. ඒ, කොහේ තිබෙන නීතියක්ද? උසාවියකින් එපායැ travel bans දාන්න. හැබැයි, පොලීසියේ නිලධාරියෙක් මෙහෙයවා 704කට travel ban දැම්මා. මාස 10යි, දවස් 18ක් ශානිව ඇතුළේ තියාගෙන හිටියා. මාදුගොඩ මන්ත්‍රීතුමා ඇයි යන්නේ? මේවා අහගෙන ඉන්න. ඔබතුමාට මේවා අහගෙන ඉන්න බැහැ, පොඩ්ඩක් අහගෙන ඉන්න. මාස 10යි, දවස් 18ක් ඇතුළේ තියාගෙන හිටියා, එක කටඋත්තරයක්වත් ගත්තේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.හැබැයි, අත්අඩංගුවට ගත්තේ 2020.07.31වෙනි දා. ඇප ලබා දුන්නා, 2021.06.18වෙනි දා. ඇප ලබා දුන්නාට පස්සේ 27 වතාවක් කටඋත්තර ගත්තා. මිනිහෙකු අත්අඩංගුවට ගන්නේ දඬුවමක් දෙන්නද? ඒක, ශානිට ක්‍රියාත්මක වෙච්ච දඬුවමක්. ඒ අය තමයි පාස්කු ප්‍රහාරය හා සම්බන්ධ විමර්ශනවලදී අවංකවම මැදිහත් වෙච්ච නිලධාරින්. හැබැයි, ඉතාම සූක්ෂ්මව ඔවුන්ට වැඩේ දුන්නා. පැය 48යි ගියේ. ඒගොල්ලන් පැය 48කදී ක්‍රියාත්මක වුණා. අපේ විෂය භාර අමාත්‍යවරයා කිව්වා වාගේ, වවුනතිව් සිද්ධිය හරියට කළමනාකරණය කළා නම්, පාස්කු දින ප්‍රහාරය වෙන්නේ නැහැ. පරීක්ෂණ නොමඟ යවලා, පුද්ගලයා නොමඟ යවලා ගත් ක්‍රියාමාර්ග ඇතුළේ තමයි ඒ වවුනතිව් සිද්ධිය වුණේ. මේ Adjournment Motion එකේ මොකක්ද තිබෙන්නේ? පෙට්ටගමේ තිබෙන වාර්තා ටික එළියට ගන්නලු. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි තමයි පෙට්ටගමේ තිබුණු වාර්තා ටික අරගෙන CID එකට භාර දුන්නේ, අරගෙන කියවලා ඒවාට action ගන්න කියලා. දැන් ඒවා සිද්ධ වනවා. දවස ගණනේ නඩු අහන අධිකරණයක් දැන් පිහිටුවා තිබෙනවා. ඒ වාගේම ජනක් ද සිල්වාගේ සභාපතිත්වයෙන් යුත් කමිටු වාර්තාව තුළින් ආ නිර්දේශ මත අද 10දෙනෙක් සම්බන්ධයෙන් පරීක්ෂණයක් ක්‍රියාත්මක වනවා. ඒවා තමයි අපේ ජන වරම පැතූ දේ. ඒ දේ තමයි මේ සිද්ධ වෙමින් යන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතැනදී උදය ගම්මන්පිලගේ පොත ගැන කිව්වා නේ. මම ඒ පොත අස්සෙන් තව කරුණු කිහිපයක් කියන්නම්. ඒ, මොනවාද? ඒ පොත දැන් මගේ අතේ තිබෙනවා. මම පොඩි සටහන් කිහිපයකුත් ගහගෙන ආවා. මගේ අතේ අලුත්ම පොතක් තිබෙනවා. ඒකට කියන්නේ, "උ දය බබාගේ මොළය සොයන පොත" කියලා. උදය බබාගේ පොතේ නම වැරදියි. මම මේ කථාව රාසමාණික්කම් මන්ත්‍රීතුමා ඉල්ලපු විවාදයේදීත් අවධාරණය කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාස්කු ප්‍රහාරය" නොවෙයි, මේක "පාස්කු දින ප්‍රහාරය" වෙන්න ඕනෑ. "පාස්කු ප්‍රහාරය" කියලා භාවිත කිරීමෙන් කිතුණු බැතිමතුන්ට සිද්ධ වන්නේ තවත් අසාධාරණයක්. දැන් මේ පොත ගැන මට මතු වන කරුණු කිහිපයක් කියන්නම්. ඇත්තවශයෙන්ම මේක නම් මහා වැදගත්කමක් දෙන්න ඕනෑ එකක් නොවෙයි. නමුත්, ඒකේ තිබෙන ඇතැම් කරුණු කිහිපයක් මම ඔබතුමාට කියන්නම්.

"මහ මොළකරු හෙළි කරන්න මෙච්චර පරක්කු වුණේ ඇයි?" කියලා මේ පොතේ තිබෙනවා. මේකේ කියන්නේ, "මහ මොළකරු සොයා යෑම" කියලා. ඔහු කවුද? ඒකට මෙච්චර කාලයක් බලාගෙන හිටියේ ඇයි කියන ප්‍රශ්නය මට මතු වුණා. පාස්කු ප්‍රහාරයෙන් පස්සේ බිහි වුණු ආණ්ඩුවේ ප්‍රබල ඇමතිවරයෙකු විදියටත්, එදා පත් වුණු ජනාධිපතිවරයාගේ කුස්සි කැබිනට්ටුවේ හිටපු සාමාජිකයෙකු විදියටත්, එතුමාට ඒ දවස්වල මෙය හෙළිදරව් කරන්න බැරි වුණේ ඇයි?

උදයගේ පොතට රොහාන් ගුණරත්න ලියපු පෙරවදනේ මෙන්න මෙහෙම වාක්‍යයක් තිබෙනවා. අපි උදයගෙන් අහන්න ඕනෑ, රොහාන් ගුණරත්න මේ වාක්‍ය ලිව්වේ ඇයි කියලා. ඒකේ එක තැනක තිබෙනවා, "කෙසේ වෙතත්, එවකට සිටි බලධාරින් මෙම තර්ජනය නිවැරදිව කියවා ගත්තේ නැත. එබැවින් නීතිය බලාත්මක කිරීමේ බලධාරින් මෙම තර්ජනය හඳුනාගෙන එය මර්දනය කිරීමට නිසි පියවර ගත්තේ නැත" කියලා. මේ වාක්‍ය ලියලා තිබෙන්නේ උදය ගම්මන්පිලගේ පොත ඇතුළේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කියන්නේ කවුරු ගැනද කියලා මම අහනවා. පොත ගැන වාගේම පෙරවදන ගැනත් වග කියනවා ඇති නේ. ඒ කියන පාස්කු ප්‍රහාරයේ තර්ජනය නිවැරදිව කියවා නොගත් එවකට සිටි බලධාරින් කවුද? එම තර්ජනය හඳුනාගෙන එය මර්දනය කිරීමට නිසි පියවර නොගත් නීතිය බලාත්මක කිරීමේ බලධාරින් කවුද? ඒ ගැන හෙළි කරන්න බැරිද? මොකද, ප්‍රහාරය සැලසුම් කිරීම තරමටම දැන දැනම ඒ ගැන පියවර නොගැනීමත් වරදක් නිසා.

රොහාන් ගුණරත්නගේ පෙරවදනේ තව ලස්සන කෑල්ලක් තිබෙනවා. ඒක අහන්න වානක මාදුගොඩ මන්ත්‍රීතුමා සිටියා නම් හොඳයි. *[බාධා කිරීමක්]* ඉන්නවාද? ඔන්න, එහෙනම් හොඳට අහගන්න. ඒකේ තිබෙනවා, "ජාතික ආරක්ෂාවට වඩා ඡන්ද දිනීම වැදගත් වුණු හෙයින් සමහර දේශපාලකයෝ ජාතික ආරක්ෂාව පාවා දුන්හ" කියලා. මේ පොතේ තමයි ඒකත් ලියලා තිබෙන්නේ. ජාතික ආරක්ෂාව පාවා දුන්නාලු, ඡන්දය දිනන්න ඕනෑ හින්දා. අන්න, පුහුල් හොරා කරෙන් දැනේ සිද්ධිය. අඩයම කරේ

[ගරු නිතිඥ සුනිල් වටගල මහතා]

තියාගෙන ගිය සිද්ධිය තමයි මේ කියන්නේ. මේ කියන්නේ කවුරු ගැනද? එදා ඡන්දය දිනන්න බලාගෙන සිටි, දේශපාලන වාසියක් ගන්න බලාගෙන සිටි දේශපාලන චරිත කවුද? අපි ඒ ලැයිස්තුවම අරගෙන බලමුද? ඒ ලැයිස්තුවේ උඩින්ම ඉන්නේ කවුද? එතකොට රොහාන් ගුණරත්න උදයගේම පොතේ පෙරවදනේ මේ කියන්නේ කවුරුන් ගැනද? එතකොට උදය පසුගිය දා එළිදැක්වූ මේ පොත එදා එළිනොදැක්වූයේ ඔහුට තිබුණු භය නිසාද, නැත්නම් දේශපාලන තක්කඩිකමක් නිසාද? අපි ඒක තමුන්නාන්සේලාගෙන් අහනවා.

ඒ වාගේම තව ප්‍රශ්නයක් තිබෙනවා. ඒ මොකක්ද? එදා ඉඳන් මේ දක්වා පරීක්ෂණ වාර්තා කිහිපයක් ප්‍රකාශයට පත් කළා. අධිකරණ ක්‍රියාමාර්ග පැවැත්වුණා. සමහරු වන්දිත් ගෙව්වා. මේ කිසිම වෙලාවකවත් "හෝව්, හෝව්" කියලා ඒ ක්‍රියාමාර්ග නතර කරන්න උදය ආවේ නැහැ. "කාදිනල්තුමනි, බිය නොවන්න, හොයන හැටි මම පෙන්වන්නම්" කියලා කියන්න තිබුණා නේ, ඒ කාලයේ. එච්චර කාලයක් නින්දේ ගැලී සිටි උදය හදිසියේම මේ වෙලාවේ මහ මොළකරු හොයන්න හිතුවේ ඇයි? ඇත්ත මහ මොළකරු හෙළි වන ලකුණු පහළ වෙලා නිසාද? එහෙම හෙළි වුණොත් එකට කාපු බීපු අය හෙළිදරව් වෙයි කියලා භය හිතුණාද? එහෙම නැත්නම් මෙච්චර කල් කළා වාගේ මේකත් තව කුලී වැඩක්ද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මේ ඉන්නේ අර එළුවාගේ මොකක්ද වැටෙනකම් බලාගෙන හිටපු නරියා වාගේද? දැන් වැටෙයි, දැන් වැටෙයි කියලා ආණ්ඩුව වැටෙනකම් බලාගෙන ඉන්න නරි රංචුවට උදය අයිති නොවෙන්න විධියක් නැහැ නේ. වැටුණාම ලොකු කෑල්ලක් ඩැහැ ගන්න බලාගෙන ඒකට සුදුසුකම් පෙන්වන්න පොඩ්ඩක් වැඩ දාලා, සද්දේ දාලා තමනුත් ඉන්න බව ලකුණු කර ගන්න ඕනෑ කියලා හිතුණු නිසාද, ඒ නම් දමනකොට කණ්ඩායමේ නම් එහෙමත් දැම්මේ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමන්ගේ හෘදය සාක්ෂියේ විලාපයට ඇහුම්කන් දෙන්නද මොහු මේ පොත ලිව්වේ? කරන්න පුළුවන් උපරිම පරිස්සම් සහගත විධියට උදයත් දන්න මහ මොළකරු හෙළිදරව් කිරීමක්ද මේ කළේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මතක් වෙනවා, ටිකක් මෑත අතීතයේ සිද්ධියක්. නාරාහේන්පිටදී ලලිත් ඇතුලත්මුදලිව ඝාතනය කළා. ඍජුවම ඒකේ චෝදනාව එල්ල වුණේ හිටපු ජනාධිපති ප්‍රේමදාසට. හිටපු ජනාධිපති ප්‍රේමදාස වහාම ප්‍රකාශයක් නිකුත් කළා, "මා ඝාතනය කළත් මගේ චරිතය ඝාතනය කරන්න එපා" කියලා. ඇතුලත්මුදලි ඝාතනයට සම්බන්ධ ඝාතකයන් කවුද කියන එක මැයි රැළියේදී හෙළිදරව් කරනවා කියාත් කිව්වා. ඒ කියන්නේ, ඇතුලත්මුදලි ඝාතනයේ මහ මොළකරු හෙළිදරව් කරනවා කියලා ප්‍රකාශ කළා. මොකද වුණේ? මැයි රැළියට පැය කිහිපයකට කලින් හිටපු ජනාධිපති ප්‍රේමදාසවත් ඝාතනය කළා. අදටත් හරියට හෙළිදරව් වෙලා නැහැ, ඇතුලත්මුදලි ඝාතනය කවුද කළේ කියලා. උදය මේ කථාව දන්නවා. උදයට පාස්කු ප්‍රහාරයේ මහ මොළකරු කවුද කියලා පොතක් ලියන්න ඕනෑ වුණා. පොත ලියලා රොහාන් ගුණරත්නට කියලා පෙරවදනකුත් ලියවා ගත්තා. පෙරවදනේ සමහර කරුණු හංගලා ගහලා තිබෙනවා. ඒක නේ මම අර මුලින් කිව්ව විධියේ වාක්‍යයක් ඒකට ඇතුළත් වෙන්නේ. පොතේ තිබෙන්නේ එකක්, පෙරවදනේ තිබෙන්නේ තව එකක්. ඊට පස්සේ උදය දන්න ඇත්ත මොළකරුවන්ට උත්සවයට ආරාධනා කළා.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න කැමතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. වේදිකාවේ බැනර් එකක් ගහලා තිබෙනවා, "පාස්කු ප්‍රහාරයේ මහ මොළකරු හෙළි කිරීම" කියලා. ශාලාවේ මුල් පේළි දිහා බැලුවාම ඕනෑ කෙනෙකුට ඉතුරු ටිකත් තේරෙනවා. මට නම් හිතෙන විධියට උදයට වුණේ මේකයි. උදයගේ අතේ බැඳගෙන ඉන්න ඥාණා මැණියෝ දීපු රතු නූලට උදය හරි භයයි. ඒ නූලට අයිති දෙවියෝ හීනෙන් පෙනිලා උදයව හොඳටම භය කළා, ඇත්ත කියන්න, නැත්නම් ඔබට හොඳ දෙයක් කරනවා කියලා. උදය දන්නවා, හරියටම ඇත්ත කිව්වොත් මොකද වෙන්නේ කියලා. මැණික් මුදලාලිගේ පුතාගේ බෙන්ස් එක හික්කඩුවේදී පෙරළිලා පුතා මැරුණු හැටි උදයට මතක් වුණා. වතුර බෝතලයක් අරගෙන කාර් එකට නැඟපු තාජුඩීන්ට වෙච්ච දේ උදයට මතක් වුණා. උදය බබාට හීන් දහඩියයි, මහ දහඩියයි දෙකම දැම්මා. දෙපැත්තෙන්ම බේරෙන්න පුළුවන් විධියක් කල්පනා කළා, උදය. පොතේ එකක් කිව්වා, පෙරවදනේ තව එකක් කිව්වා. "සභාව දිහා බලාපියව්" කියලා ඇහැට ඇඟිල්ලෙන් ඇනලා ඇත්ත පෙන්වලා දුන්නා.

මට කියන්න තිබෙන්නේ මෙච්චරයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි මේ පොත් අස්සේ තිබෙන දේවල් ඉතා සියුම්ව තේරුම් ගන්න ඕනෑ. CID එක ගන්න action අපි දන්නේ නැහැ. ඇත්තවශයෙන් මේ පොතේ තිබෙන ඇතැම් කරුණු, සමහර දේවල් මේ පරීක්ෂණ නොමඟ යවන්න, එහෙම නැත්නම් ගරු අධිකරණයේ විභාග වන නඩුවලට බලපාන කරුණු කාරණා. ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි එක දෙයක් කියනවා, මාදුගොඩට. භය වෙන්න එපා. ඇත්ත මහ මොළකරු අපි අනිවාර්යයෙන්ම මේ පරීක්ෂණ ඇතුළේ හෙළිදරව් කරනවා. ඒක ජාතික ජන බලවේගයේ ජන වරම ඇතුළේ තිබෙන පොරොන්දුවක්. ඒ පොරොන්දුව අපි ඉෂ්ට කරනවා කියා මේ වෙලාවේදී මතක් කරමින් මම නිහඬ වනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The next speaker is the Hon. Harshana Rajakaruna. You have four minutes.

[අ.භා. 4.15]

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මට මේ සිද්ධිය අද වාගේ මතකයි. පාස්කු ප්‍රහාරය වුණු වෙලාවේදී උදේ ඉඳන් මම හිටියේ අත්තනගල්ල රජ මහා විහාරයේ සෞඛ්‍ය සායනයක් කරමින්. ඒ වෙලාවේදී මේ සිදුවීම ආරංචි වුණු ගමන් මම කටානේ කටුවාපිටිය පල්ලියට ගියා. ඒ වෙච්ච දේ ඉතාම බරපතළයි. මේ රටේ කවදාවත් නැවත මෙවැනි දෙයක් වෙන්නේ නැති වෙන්න වග බලා ගන්න ඕනෑ. එම නිසා සමගි ජන බලවේගයේ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමාත්, අපි හැමෝමත් උපරිම සහයෝගය සහ ශක්තිය ලබා දෙනවා, මේ ආණ්ඩුවට. ඒ ගැන කිසිම සැකයක් තබා ගන්න එපා. අපට අවශ්‍ය වන්නේත් මෙහි වගඋත්තරකරුවන් සෙවීම. තමුන්නාන්සේලා ඒක අවංකව ඉටු කරන්න කියලා අපි මේ වෙලාවේදී ඉල්ලීමක් කරනවා.

දැන් මේ විවාදය ගත්තාම, ආණ්ඩු පක්ෂයෙන් වැඩියෙන්ම කථා කරන්නේ පොතක් එළිදැක්වීම පිළිබඳවයි. සජිත් ප්‍රේමදාස මැතිතුමාටත් මේ තුළින් මඩ ගහන්න හදනවා. අනුර කුමාර

දිසානායක ජනාධිපතිවරයාගේ වචනයෙන්ම කියනවා නම් සජිත් ප්‍රේමදාස මැතිතුමා ඔය පොත කාලා බලලා නොවෙයි එතැනට ගියේ; ඒ පොතේ මොනවාද තිබුණේ කියන එක දැනගෙන නොවෙයි ගියේ. *[බාධා කිරීම්]* ඒ නිසා කරුණාකර තමුන්නාන්සේලා අවංකව ඔබතුමන්ලාගේ රාජකාරිය ඉටු කරන්න. මම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, මේ ආණ්ඩුව කියන දේවල්, කරන දේවල්, කිව්ව දේවල් මේ රටේ ජනතාව දැන් පිළිගන්නේ නැති තත්ත්වයකට පත් වෙලා තිබෙන බව. තමුන්නාන්සේලා එදා වේදිකාවේදී කිව්ව දේවල් අද කරන්නේ නැහැ. ඒකයි අද අපට තිබෙන ගැටලුව. පාස්කු ප්‍රහාරය පිළිබඳව සිදු කරන පරීක්ෂණ ගැන තිබුණු විශ්වාසය නැති වෙලා තිබෙනවා. ඒ මොකද? ඔබට මතකද, අවුරුද්දකට කලින්, 2025 මාර්තු මාසයේ අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා වේදිකාවට ඇවිල්ලා අප්‍රේල් පාස්කු ඉරු දිනට කලින් අපි මහ මොළකරු හෙළි කරනවා කියලා කියපු ආකාරය? එහෙම කිව්වේ නැද්ද? තමුන්නාන්සේලා දැන් වචනයක්වත් ඒ ගැන කථා කරන්නේ නැහැ. ඇයි, ඒ? තමුන්නාන්සේලා ඉතා පැහැදිලිව ඒ ගැන කිව්වා. ඒක කියලාත් දැන් අවුරුද්දක් වෙනවා. නමුත්, මහ මොළකරු කෝ? *[බාධා කිරීම්]* ඒක කියලාත් දැන් අවුරුද්දක් වෙනවා. නමුත්, මහ මොළකරු නැහැ. අනුර කුමාර දැන් ගල් අඟුරුවලින් නාගෙන තිබෙන්නේ. ඒකයි අද වෙලා තිබෙන්නේ. කරුණාකරලා මේකට ජාත්‍යන්තර විශේෂඥ සහයෝගය අවශ්‍ය නම් ඒක හරි ලබා ගන්න. ඒ ගැන කිසිම සැකයක් නැහැ. අපටත් අවශ්‍ය වෙන්නේ මේ කටයුත්තේ නිමාවක් දකින්න.

අපි කවුරුත් දන්නවා, ගෝඨාභය රාජපක්ෂ යුගයේ මේ වෙනුවෙන් සාධාරණයක් ඉටු වුණේ නැහැ කියලා. ඔව්, ශානිව මාරු කළා, CID එකේ අයව මාරු කළා. ඒ ගැන අපි එදාත් කථා කළා. අදත් අපි ඒ ගැන කථා කරනවා. රිසාඩ් බදියුදීන් හිටපු ඇමතිතුමාව, Dr. Shafiව ඒකට අල්ලා ගන්නයි හැදුවේ. නමුත්, ඒකට සාධාරණයක් ඉටු වුණේ නැති හින්දා තමයි මේ රටේ ජනතාව - විශේෂයෙන්ම මේ පිළිබඳ සංවේදී ජනතාව - තමුන්නාන්සේලාට ජන වරමක් දුන්නේ. දැන් අවුරුදු කීයක් ගත වෙලාද? අවුරුදු එකහමාරක්. තමුන්නාන්සේලා එක පැන් පහරින් කරනවා කිව්ව කණ්ඩායම නේ. එක පැන් පහරින් කරනවා කිව්වා; සතියෙන් කරනවා කිව්වා; මාසයෙන් කරනවා කිව්වා; පළමුවැනි අය වැයෙන් කරනවා කිව්වා. නමුත්, අපි තවම ඒවා කරන තුරු බලාගෙන ඉන්නවා. ඒකයි අපි කියන්නේ, කරුණාකර මේ කටයුත්ත ඉක්මන් කරන්න කියලා. *[බාධා කිරීම්]* මේ කටයුත්ත ඉක්මන් කරන්න.

තමුන්නාන්සේලා ගැන අද වනකොට විශ්වාසයක් නැහැ. දැන් පව ගහලා, පව ගහලා මේ රටේ ජනතාව රවටලා තිබෙනවා. දැන් මේ සම්බන්ධයෙන් ඔබේ ප්‍රධානියාම කිව්වා නේ. 2025 මාර්තු මාසයේ නේ කිව්වේ, පාස්කු ප්‍රහාරයේ මහ මොළකරු හෙළි කරනවා කියලා. නමුත් ඒක තවම කර ගන්න බැරි වෙලා තිබෙනවා නේ. අපි ඉතාම ඕනෑකමින් කියනවා, කරුණාකරලා මේ ආණ්ඩුවේ නොහැකියාව වහගන්න වෙන වෙන කථා කියන්න එපා කියලා. විපක්ෂයේ අපි ගැනවත්, වෙන කවුරුවත් ගැනවත් එහෙම කථාවක් නැහැ. අද ඕනෑ කෙනෙකුට පොත් ලියලා එක එක ඒවා කරන්න අවස්ථාව ලැබිලා තිබෙන්නේ තමුන්නාන්සේලාගේ වැඬේ අකුරට ඉටු වෙලා නැති හින්දා නේ. ඔබ, ඔබේ කටයුත්ත හරියටම ඉටු කළා නම් අද කාටවත් වෙන දේවල් කරන්න බැහැ නේ; වෙන දේවල් කියන්න බැහැ නේ. පොත් හෝ මොනවා හෝ ලියා ගන්න බැහැ නේ. දැන් තමුන්නාන්සේලා ඒක කරන්නේ නැතුව අවස්ථාව ලබා දීලා තිබෙනවා, එක එක අයට එක එක දේවල් කරන්න. ඒක හින්දා කරුණාකර ඔබ, ඔබේ කටයුත්ත අකුරට ඉටු කරන්න. ඒ වෙනුවෙන් අපි උපරිම ශක්තිය ලබා දෙනවා කියන එකත් මේ වෙලාවේදී මම ප්‍රකාශ කරන්න කැමැතියි. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Sugath Thilakaratne. You have nine minutes.

Order, please! Before he starts, will an Hon. Member propose the Hon. Chanaka Madugoda to the Chair?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

Sir, I propose that the Hon. Chanaka Madugoda do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු චානක මාදුගොඩ මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. CHANAKA MADUGODA took the Chair.*

[අ.භා. 4.20]

**ගරු සුගත් තිලකරත්න මහතා (ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுகத் திலகரத்ன - விளையாட்டுத்துறைப் பிரதி அமைச்சர்)
(The Hon. Sugath Thilakaratne - Deputy Minister of Sports)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කළ යෝජනාව සම්බන්ධයෙන් වචන කිහිපයක් කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අපි අද මේ විවාදයට ගෙන තිබෙන්නේ ඉතාම දුක්බර සිදුවීමක් ගැනයි. 2019 අප්‍රේල් 21 දින සිදු වූ පාස්කු ප්‍රහාරය සම්බන්ධව සිහිපත් කරමින්, එම සිදුවීමත් එක්ක අපි ඉගෙන ගත යුතු පාඩම් පිළිබඳව අදහස් දැක්වීමට මා බලාපොරොත්තු වනවා.

ඇත්තටම පාස්කු ඉරිදා දිනය කියන්නේ කිතුනු භක්තිකයින්ගේ අතිශයින්ම පූජනීය දිනයක්. එදින නොසිතූ ලෙස ස්ථාන කිහිපයකටම බෝම්බ ප්‍රහාර කිහිපයක්ම එල්ල වුණු නිසා මිනිස් ජීවිත 250කට අධික සංඛ්‍යාවක් අපට අහිමි වුණා. තවත් සිය ගණනක් තුවාල ලබා තිබෙනවා. ඔවුන් අතර පූර්ණ කාලීනව රෝගී වුණු අයත් ඉන්නවා. ඒ විධියට ඔවුන් අසරණ වෙලා ඉන්නවා. ඇත්තටම මේ වුණු හානිය අපි බලන්න ඕනෑ සංඛ්‍යාවක් හැටියට නොවෙයි. එම ප්‍රහාරය නිසා අපේ රටේ සමහර පවුල් බිඳ වැටුණා; ඒ පවුල්වල තිබුණු සිහින බිඳ වැටුණා; ඔවුන්ගේ ජීවිතවල තිබුණු අනාගත බලාපොරොත්තු විශාල වශයෙන් බිඳ වැටුණා.

විශේෂයෙන් මේකෙදි අපට එක දෙයක් හෙළිදරව් වෙනවා, අපේ රටේ පැවති ආරක්ෂාව සම්බන්ධව. එවකට අපේ රටේ පැවති ආරක්ෂාව පිළිබඳව, බුද්ධි තොරතුරු පිළිබඳව, රාජ්‍ය වගකීම් පිළිබඳව බරපතළ ප්‍රශ්නයක් මේ පාස්කු ප්‍රහාරයත් එක්ක

[ගරු සුගත් තිලකරත්න මහතා]

එළියට ආවා. ඒ වාගේම, එම ප්‍රහාරයට වග කිවයුත්තේ කවුද සහ ඒ අවස්ථාවේදී වගකීම් පැහැර හැරියේ කවුද කියන එක සම්බන්ධවත් මේ වෙනකොට අපට ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. එම නිසා මේ සම්බන්ධයෙන් නිවැරදි ලෙස කටයුතු කර, ඒ වින්දිතයින්ට සාධාරණයක් විය යුතුයි, යුක්තිය ඉටු විය යුතුයි කියලා අපි දැඩි ලෙස විශ්වාස කරනවා. මේ වෙලාවේ අපි එකිනෙකාට දෝෂාරෝපණය කර ගන්නවාට වඩා, සත්‍යය කුමක්ද කියා සොයාගෙන යන්න ඕනෑ. විශේෂයෙන්ම මිනිස්සු ඒ සත්‍යය තුළින් යුක්තිය බලාපොරොත්තු වනවා. මොකද, සත්‍යය නැති තැන යුක්තියක් ඉෂ්ට වෙන්නේ නැහැ කියන විශ්වාසය අපට තිබෙනවා. ඒ වාගේම තමයි, යුක්තිය ඉෂ්ට වෙන්නේ නැත්නම් මිනිසුන් තුළ තිබෙන විශ්වාසය ගොඩක් වෙලාවට කඩතොලු වෙනවා. ඒ නිසා ඒ කඩ වෙච්ච විශ්වාසය අපි ඔවුන් තුළ නැවත ඇති කරන්න අවශ්‍ය වෙනවා. මේ තුළින් අපි ඉගෙන ගත යුතු පාඩම හැටියට මා දකින්නේ එයයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රහාරය අපේ සමාජයේ සමගියට එල්ල වුණු විශාල පහරක්. පාස්කු ප්‍රහාරයේ බිහිසුණු පැත්ත විධියට මා දකින්නේ එයයි. මෙය, අපේ සමාජයේ ජාතික වශයෙන් සහ ආගමික වශයෙන් තිබුණු එකමුතුවට එල්ල කරපු විශාල ප්‍රහාරයක් සහ ඉතා පහත් ක්‍රියාවක්. ඒ වාගේම, කතෝලික ප්‍රජාව ඇතුළු අපේ මුළු ශ්‍රී ලංකාවටම එල්ල වුණු ප්‍රහාරයක් සහ අපේ ආගම් සහ ජාතීන් අතර බෙදීමක් ඇති කරන්න කරපු අධම ක්‍රියාවක් විධියට මා මෙය දකිනවා. නමුත්, ඇත්තටම අපේ පිළිතුර විය යුත්තේ ආගම් ලෙස, ජාතීන් ලෙස බෙදීම නොව, අපගේ එකමුතුකම වර්ධනය කර ගනිමින් කටයුතු කිරීමයි.

විශේෂයෙන්ම ඒ කාලය තුළ අපේ සමාජයේ කඩා වැටීමක් තිබුණා. එම ම්ලේච්ඡ ප්‍රහාරය නිසා වැඩිහිටියන්, දෙමව්පියන් ඇතුළු කුඩා දරුවන් දැඩි ලෙස කම්පනයට පත් වූ කාලයක් තිබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් මා ලැබූ අත්දැකීමක් විශේෂයෙන්ම කියන්න ඕනෑ. Sri Lankan Olympiansලා හැටියට අපි, එම ප්‍රහාරයෙන් කම්පනයට ලක් වුණු දරුවන්ගේ මානසික සුවය වෙනුවෙන් වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න උත්සාහ කළා, කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානය පෙරටුකොටගෙන. ඒ අවස්ථාවේදී කටුවාපිටිය දේවස්ථානයට ගමේ ළමුන් ටික ගෙනැවිත් දෙන්න කියලා අපි ඉල්ලීමක් කළා. ඒ ප්‍රහාරය නිසා භීතියට පත් වෙච්ච ළමයින් අපි ඉල්ලීම් කළත් එන්නේ නැතිව ගෙවල්වල රැඳී සිටියා. විශේෂයෙන්ම ඔවුන් දහම් පාසලට එන්නේ නැතිව, පල්ලියේ දේව මෙහෙයට එන්නේ නැතිව මාස දෙකක විතර කාලයක් මුළුගැන්විලා හිටියා.

හැබැයි, අපේ උත්සාහයෙන්, පල්ලියේ පියතුමාත් එක්ක එකතු වෙලා, ඒ ළමයින් දේවස්ථානය වෙත ගෙන්වන්න විශේෂ ක්‍රීඩා වැඩසටහනක් ක්‍රියාත්මක කළා. හැබැයි, එදා උදේ 10.00-11.00 වෙනකොටත් ඇවිල්ලා හිටියේ, ඒ ගමේ හිටපු ළමයින් 20ක් විතර පමණයි. හැබැයි හවස 3.00-3.30 වෙද්දී ක්‍රමානුකූලව ළමයින් 200කට වැඩි පිරිසක් දේවස්ථානයට ගෙන්වා ගන්න අපට හැකියාව ලැබුණා. අපි එහිදී දැක්කා, ඒ ළමයින් විඳපු වේදනාව, ඔවුන්ගේ භීතිය. ඒ හැම දෙයක්ම අපි අත්වින්දා. අපි උත්සාහ කළා, ඒ ළමයින් සතුටු කරලා, ඔවුන්ගේ තිබුණු ඒ මානසික පීඩනය, භීතිය අයින් කරලා ඔවුන් නැවතත් සමාජගත කරන්න. ඔවුන්ට දහම් පාසලට එන්න, පාසලට යන්න, දෙමව්පියන් අතරින් එළියට එන්න, ගෙදරින් එළියට එන්න, ගමෙන් එළියට එන්න උදව් කරන්න අපට හැකියාව ලැබුණා.

විශේෂයෙන්ම ඒ ප්‍රහාරය ජාති සහ ආගම් අතර භේදයක් ඇති කරන්න එල්ල වුණු ප්‍රහාරයක් හැටියට අපට හිතන්න පුළුවන්. ඒ අවස්ථාවේ අපේ ආගමික නායකයන් ගත්ත උත්සාහය, සියලු ආගමික නායකයන් එකතු වෙලා රටේ ඒ වෙනකොට තිබුණු තත්ත්වය මැඩ පවත්වා ගන්න කටයුතු කළ ආකාරය අපි අගය කළ යුතුයි. අපි සියලු ආගම්වලින් පෝෂණය වෙච්ච රටක්. ඉතින් මම හිතනවා, ඇත්තටම අපේ ආගමික නායකයන් ගත්ත ඒ ක්‍රියාමාර්ගය අපි ඉතාම අගය කළ යුතුයි කියලා. අපි ගෞරවයෙන් ඒ ගැන සිහිපත් කරන්න ඕනෑ. විශේෂයෙන්ම කටුවාපිටිය දේවස්ථානයේ සුන්බුන් අතරින් නැඟුණු වැලපීම ආගමික යුද්ධයකට පෙරළෙන්න ඉඩ නොදී සාමය රැක ගන්න කටයුතු කරමින් කිතුනු ප්‍රජාව රටටම ආදර්ශයක් දුන්නා. ඒ වාගේම ඔවුන් එදා ඇත්තටම ඉල්ලා සිටියේ, පළිගැනීම නොවෙයි. ඒ වෙනුවට ඔවුන් ඉල්ලා සිටියේ යුක්තිය. මේ වෙනකොට ජාතික ජන බලවේගය රජයක් විධියට අපි ඒ යුක්තිය වෙනුවෙන් කටයුතු කරනවා. ඉදිරියේදී අපට ඒ පිළිබඳව සියලු කරුණු දැන ගන්න පුළුවන් වෙයි කියලා මා දැඩි ලෙස විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ප්‍රහාරයත් එක්ක අපි රටක් හැටියට ඉගෙන ගත යුතු දෙයක් තිබෙනවා. විශේෂයෙන්ම අපි අවධානය යොමු කළ යුතු කරුණු තිබෙනවා. ඒ ප්‍රහාරය පිළිබඳ සත්‍යය අපි මේ රටට හෙළි කළ යුතු වෙනවා. මොකද, කිසිදු පුද්ගලයෙක් හෝ කණ්ඩායමක් නීතියට ඉහළින් නැහැ කියන එක අපි මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

ඒ වාගේම ඒ වින්දිතයන්ගේ පවුල්වලට යුක්තිය ඉටු කිරීම අපේ පරම වගකීමක් කියලා මා විශ්වාස කරනවා. විශේෂයෙන් ජාතික ජන බලවේගයේ මේ රජය තුළ අපට ඒ වගකීම අනිවාර්යයෙන්ම ඉෂ්ට කරන්න පුළුවන් කියලා අපි හිතනවා. ඒ වාගේම ඕනෑම ආකාරයක අන්තවාදයක් අපි ඉස්සරහට ආවොත්, ඒක අපි ආගමික, දේශපාලනික වශයෙන් අනිවාර්යයෙන්ම ප්‍රතික්ෂේප කළ යුතු වෙනවා, රටක් ලෙස අපි ඉස්සරහට යද්දී. අපට දැන් විශ්වාසයක් තිබෙනවා. මොකද, අපි දේශපාලනය පටන් ගනිද්දී ජාති, ආගම් සියලු භේද අත්හැරලා එකට ජීවත් වෙන්න ඕනෑ, සමානාත්මතාව මත ජීවත් වෙන්න ඕනෑ රටක් විධියට තමයි අපි දේශපාලනය කරගෙන ආවේ. ඒ නිසා අපි හිතනවා, මේ රටේ මිනිස්සුන්ට අපේ රජය ගැන විශාල බලාපොරොත්තුවක් තිබෙනවා, විශ්වාසයක් තිබෙනවා කියලා. ඉතින් ඒ සියලු දෙනාගේම වගකීම අපි භාර අරගෙන තිබෙනවා. මම හිතනවා, ඒ සියලු දේ රජයක් හැටියට අපට කරන්න පුළුවන් කියලා.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. ඇත්තටම අපි මේ විවාදය භාවිත කළ යුත්තේ එකිනෙකාට ඇඟිල්ල දිගු කර ගනිමින් දේශපාලන වාසි ලබා ගන්න නොව, ඉන් එහාට ගිහිල්ලා පාස්කු ප්‍රහාරයෙන් වින්දිතයන් බවට පත් වුණු, එහෙම නැත්නම් එයින් අයුක්තියට, අසාධාරණයට ලක් වූ සියලුදෙනාට සාධාරණය සහ යුක්තිය ඉටු කිරීමටයි.

මට අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.29]

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
*බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්.*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විෂයානුබද්ධව කථා කිරීමට පෙර මම කාරණයක් කියන්න ඕනෑ. ආණ්ඩු පක්ෂයේ මුල් පෙළ ඇමතිවරු දෙදෙනෙක් සභාවේ ඉන්නවා. ඒ ඇමතිවරු හරහා ආණ්ඩුවට ඉල්ලීමක් කරන්න මම කැමැතියි. මැද පෙරදිග යුද තත්ත්වය තාවකාලික සටන් විරාමයකට ගිහිල්ලා තිබෙන අවස්ථාවක ඉරාන නෞකාව තුළ ඉඳලා බේරා ගත්ත තරුණ නාවිකයන් -ඒ කිහිපදෙනෙක් රටේ ඉන්නවා. ඒ අය- වහාම ඉරානයට පිටත් කරන්න කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. ඒ පිළිබඳව නැවත වාරයක් ගිහිල්ලා ඇමෙරිකාවෙන් අහන්නේ නැතුව, මධ්‍යස්ථ රටක් නම් කරුණාකරලා ඒ තුවාල වුණු, බේරා ගත්ත ඒ තරුණ නාවික කණ්ඩායම නැවත පිටත් කරන්න කටයුතු කරන්න.

They are all young cadets. So, please see to it that you repatriate them to Iran during this period of ceasefire. We do not know, with Donald Trump, what will happen after two weeks. Therefore, in this situation, it is our duty to see that they are repatriated to Iran without any delay.

The President came out with a big lie about the Americans asking to land some planes in Mattala in order to avoid the issue of delaying that Iranian ship from coming into our ports. That is why, finally, that ship got destroyed. We paved the way or allowed the USA to attack the ship and finally, claimed that we are neutral. But, in fact, our activities have not shown true neutrality. Anyway, at least at this grave moment or during this ceasefire period, I am asking the Government to see that those young cadets are immediately returned to Iran.

Having said that, now, I would like to move onto the subject under discussion. පාස්කු ඉරිදා සිද්ධිය පිළිබඳව කථා කරද්දී මම විශේෂයෙන් කියන්න ඕනෑ, ශානි අබේසේකර සහ රවී සෙනෙවිරත්න කියන ඒ උසස් පොලිස් නිලධාරින් පිළිබඳව පූර්ණ විශ්වාසය අපට තිබෙන බව. ඒ විශ්වාසය උඩ, මේ විමර්ශනය තුළ අලුත් දිශානතියක් දැන් ඇති වෙලා තිබෙනවා කියන එක අපි දකිනවා. ගරු ඇමතිතුමා දැන් ඒ පිළිබඳව කරුණු කිහිපයක් පැහැදිලි කළා. ඒ නිලධාරින් දෙදෙනාට පූර්ණ සහයෝගය ලබා දීමට මේ ආණ්ඩුව කටයුතු කරන්න කියන එකයි අපේ ඉල්ලීම.

මීට දවස් කිහිපයකට පෙර මහෙස්ත්‍රාත් උසාවියේ මේ නඩුව කැඳවද්දී; විශේෂයෙන්ම අත්අඩංගුවට අරගෙන තිබෙන රාජ්‍ය බුද්ධි සේවාවේ හිටපු ප්‍රධානියා වන සුරේෂ් සලේ මැතිතුමාගේ ඇප ඉල්ලීමේ වාරයේදී - ගරු අධිකරණ ඇමතිතුමාත් සභාවේ ඉන්නවා - අපේ නීතිපති දෙපාර්තමේන්තුවේ කිසිම කෙනෙක් පැමිණ සිටියේ නැහැ. මහෙස්ත්‍රාත්වරයා අහපු ප්‍රශ්නවලට පිළිතුරු දීමේ හැකියාවක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින්ට තිබුණේ නැති බව අපි දැක්කා. මෙවැනි වැදගත් නඩුවලදී නීතිපතිතුමාගේ නිලධාරින් අනිවාර්යයෙන් පැමිණ ඒවාට සහයෝගය දෙන්න ඕනෑ. ඒ සහයෝගය දෙන්නේ නැත්තේ ඇයි කියන එක විශාල ප්‍රශ්නයක්. ඒ අනුව, මේ රජයටත් යම් බලපෑමක් තිබෙනවාද කියන සැකය අපට මතු වෙනවා. එබැවින් ඒ පිළිබඳව කටයුතු කරන්න කියන ඉල්ලීමත් අපි කරනවා.

විශේෂයෙන්ම මේ සිද්ධිය පිළිබඳව නිරන්තරයෙන් සලකා බලද්දී අපි නොයෙකුත් කාරණා දකිනවා. වැදගත් සාක්ෂිකරුවෙකු හැටියට අපට ඉදිරිපත් කළ හැකිව තිබුණේ සහරාන්ගේ බිරිඳ හාදියා කියන තැනැත්තියයි. ඒ කොමිෂන් සභාවේ සභාපතිතුමා සහරාන්ගේ බිරිඳගේ සාක්ෂි කැඳවීමට යද්දී නීතිපති දෙපාර්තමේන්තුව ඒකට විරුද්ධ වුණා. ඇයි එහෙම විරුද්ධ වුණේ? නමුත්, අන්තිමට සභාපතිතුමාගේ තීරණය මත ඒ සාක්ෂිය රහසිගතව පටිගත කළා. ඒක දැනට වාර්තාවේ තිබෙනවා. ඒවා දකිද්දී, අපි බලනවා හාදියාව අපරාධකාරියක් හැටියට. දැන් එතුමියට විරුද්ධවත් නඩු පවරා තිබෙනවා. ඒ නඩු පැවරීම මහ හැරලා එතුමිය සාක්ෂි හැටියට තබා ගත්තා නම් මේ නඩුකරවලින් ඊට වඩා දේවල් ඔප්පු කර ගන්න පුළුවන් වේවි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම ප්‍රහාරය සම්බන්ධයෙන් දැනට නඩු 41ක් පවරා තිබෙනවා. මෙහිදී අප දිගින් දිගටම දකින දෙයක් තිබෙනවා. ඒ නඩුවලින් හිජාස් හිස්බුල්ලා, අහ්නාෆ් ජසීම්, අසාත් සාලි, Dr. Shafi හැර අනෙක් හැම නඩුවකටම ශානි අබේසේකර සහ රවී සෙනෙවිරත්න අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාරව හිටපු කාලයේ - ශානිලාගේ කාලයේ - ලබා ගත් සාක්ෂි තමයි උපයෝගී වෙලා තිබෙන්නේ. ඊට පසුව කිසි දෙයක් වෙලා නැහැ. අපි ඒක දකිනවා.

මේ කාරණය ඉදිරියට යන කොට තවත් නොයෙකුත් දේවල් හෙළිදරව් වෙන්න ඉඩ තිබෙනවා. විශේෂයෙන්ම ඒ හෝටලයේ සහරාන් හිටපු කාමරයට යාබද කාමරයේ - ඒ floor එකේම - හිටපු විදේශිකයන් තුන් දෙනෙක්, බෝම්බ පිපුරුණාට පස්සේ හෝටලයටත් කියන්නේ නැතිව තමන්ගේ රටට ගිහිල්ලා Hotel Managerට දුරකථන පණිවුඩයක් දීලා තිබෙනවා. ඒ තුන්දෙනා ඇයි ගියේ, ඇයි එතැන හිටියේ? ඒ ගැන තවම හොයලා නැහැ. ඒ පිළිබඳව සොයා බලන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි. තවත් සිද්ධීන් කිහිපයක් තිබෙනවා. විශේෂයෙන්ම චවුනතිව් සිද්ධිය. අසාද් මවුලානා "Channel 4" නාළිකාවට කරුණු හෙළිදරව් කරපු සිද්ධියෙන් පස්සේ අසාද් මවුලානාගේ සාක්ෂිය සටහන් කර ගැනීමේ අවශ්‍යතාවක් තිබෙනවා. ඒකට අවශ්‍ය වන නීතිය පනවා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි. කථාව අවසන් කරන්න.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
The Code of Criminal Procedure Act has been amended; also the Assistance to and Protection of Victims of Crime and Witnesses Act is there. So, using those provisions, Azad Maulana's evidence have to be recorded, even remotely. I think that has to be done very fast so that the entire inquiry could go in the correct direction. Therefore, these matters have to be brought up.

Together with that, we expect that those two officers who have done a wonderful job in bringing this inquiry at least to this stage would continue to be assisted by the Government, particularly by the Attorney-General's Department so that the inquiry could, finally, bring out the real masterminds behind the incident. Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.37]

**ගරු (මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා (විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා)**

(மாண்புமிகு (பேராசிரியர்) கிரிஷாந்த அபேசேன - விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சர்)

(The Hon. (Prof.) Chrishantha Abeysena - Minister of Science and Technology)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාස්කු ඉරිදා ප්‍රහාරය සිදු වෙලා අප්‍රේල් 21වැනි දාට අවුරුදු 7ක් පිරෙනවා. මම ගිය අවුරුද්දේත් පාස්කු ඉරිදා ප්‍රහාරය පිළිබඳ සභාව කල් තැබීමේ විවාදයකට සහභාගි වුණා මට මතකයි. මේ වෙද්දී පාස්කු ප්‍රහාරය පිළිබඳ නඩු කිහිපයක්ම පවතිනවා. මා දන්නා විධියට ඒක පොඩි ගණනක් නොවෙයි. එකී නඩු අධිකරණයේ විභාග වෙද්දී මේ කාරණය ගැන තවදුරටත් පාර්ලිමේන්තුවේ විවාද කිරීම උචිතද කියන ප්‍රශ්නය මතු වෙනවා. අධිකරණයේ නඩු පවතිද්දී මෙවැනි යෝජනා ගෙන ඒම පිළිබඳව මගේ විරෝධය දක්වනවා.

මෙම සිදුවීම ගැන සොයා බලන්න ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කර තිබූ බව අපි දන්නවා. ඒකේ reports තිබෙනවා. ඒවායෙන් තමයි අපට කරුණු ගන්න පුළුවන් වෙන්නේ. විපක්ෂය අද මතු කරපු අදහස් ගිය අවුරුද්දේත් කිව්වා. ඒවා එකම දේවල්. රිබ්‍රිහිම් ගැන කියනවා. ඔච්චර තමයි කියන්න තිබෙන්නේ. ඊට වඩා දෙයක් කිව්වේ නැහැ. ඉතින්, මේක පූර්වාදර්ශයක් නොවිය යුතුයි. මේ කාරණය ගැන අධිකරණයේ විභාග වෙද්දී මේ කරන දේවල් බලපෑම් හැටියට තමයි සලකන්න පුළුවන් වෙන්නේ. මොකද, බලපෑම් මීට ඉස්සෙල්ලාත් වෙලා තිබෙනවා.

ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා සඳහන් කළා, පිල්ලෙයාන්ගේ පොත ගැන. පිල්ලෙයාන්ගේ පොතේ තිබෙන්නේ මොකක්ද? අවසානයේදී කියන්නේ, මුස්ලිම් අන්තවාදය මේකට වග කියන්න ඕනෑ කියලායි. ඊයේ පෙරේදා දවසක ගම්මන්පිලත් පොතක් එළියට දැම්මා නේ. ඒකෙන් මොකක්ද කියන්නේ? ඒත් ඒකම නේ කියන්නේ. ඊට වඩා කිසි දෙයක් කියන්න නැහැ. ඇයි, මෙහෙම පොත් එළියට දමන්නේ? මහ මොළකරු කවුද කියලා ඔය පොත්වලින් කියන්න පුළුවන් නම්, මෙච්චර දඟලන්න ඕනෑ නැහැ නේ. දේශපාලනිකව බලපෑම් කරන්න හදනවා, අද පවත්වාගෙන යන පරීක්ෂණවලට. නඩු පවරා තිබෙනවා විතරක් නොවෙයි, අද ගොඩක් පරීක්ෂණ කරගෙන යනවා.

ඒ වාගේම අපි දැක්කා, විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාත් එතැන හිටියා. ඒ විතරක් නොවෙයි, ඒ පොත එළිදැක්වීමේ උත්සවයට පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් චෝදනා ලබන දේශපාලන ව්‍යාපාරවල නායකයෝ ටික, හිටපු ජනාධිපතිවරු හිටියා. ඒ ගොඩේ තමයි විපක්ෂ නායකතුමාත් හිටියේ. ඉතින්, විපක්ෂ නායකතුමා එතැන සිටීම පිළිබඳවත් නොයෙක් ප්‍රශ්න තිබෙනවා. සමගි ජන බලවේගයේ සමහර මන්ත්‍රීවරු කිව්වා, ඒක AI නිර්මාණයක් කියලා. අදත් සමහර අය ඒ ගැන එක එක දේවල් කියනවා. ඒ නිසා මේ වෙද්දී සමගි ජන බලවේගයත් කෑලිවලට බෙදිලාද කියලා හිතාගන්න අමාරුයි. සමහර අය කිව්වා, විපක්ෂ නායකතුමා එතැනට ගියේ කාල බලලාද කියලා. කාලා බලන්න දෙයක් නැහැ නේ. එතුමා දේශපාලනඥයෙක් නම් එතුමාට දේශපාලන බුද්ධියක් තිබෙන්න ඕනෑ මේ කොයි වාගේ තැනක්ද කියලා. ඒ තරම් බොළඳ ද, දන්නේ නැතුව එතැනට ගියා කියන්න? ඒ විතරක් නොවෙයි. අපි මාධ්‍යයෙන් දැක්කා, හිටපු පොලිස් ඇමති චෝදනා කරනවා, ISවලට සම්බන්ධ අය සමගි ජන බලවේගයේත් ඉන්නවා කියලා. අපි දන්නේ නැහැ, හිටපු පොලිස් ඇමති තමයි එහෙම කියන්නේ.

අද කථා කරනවා ඒකාබද්ධ විපක්ෂයක් ගැන. දැන් ඒකාබද්ධ විපක්ෂයක් නොවෙයි තිබෙන්නේ. කෑලි කෑලිවලට කැඩෙන ලෙවල් එකේ විපක්ෂයක් තමයි අද තිබෙන්නේ. අපි දන්නේ නැහැ විපක්ෂ නායකතුමාට ඩීල් එකක් තිබෙනවාද කියලා, නාමල් රාජපක්ෂලාගේ පොහොට්ටුවත් එක්ක. ඒවා අපි දන්නේ නැහැ. අපි කොහොමද ඒවා දන්නේ?

පාස්කු ප්‍රහාරය කුමන්ත්‍රණයක් කියලා කිව්වා හිටපු නීතිපති දප්පුල ද ලිවේරා මහත්මයා. ඇත්තටම, ඒක කුමන්ත්‍රණයක් තමයි. අපි දන්නවා, ඒ දේශපාලන පෙළ ගැස්වීම ගැන; පාස්කු ප්‍රහාරයට පෙර සිද්ධ වුණු වවුනතිව් ප්‍රහාරය ගැන. අපි අදත් ඒ ගැන සඳහන් කළා. ඒක බැර කළේ එල්ටීටීඊ සංවිධානයට; අජන්තන්ට. හැබැයි, ඒක එහෙම නොවෙයි. අපේ ආණ්ඩුව විසින් අද හොයාගෙන තිබෙනවා, ඒක මුස්ලිම් අන්තවාදය විසින් ඇති කරපු දෙයක් කියලා. ඒ නිසා එදා හිටපු රාජ්‍ය නිලධාරින් මේවා ගැන දැන දැනම ඇත්ත වසන් කළා. අපේ රටේ තිබුණා දේශපාලන බලයට යම් කෑදරකමක්. ඒ කෑදරකම නිසා එක පැත්තකින් මුස්ලිම් අන්තවාදයට සල්ලි දුන්නා; ඒ account එකෙන්ම දකුණේ අන්තවාදයටත් සල්ලි දුන්නා. අන්න එහෙම තමයි මේ රට කෑවේ. එක අන්තවාදයක් එද්දී, ඒකට සාපේක්ෂව අනෙක් පැත්තෙන් අනෙක් අන්තවාදයත් උඩට එනවා. ඒගොල්ලන්ගේ දේශපාලනය ඒක තමයි. ඒ කට්ටියට "රාජපක්ෂ නිකාය" කියලාත් කියනවා. අන්න ඒ අය එකිනෙකා අවුස්සගන්නවා, අන්තවාදය නිසා. ඒ දේශපාලනය අපේ රටින් දැන් අපි අයින් කර තිබෙනවා.

පාස්කු ඉරු දින ප්‍රහාරය ඇති වුණේ යහ පාලන ආණ්ඩුව කාලයේ. ඒ ප්‍රහාරය වෙන්න ඉස්සෙල්ලාත් හරියට කටයුතු කළේ නැහැ. බුද්ධි තොරතුරුත් තිබිලාත් ඒක වළක්වා ගැනීම සඳහා කිසිම කටයුත්තක් කළේ නැහැ. ඒ වාගේම ඒ ප්‍රහාරය වුණාට පසුවත් යහ පාලන ආණ්ඩුව විසින් කිසි දෙයක් කළේ නැහැ. ඒගොල්ලන් තමයි අවුරුදු එකහමාරක් බලයේ හිටියේ. හැබැයි, අද කථා කරනවා, අපේ මේ ආණ්ඩුව කාලයේ තමයි පාස්කු ප්‍රහාරය වෙලා තිබෙන්නේ කියන විධියට. ඒ විධියට තමයි අද කථා කරන්නේ; මිනිස්සු අන්දවන්න හදන්නේ. දැන් අපි අලුත් විමර්ශන කටයුතු කරමින් යනවා. හිටපු බුද්ධි අංශ ප්‍රධානී සුරේෂ් සලේව දැන් අත්අඩංගුවට ගෙන තිබෙනවා. එතුමා රාජ්‍ය සේවකයෙක්. රටකට බුද්ධි අංශයක් මොකටද? බුද්ධි අංශයක් ඕනෑ රාජ්‍යය ආරක්ෂා කරන්නයි. බුද්ධි අංශ නිලධාරින්ගේ ප්‍රධාන කාර්යය තමයි රාජ්‍යය ආරක්ෂා කිරීම. ආණ්ඩු ආරක්ෂා කිරීමවත්, ආණ්ඩු පවත්වා ගැනීමවත්, ආණ්ඩු පෙරළීමවත් නොවෙයි බුද්ධි අංශවල රාජකාරිය. ඉතින්, ඒ නිලධාරින්ගෙන් හරි දෙයක් වෙලා නැහැ. මම කියන්නේ, සලේ විතරක් නොවෙයි තව අය ඇති. මේකට සම්බන්ධ අය හමුදාවේ ඇති; පොලිසියේ ඇති. අපි නොදැනුවත් අය තව ඕනෑ තරම් ඇති. අපට වැඩක් නැහැ තරු. තරුවලින් අපට වැඩක් නැහැ. රාජ්‍ය නිලධාරින්ට විතරක් නොවෙයි, මේකට සම්බන්ධ දේශපාලනඥයන්ට අපි ඉස්සරහදී තරු පෙන්වනවා. අපේ විමර්ශනවල කිසිම අඩුපාඩුවක් නැහැ. අපි කියපු විධියටම ඒ කටයුතු කරගෙන යනවා.

අපේ ජාතික ජන බලවේගය ආණ්ඩුව ප්‍රතිඥාවක් දුන්නා. ඒ ප්‍රතිඥාවේ කරුණු 7ක් තිබුණා. මේ වෙද්දී ඒ කරුණු හතේම ලොකු ප්‍රගතියක් තිබෙනවා. අපි මහ මොළකරු කියන අය - එක්කෙනෙක් වෙන්න පුළුවන්, කිහිපදෙනෙක් වෙන්න පුළුවන් - අධිකරණය ඉස්සරහට ගෙනියන්න, නීතිය ඉදිරියට ගෙනියන්න අවශ්‍ය කටයුතු කර තිබෙනවා. ඒ වාගේම මේ ප්‍රහාරය වැළැක්වීමට කටයුතු නොකිරීම පිළිබඳ විභාග වනවා; තවදුරටත් විභාග වනවා. ඒ වාගේම ඒ පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාව තිබෙනවා. ඒ වාර්තාව මෙච්චර කල් එළියට දුන්නේ නැහැ. ඒක පාර්ලිමේන්තුවේ විතරයි තියා ගත්තේ. අපේ ආණ්ඩුව ආවාට පස්සේ තමයි ඒක එළියට දැම්මේ. අද ඒක කියවන්න පුළුවන්. ඒ විධියට පාරදෘශ්‍යභාවයකින් අපි කටයුතු කර තිබෙනවා. ඒ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ කියලා

තිබෙනවා, අපරාධකරුවෝ ගැන. ඒ යටතේ දැනටමත් කිහිප දෙනෙකුට මම දන්නා විධියට 10කට වැඩි පිරිසකට - 20ක්, 25ක් වෙන්නත් පුළුවන් - නඩු පවරා තිබෙනවා. ඒ සමහර නඩු අපරාධ නඩු. ඉතින්, මේ විධියට තමයි අපි පාස්කු ඉරු දින ප්‍රහාරය පිළිබඳ ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නේ. ඒ වාගේම අපි අපේ ප්‍රතිඥාවේදී කිව්වා වාගේ ප්‍රමුඛතාව පදනම් කරගෙන ඉක්මනට නඩු අහනවා. දැනුත් දවස ගාණේ නඩු අහනවා, පාස්කු ඉරු දින ප්‍රහාරය පිළිබඳව. ඉතින් අපි දීපු පොරොන්දු, අපේ ප්‍රතිඥාව ඉටු කරමින් යනවා.

මතක තබා ගන්න, මේ ප්‍රහාරය සිද්ධ වෙලා දැන් අවුරුදු 7කට කිට්ටු වෙලාය කියන එක. මේ අවුරුදු 7 තුළ තිිබියේ වෙනත් ආණ්ඩු. ඒවාට සම්බන්ධ වෙච්ච ආණ්ඩු, නිලධාරින්. සමහර විට ඒ නිලධාරින් තවත් ඉන්න පුළුවන්. හැබැයි, මේ අයම තමයි මේක පිටුපසට අදින්නේ. ඒ අභියෝග ඔක්කොම හමුවේ අපි ඉස්සරහට යනවා. මේ වෙද්දී ගරු කාදිනල් උන්නාන්සේ ඇතුළු කතෝලික සභාව අපි කෙරෙහි විශ්වාසය තබා තිබෙනවා. අපි කරන වැඩ කටයුතු කෙරෙහි විශ්වාසය තබාගෙන ඉන්නවා. ඒ විතරක් නොවෙයි, මුළු රටේම ජනතාව අපි ගැන විශ්වාසය තබා ගෙන ඉන්නවා.

අවසාන වශයෙන්, ශුද්ධ වූ බයිබලයේ පාඨයකින් මගේ කථාව අවසන් කරන්නම්.

"නඩු තීන්දුවක් දෙන විට සාධාරණව සිතිය යුතුයි. දිළින්දාගේ පහත් තත්ත්වයවත්, බලවතාගේ උසස් තත්ත්වයවත් නොසලකා සාධාරණ ලෙස නුඹේ අසල්වැසියා විනිශ්චය කළ යුතුයි." බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු එම්.ඒ.එම්. තාහිර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 2ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.48]

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று விவாதத்துக்கு எடுத்துக்கொள்ளப்பட்டுள்ள விடயமானது, ஒட்டுமொத்த முஸ்லிம் சமூகத்தையும் பயங்கரவாதிகளாகக் காட்டுவதற்காக மேற்கொள்ளப்பட்ட 'ஈஸ்டர்' குண்டுத் தாக்குதல் சம்பந்தமானது. கிழக்கு மாகாணத்தைச் சேர்ந்த ஒருவரையே இந்தத் தாக்குதலின் சூத்திரதாரியாகக் குறிப்பிட்டு இருக்கிறார்கள். இந்த நாட்டின் பல இடங்களிலும் மேற்கொள்ளப்பட்ட 'ஈஸ்டர்' குண்டுத் தாக்குதலானது, உயிர்களை மாத்திரம் காவுகொள்ளவில்லை. முஸ்லிம் சமூகத்தை இந்த நாட்டிலுள்ள ஏனைய இனத்தவர் களிடமிருந்து தூரப்படுத்துவதாகவும் அமைந்திருந்தது. இவ்வாறான ஒரு தாக்குதல் எதற்காக நடத்தப்பட்டது? என்பதை இங்கு பேசிய அனைவரும் வெளிப்படையாகச் சொல்கின்றார்கள். அண்மையில் இடம்பெற்ற ஒரு புத்தக வெளியீட்டு நிகழ்விலும் இந்தத் தாக்குதலின் சூத்திரதாரி இருக்கிறார் என்று வெளிப்படையாகச் சொன்னதை நாங்கள் பார்த்தோம். நாங்கள் அரசாங்கத்திடம் விநயமாகக் கேட்டுக் கொள்வது என்னவென்றால், நீதிமன்றத்தில் இவ்விடயம் சம்பந்தமான வழக்குகள் இருக்கின்றதெனக் கூறி காலத்தை இழுத்தடிக்க வேண்டாம் என்றுதான். உங்களை நம்பி ஒட்டுமொத்த முஸ்லிம் சமூகமும் வாக்களித்ததன் நோக்கம், கடந்த கால அரசாங்கம் முஸ்லிம் சமூகத்துக்கு எதிராக நடத்திய இந்தத் தாக்குதலால் பாதிக்கப்பட்டவர்களுக்கு இதுவரை கிடைக்காமல் இருக்கின்ற நீதியைப் பெற்றுக் கொடுக்க வேண்டும் என்பதுதான்.

“ஒரே கையொப்பத்தில் 'ஈஸ்டர்' குண்டுத் தாக்குதலின் சூத்திரதாரியைக் கண்டுபிடித்து, அவருக்கான தண்டனையை வழங்குவோம்” என்று மாண்புமிகு சனாதிபதி அவர்கள் வாக்குறுதி அளித்திருந்தார். நீங்கள் இந்த விடயத்தை முன்வைத்து மூன்று தேர்தல்களில் வெற்றி பெற்றீர்கள். ஒன்று, சனாதிபதித் தேர்தல். அடுத்தது, பொதுத் தேர்தல். மற்றையது, உள்ளூராட்சி மன்றத் தேர்தல். இவை எல்லாம் முடிந்து, 2025 மார்ச் மாதம் 'ஈஸ்டர்' குண்டுத் தாக்குதலின் சூத்திரதாரியை வெளிப்படுத்துவதாகக் கூறியும்கூட, இதுவரை நீங்கள் அதைச் செய்யவில்லை. இப்போது நீங்கள், இவ்விடயம் தொடர்பில் நீதிமன்றத்தில் வழக்குகள் இருப்பதாகக் கூறுகின்றீர்கள். நாங்கள் இந்த விடயம் தொடர்பில் அழுத்தம் கொடுக்கும்போது, “எங்களுக்கு அழுத்தம் தர வேண்டாம்” என்று நீங்கள் கூறுகிறீர்கள். ஏன் நான் இதைக் கூறுகின்றேன் என்றால், இந்தத் தாக்குதலால் ஒட்டுமொத்தமாகப் பாதிக்கப்பட்டது முஸ்லிம் சமூகம் என்பதனால்தான்.

குறிப்பாக, எங்களுடைய தேசியத் தலைவர் கௌரவ றிஸாட் பதியுதீன் அவர்களை அநியாயமாக இச்சம்பவத்துடன் தொடர்புபடுத்தி, அவர்தான் இதற்கு முழுப் பொறுப்புடையவர் என்பதுபோல சித்திரிக்க முற்பட்டார்கள். இந்தத் தாக்குதலின் சூத்திரதாரியாக இன்று கைதுசெய்யப்பட்டு இருப்பவர், சுரேஷ் சலே அவர்கள்! கொசுக்கடி, எலித்தொல்லை போன்றவற்றைத் தாங்க முடியாதுள்ளதாகவும் தன்னால் சிறையில் இருக்க முடியாதுள்ளதாகவும் அவர் கூறியிருக்கிறார். ஆனால், இதே 'ஈஸ்டர்' குண்டுத் தாக்குதலைக் காரணங்காட்டி, முஸ்லிம் உலமாக்கள், இளைஞர்கள், யுவதிகள், அரசியலில் சார்ந்தவர்களென 500க்கும் மேற்பட்டவர்களை அப்போதிருந்த அரசாங்கம் வேண்டுமென்றே கைது செய்தது. அவ்வாறானதோர் அநியாயத்தைச் செய்வதற்கு எப்படி அப்போதிருந்த ஆட்சியாளர்களுக்கு மனம் வந்தது என்பதை எங்களால் புரிந்துகொள்ள முடியாமல் இருக்கின்றது.

இந்தத் தாக்குதலால் பாதிக்கப்பட்டவர்கள் முஸ்லிம்கள்! இந்தத் தாக்குதல் இடம்பெற்ற காலப் பகுதியில் எங்களுடைய முஸ்லிம் மக்கள் தமது வீடுகளில் புனித அல்-குர்ஆனைக்கூட வைத்திருக்க முடியாத ஒரு சூழ்நிலை ஏற்பட்டது. அதுமாத்திரமன்றி, மரக்கறி cut பண்ணுவதற்குப் பயன்படுத்தும் கத்தி மற்றும் அரபு எழுத்துக்கள் அடங்கிய நூல்கள், ஹதீஸ் புத்தகங்கள் என்பவற்றை வைத்திருக்க முடியாத சூழல் நிலவியது. எமது பெண்கள் கலாசார ஆடைகளை அணிந்து பாடசாலைக்கு அல்லது பொது இடங்களுக்குச் செல்ல முடியாத அளவுக்கு நிலைமையை ஏற்படுத்தினார்கள். தற்போதைய அரசாங்கத்தினர் இந்தத் தாக்குதலின் சூத்திரதாரியைக் கண்டுபிடித்து மக்களுக்கு வெளிப்படுத்துவதாகக் கூறியும், காலத்தை இழுத்தடிக்கிறார்கள். எனவே, இந்த விடயத்தை அவசரமாக முன்னெடுக்க வேண்டுமெனக் கேட்டு, விடை பெறுகின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු බිමල් රත්නායක ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.52]

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. පාස්කු ඉරු දින ප්‍රහාරය පිළිබඳව අද දින පැවැත්වෙන සභාව කල් තබන අවස්ථාවේ විවාදයේදී ආණ්ඩු පාර්ශ්වය පැත්තෙන් කරුණු රාශියක් ඉදිරිපත් කර තිබෙනවා.

මේ සිද්ධිය වෙච්ච මොහොතේදී දැවැන්ත ජාතිවාදී බලයක් රාජපක්ෂලා ගොඩ නඟාගෙන තිබුණු වෙලාවකදීත්, පාස්කු ප්‍රහාරයෙන් පසුවත් "මේ පැලෝපීය නාල කථාව බොරු, Dr. Shafiලා මෙහෙම කළා කියන්නේ බොරු" කියලා විරුද්ධ පාර්ශ්වය පැත්තේ ඉඳගෙන අපිට කථා කරන්න ධෛර්යයක් තිබුණා. අපි ඒ වෙලාවේත් කිව්වා, පැහැදිලිව මේක මුස්ලිම් ජනතාව විසින් කරපු දෙයක් වෙන්න බැහැ, මේ පිටුපස්සේ අනිවාර්යයෙන්ම දැඩි දේශපාලන සැලැස්මක් තිබෙනවා කියලා. පක්ෂයක් ලෙස අපි ඡන්ද බලාගෙන දේශපාලන ස්ථාවරයන් වෙනස් කර ගන්නවත්, එදා දරපු ස්ථාවරය එක දශමයකින්වත් වෙනස් කර ගන්නවත් කටයුතු කළේ නැහැ. ඒ වෙලාවේ අපට ගැටලුවක් ඉදිරිපත් වුණා. අපේ පක්ෂයෙන් 2015 ජාතික ලැයිස්තුවට ඉදිරිපත් වෙච්ච රිෂ්‍යාඩ් හිජාස්ගේ පවුලේ අය මේකට සම්බන්ධ නිසා අපට විශාල චෝදනාවක් එල්ල කළා. ඒ වෙලාවෙත් අපි කිව්වා, ඔහුට අදාළව පරීක්ෂණ කරන්න කියලා. පරීක්ෂණ කළා. පරීක්ෂණ කරලා නිදහස් කර තිබෙනවා. මා දන්නා තරමින් ඔහුගේ දේපළත් නිදහස් කර තිබෙනවා. අවුරුදු ගාණක් රනිල්-මෛත්‍රී ආණ්ඩුවෙන් සිරගත කරගෙන හිටියේ. ඊට පස්සේ ගෝඨාභයගේ ආණ්ඩුවෙන් තමයි නිදහස් වුණේ. මම හිතන විදියට, එතුමාගේ දේපළත් දැන් නිදහස් කරලා තිබෙනවා. ඇප පිට ඉන්නවාද, උසාවියෙන් නිදහස් වෙලාද කියලා මම දන්නේ නැහැ. නමුත් මේ තත්ත්වය ගොඩනැගුණේ කොහොමද කියන එක පිළිබඳව අපට පැහැදිලි අදහසක් තිබුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඕනෑම තත්ත්වයකදී ජාතිවාදී නොවී සිටීමේ දේශපාලන ධෛර්යය ජනතා විමුක්ති පෙරමුණටත්, ජාතික ජන බලවේගයටත් තිබෙනවා. අපි ඡන්ද බලාගෙන නොදන්නා පොත් එළි දක්වන තැන්වලට ගියේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටක විපක්ෂ නායකවරයෙක් කියනවා නම්, "Invitation එක දුන්නා. මම දැනගෙන හිටියේ නැහැ, මම ගියා. ඊට පස්සේ තමයි දැන ගත්තේ" කියලා, එතුමා රටක් පාලනය කරන්නේ කොහොමද? ගිහිල්ලා අනාථ වුණාට පස්සේ කියනවා, ඒ AI කියලා. එතුමාගේ පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් කියනවා, ඒ AI කියලා. මම ඒක පැහැදිලි කරන්නම්. ඒ නිසා මොන ජාතිවාදී කෝලාහලයක් මැද්දේ වුණත්, අපේ ඡන්ද බිංදුවට වැටෙද්දීත් අපට අපේ දේශපාලන ස්ථාවරයන් හොළවා ගන්නේ නැතුව ඉන්න පුළුවන්. ඒ දේශපාලන ධෛර්යය අපේ පක්ෂය අවුරුදු 50ක්, 60ක් තිස්සේ අපට දීලා තිබෙනවා. හිර ගෙවල් ඇතුළේදී පාවා දුන්නේ නැත්නම් පාර්ලිමේන්තුව තුළ කොහොමත් පාවලා දෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මේ පාස්කු ප්‍රහාරයේ කථාව ගත්තොත් මෙන්න මෙහෙමයි. මෙතැන ගොඩක් අය මේ ගැන කිව්වා. කවුද මේකේ වින්දිතයෝ? ඒක ලෙහෙසියි සොයා ගන්න. මෙහි වින්දිතයෝ, මැරිච්ච අය 300යි; ඒගොල්ලන්ගේ ඥාතීන් හය හත්දහසක් වාගේම මේකේ අතිවිශාලතම වින්දිතයෝ මේ රටේ මුස්ලිම් ජනතාව බව මම හැමදාම කියලා තිබෙනවා. ඔවුන් තමයි මේකෙන් කළුම කළු වෙලා මේ රටට එරෙහි ප්‍රජාවක් විදියට රාජපක්ෂලා වර්ගීකරණය කරන මට්ටමට ආවේ. මම හිතන විදියට, සාධාරණ මුස්ලිම් මිනිහෙකුට ලංකාවේ ඉන්න බැරි මට්ටමේ වෛරී සහගත වටපිටාවක් මේ පාස්කු ප්‍රහාරයෙන් පසුව ගොඩනැගුණා. ඒ නිසා ප්‍රධාන වශයෙන් ගත්තොත්, ඒ මිය ගිය, මරා දමන ලද ක්‍රිස්තියානි, කතෝලික - සමහර විට වෙන ආගම්වල අයත් ඉන්න පුළුවන් - ජනතාවත්, ඒ වාගේම ඒකෙන් ප්‍රජාවක් ලෙස බැට කාපු ඔය Dr. Shafi ඇතුළු පොදුවේ මුස්ලිම් ජනතාවත් මේකේ වින්දිතයෝ වශයෙන් හඳුන්වන්න පුළුවන්.

දැන් වින්දිතයා පැහැදිලියි. මෙහි අපරාධකරුවෝ කවුද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අපරාධයේ ලොකු කොටස් දෙකක් තිබෙන බව මම විශ්වාස කරනවා. අපරාධයට කලින් එකයි, අපරාධයයි, අපරාධයෙන් පසුවයි. මේ අපරාධය හරි පැහැදිලියි. මුස්ලිම් මිනිස්සුන්ට ගහන්න ඕනෑ කියන මතය හදන්න රාජපක්ෂ ගැති සමහර බුද්ධි අංශත් එකතු කරගෙන, පොලිසියේ හිටපු සමහර කට්ටියත් එකතු කරගෙන 2012 ඉඳන් රාජපක්ෂලා අවුරුදු හයක් වැඩ කළා. අපි කවුරුත් දන්නවා, ජනාධිපතිතුමාත් කිව්වා; හිටපු ජනාධිපතිතුමාත් කිව්වා, බුද්ධි අංශයේ එකම ශිෂ්‍යයා වගේ තමයි බොදුබල සේනා එකටයි මුස්ලිම් අන්තවාදය පතුරවන එකටයි ගෙව්වේ කියලා. ඇත්තටම 2012 ඉඳලා රාජපක්ෂලා බලයේ සිටියදී තමයි මුස්ලිම් විරෝධී දේශපාලන පසක් මේ රටේ හදන්න තීන්දු කළේ. මොකද, යුද්ධය ඉවර වුණාට පසුව දෙමළ විරෝධය අවසන් කරලා මිනිස්සුන්ට මොනවා හරි විරෝධයක්, සතුරෙක් පෙන්වා ගන්න ඕනෑ නිසා අපේ රට තුළ මුස්ලිම් විරෝධී පසක් හදන්න විශාල වැඩ පිළිවෙළක් ගෙනිච්චා. ඒ නිසා රාජපක්ෂලා විශාල වශයෙන්, දේශපාලන වශයෙන්, හමුදාමය වශයෙන් ඒකට invest කළා. ඒ investment එක ඇතුළේ; දේශපාලන වශයෙන් කරපු දේවල් ඇතුළේ මුස්ලිම් ජනතාව අන්තවාදයට ගොදුරු කර ගැනීමේ ජාත්‍යන්තර සැලැස්මක් තිබෙනවා. ඒක බොරුවක් නොවෙයි. මුස්ලිම් ජනතාව විශාල වශයෙන් ඒකට ගොදුරු වෙලා තිබෙනවා; දරුවන් ගොදුරු වෙලා තිබෙනවා. මොකද, මේ පැත්තෙන් ගහනකොට අර පැත්තෙන් තල්ලු වෙනවා. අද ඇමෙරිකාව ගහන හැම මිසයිලයකටම දරුවෝ ටිකක් අනෙක් පැත්තෙන් තල්ලු වෙනවා. ඒක තමයි ඇත්ත. මොකද, අසාධාරණ ලෙස කටයුතු කරනකොට ඒක සිද්ධ වෙනවා. ඒ නිසා රාජපක්ෂලා මොකක්ද කළේ? අන්න ඒ ලෝක තත්ත්වය යොදා ගෙන මෙතැන සහමුලින්ම මුස්ලිම් විරෝධී දේශපාලනයක් හදලා, මුස්ලිම් අයට ගැහුවාට කමක් නැහැ වාගේ නිකම් මතයක් හැදුවා. ඉස්සෙල්ලාම මිනිහෙක් මානසිකව ත්‍රස්තවාදියෙක් කරන්න ඕනෑ එහෙම නේ. එතකොට, සමාජය තුළ මෙයා ත්‍රස්තවාදියෙක්. ඉරානයට එහෙම නේ කළේ, නේද? ඉරානය කරපු වැරැද්ද මොකක්ද කියලා ඇහුවොත්, හොයා ගන්න දෙයක් නැහැ. නමුත් ඉරානය නිකම් වැරදියි වාගේ නේ, ඊයේ පෙරේදා වෙනකම්ම තිබුණේ. එවැනි මතයක් හදන්න ඕනෑ. ඉස්සර අපටත් හැදුවා. ඒ නිසා ඉස්සෙල්ලා වැරදි කියලා තර්කයක් හදන්න ඕනෑ. ඒක තමයි රාජපක්ෂලා කළේ. ඒගොල්ලෝ ඒකට සිද්ධිත් හැදුවා. මම ඔය ගැන හොඳට කථා කරලා තිබෙනවා, පොත් යොදාගෙන; ඔය 2016 United States Presidential Election එක දිනන්න propaganda විතරක් නොවෙයි, සමාජ තත්ත්වයක් නිර්මාණය කරගත්තේ කොහොමද කියලා. මැතිවරණය දිනන්න අවශ්‍ය කරන සමාජ තත්ත්වයක් නිර්මාණය කරනවා. මැතිවරණය දිනන්න advertisements දාන එක, පොඩි පොඩි රැස්වීම් තියන එක නොවෙයි ප්‍රධාන වෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔවුන් මැතිවරණය දිනන්න අවශ්‍ය කරන සමාජ තත්ත්වයක් නිර්මාණය කළා. ඒකම තමයි රාජපක්ෂලා මෙහේ කළේ. 2016දී ඇමෙරිකාවේ Republican Party එක ඒක කළා. ඒ ගැන ලියපු හොඳ පොතකුත් තිබෙනවා,

"Mindf*ck" කියලා. කොහොමද ඒ programme එක ගියේ කියලා එහි තිබෙනවා. ප්‍රහාරයට කලින් සැලැස්ම, මතය හැදීම, සිදුවීම්වලින් මුස්ලිම් මිනිස්සුන්ට ගහන්නම ඕනෑය කියන මතය හදපු එක. දෙක ප්‍රහාරය. ප්‍රහාරයෙන් පස්සේ, ප්‍රහාරය කළේ කවුද කියලා සොයා ගන්න බැරි වෙන්න ප්‍රහාරකයන්ට උපදෙස් දුන් කණ්ඩායම් විසින් පරීක්ෂණ කණ්ඩායම් නොමඟ යවන්න හදපු දැවැන්ත සැලැස්ම. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතනවා, මේකේ ලොකුම සැලසුම් දෙක වෙන්නේ පළමුවෙනි එකයි, තුන්වෙනි එකයි කියලා. ප්‍රහාරය, suicide. මොකද, ඒ දවස්වල check කරන්නේ නැහැ නේ, school bag එකක් වාගේ එකක් පිටේ දාගෙන ඇවිල්ලා පුපුරවනවා. එක checkpoint එකකදී හරි check කළා නම් ඒක අහුවෙනවා. ඒකට මහ ලොකු සැලසුමක් තිබුණා කියලා හිතන්න බැහැ; මහන්සි වෙන්න ඇති. නමුත් අපට පෙනෙනවා, ඒක නිකම් ගෙදර යන ගමන් තියාගෙන ගිය වැඩක් වාගේ කියලා. පළමුවෙනි එකයි, තුන්වෙනි එකයි තමයි ලොකු.

මේ ප්‍රහාරකයන් මොකක්ද කළේ? බෝම්බ පුපුරවා ගත්තේ සහරාන් ඇතුළු කණ්ඩායම බව අපි කවුරුත් දන්නවා. හැබැයි ඒකේ පළමුවෙනි කොටසයි, තුන්වෙනි කොටසයි කළේ සහරාන්ලා නොවෙයි. ප්‍රහාරය ගැන සොයද්දි හමු වනවා, ඒක කළ අය මොකද්ද කළේ කියලා. ප්‍රහාරයට අදාළ කරන පස හදපු එක විශ්ලේෂණය කරලා තමයි අපට ඒක සොයා ගන්න වෙන්නේ. ප්‍රහාරයෙන් පස්සේ විමර්ශන අනෙක් පැත්තට හරවන්න කළ කටයුත්ත තමයි මම හිතන විධියට ලංකා ඉතිහාසයේ කළ ඉතාම සූක්ෂ්ම සැලැස්ම.

මේක වුණේ 2019දී. ඒ වෙනකොට තිබුණේ රනිල්-මෛත්‍රී ආණ්ඩුව, සජිත් ප්‍රේමදාස මහත්තයාත් ඒ පක්ෂයේ ලොකු නායකයෙක්. අපි දන්නා තරමින් fresh පිට ඒ ප්‍රහාරය පිළිබඳව ඕනෑ තරම් තොරතුරු සොයන්න තිබුණා. අපි දන්නවා, ලෝකයේ සමහර බුද්ධි අංශ මෙහේ පදිංචි වෙලා අපට ඒ සඳහා උදවු කළ බව. තවත් විදේශීය බුද්ධි අංශ ඇවිල්ලා අතිවිශාල වශයෙන් අපට ඒ සඳහා උදවු කළා. හැබැයි පරීක්ෂණවලට ඒ පැවති සජබ ආණ්ඩුව - රනිල් වික්‍රමසිංහ-සජබ කියලා කියන්නත් පුළුවන් - සාධාරණයක් කළේ නැහැ; ඒක තමයි ඇත්ත.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට පස්සේ ගෝඨාභයලා බලයට පත් වුණා. ගෝඨාභය බලයට පත් වුණාට පස්සේ - අපි මේ ගැන මීට කලින් කියලාත් තිබෙනවා - ඒගොල්ලන්ගේ ප්‍රධාන උපාය මාර්ගය වුණේ මොකක්ද? මේ පරීක්ෂණය යට ගහන්න ඒගොල්ලන් දැවැන්ත තුන්වෙනි සැලැස්මක් හැදුවා. ඒ දැවැන්ත සැලැස්ම ක්‍රියාත්මක කරන්න ස්වර්ණමය මොහොතක් ආවා. ඒ, මොකක්ද? ඒක කරපු අයටම බලය ආවාට පස්සේ බුද්ධි අංශවල හිටපු අය සම්පූර්ණයෙන්ම මාරු කළා. අපි මීට කලිනුත් කියලා තිබෙනවා, CID එකේ 750ක් විතර මාරු කළා, ශානි අබේසේකරලා වාගේ අය සිරගත කළා, රවී සෙනෙවිරත්න වාගේ අය නෙරපලා දැම්මා කියලා. ඒ වාගේ විවිධ දේවල් කළා. ඊට අමතරවත් තව ගොඩක් දේවල් කරන්න ඇති. අපට අහුවෙනවා නේ නාමල්ලාගේ පක්ෂයෙන් ඡන්දය ඉල්ලපු මිද්දෙනිය පැත්තේ කෙනාත් ඉන්නවා කියලා රවිරාජ් නඩුවේ, නේද? 2016දී ලබා දුන් තීන්දුවෙන් ඒගොල්ලන් කොහොමද නිදහස් කළේ? සම්පත් මනම්පේරි. මම දන්නා විධියට උසාවියෙන් නැවත ඒ නඩුව විභාගයට ගන්නවා. ජනාධිපතිතුමා විපක්ෂයේ සිටියදී මුල සිටම මේ ගැන හරියට කියලා තිබෙනවා.

ඒ මිනීමරුවන්, ඝාතකයන් බලයට ගෙනාවාට පස්සේ ඒගොල්ලන්, ඒ ඝාතන සැලසුම් කළ අය විසින් උසාවි, පොලීසි ආදී ඒ පරීක්ෂණ ආයතන සියල්ලට මොකක්ද කළේ? ඒ පරීක්ෂණ ආයතන සියල්ල වෙනස් කළා. ඇයි එහෙම කළේ? එක පැත්තකින් ඝාතකයින් ආරක්ෂා කර ගන්නත්, අනෙක් පැත්තෙන් කවදා හරි සාධාරණ ආණ්ඩුවක් ඇවිත් ඒ පරීක්ෂණ කළොත් ඒ කටයුත්ත ඉතාම දුෂ්කර කරන්නත්, කොහෙත්ම සොයා ගන්න බැරි තරමටත් ඔවුන් ඒ සාක්ෂි විනාශ කළා. ඒ සාක්ෂි විනාශ කිරීමේ මූලික දේ තමයි, ඒ ගැන කටයුතු කළ ප්‍රධාන පර්යේෂකයෝ, විමර්ශන නිලධාරින් මාරු කරලා ඒගොල්ලන්ව දඩයම් කළ එක. ඒ වාගේ විවිධ දේවල් කරලා තිබෙනවා. මේ ජාතික ජන බලවේගයේ අපේ ආණ්ඩුව එනකොට මොකක්ද තිබුණේ? මේ මිනී මැරුමේ, මේ ඝාතනයේ freshම දේවල් කරන්න තිබුණේ සජබ ආණ්ඩුවට; රනිල්ට, සජිත්ට තමයි කරන්න තිබුණේ. නමුත් කළේ නැහැ. මොකද, එතකොට ඒ evidence වහන්න තරම් කාලයක් නැහැ. නමුත්, ඒක කළේ නැහැ. ඒ නිසා තමයි රාජපක්ෂලාට බලය ගියාට පස්සේ ඒගොල්ලන්ට ඒක තව හංගන්න පුළුවන් වුණේ. අපි ආවාට පස්සේ මොකක්ද කළේ? ඔබතුමන්ලා දන්නවා, මේ සම්බන්ධව ජනක් ද සිල්වාගේ සභාපතිත්වයෙන් කොමිෂන් සභාවක් ක්‍රියාත්මක වුණු බව. එම කමිටුව පිටු 37,000ක, වෙළුම් 80ක වාර්තාවක් ඉදිරිපත් කළා.

මොකක්ද කළේ? මෛත්‍රීපාල සිරිසේනලා, ගෝඨාභය රාජපක්ෂලා, රනිල් වික්‍රමසිංහලා ඒ වාර්තාව එළිදැක්වූයේ නැහැ. ජනාධිපතිතුමා පත් වුණාට පස්සේ අපි ඒ සම්පූර්ණ වාර්තාව ගත්තා, එය පිටු 37,000ක්. අපි teams 10ක් දාලා අද සම්පූර්ණයෙන්ම ඒ කටයුතු අවසන් කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒකේ පැහැදිලිව යෝජනා කරලා තිබෙනවා, රටේ හිටපු ප්‍රධාන පුද්ගලයන්ගේ සිට විවිධ පුද්ගලයන්ට, විවිධ සංවිධානවලට අදාළව අපරාධමය චෝදනා ගොනු කරන්න කියලා. අපි ඒවා නීතිපතිතුමාට ලබා දෙමින් තිබෙනවා. අපි හිතනවා, ඒක ජනගත කිරීමට වඩා පරීක්ෂණ කරන ආණ්ඩුවක් ආවාට පස්සේ ඒක නීතිපතිවරයාට දෙන එක හොඳයි කියලා. එහෙම නැතිව සතුරාට ඒවා ඔක්කෝම දෙන එක අත්‍යවශ්‍ය නැහැ, මේ ගැන දන්නා අයත් ඇති.

අපි අවුරුද්දක් ඇතුළත කරපු ඒවා මොනවාද කියලා අහනවා නේ. අපරාධයේ දූම දමන වෙලාවේ නොකරපු දේවල් තමයි, අපරාධකරුවා ආණ්ඩු කළාට පස්සේ අපි දැන් මේ කරන්නේ. ඒ නිසා එය අමාරුයි. ඒ අමාරුව මැද හෝ අපි ගිහිල්ලා අද හරි පැහැදිලි සාක්ෂි මත තමයි හිටපු බුද්ධි අංශ ප්‍රධානියා අත්අඩංගුවට අරගෙන තිබෙන්නේ. ඒක ආනන්ද විජේපාල ඇමතිතුමාත් කිව්වා. එහෙම නැතුව හදිසියේ තද වෙලා, අර රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා anti-Muslim context එක ඇතුළේ අත්අඩංගුවට ගත්තා වාගේ නොවෙයි මෙය කළේ. රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා අත්අඩංගුවට අරගෙන මාස හයක් හිටියා, ඔබතුමාත් victim කෙනෙක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අපි ප්‍රධාන පෙළේ අපරාධකරුවන් අත්අඩංගුවට ගන්නකොට බොහොම පරිස්සමෙන් තමයි ගන්න ඕනෑ, බේරෙන්න බැරි වෙන්න. මොකද, ඒගොල්ලන් වෙනුවෙන් ජනාධිපති නීතිඥවරුන් 100ක් ගේන්න පුළුවන්. ඒ නිසා හරියට බලලා තමයි අත්අඩංගුවට අරගෙන තිබෙන්නේ. වැරැදිකරුද, නැද්ද කියන එක උසාවිය තීන්දු කරයි.

අද වෙලා තිබෙන්නේ මොකක්ද? මේ අපරාධය වහපු අපරාධකරුවන් ආණ්ඩු කළාට පස්සේ මුළු අපරාධයේම සැලසුමට අපි මොකක්ද කරලා තිබෙන්නේ? ඒගොල්ලන් අපට වැරදි උමඟක් කපලා දීලා තිබුණා. අපි ඒ උමඟේ ගිහිල්ලා දැන් ඇත්ත හෙළිදරව් කරගෙන, ඉව තිබෙන පැත්තට ගිහිල්ලා තිබෙනවා. මම හිතන විධියට, අපි දැන් ගොඩක් දුර ගිහිල්ලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසාන නිසා කථාව අවසන් කරන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මට විනාඩියක්, දෙකක් ගරු මහින්ද ජයසිංහ ඇමතිතුමාගේ කාලයෙන් ගන්න පුළුවන් වෙයි, තව කාරණා එකක්, දෙකක් කියන්න තිබෙන නිසා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මට කියන්න ඕනෑකම තිබෙන්නේ, මේ අපරාධය සම්බන්ධයෙන් අපි පරීක්ෂණ කරන්න පටන් අරගෙන තිබෙනවා කියන එක. හැබැයි, අද වෙලා තිබෙන්නේ මොකක්ද? අද වෙලා තිබෙන්නේ දේ තමයි, ඒ මිනීමරුවොත් එක්ක, ඒ මහා ඝාතකයොත් එක්ක සජිත් ප්‍රේමදාසලා එකට වාඩිවෙන එක; එතුමාගේ පක්ෂයේ සාමාජිකයෝ එකට වාඩිවෙන එක. පසුගිය කාලයේ චෝදනාවක් කළා. ඒ මොකක්ද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම එදාත් මෙතැනදී කිව්වා, සජබයේ මන්ත්‍රීවරුන් වැඩිපුරම පහර ගැහුවේ කාටද? ශානි අබේසේකරට, රවී සෙනෙවිරත්නට. අපි දන්නවා, සමහර ඒවා subjective නැති වුණාට, විෂය දන්නා ඒ පරීක්ෂණය කරන අය අයින් කළාම සමහර පරීක්ෂණ අවුරුදු 25කට, 30කට වැළලෙන බව. මේ සභාවේ සජබයේ කී දෙනෙක් ශානිට පහර ගැහුවාද, සජබයේ කී දෙනෙක් රවී සෙනෙවිරත්නට පහර ගැහුවාද? මිනීමරුවෙකුගේ වුවමනාව ඉටු කරන්න පටන්ගත්තා. ඒක තමයි ඇත්ත, මම මෙතැනදී ඒක කියලා තිබෙනවා නේ. *[බාධා කිරීමක්]* මට වෙලාව නැහැ. Points of Order ගන්න නිසා මම නම කියන්නේ නැහැ. ඕනෑ නම් මට පෙන්වන්න පුළුවන්. මට වෙලාව නැහැ, ඒ ගැන කථා කරන්න.

ඊට පස්සේ අනෙක් කාරණය මොකක්ද? විපක්ෂ නායකවරයා අද ඉන්න ඕනෑ කොතැනද? එතුමාට මෙතැනදි සහමුලින්ම රාජ්‍යමය වගකීමක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ මහා අපරාධය වෙන වෙලාවේ එතුමා ඒ ආණ්ඩුවේ අතිප්‍රබල නායකයෙක්. තුන්වැනියා, නැත්නම් හතරවැනියා. මෛත්‍රීපාල, රනිල්, සාගල, සජිත්. එතකොට අද එතුමා විපක්ෂ නායක. එතුමා එතකොට අපරාධය වළක්වපු නැති එකේත් වැරදිකරුවෙක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, විනාඩි දෙකක කාලයකුත් ගත වෙලා අවසන්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මම තව විනාඩි දෙක තුනක් ගන්නම්.

අපරාධය වළක්වපු නැති එකේත් වැරදිකරුවෙක්. අපරාධයෙන් පස්සේ පරීක්ෂණ කරලා අපරාධකරුවන් අල්ලපු නැති එකේත්, එතුමා දේශපාලන වශයෙන් වැරදිකරුවෙක්. මම කියන්නේ නැහැ, එතුමාගේ අවබෝධයෙන් මේ දේවල් වුණා කියලා. ඒ දේශපාලන වගකීමේදී අසමත් වෙච්ච පුද්ගලයෙක් එතුමා. අද එතුමා කොහේද යන්නේ?

කවුද, ගම්මන්පිල කියන්නේ? ගම්මන්පිල කියන්නේ අපරාධකරුවාගේ කඳවුරේ ප්‍රසිද්ධ පුද්ගලයෙක්. ඒක ගම්මන්පිල හංගන්නේ නැහැ. ඒ අතින් ගම්මන්පිල කෙළින් මිනිහෙක්. පිල්ලෙයාන් වෙනුවෙන් ගම්මන්පිල නඩු කියනවා. රාජපක්ෂගේ ඕනෑම දෙයක් වෙනුවෙන් ගම්මන්පිල ඉදිරිපත් වනවා. ඒ ගම්මන්පිලගේ පොත බලන්න යනවා, සජිත් ප්‍රේමදාස. මොකක්ද, ඒකෙන් දෙන්න හදපු පණිවුඩය? සමාජ විරෝධයක් ආවේ නැත්නම් මොකක්ද දෙන පණිවුඩය? දෙන පණිවුඩය තමයි, ගම්මන්පිල කියන එක හරි කියන එක. ඒක නේ ඒකෙන් කියන්නේ. *[බාධා කිරීමක්]* මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටක විපක්ෂ නායකවරයාට උත්සව කීයකට යන්න invitations ලැබෙනවාද? *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමනි, මට වෙලාව නැහැ. ඔබතුමාගේ හෘදය සාක්ෂියෙන් අහලා බලන්න. *[බාධා කිරීමක්]* මම අහන්නේ ඒකයි. විපක්ෂ නායකවරයෙකුට නොවෙයි, මේ නිකම් සාමාන්‍ය මන්ත්‍රීවරයෙකුට කොච්චර invitations එනවාද? මම ඒකයි කියන්නේ, invitations එනවා, ඒ එන invitations ඔක්කෝම භාර ගන්නේ නැහැ කියලා. පාස්කු ප්‍රහාරය සම්බන්ධව ගම්මන්පිල කියන්නේ මොකක්ද? ඔහු press conferences ගොඩක් තියලා කිව්වා, ඔහු මහ මොළකරුවාද, අපරාධකාරයාද හෙළිදරව් කරන්නේ කියලා. එතුමා බණ පොතක් දමන්නේ නැති බව සජිත් ප්‍රේමදාස මහත්තයා දන්නවා. ගම්මන්පිල 31වැනි දා ඉදිරිපත් කරන්නේ වෙන මොකක් හරි දෙයක් නොවෙයි. සජිත් ප්‍රේමදාස මහතා යනකොටත් ඒක දන්නවා. මොකටද ගියේ? අද ඔබතුමන්ලා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

වාගේයි; මම මේ වචනය කිව්වේ දේශපාලනමය වශයෙන් හොඳද? වෙනත් අර්ථයකින් ගන්න එපා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

වාගේයි. ඔබතුමන්ලා හිතනවා, අතට හසුවන හැම එකකින්ම ආණ්ඩුවට පහර ගහන්න ඕනෑය කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා, විනාඩි හතරක කාලයක් ගත වී තිබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
කමක් නැහැ, මට තව විනාඩි දෙක තුනක් ලබා දෙන්න. මම ඒ කාලය අඩු කරන්නම්. අපේ මන්ත්‍රීවරුන් මට සමාව දෙයි.

විපක්ෂයේ ඔබතුමන්ලා අද මොකක්ද කරන්නේ? ඔබතුමන්ලා අද ඕනෑම අපරාධකරුවෙක් එක්ක, ඕනෑම අපතයෙක් එක්ක හිටගන්නවා. මොකටද? මේ ආණ්ඩුවට ගහන්න. එච්චරයි, සජිත් ප්‍රේමදාසට තිබෙන්නේ. ඕනෑම අපරාධකරුවෙක් එක්ක, ඕනෑම අපතයෙක් එක්ක හිටගන්නවා. ඒත් කමක් නැහැ, දේශපාලන වශයෙන් නම්. අමු මිනීමරුවොත් එක්ක, අමු ගහලයොත් එක්ක, ඇස් පනාපිට මේ දේවල් වෙන්නේ. සුරේෂ් සලේ අත්අඩංගුවට ගත්තාට පසුව විපක්ෂ නායකතුමාට හිතෙන්න ඕනෑ නැද්ද, අපි ඒ වාගේ රටේ ප්‍රබල හමුදා නායකයෙක් අත්අඩංගුවට ගනියිද සාක්ෂි නැතුව කියලා?

ගම්මන්පිලගේ පොත එළිදක්වන එකට යන එකෙන් විපක්ෂ නායකතුමා දෙන්න හදපු පණිවුඩය මොකක්ද? සමාජ විරෝධයක් මැද්දේ ඒක backlash වුණේ නැත්නම්, මොකක්ද දෙන පණිවුඩය? මේක කරලා තිබෙන්නේ සහරාන්. එතකොට මිනීමරුවා බේරන්න තමයි විපක්ෂ නායක ගියේ. මිනීමරුවා බේරන්න තමයි මෙතැනදී ශානි අබේසේකරලාට ගැහුවේ. මිනීමරුවා බේරන්න තමයි අද කියන්නේ, උසාවිය දිනපතා නඩු අහනවා කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි මොකක්ද, කාදිනල්තුමා කියන්නේ? මොකක්ද, වින්දිතයෝ කියන්නේ? මොකක්ද, මේ රටේ මුස්ලිම් ජනතාවට අවශ්‍ය? ඉක්මනින් මේකේ ඇත්ත අපරාධකරු හෙළිදරව් කරලා ඒ මුළුමහත් මුස්ලිම් ජනතාවට දමපු කැලලෙන් ඔවුන් අයින් කරන්න කියන එකයි කියන්නේ. ක්‍රිස්තියානි, කතෝලික අම්මා තාත්තාට තිබෙන අවශ්‍යතාව මොකක්ද? මගේ ඥාතීන් පවා නැති වුණා, කටුවාපිටියේ සිද්ධියේදී. ඒ නිසා හෝ වෙනත් පෞද්ගලික කාරණයක් නිසා නොවෙයි මම මේවා කියන්නේ. මොකක්ද, ක්‍රිස්තියානි ජනතාවට අවශ්‍ය? මේක කවුද කළේ කියලා ඇත්ත දැනගන්නයි අවශ්‍ය. ඒ ක්‍රිස්තියානි මිනිස්සු, මුස්ලිම් මිනිස්සු සහ මේ මුළු රටම පාවා දීලා තමයි අද සජිත් ප්‍රේමදාසලා ගියේ. මට ප්‍රශ්නයක් නැහැ, එතැන රාජපක්ෂලා හිටියත්. මොකද, රාජපක්ෂලා කොහොමත් ඒ පොත ලියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම සමාව ඉල්ලනවා, ඔබතුමාගෙන් වෙලාව ඉල්ලා ගනිමින් මෙහෙම කථා කරමින් යන එක ගැන. මම හිතනවා, ඔබතුමා ඒකට මට සමාව දෙයි කියලා.

අවසාන වශයෙන් මට කියන්න තිබෙන්නේ මේකයි. මේකත් එක්ක සෙල්ලම් කරන්න එපා. ඇත්තටම මම ගරු කරනවා, විපක්ෂයේ සිටින දෙමළ ජාතික සන්ධානය ඇතුළු පක්ෂවල මන්ත්‍රීතුමන්ලාට. අපට පෙනෙනවා, ඒගොල්ලන් truly විපක්ෂයේ භූමිකාව ඉටු කරන බව, යම් කිසි වැදගත් පරිණත ක්‍රමයකට. නමුත් අපට මේ ප්‍රධාන විපක්ෂය කියන එකෙන් මොකක්ද පෙනෙන්නේ? ජෝකර්ලා පෙනෙන්නේ. අපේ විපක්ෂ නායක ඒ වාගේ තැනකට ගිහිල්ලා අනාථ වෙලා AI කියන්න වුණාට පසුව, එතුමා විපක්ෂ නායක තනතුරත් හෑල්ලු කරනවා නේ.

අපි කියන්න කැමැතියි, අපි මේ පරීක්ෂණය කරන බව. ඒක අපි ගිවිස ගත් දෙයක්. අපි ඒක කරන්න ඕනෑ. ඒ වෙනුවෙන් අපේ නිලධාරින් උපරිමයෙන් කැපවනවා. අපි කියන්න කැමැතියි, පාස්කු ප්‍රහාරය සාධාරණීකරණයට, ඒ දේශපාලන ද්‍රෝහීකමට, ජනතා ද්‍රෝහීකමට අද සජිත් ප්‍රේමදාස මහතා ඇතුළු සජබ කණ්ඩායම දායක වෙමින් ඉන්න බව. අපි කනගාටු වනවා, ඒ විධියට පහළ මට්ටමේ දේශපාලනයකට ඔබතුමන්ලා වැටුණු එක ගැන. එතැනට වැටෙන්න එපා.

මට කාලය ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[பி.ப. 5.12]

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர்கள் அவர்களே, முக்கியமானதொரு விவாதம் நடைபெறுகின்ற இவ்வேளையில், சிறியதொரு விடயத்தை நான் clarify பண்ண விரும்புகிறேன். நேற்றைய எனது உரையில், சவூதி அரேபியாவில் அமெரிக்காவின் இராணுவத் தளங்கள் இருப்பதாகவும் அங்குள்ள படையினரை வெளியேற்ற வேண்டுமெனவும் நான் கூறியதாக பல ஊடகங்களில் பிழையாக செய்தி வெளியிடப்பட்டதனால் அதைத் திருத்த வேண்டிய பொறுப்பு எனக்கு இருக்கின்றது. சவூதி அரேபியாவானது இலங்கைக்கு எல்லா காலகட்டத்திலும் உதவி செய்திருக்கிறது. அது யுத்த காலமாக இருக்கலாம்; சுனாமி அனர்த்தம் ஏற்பட்ட காலமாக இருக்கலாம்; அதற்குப் பின்னரான காலமாக இருக்கலாம். முஸ்லிம்களாகிய எங்களுடைய புனித கஃபாவும் அந்த நாட்டில்தான் இருக்கின்றது. சவூதி அரேபியா அரசாங்கமானது, எமது நாட்டுக்கு, அரசாங்கத்துக்கு, சமூகத்துக்கு எல்லா வகையிலும் உதவி செய்திருக்கிறது. அந்த நாடு பற்றி பிழையான செய்தியை நான் இங்கு சொல்லவில்லை. சவூதி அரேபியாவில் அமெரிக்காவின் இராணுவப் படையோ அல்லது இராணுவத் தளமோ இல்லை என்பதை நான் இங்கு சொல்லியாக வேண்டும். இந்த விடயம் சம்பந்தமாக இன்னொரு சந்தர்ப்பத்தில் நான் விரிவாகப் பேசுவேன்.

இன்று நடைபெறுகின்ற 'ஈஸ்டர்' தாக்குதல் சம்பந்தமான முக்கிய விவாதத்தில் கௌரவ அமைச்சர் பிமல் ரத்நாயக்க அவர்கள் கூறிய பல விடயங்களோடு நான் உடன்படுகின்றேன். அண்மையில் இடம்பெற்ற உயிர்த்த ஞாயிறு சம்பந்தமான புத்தக வெளியீட்டு நிகழ்வில் எதிர்க்கட்சித் தலைவர் அவர்கள் அதுவும் ஸஜபின் தலைவர் அவர்கள் கலந்து கொண்டதை எமது கட்சி விரும்பவில்லை. இவ்வாறான செயற்பாடுகள் எதிர்காலத்தில் அவருக்கும் எதிர்க்கட்சிக்கும் பாரிய பாதிப்பை ஏற்படுத்தும் என்பதை நான் இந்த உயர் சபையில் சொல்லிவைக்க விரும்புகின்றேன். ஷானி அபேசேகர, ரவி செனவிரத்ன போன்றவர்களை எதிர்க்கட்சியில் இருக்கின்றவர்கள் தவறாகப் பேசுவதாக இங்கு பேசிய கௌரவ அமைச்சர் பிமல் ரத்நாயக்க அவர்கள் சொன்னார். මට නම් ලොකු විශ්වාසයක් තිබෙනවා, ශානි අබේසේකර ගැනත්, මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ දැන් ඉන්න ලේකම් රවී සෙනෙවිරත්න මහතා ගැනත්. අපිට නම් ලොකු විශ්වාසයක් තිබෙනවා, එතුමන්ලා තමන්ගේ රාජකාරිය හරියට ඉටු කරයි කියලා. අපි විපක්ෂයේ හිටියා කියලා හැම දෙයකටම සහයෝගය දෙන්නේ නැහැ කියලාත් මම මේ වෙලාවේදී කියන්න කැමැතියි.

'ஈஸ்டர்' குண்டுத் தாக்குதலால் அதிகமாகப் பாதிக்கப்பட்ட வர்கள் கத்தோலிக்க மக்கள்! அவர்கள் பல உயிர்களைப் பலிகொடுத்து இருக்கிறார்கள். அதற்கு நிகராக முஸ்லிம் சமூகமும் பாரியளவில் பாதிக்கப்பட்டு இருக்கிறது. JVP இந்தக் கொலையைச் செய்ததுபோல காட்டுவதற்காக இன்று புத்தகம் எழுதுவதை நாங்கள் பார்க்கிறோம். இவ்வளவு காலமும் என்னை, என்னுடைய சகோதரரை, ஹிஜாஸ் ஹிஸ்புல்லாஹ்வை, அசாத் சாலியை, வைத்தியர் சாபியை, அஹ்னாப் ஜஸீமை குற்றஞ்சாட்டியவர்கள், இப்பொழுது கௌரவ முஜிபுர் ரஹுமான்மீது துரோகத்தனத்தைக் காட்டுவதை நாங்கள் பார்க்கின்றோம். இவை எல்லாம் எதைச் சொல்லுகிறது என்றால், சதியாலும் சூழ்ச்சியாலும் பொய்யாலும் இந்தத் தாக்குதல் சம்பவத்தை மீண்டும் மக்களிடம் கொண்டுபோய், மீண்டும் ஆட்சியைப் பிடிக்க முயற்சிப்பதைத்தான். இவர்களை நாங்கள் சதிகாரர்களாகவே பார்க்கின்றோம். இவ்வாறான சதியின் ஊடாகத்தான் அவர்கள் ஆட்சியைப் பிடித்தார்கள். அவ்வாறு ஆட்சியைப் பிடித்தாலும், அவர்களால் எவ்வளவு காலம் இந்த நாட்டில் ஆட்சி செய்ய முடிந்தது? அவர்களால் நிம்மதியாகத் தூங்க முடிந்ததா? இந்த நாட்டில் எந்தவோர் அரச தலைவருக்கும் ஏற்படாத அவமானம் - நாட்டை விட்டு ஓடவேண்டிய துர்ப்பாக்கிய நிலை - கோட்டாபய ராஜபக்ஷவுக்கு மாத்திரம்தான் ஏற்பட்டது என்பதை இந்தச் சபையில் நான் சொல்லியாக வேண்டும்.

[ගරු රිසාඩ් බදියුදීන් මහතා ]

எதிர்க்கட்சியாக இருக்கிறோம் என்பதற்காக அரசாங்கம் செய்கின்ற எல்லாவற்றையும் விமர்சிக்கின்றவர்களாக அல்லாமல், இந்தத் தாக்குதல் தொடர்பான விசாரணைக்கு அரசாங்கம் எடுக்கின்ற அத்தனை நடவடிக்கைகளுக்கும் எமது கட்சி மட்டுமல்ல, எதிர்க்கட்சியில் இருக்கின்ற அத்தனை பேரும் பூரண ஒத்துழைப்பைக் கொடுக்க வேண்டிய தார்மீகப் பொறுப்பு இருக்கிறது. உண்மையான நாட்டுப் பிரஜைகளாக இருந்தால், நாம் இதைச் செய்ய வேண்டும்.

முஸ்லிம் சமூகம் ஆயிரம் வருடங்களுக்கும் மேலான பழைமைவாய்ந்த சமூகமாகும். மன்னர் ஆட்சியாக இருக்கலாம், சுதந்திரத்துக்குப் பிறகுள்ள ஆட்சியாக இருக்கலாம், எந்தவொரு கால கட்டத்திலும் முஸ்லிம் சமூகம் நாட்டுக்கெதிராக சதிகளைச் - குமந்திரண - செய்வதற்கோ அல்லது நாட்டைப் பிரிப்பதற்கோ முயன்றதில்லை. ஆனால், சஹ்ரான் போன்ற சதிகாரர்களை, கயவர்களை, நாசகாரர்களை ஏதோவொரு சக்தி பின்னாலிருந்து இயக்கி இருக்கின்றது. எனவே, அவ்வாறான சக்தியைக் கண்டுபிடிக்க வேண்டிய தேவைப்பாடு இருக்கிறது. இல்லையென்றால், இன்னுமொரு காலத்திலோ, இன்னுமொரு தசாப்தத்துக்குப் பின்னரோ தாங்கள் ஆட்சிபீடம் ஏறுவதற்கு மீண்டும் இவ்வாறான சதிகளைச் செய்ய முயற்சிப்பார்கள். எனவே, மாண்புமிகு அநுர குமார திசாநாயக்க அவர்களின் தலைமையிலான அரசாங்கம் இந்த விடயத்தில் உறுதியாக இருந்து உண்மையான சூத்திரதாரிகளைக் கண்டுபிடிக்க வேண்டுமென நாங்கள் எதிர்பார்க்கின்றோம்.

பாதிக்கப்பட்ட கத்தோலிக்க மக்களுக்கு நட்டஈடு கொடுக்கப் போவதாகக் கேள்விப்பட்டோம். நிச்சயமாகக் கொடுங்கள்! அதேபோல, இந்தச் சம்பவத்தைத் தொடர்ந்து, ஆயிரக்கணக்கான முஸ்லிம்கள் சிறைகளில் அநியாயமாக அடைக்கப்பட்டார்கள்; மானபங்கப்படுத்தப்பட்டார்கள்; அவர்களுடைய வியாபாரங்கள் அழிக்கப்பட்டன. இவ்வாறான பாரிய கஷ்டங்களுக்கு அவர்கள் உள்ளாகினார்கள். நீங்கள் அவர்களையும் கவனித்து, அவர்களுக்கும் நட்டஈடு கொடுக்க வேண்டும். அத்தோடு, இந்த விசாரணையை தூய்மையாக முன்னெடுக்க வேண்டும். ஹிஜாஸ் ஹிஸ்புல்லாஹ்வுடைய வழக்குத் தொடர்பில் Auditor-General's Department இன்னும் எந்தவித நடவடிக்கையும் எடுக்கவில்லை. Auditor-General's Department එක හිස්බුල්ලාගේ නඩුව සම්බන්ධයෙන් තවම තොරතුරු සොයා ගෙන යනවා. ඒකට තවම තීන්දුවක් දීලා නැහැ. ඇයි දන්නේ නැහැ, තවම එහෙම තොරතුරු සොයා ගෙන යන්නේ.

ඒ වාගේම මගේ සහෝදරයා අවුරුදු දෙකහමාරකට හිරේ දැම්මා. ඇයි, ඒ? ඒ, ඊබ්‍රහිම් හාජ්ජියාර්ගේ පුතාට මිනිත්තු එකහමාරක් දුරකථනයෙන් කථා කරලා තිබුණාය කියලා. ඒක තමයි ඔහු හිරේ දාන්න බලපෑ කාරණය. ඔහු ලොකු ව්‍යාපාරිකයෙක්. මගේ සහෝදරයාත් ව්‍යාපාරිකයෙක්. ඒගොල්ලන් ඒ කාලයේ මොනවා හරි ව්‍යාපාර කටයුත්තකට මිනිත්තු එකහමාරක් කථා කරපු එකට මගේ සහෝදරයා අවුරුදු දෙකහමාරකට හිරේ දැම්මා. ඔහුව මාස 6ක් හිරේ දාලා නිදොස් කොට නිදහස් කළාට පසුව ආපහු මහින්දානන්ද අලුත්ගමගේගේ නායකත්වයෙන් උදය ගම්මන්පිල, විමල් වීරවංශ ඇතුළු මන්ත්‍රීවරු 100ක් එකතු වෙලා අත්සන් කරලා ගෝඨාභය රාජපක්ෂ මහත්තයාට ලිපියක් දුන්නා, ඔහුව ආපසු අත්අඩංගුවට ගන්න කියලා. ඒ වාගේ පාලනයක් තමයි ඒ කාලයේ තිබුණේ. ඒගොල්ලන් ඊට පස්සේ ආපසු මගේ සහෝදරයාව අත්අඩංගුවට අරගෙන අවුරුදු දෙකක් හිරේ තියාගෙන ඉඳලා නිදහස් කළා. ඒ වාගේ ජරා වැඩ කළා, මේ රටේ ඇති වුණු පාස්කු ප්‍රහාරය පාවිච්චි කරලා.

நான் அதிகம் பேச விரும்பவில்லை. ஒரேயொரு விடயத்தைச் சொல்லி முடிக்கிறேன். எங்களுடைய மார்க்கத்தின்படி, நாங்கள் அல்லாஹ்வை நம்புகின்றோம். சதிகாரர்களால் - சூழ்ச்சிக்காரர்களால் - ஒருபோதும் வெற்றியடைய முடியாது. சதிகாரர்களுக்கெல்லாம் பெரிய சதிகாரன் அல்லாஹ் என்பதை இந்தச் சபையில் கூறி, விடை பெறுகிறேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුනීර් මුලෆ්ෆර් නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.18]

**ගරු මුනීර් මුලෆ්ෆර් මහතා (ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு முனீர் முலாபர் - சமய மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Muneer Mulaffer - Deputy Minister of Religious and Cultural Affairs)
මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

විශේෂයෙන් ජාතික ජන බලවේගයේ ප්‍රධාන මැතිවරණ පොරොන්දුවක් නොවුණත්, වගකිව යුතු රජයක් ලෙස අපි මේ රටේ ජනතාවට ලබා දීපු පොරොන්දුවක් වුණු පාස්කු ප්‍රහාරයේ මහ මොළකරුවන් පිළිබඳව හෙළි කිරීමේ පොරොන්දුව ඉෂ්ට කරනවාය කියන කාරණාව අපේ මැතිවරණ වේදිකාවල පැහැදිලිව සඳහන් කළා. පාර්ලිමේන්තුව තුළ 13වැනි වතාවටත් පාස්කු ප්‍රහාරය පිළිබඳව විවාද වන මේ අවස්ථාවේදී මම ඇත්තටම එක පැත්තකින් සතුටු වෙනවා, වර්තමාන රජයේ ඒ පරීක්ෂණ කොතරම් දුරට සාර්ථක දිසාවකට යොමු වෙලා තිබෙනවාද කියන එක විපක්ෂයේ ප්‍රධානම නායකයෝ පිළිගැනීම සම්බන්ධයෙන්. අපිට ඡන්දය දීපු ජනතාව විතරක් නොවෙයි, අපේ ජනාධිපතිතුමාව පරාජයට පත් කිරීම වෙනුවෙන් වැඩ කරපු ඒ පක්ෂයේ නායකයොත් ඒ පිළිබඳව විශ්වාසය තැබීම අපිට විශාල සතුටක්. ඒ අනුව අපේ නිලධාරීන් පිළිබඳ විශ්වාසය; විශේෂයෙන් ශානි අබේසේකර වාගේම රවී සෙනෙවිරත්න කියන නිලධාරීන් පිළිබඳව තිබෙන විශ්වාසය නිසාත් වර්තමාන රජයේ ඒ කටයුත්ත එතුමන්ලා සහයෝගය ලබා දෙන කාරණාවක් බව විපක්ෂය සඳහන් කළා.

හැබැයි, මම මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. එක පැත්තකින් ඔබතුමන්ලා මේ පරීක්ෂණය පිළිබඳව සතුටට පත් වෙනවා, අගය කරනවා වාගේම තවත් පැත්තකින් දේශපාලන වශයෙන් ඔබතුමන්ලා යම් විධියකට පසුතැවෙන්න ඕනෑ, දෙවතාවක් ජනාධිපතිවරයෙක් බවට පත් කරන්න උතුරු, නැගෙනහිර ඇතුළු රට පුරාම කරේ ගහගෙන ගියපු ඒ අපේක්ෂකයා, ඔබතුමන්ලා නියෝජනය කරන, ජයග්‍රහණය කරවන්න ඔබතුමන්ලා වෙර දරපු ඒ නායකයා "පාස්කු ප්‍රහාරයේ මහ මොළකරු සොයා යෑම" කියන පොත එළිදක්වන අවස්ථාවට සහභාගි වීම පිළිබඳව. විශේෂයෙන් ඔබතුමන්ලාට ඒ කනස්සල්ල, වේදනාව තිබෙනවා කියා මම විශ්වාස කරනවා.

මම මේ මොහොතේදී විශේෂයෙන් මතක් කළ යුතු තව දෙයක් තිබෙනවා. අපේ බිමල් රත්නායක ඇමතිතුමාත් මේ ප්‍රහාරය පිළිබඳව වාගේම මේ සිද්ධීන් පිළිබඳව ඉතා පැහැදිලිව සඳහන් කළා. අපි දිගින් දිගටම, ලැබෙන හැම අවස්ථාවකම මේ ප්‍රහාරය පිළිබඳව කථා කළා. ඇත්තටම මේ කථා බහ දෙස

බලනවිට, මේ විවාද දෙස බලනවිට, මාධ්‍ය දෙස බලනවිට අපට හැඟෙන්නේ මොකක්ද? අපිට හැඟෙන දේ තමයි එය වළක්වා ගන්න පුළුවන්කම තිබුණු ප්‍රහාරයක් කියන එක. ඒ වාගේම බේරා ගන්න හැකිව තිබුණු ජීවිත අපි අහිමි කරගත්තා කියන වේදනාව ශ්‍රී ලාංකික පුරවැසියන් ලෙස අප හැම දෙනාටම තිබෙනවා. විශේෂයෙන්ම ඒ තොරතුරු, කරුණු කාරණා ලැබී තිබියදීත් එවකට පැවැති පාලන තන්ත්‍රය කටයුතු කළේ කොහොමද කියන කාරණය හරිම පැහැදිලියි.

මේ අවස්ථාවේදී මතක් කළ යුතු තවත් කාරණයක් තිබෙනවා. 2009 වසරේදී යුද්ධය අවසන් වුණාට පසුව රටේ සියලු දෙනාගේම බලාපොරොත්තු වුණේ රටක් ලෙස නැවත යුද්ධයකට නොයා, ශ්‍රී ලාංකිකයන් ලෙස සියලු දෙනාම ඒක රාශි කරගෙන එක ගමනක් යෑමයි. එවැනි ගමනක් යන්න අපට පුළුවන් වුණා නම්, අපට ඒ සමෘද්ධිමත් රට ළඟා කරගන්න තිබුණා. හැබැයි, ඒ පාලකයාට වුවමනා වුණේ මොකක්ද?

ඒ වාගේම අද ලෝකයේ පවතින යුද්ධයේ අරමුණ මොකක්ද? ඒ යුද්ධය තුළ තිබෙන කාරණාව මොකක්ද? ආයුධ නිෂ්පාදකයාට ලෝකයේ කොහේ හරි යුද්ධයක් තිබෙන්න ඕනෑ. යුද්ධයෙන් තමයි ඔවුන්ගේ පැවැත්ම රඳා පවතින්නේ. එම නිසා ඕනෑම කෙනෙක්ව ඔවුන්ට ත්‍රස්තවාදී කරන්නත් පුළුවන්, අන්තවාදී කරන්නත් පුළුවන්. ඒ ඕනෑ දෙයක් කරන්න පුළුවන්. ගරු බිමල් රත්නායක ඇමතිතුමා සඳහන් කළා වාගේ 2009දී මේ රටේ පැවැති යුද්ධය ඉවර වුණාට පස්සේ නාටකයක් ගොඩ නැඟුවා. මොකද, හතුරෙක් හොයා ගන්න අවශ්‍ය වුණා. ඒ හතුරාව හොයා ගත්තේ වෙන කෙහෙන්වත් නොවෙයි, මුස්ලිම් සමාජය තුළින්. රටේ බිල්ලෙක් මැව්වා, මුස්ලිම් සමාජය මේ රටට අහිතකර සමාජයක් කියලා. දිගින් දිගටම ඒ මතය ගොඩ නඟාගෙන ආවා. එහි ප්‍රතිඵලයක් තමයි 2014දී දර්ගා නගරයට එල්ල වුණු ප්‍රහාරය. එය ඉතාම සුළු සිද්ධියක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා ජාතික ජන බලවේගය ආණ්ඩුව බලයට පත් වෙලා අවුරුදු එකහමාරක් පමණ වන කාලය තුළ නැවත නැවතත් ඒ ජාතිවාදී කණ්ඩායම් මේ සමාජය තුළ ජාතිවාදය වපුරන්න, ඒකට උඩගෙඩි දෙන්න විවිධ උත්සාහ දරන විට වගකිව යුතු රජයක් ලෙස අපි ඊට එරෙහිව හැම විටම කටයුතු කර තිබෙනවා. අපට ඒ ගැන ආඩම්බර වෙන්න පුළුවන්. හැබැයි, එදා තිබුණේ එවැනි තත්ත්වයක් නොවෙයි. එදා තිබුණේ වෙනස්ම තත්ත්වයක්. 2014දී රාජ්‍ය අනුග්‍රහය දැක්වූවා, ඒ ප්‍රහාරවලට. ඒවාට තමන්ගේ සියලු සහයෝගය ලබා දීලා තමයි ආර්ථිකය හැම පැත්තෙන්ම කඩා වැට්ටුවේ. ඒ විතරක් නොවෙයි. විශේෂයෙන් පාස්කු ප්‍රහාරයේ මහ මොළකරු විධියට සමහරුන්ව තෝර ගත්තා.

අපට මතකයි, 2019 ජනාධිපතිවරණය; 2020 මහ මැතිවරණය. සාමාන්‍යයෙන් අපේ රටේ තිබුණු සම්ප්‍රදායක් තමයි, මුස්ලිම් සමාජය බහුලව ඉන්න කොළඹ වාගේ දිස්ත්‍රික්කයකට, ගම්පහ වාගේ දිස්ත්‍රික්කයකට, කළුතර වාගේ දිස්ත්‍රික්කයකට අඩුම තරමින් ආසනයක් දිනා ගන්න බැරි වුවත් මැතිවරණයකදී ප්‍රධාන දේශපාලන පක්ෂවලින් මුස්ලිම් අපේක්ෂයකු ඉදිරිපත් කිරීම. හැබැයි ඒ පැවැති මහ මැතිවරණයේදි බලය ලබා ගැනීම වෙනුවෙන් කිසිම මුස්ලිම් අපේක්ෂකයකු ඉදිරිපත් කළේ නැහැ. ගම්පහ දිස්ත්‍රික්කයේ එක්තරා මුස්ලිම් අපේක්ෂකයකු 2020 මහ මැතිවරණයේදී තමන්ට අපේක්ෂකත්වය දෙන්න කියලා ඉල්ලීමක් කළාම දීපු උත්තරය තමයි, "මුස්ලිම් අපේක්ෂකයකු දාලා ඡන්ද දහදාහක් ගන්නවාට වඩා ඔබලාට එරෙහිව හඬ නඟලා, ඔබලාට එරෙහිව සමාජය තුළ වෛරය වපුරලා අපට පුළුවන් ඡන්ද ලක්ෂයක් ගන්න" කියන එක. එහෙම දේශපාලන පසුබිමක් තිබුණේ.

ඊළඟට, තව දෙයක් මතක් කළ යුතුයි. සාමාන්‍යයෙන් අර්බුදයකදී තමයි අපට මනුෂ්‍යයන්ව හඳුනා ගන්න පුළුවන් වන්නේ. අර්බුදයකදී තමයි ඇත්තටම අපට තේරුම් ගන්න පුළුවන්, අපිත් එක්ක කවුද හිට ගන්නේ කියන එක. 2019දි ප්‍රහාරය සිදු වූ අවස්ථාවේ විශේෂයෙන් ජාතික ජන බලවේගයේ මන්ත්‍රීවරු කිහිපදෙනෙකු පමණක් පාර්ලිමේන්තුව තුළ හිටියත් එතුමන්ලා මුස්ලිම් සමාජය එක්ක හිට ගත්තා; ජාතිවාදයට එරෙහිව පාර්ලිමේන්තුව තුළත්, පිටතදීත් කටයුතු කළා. අද ඔය ඉදිරි පෙළ ඉන්න මුස්ලිම් නායකයින් මතක් කරලා බලන්න, පාස්කු ප්‍රහාරය සිදු වෙලා ටික දිනකට පස්සේ අපේ රටේ ඇති වුණු සංසිද්ධියත් එක්ක, වාතාවරණයත් එක්ක, මුස්ලිම් කැබිනට් ඇමතිවරු, මන්ත්‍රීවරු ඉල්ලා අස් වනකොට ඔය පක්ෂයේ වර්තමාන නායකත්වය දරන කෙනා මොන වාගේ ප්‍රකාශයක් කළාද කියන එක. තමන් නියෝජනය කරන, තමන්ගේම කැබිනට් ඇමතිවරුන්ට ඒ ඉරණම අත් වනකොට එදා නිහඬව ඒ දෙස බලා සිටියා මිස ඒකට එරෙහිව කටයුතු කළේ නැහැ. අද තමන් කොතැනද හිට ගන්නේ කියන එක ඉතා පැහැදිලිව පෙනෙනවා. පසුගිය දිනක "පාස්කු ප්‍රහාරයේ මහ මොළකරු සොයා යෑම" පොත හෙළි දක්වන අවස්ථාවේ ඉදිරි පෙළ වාඩි වෙලා සිටිමින්ම තමන් නියෝජනය කරන්නේ මෙන්න මෙතැනයි කියන පණිවුඩය ලබා දුන්නා. අවංකව සමගි ජන බලවේගය නියෝජනය කරන සමහර මන්ත්‍රීවරුන්ට එය දරා ගන්න බැරි තත්ත්වයක් තුළ තමයි, එය AI තාක්ෂණයෙන් කළ දෙයක් යැයි කියමින් බේරා ගන්න කටයුතු කරන තත්ත්වයට පත් වුණේ.

විශේෂයෙන් මේ අවස්ථාවේදී මේ සම්බන්ධ පරීක්ෂණ පිළිබඳව නොවෙයි, මේ කාරණාව පිළිබඳව නොවෙයි මම මේ මොහොතේ කථා කරන්න හිතන්නේ. රටක එවැනි ප්‍රහාරයක් සිදු වුණාම පාලකයා කොහොමද හැසිරෙන්න ඕනෑ කියන එක පෙන්වන්න අපට ආදර්ශ තිබෙනවා. මා එයට හොඳ උදාහරණයක් කියන්නම්. අපි හැමදෙනාටම මතකයි, 2019දී ක්‍රයිස්ට්චර්ච් නගරයට ප්‍රහාරයක් එල්ල වුණු බව. 51දෙනෙකු ඒ අවස්ථාවේ ඝාතනය වුණා. ඒ සිද්ධියෙන් පස්සේ නවසීලන්ත අගමැතිතුමිය පල්ලියට ඇවිල්ලා කියපු දේ මොකක්ද? මුළු සමාජයම වැරදිකරුවන් බවට පත් කරන්න ගියේ නැහැ. ඒ ත්‍රස්තවාදීන් හුදෙකලා කරලා රටේ පුරවැසියන් ආරක්ෂා කරන වැඩ පිළිවෙළක් ඒ අගමැතිතුමිය ඒ වෙලාවේ කළා. හැබැයි, අපේ රටේ මොකක්ද කළේ? සමහර පෞද්ගලික නාළිකා, සමහර පිරිස් අමු අමුවේ තමන්ගේ මිත්‍රත්වය බිඳ ගන්නා තැනට කටයුතු කළා. ඉතාම ලජ්ජයි. මුළු මුස්ලිම් සමාජයම ත්‍රස්තවාදීන් බවට පත් කරලා, අන්තවාදීන් බවට පත් කරලා, භීතියට පත් කරලා, තමන් ජීවත් වන රට පිළිබඳ ප්‍රශ්නාර්ථයක් හැම කෙනාගේම හදවත් තුළ ඇති කළා. ඒ විතරක් නොවෙයි, ප්‍රහාරයෙන් පස්සේ පළිගැනීම් සිදු වුණා. අපි දන්නවා මිනුවන්ගොඩ, කොට්ටාරමුල්ලේ ඝාතනය. එතැනින් නැවතුණේ නැහැ. මැතිවරණ ජයග්‍රහණයෙන් පස්සේ ජනාධිපතිවරයා ලෙස පදවි ප්‍රාප්තිය ලැබෙන කොටත් ඒ වෛරය එලෙසම මුදා හරින තත්ත්වයකට ගියා. ඒ විතරක් නොවෙයි, කොතරම් දුරට වෛරය තමන් තුළ තිබුණා ද කියන එක තමයි වෛද්‍ය ෂාෆි මහතා සම්බන්ධයෙන් වන කාරණයේදී පෙන්නුම් කළේ. වෛද්‍යවරයෙක් පිළිබඳ තිබෙන විශ්වාසය ඉතාම නින්දිත විධියට, ඉතාම මජර විධියට, කැත විධියට සමාජය තුළ කඩ කරන තරමටම ඒ පාලකයෝ කටයුතු කළා.

ඒ විතරක් නොවෙයි. කොරෝනා වසංගතය මුළු ලෝකයම වෙළාගෙන සිටි අවස්ථාවක, සියලු දෙනාම පීඩාවට පත් වෙලා ආර්ථික වශයෙන් තමන්ට ක්‍රියා කර ගන්න බැරි තත්ත්වයක් තුළ, ලෝකයේ කිසිම රටක් ගත්තේ නැති තීන්දුවක් අරගෙන, අකැමැත්තෙන්ම කොරෝනා මරණ ආදාහනය කරන තත්ත්වයට පත් වුණා. ඒ නිසා මේ ප්‍රහාරය තුළ අවසාන වශයෙන් අපි තේරුම් ගන්න ඕනෑ මොකක්ද? අන්තවාදී අදහස් දරන,

[ගරු මුනීර් මුලාෆර් මහතා]

ත්‍රස්තවාදීන් විධියට හැසිරෙන පුද්ගලයන් ඕනෑම සමාජයක් තුළ ඉන්න පුළුවන්. ඔවුන්ව හුදෙකලා කර රටේ සාමය ගොඩනඟන එක තමයි රජයක වැඩ පිළිවෙළ වෙන්න ඕනෑ. ඒ මිස, රජයක් විසින් ජාතියක් හෝ ආගමක් නියෝජනය කරන කොට්ඨාසයක් ත්‍රස්තවාදීන් ලෙස හංවඩු ගසන ඒ නීච ක්‍රියාව තවදුරටත් මේ රට තුළ නොවිය යුතුයි. ජාතික ජන බලවේගය රජය ඒ සමඟිය, ඒ සාමය වෙනුවෙන් කටයුතු කරනවා වාගේම ඒ ප්‍රහාරයට සම්බන්ධ සැබෑ මහ මොළකරුවන් හොයා ගැනීමේ කාර්යය වෙනුවෙන් අනිවාර්යයෙන්ම වැඩ කරනවාය කියමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු සුජීව දිසානායක මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු සුජීව දිසානායක මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු චානක මාදුගොඩ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සුජීව දිසානායක මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சஜீவ திசாநாயக்க அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. CHANAKA MADUGODA left the Chair, and THE HON. SUJEEWA DISSANAYAKE took the Chair.*

[අ.භා. 5.30]

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කථා කරන්නේ නැහැ කියලා හිටපු මාතෘකාවක් ගැන නැවත නැවත කථා කරන්න වීම සම්බන්ධව එක පැත්තකින් කනගාටු වෙනවා. ඒ වාගේම කලකිරීමකටත් පත් වෙලා තිබෙනවා. අපිට මතකයි, මේ ආණ්ඩුව බලයට ආපු වෙලාවේ කියාපු දේවල්. පසුගිය ඉතිහාසය ගත්තාම පාස්කු ප්‍රහාරයට පසු ඒ ප්‍රහාරය විකුණා ගෙන කාපු කණ්ඩායම් හිටියා. මතක තියා ගන්න, ඒ කණ්ඩායම්වලට තමුන්නාන්සේලාත් අයිතියි. තමුන්නාන්සේලා ආණ්ඩුව ගන්න පෙරත් කිව්වා, ආණ්ඩුව ගත්තාට පස්සේත් කිව්වා, ගිය අවුරුද්දේ අප්‍රේල් 21වන දා වන විට මහ මොළකරු ගැන කියනවා කියලා. හැබැයි, මේ අවුරුද්දේත් දැන් අප්‍රේල් 21 දක්වා ආවා, මහ මොළකරු ගැන තමුන්නාන්සේලාට කියන්න බැරිව ගියා.

අපි දැක්කා එදා රාජපක්ෂලාව පෝෂණය කරපු තමුන්නාන්සේලාගේ කණ්ඩායම්, එදා උදය ගම්මන්පිලත් එක්ක හිටපු කණ්ඩායම් අද නිකම් ලජ්ජා නැතිව කථා කරනවා රාජපක්ෂලා, උදය ගම්මන්පිලලා එක්ක අපි හිටියා වාගේ. අපි එහෙම හිටියේ නැහැ, මතක තියා ගන්න. අපිට තිබෙන ඊළඟ ප්‍රධාන ප්‍රශ්නය, මේ කියපු කථාවලින් අපිට තේරුණු දේ තමයි ඒ ගම්මන්පිලගේ පොත අච්චු ගහන එකේ මහ මොළකරු ආණ්ඩුව ද කියන එක. සමහර අයගේ කථාවලින් අපිට එවැනි ප්‍රශ්නයක් ඇති වනවා. මොකද, ඒ අයගේ කථාවල අවසානයේ තිබෙනවා ගම්මන්පිල කරපු දේ හරි කියලා. එතකොට ගම්මන්පිල එක එක්කෙනාට ආරාධනා කරන්න කිව්වෙත් ඒ වැඩ පිළිවෙළේ කොටසක් හැටියට ද කියන එක ගැන අපිට ප්‍රශ්නයක් තිබෙනවා. තමුන්නාන්සේලා මොන තරම් හිනා වුණත්, තමුන්නාන්සේලා හිනා වුණේ, තමුන්නාන්සේලා - ආණ්ඩුවෙන් - ඒ පොත ගහන්න යම් කිසි උදව්වක් කළා නම් ඒ දේවල් කළේ මේ රටේ මැරුණු මිනිසුන්ගේ මළ කඳන් උඩින් කියන එක හොඳට මතක තියා ගන්න. මේ පොතක් ගහලා රුපියල් 1,500ක් හොයා ගන්න ගියාම, ඊළඟට තව පොතක් ගහන්න හදනවා තව මහ මොළකාරයෙක් ගැන; අපේ මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා ගැන. මුජිබුර් රහුමාන් මැතිතුමා, අපේ මන්ත්‍රීවරයෙක්. අපිට විශ්වාසයි එතුමා ගැන.

එතුමා එහෙම දෙයක් කළා නම් ඒ මිනිස්සු මෙච්චර කල් බම්බු ගැහුවාද? එහෙම නම්, "මහ මොළකරු" කියලා එතුමාට එදා කියන්න එපායැ. එදා ඒ බව කියලා ආරක්ෂක අංශවලින් වැඩ කටයුතු කරන්න එපායැ. මේ ඔක්කෝම කරකවලා තමුන්නාන්සේලාත් එක්ක සම්බන්ධීකරණයකින් මේ වැඩ කරගෙන යන බව අපට පෙනී යනවා. ඒක මතක තියාගන්න.

තමුන්නාන්සේලා මේ වෙලාවේ පට්ටපල් බොරු ටිකක් මේ සභාවේ කිව්වා. මොනවාද කියපු පට්ටපල් බොරු? "Channel 4" සිද්ධියත් එක්ක පිල්ලෙයාන් අත්අඩංගුවට අරගෙන කාලයක් තිස්සේ තියාගෙන හිටියා නේ. නමුත් අද කිව්වා, එයාව රිමාන්ඩ් කරලා තිබෙන්නේ පාස්කු ඉරුදින මහා ප්‍රහාරය සම්බන්ධවයි කියලා. තමුන්නාන්සේලා මතක තියා ගන්න, ඒක මේ රටේ සමස්ත ජනතාවට කියපු පට්ටපල් බොරුවක් බව. එහෙම නම්, අපි කොහොමද තමුන්නාන්සේලා විශ්වාස කරන්නේ? පොලීසියේ ප්‍රකාශය තිබෙනවා, ඔහුව රිමාන්ඩ් කරලා තිබෙන්නේ මහාචාර්ය සුබ්‍රමනියම් රවින්ද්‍රනාත් මහත්මයාගේ පැහැර ගැනීම සහ අතුරුදහන් කිරීම සම්බන්ධවයි කියලා. ඔහු රිමාන්ඩ් කරලා තිබෙන්නේ පාස්කු ඉරුදින ප්‍රහාරය සම්බන්ධයෙන් නොවෙයි. එහෙම නම්, තමුන්නාන්සේලා ඒ බොරුව කියන්නේ කාටද?

ඊළඟට, තවත් කථාවක් කිව්වා. එදා පරීක්ෂණ නොමඟ යැව්වා කිව්වා. පරීක්ෂණ නොමඟ යැව්වා නම්, පාස්කු ඉරු දින ප්‍රහාරයට සම්බන්ධ ප්‍රදේශය භාරව එදා හිටියේ වර්තමාන ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යවරයා වන අරුණ ජයසේකර මහත්මයා. එදා පරීක්ෂණ නොමඟ යැව්වා නම් ඒ නියෝජ්‍ය ඇමතිවරයා ද ඒ නොමඟ යැවීම කළේ? එහෙම නම්, තමුන්නාන්සේලා පිටුපසට හැරිලා ඔය පැත්තේ ඉන්න ඒ නියෝජ්‍ය ඇමතිවරයාගෙන් අහන්න ඕනෑ, එතුමාද ඒ නොමඟ යැවීමට සම්බන්ධ කියලා. යමක් කියන කොට ඒ කියන දේ හරියට තේරුම් අරගෙන කියන්න තමුන්නාන්සේලා මතක තියා ගන්න.

අපි මේ අවස්ථාවේදී මේ කථාවත් විශේෂයෙන් මතක් කරනවා. තමුන්නාන්සේලාගේ කථාවලදී සාරා ජෙස්මින් ගැන කිව්වා; සාරා ඉන්නවා කියලා කිව්වා. සාරා ඉන්දියාවේ ඉන්නවා කියලා මීට පෙර කිව්වේ තමුන්නාන්සේලායි. තමුන්නාන්සේලා දැන් ඉන්දියාවත් එක්ක ගිවිසුම් හතක්, අටක් විතර ගහලා තිබෙනවා. ඉන්දියාවට ගිහිල්ලා දණ ගහලා වැන්දා තමුන්නාන්සේලාගේ ටිල්වින් සිල්වා එහෙම. එහෙම නම්, දැන් ඉන්දියාවෙන් ඇහුවාද, සාරා ඉන්දියාවේ ඉන්නවාද කියලා?

තමුන්නාන්සේලා එදා කියපු ඒ දේ ආයෙත් කිව්වාද? ඒ ගැන ආයෙත් ඇහුවාද? කොන්දක් තිබුණාද එහෙම අහන්න? එහෙම නැත්නම්, එදා මේ රටේ ජනතාවට කිව්වේ බොරුද? අද කියන්නේ වෙන දෙයක්ද? මතක තියා ගන්න, තමුන්නාන්සේලා තමයි ඕනෑම එකෙක් එක්ක, ඕනෑම ජරාවක් කාලා තමන්ගේ ආණ්ඩුව කරගෙන යන්න අවශ්‍ය කරන වැඩසටහන හදන්නේ. 2005දී කළා වාගේම තමයි තමුන්නාන්සේලා තවමත් කටයුතු කරන්නේ.

මෙතැනදී විශේෂයෙන් මතක් කරන්න ඕනෑ තවත් කාරණා තිබෙනවා. ආණ්ඩුව දැන් සජිත් ප්‍රේමදාස මැතිතුමා ගැනමයි කථා කරන්නේ. ආණ්ඩුව දැන් සජිත් ප්‍රේමදාස ගැනම කථා කරන්නේ ඇයි? එතුමා මොනවාද කරලා තිබෙන්නේ? එතුමා තමයි පාස්කු ඉරුදින ප්‍රහාරයෙන් පස්සේ පල්ලි ටික හැදුවේ. තමුන්නාන්සේලාත් සම්බන්ධීකරණය වෙලා තමයි මුස්ලිම් ජනතාවගේ දේවල් කැඩුවේ. ඒ කඩපු ඒවාට වන්දි ගෙව්වේත් එතුමා. පොත එළිදක්වන තැනට එතුමා ගිය එක වෙන කථාවක්. හැබැයි, එතුමා එතැනට ගියේ ඒ පොතේ තිබෙන දේවල් පිළිගෙනද? එතුමා පැහැදිලිව කියනවා, මේ පොතේ තිබෙන දේවල් දැක්කාට පස්සේ ඒක සම්පූර්ණයෙන්ම අනවශ්‍ය දෙයක්, තමන් ඒක පිළිගන්නේ නැහැ කියලා තීන්දු කළ බව. හැබැයි, ඉස්සෙල්ලාම තමුන්නාන්සේලාගේ කොන්ද තියාගන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ඊබ්‍රහිම්ගේ ගෙදරින් තමයි වැඩිපුරම සල්ලි දීලා පාස්කු ඉරු දින ප්‍රහාරය සිදු කරන්න වැඩ කටයුතු ටික කළේ. ඒ, තමුන්නාන්සේලාගේ ජාතික ලැයිස්තු මන්ත්‍රීවරයෙක්. එහෙම නම්, ඊබ්‍රහිම්ට දාපු නඩුව ගැන තමුන්නාන්සේලා කොන්ද පණ ඇතුව දැන් කියන්න. ඊබ්‍රහිම්ට දැන් මොකක්ද කරලා තිබෙන්නේ කියලා කියන්න. ඒවා වහගෙන, සාරා ජෙස්මින් ගැන අහන්නේ නැතුව ඒක වහගෙන තමුන්නාන්සේලා හදනවා තමන් බේරිලා මේ කටයුත්ත කරන්න. ශානි සහ රවී කියන දෙන්නාටම එදා පැවැති ආණ්ඩුවලින් පහර ගහනකොට ඒ අය වෙනුවෙන් කථා කළේ සමඟි ජන බලවේගයේ අපයි කියන එක හොඳට මතක තියා ගන්න. අපි කවුරුවත් මේ රටේ පරීක්ෂණ පවත්වන ආරක්ෂක අංශවලට බලපෑම් කරන කිසිම වැඩ කටයුත්තක් කිසිම දවසක කරලා නැහැ. ඒ පාස්කු ඉරු දින මහා ප්‍රහාරය කියන්නේ, එක පැත්තකින් කතෝලික ජනතාව බරපතළ විධියට කඩා වට්ටලා විනාශ කරපු ප්‍රහාරයක්. ඒ වාගේම එමඟින් අහිංසක මුස්ලිම් ජනතාවටත් බරපතළ ප්‍රශ්නයක් ඇති වුණා. ඒගොල්ලන්ටත් එහි වින්දිතයන් බවට පත් වෙන්න සිදු වුණා. එම නිසා කරන හැම දෙයක්ම, කථා කරන හැම දෙයක්ම ගැන මතක තියා ගෙන ඔබතුමන්ලා කථා කරන්න.

එදා එම ප්‍රහාරයෙන් මේ රටේ අහිංසක මිනිසුන් පිරිසක් ත්‍රස්තවාදී කණ්ඩායමක් විසින් මරනු ලැබුවා. අපි අදටත් හිතනවා, ඒක මෙහෙයවපු ඊට ඉහළින් කණ්ඩායමක් ඉන්නවා කියලා. ඊට ඉහළින් ඉන්න කණ්ඩායම කවුද කියන එක අපි දන්නේ නැහැ. ඒක හොයන එක තමයි තමුන්නාන්සේලාට භාර දීලා තිබෙන්නේ. අදත් අප මේ ගැන කථා කරන්න ගත්තේ වෙන කාරණාවක් නිසා නොව, පසුගිය අප්‍රේල් 21ට පෙර පාස්කු ඉරුදින ප්‍රහාරයේ මහා මොළකරු ප්‍රකාශයට පත් කරනවා කියලා තමුන්නාන්සේලා ආණ්ඩු බලය ලබා ගත්තු ගමන් වර්තමාන ජනාධිපතිවරයා තමාගේම කටින් කියපු නිසා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
තවත් අවුරුද්දක් ඉදිරියට ගියාට පස්සේ තමයි අද නැවත වතාවක් මේ කථාව කියන්නේ. මේක අවසාන කථාව විය යුතුයි. මේ කථාව තමුන්නාන්සේලාගෙන් ආපහු අහන්න අපි සූදානම් නැහැ.

එම ප්‍රහාරයෙන් මැරුණු අහිංසක මිනිසුන්ට අපි ගෞරවය දක්වනවා. ඒ අය සමාදානයේ සැතපේවා කියලා අපි විශේෂයෙන්ම ප්‍රාර්ථනා කරනවා. හැබැයි, කරුණාකරලා ඒ අයගේ මිනී වළවල් උඩින් තමුන්නාන්සේලාගේ දේශපාලනය කරන්න එපා. අපි ගම්මන්පිල ඇතුළු අනික් කණ්ඩායමටත් කියනවා, තමුන්නාන්සේලාගේ බඩගෝස්තරවාදී, කාලකණ්ණි, අභූත දේශපාලනය ඒ අහිංසක මිනිසුන්ගේ මිනී කඳන් උඩින් කරන්න යන්න එපා කියලා. අපි විශේෂයෙන් ඒ ඉල්ලීම කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මොකද, ඒ පොතට දාලා තිබෙන නමටත් අපි විරුද්ධයි. කතෝලිකයෙකු හැටියටත්, මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන කෙනෙකු හැටියටත් මම ඒකට විරුද්ධයි.

**ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)
එහෙම නම් ඇයි, තමුන්නාන්සේලාගේ නායකතුමා එය එළි දක්වන තැනට ගියේ?

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
එතුමා විපක්ෂ නායකවරයා හැටියටයි එතැනට ගියේ. එතුමා ගිය එකේ ප්‍රශ්නය මොකක්ද?

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
අපි ඒ ගැන කියන්නම්, අපේ කථාවේදී.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
කාරණය මේකයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
දැන් තමුන්නාන්සේලාගේ අතේයි බලය තිබෙන්නේ. ඒ නිසා තමුන්නාන්සේලා මහ මොළකරු සොයන්නකෝ. තමුන්නාන්සේලා මහ මොළකරු සොයලා දෙන්නකෝ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මේ ආණ්ඩුව ඇවිත් අවුරුද්දක් ගියා; අවුරුදු එකහමාරකුත් ගියා. මේ අවුරුද්ද ඉවර වනකොට තමුන්නාන්සේලා,- *[බාධා කිරීමක්]* මේක මතක තබා ගන්න. අවසානයේදී තමුන්නාන්සේලාත් මහ මොළකරු සහරාන් කියලා කියන්න බලාපොරොත්තු වෙන්න එපා. අවසානයේදී ලජ්ජා නැතුව- *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

**ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஸ்டெபனி பர்னாந்து)
(The Hon. Stepni Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාස්කු ඉරු දින ප්‍රහාරය,-

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මගේ කථාව අවසන් කරන්න දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
වෙලාව සම්බන්ධව ගැටලුවක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමාට වැඩිපුර විනාඩි දෙකක කාලයක් දුන්නා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
කථාව නවත්වන්න කියලා තමුන්නාන්සේ කලින් දැනුම් දෙන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මම ඔබතුමාට කිව්වා; හතර වතාවක් කිව්වා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
කිව්වේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මම හතර වතාවක් කිව්වා, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමා බලන්න. නැත්නම්, ලේකම් මණ්ඩලයෙන් අහන්න.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මේකෙන් දේශපාලනය කරන්න එපා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දේශපාලනය නොවෙයි, කාලය සම්බන්ධයෙන් ගැටලුවක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஸ்டெபனி பர்னாந்து)
(The Hon. Stepni Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කතෝලික ජනතාවට එල්ල කරපු එම ප්‍රහාරය ඇත්තටම හෙළා දකින්න ඕනෑ එකක්.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මට අවස්ථාව දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථාව අවසන් කළ යුතු වෙලාවට විනාඩි දෙකකට කලින් මම ඒ බව ඔබතුමාට මතක් කළා. ඊට පස්සේ හතර වතාවක් කිව්වා, කාලය අවසන් බව. ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා. 5.39]

**ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஸ்டெபனி பர்னாந்து)
(The Hon. Stepni Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කතෝලිකයෙකු හැටියට මේ ප්‍රහාරයේ බරපතළකම පිළිබඳව මම දන්නවා. මොකද, කතෝලිකයෙකුගේ මූලිකම කාරණා තුන තමයි නත්තල, මහ සිකුරාදාව සහ ක්‍රිස්තුස් වහන්සේගේ උත්ථානය සිදු වූ පාස්කු ඉරිදාව. ඇත්තටම පාස්කු ඉරු දිනය තමයි කතෝලිකයකුගේ විශේෂම අවස්ථාව. මොකද, කතෝලික ආගම රැඳිලා තිබෙන්නේ උත්ථානයත් එක්කයි. ඒ උත්ථානය සැමරීම සඳහා පල්ලිවලට ගිය ඒ අහිංසක මිනිසුන්ට එල්ල කරපු ඒ ප්‍රහාරය ඉතාම නින්දිත ප්‍රහාරයක්. ඔබතුමන්ලාත් දන්නා පරිදි, හැම කතෝලිකයෙක්ම මහ සිකුරාදාට පල්ලි යනවා. එසේ පල්ලි යන හැම කෙනෙකුගේම බලාපොරොත්තුව වෙන්නේ උත්ථාන වූ ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් කරන යාඥාවට සහභාගි වීමයි. ඒ හැම කෙනෙක්ම බොහොම ශ්‍රද්ධාවෙන් තමයි ඒ යාඥාවට සහභාගි වෙන්නේ. එම නිසා පාස්කු ඉරුදින එල්ල කරපු ඒ ප්‍රහාරය ඉතාම නින්දිත ප්‍රහාරයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම කතෝලිකයෙකු වශයෙන් මා ඒ ප්‍රහාරය දකින්නේ, ජාතිවාදී ප්‍රශ්නයක් ඇති කර ගන්න හදපු ප්‍රහාරයක් ලෙසයි. හැබැයි, කතෝලික ජනතාව වෙනුවෙන් මම කියන්න ඕනෑ, අපේ ආගමික නායක කාදිනල් හිමිපාණන් වහන්සේ ඒ ප්‍රහාරයෙන් පසු තත්ත්වය බොහොම හොඳින් කළමනාකරණය කළ බව. මම දන්නවා, ඒ ප්‍රහාරය සිදු වුණු ගමන්ම උන්වහන්සේ නිහතමානී ලෙස හැම පල්ලියකටම ගිහිල්ලා ඒ තැන්වල හිටපු හැම කතෝලිකයෙකුම හමු වෙලා ප්‍රශ්නයක් ඇති නොවන පරිදි ජනතාව සන්සුන් කළ බව. ඇත්තටම ඒ ප්‍රහාරය වුණු දිනට පහුවදා මමත් කටුවාපිටියට ගියා. මම යනකොටත් කාදිනල්තුමා එතැනට ඇවිල්ලා සිටියා. ඒ වෙලාවේ උන්වහන්සේ කිව්වේ, මේ ප්‍රහාරය නිසා අප ජාතීන් අතර බෙදීමක් ඇති කර ගන්නේ නැතුව ජාතීන් අතර සමඟිය ඇති කර ගන්න ඕනෑ, මේ ප්‍රහාරයට මුහුණ දුන් වින්දිතයන්ට සාධාරණය ඉෂ්ට වෙන්න ඕනෑ, ඒ වාගේම මේ ප්‍රහාරය කරපු අය සොයා ගන්න ඕනෑ, සොයාගෙන ඒ වැරැදිකරුවන් අත්අඩංගුවට ගන්න ඕනෑ කියලායි.

එම ප්‍රහාරය සිදු වූ අවස්ථාවේ විවිධ ජාතීන්ට අයත් අය 300දෙනෙකු පමණ මිය ගියා. මට මතක විධියට එම ප්‍රහාරයෙන් රටවල් 12ක ජනතාව මිය ගියා. මා හිතන විධියට, ඒ ප්‍රහාරය ගැන මේ පාර්ලිමේන්තුවේ කථා කරන 13වැනි අවස්ථාවයි මෙය. දහතුන්වැනි අවස්ථාව කියන්නේ, මේ ප්‍රහාරය ගැන මේ ආණ්ඩුව ඉතාම හොඳ තීන්දුවක් අරගෙන තිබෙන අවස්ථාව. මෙහෙම අවස්ථාවක මේ ප්‍රහාරය ගැන කථා වෙන්නේ මොකද කියන එක ගැන අපට ලොකු ප්‍රශ්නයකුත් තිබෙනවා. ආණ්ඩුව මේ ප්‍රහාරය ගැන සාක්ෂි විමසමින් නිසියාකාරව ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නේ. ඒකට හේතුවක් තිබෙනවා. මේ ආණ්ඩුව පත් වෙද්දී අපේ මූලික ප්‍රතිපත්තියක් වුණා, පාස්කු ප්‍රහාරයට අදාළ වැරදිකරුවන් සොයලා නීත්‍යානුකූලව දඬුවම් කරනවා කියන එක. ඒක අපේ ආණ්ඩුවේ මූලික ප්‍රතිපත්තියක් වෙලා තිබුණා. ඒ නිසා ජනතාව මේ ආණ්ඩුව කෙරෙහි ලොකු විශ්වාසයක් තැබුවා. ඒ විශ්වාසය තහවුරු කරමින් කටයුතු කරන අවස්ථාවක් මේ. දැන් මේ ප්‍රහාරය ගැන සාක්ෂි විමසමින් එක් එක්කෙනා අත්අඩංගුවට ගනිමින් කටයුතු කරනවා. අවසානයේ සුරේෂ් සලේ අත්අඩංගුවට ගැනීමත් සමඟ මේ රටේ පොඩි ප්‍රශ්න ටිකක් ඇති වුණා. එහෙම නේද? එහෙම ප්‍රශ්න ඇති වෙන්න හේතුව තමයි මේ ප්‍රහාරයේ තවත් හිස්තැන් හෙළිවීමයි.

ඒ අත්අඩංගුට ගැනීමත් සමඟම උදය ගම්මන්පිල හිටපු මන්ත්‍රීතුමා මේ ගැන පොතක් ලියලා එළියට දැම්මා. ඒ පොත ලියලා එළියට දමනවාත් සමඟ මේකේ තව පොඩි පොඩි දේවල් ටිකක් එළියට එන්න පටන් ගත්තා. එයාගේ කටින්ම යම් යම් දේවල් කියැවෙන්න ගත්තා. ඇත්තටම තව වැඩි කාලයක් නොගොස් ඒ සියලු වින්දිතයන්ට සාධාරණය ඉෂ්ට වෙන්නත්, මේ ප්‍රහාරය සිද්ධ කරපු අයට නිසි දඬුවම් ලබා දෙන්නත් අපි ක්‍රියාත්මක වෙනවා.

මෙතෙක් කල් විපක්ෂයේ අය අප්‍රේල් 21වැනි දා සිදුවූ පාස්කු ප්‍රහාරය දෙපැත්ත මාරු කර කර බෝලයක් වාගේ එහාට මෙහාට පාස් කර කර හිටියා. හැබැයි, අපි මේ ආණ්ඩුව භාර ගත්තාට පසුව අවශ්‍ය ක්‍රියාමාර්ග අරගෙන මේ ප්‍රහාරය කරපු අයට ඉක්මනින් දඬුවම් දෙන්න පටන් අරගෙන තිබෙනවා. මේ පාස්කු ප්‍රහාරය දේශපාලන ගේම් එකක් බව අපි කවුරුත් දන්නවා. මේ තොරතුරු තව නොබෝ දිනකින් එළියට එන බවත් බොහෝ දෙනෙක් දන්නවා. ඒ නිසා තමයි හැම කෙනෙක්ම මේ දේවල් එළියට දාගෙන යන්නේ. ඇත්තටම මේක මේ අවස්ථාවේ විවාදයට ගත යුතු මාතෘකාවක් නොවුණත්, විපක්ෂ නායකතුමා මේක එළියට ඇදලා ගත්තේ මොකද කියන එක ගැනත් අපට පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, මහ මොළකරුවන් එළියට එන හැම අවස්ථාවකදීම මේ වාගේ දේවල් සිද්ධ වෙලා තිබෙනවා. අපි කියන්නේ මේ ප්‍රහාරය ගැන ඉක්මනින්ම ක්‍රියාමාර්ග ගන්න ඕනෑ කියලායි.

මට මතකයි, මේ පාස්කු ප්‍රහාරය සිදු වෙලා සතියක් විතර යද්දී අපේ අනුර කුමාර මැතිතුමා අප කැඳවලා පොඩි සාකච්ඡාවක් කළ ආකාරය. ඒ සාකච්ඡාවේදී එතුමා කිව්වා, "මොනවා වුණත් අපි සියලු ජාතීන් එකතු කරන තැනකට යන්න ඕනෑ. ජාතිවාදය අපේ පක්ෂය තුළ නැහැ. හැම ජාතියක්ම එකතු කරගෙන ගියොත් තමයි අපට මේ රට දියුණු කරන්න, සංවර්ධනය කරන්න පුළුවන් වන්නේ. අපට මේ අවස්ථාවේ බලය නැති වෙන්න පුළුවන්. නමුත් අපි කෙළින් හිටගන්න ඕනෑ, ජාතිවාදය නැති ස්වාධීනව ජීවත් වෙන්න පුළුවන් නිවැරදි රටක් වෙනුවෙන්" කියලා.

මා මේ අවස්ථාවේදී අවසාන වශයෙන් කියා සිටිනවා, අනුර කුමාර දිසානායක සහෝදරයා බලයට පත් වෙලා වැඩි කාලයක් යන්න ඉස්සෙල්ලා මේ ප්‍රශ්න විසඳලා රටට නිවැරදි නායකත්වයක් දීලා තිබෙනවා කියලා. දැන් අපට පුළුවන් වැරදිකරුවන් අත්අඩංගුවට අරගෙන මේ කටයුතු නිවැරදි දිසාවට ගෙනියන්න. වින්දිතයන්ට සාධාරණය ඉෂ්ට වෙන්නත්, වැරදිකරුවන්ට දඬුවම් දෙන්නත් පුළුවන් විධියට මේ රට ගොඩ නඟනවා කියන කාරණය කියමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.47]

**ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ගරු AI සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමා විසින් පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් සභාව කල් තබන යෝජනාව ඉදිරිපත් කරනකොට මට සිහි වුණේ විපක්ෂයට අත් වෙච්ච ඉරණම ගැනයි.

අද මේ විපක්ෂයට ජාතික ශෝක දිනයක් බවට පත්වෙලා තිබෙනවා, පැති දෙකකින්. පසුගිය දවසක අර ගම්මන්පිල උන්නැහේගේ පොත එළිදක්වන එකට ගිහිල්ලා දැන් කොළේ ඉරාගෙන, ඇඟේ හලාගෙන, හත් පොළේ ගාගෙන, ගලේ පහරපු බළල්ලු බවට පත්වෙලා ඉන්නවා, විපක්ෂයේ මහත්වරු ටික. ඒ එකක්. *[බාධා කිරීමක්]* ඊළඟට, ඉරානය සහ ට්‍රම්ප් අතර යුද්ධය. මේ යුද්ධය තලු මර මරා හිටියේ, මේ මහත්වරු. මේ රටේ ජනතාව විපතට පත්වෙලා, ජනතාවට තෙල් පෝලිම් හැදිලා, ජනතාවගේ බඩු මිල ඉහළ ගිහිල්ලා, විදුලිය නැතිවෙලා, මේ රටේ ජනතාව විපත්තියට පත් වෙනකල් තලු මර මරා හිටියේ, මේ අය. නමුත් අද වෙනකොට ඒකටත් තාවකාලිකව යුද විරාමයක් ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා මම හිතන හැටියට අද මෙතුමන්ලාට ජාතික ශෝක දිනයක්. ඒක නිසාම තමයි AI සජිත් ප්‍රේමදාස මහත්මයාට සිද්ධ වුණේ අද මෙහෙම සභාව කල් තැබීමේ යෝජනාවක් ගෙනෙන්න, එතුමාගේම අත්සනින්. වෙන කාගේවත් නොවෙයි, එතුමාගේම. ඉතින්, පසුගිය දිනක ගම්මන්පිලගේ පොත එළිදැක්වුණා. මේ ගම්මන්පිල මාසයක විතර ඉඳලා කිය කියා හිටියේ 31වන දා මහ මොළකරුවෝ සොයාගෙන යනවා කියලා. ඒක බලන්න තමයි ගිහිල්ලා ඉස්සරහා පේළියේ වාඩිවෙලා හිටියේ. මීට කලින් කථා කරපු ගරු මන්ත්‍රීතුමා කතෝලික මන්ත්‍රීවරයෙක්. මම හිතන හැටියට තව ඉස්සරහටත් කථා කරන්න ඉන්නවා, කතෝලික මන්ත්‍රීවරු.

[ගරු මහින්ද ජයසිංහ මහතා ]

මම අහනවා, පසුගිය කාලය තිස්සේ ඔයගොල්ලන්ම චෝදනා කරපු රාජපක්ෂලාත් එක්ක එක පෙළට ඉඳගෙන වින්දිතයන්ට සාධාරණය ඉටු කරන්න පුළුවන්ද කියලා. එතුමාගේ පුටුවට පුටු දෙකක් විතර එහා පැත්තෙන් හිටියේ මේ පාස්කු ප්‍රහාරයට අදාළ නඩුවකින් වන්දි ගෙවන්න කියපු මෛත්‍රීපාල සිරිසේන හිටපු ජනාධිපති. එයා එක්ක එක පෙළට වාඩිවෙලා සිටියා. ඒ එක පෙළට වාඩිවෙලා පුළුවන්ද වින්දිතයන්ට සාධාරණය ඉටු කරන්න? විශේෂයෙන්ම අපේ කතෝලික ආදරණීය බැතිමතුන්ට විතරක් නොවෙයි, සමස්ත රටේ ජනතාවට සාධාරණය ඉටු කරන්න පුළුවන්ද කියලා අපි අහනවා. ඒ විතරක් නොවෙයි. එක්කෙනෙක් කියනවා, ඒ "AI සජිත්" කියලා. තව කෙනෙක් කියනවා, නැහැ, එතුමා දැනගෙන නොවෙයිලු ගියේ. තව කෙනෙක් එක එක ජාතියේ ඒවා කියන්න පුළුවන්. හිතෙන හිතෙන ඒවා කියනවා. අඩුම ගණනේ ඔක්කොම එකතු වෙලා එක කථාවක් කියන්නකෝ, අප්පා. හැමෝම එකතු වෙලා එක කථාවක් කියන්නකෝ. එහෙමත් නැහැ. අපි දන්නේ නැහැ "AI සජිත්" ද, එහෙම නැත්නම්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ද කියලා. ඒ තරමට දේශපාලනය කියවාගන්න බැරි නම්, ඒ තරමට දේශපාලනය බොඳවෙලා නම් තිබෙන්නේ, රටක විපක්ෂයකට, රටේ ජනතාවට නායකත්වය දෙන්නේ කොහොමද කියලා අපි අහනවා. ඊළඟට ජනාධිපති වෙන්න නේ සූට් මහගෙන ඉන්නේ. ඉතින් කොහොමද ජනාධිපති වෙන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට කියන්න ඕනෑකම තිබෙනවා තවදුරටත් මේ රටේ ජනතාව රවටන්න උත්සාහ කරන්න එපා කියලා. අඩුම ගණනේ නිහතමානී වෙන්න. ඔව්, දැන් ඒක වුණා, එතැනට ගියා, වැරැද්දක් වුණා කියලා. නිහතමානීව ඒ වැරැද්ද පිළිගන්න, භාරගන්න, අපි අනාගත්තා කියලා. අඩුම ගණනේ දැන් ඒක භාරගන්න. එහෙමත් නැහැ. ඒ වෙනුවට තව ඒක සුද්ද කරන්න යනවා. සුද්ද කරන්න යන්න යන්න ගලේ පහරපු බල්ලාට වෙච්ච දේම තමයි වෙන්නේ. ඇඟ පුරාම ගෑවෙනවා. අර fan එකකට මල පහ කරලා වාගේ දැන් ඒක කාමරය පුරාම හැම තැනම යනවා. ඒ විතරක් නොවෙයි, පාර්ලිමේන්තුව පුරාත් දැන් යනවා. එහෙම තැනකට දැන් මේක පත්වෙලා තිබෙන්නේ. ඒ නිසා මේක තවදුරටත් නිවැරදි කරන්න බැහැ. විශේෂයෙන්ම මේ පාස්කු ඉරු දින ප්‍රහාරය කියලා කියන්නේ එක් සිද්ධියක් නොවෙයි, සිද්ධි දාමයක අවසානය. ඇයි ඒ? අපට මතකයි, ඊට පෙර වසර ගණනාවක් තිස්සේ වඳ කොත්තු මතු වුණා, වඳ ජෙල් මතු වුණා, වඳ බ්‍රේසියර් මතු වුණා, වඳ සැත්කම් මතු වුණා. මට මතකයි, ඒ වෙලාවේ වඳ සැත්කම් ගැන චෝදනා කළේ ෂාෆි කියන වෛද්‍යවරයාට. මේ වෙනකොට ඔහු සම්පූර්ණයෙන්ම ඒ චෝදනාවෙන් නිදොස්කොට නිදහස් කර තිබෙනවා. ඒ වෙලාවේ මහින්ද රාජපක්ෂ කිව්වා මට මතකයි, "ෂාෆි විසින් වඳ කරපු හැම අම්මෙකුටම වන්දි ගෙවනවා" කියලා. එහෙම කියපු රාජපක්ෂලාත් එක්ක තමයි එක පෙළට AI සජිත් ප්‍රේමදාස වාඩිවෙලා හිටියේ. ඒ නිසා වෙන වෙන බොරු කියලා දැන් සමාජයෙන් ගැලවෙන්න බැහැ. මේ පාස්කු ප්‍රහාරය කියලා කියන්නේ සිද්ධි දාමයක අවසානය. ඒ හැම එකක්ම ගැට ගැහුවේ, ඒ හැම එකක්ම පෙළ ගැස්සුවේ බලයට ඒම වෙනුවෙන්. ඒ අය අද මෙතැන හිටියා නම් හොඳයි. ගම්මන්පිල එළිදක්වපු පොතේ මහ මොළකරුවන්ගෙන් මෙතැන ඉන්න ඕනෑ කෙනෙක්, මේ විපක්ෂයේ ඉස්සරහා පේළියේ සාටක දාගෙන ඉන්න මහත්තයා. හැබැයි, අද නැහැ. හිටියා නම් හොඳයි. මොකද, ඔහු සමහර වෙලාවට ඉතිහාසය අමතක කරලා හිතනවා, එයාට වගේම රටේ ජනතාවටත් ඉතිහාසය අමතක වෙලා කියලා. නැහැ නාමල්, රටේ ජනතාවට ඉතිහාසය අමතක වෙලා නැහැ. මේ රටේ ආර්ථිකය විනාශ කරපු විධිය, බලයට ඒම වෙනුවෙන් පාස්කු ප්‍රහාරය ඇතුළු විවිධ අපරාධ කරපු විධිය මේ රටේ ජනතාවට අමතක වෙලා නැහැ. ඒ නිසා අද මේ පාස්කු ප්‍රහාරය පිළිබඳව සභාව කල් තබන අවස්ථාවේ ගෙනාපු යෝජනාව විවාදයට ගන්න වෙලාවේදී ඒ අය මේ සභාවේ හිටියා නම් හොඳයි.

ඒ විතරක් නොවෙයි. ඊට දවස් තුන හතරකට පස්සේ අපි දැක්කා, - මීට කලින් සැරයක් මේ පාර්ලිමේන්තුවේදී පාස්කු ප්‍රහාරයේ මහ මොළකරු කියලා තව කෙනෙකුගේ නමක් හෙළිදරව් කළා නේ. සරත් වීරසේකර හිටපු මන්ත්‍රීවරයා නමක් හෙළිදරව් කළා නේ. අපට මතකයි, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාට එතුමා චෝදනා කළා, මේ ප්‍රහාරයට එයා සම්බන්ධයි, මේ ප්‍රහාරය සම්බන්ධයෙන් එයාගේ link එකක් තිබෙනවා කියලා. අපි අහනවා, දැන් 31 ඉඳලා දවස් කීයක් ගතවෙලා තිබෙනවා ද? ඒ ප්‍රකාශ කරලාත් දැන් දවස් කීයක් ගත වෙලා තිබෙනවා ද? අද මේ පාර්ලිමේන්තුවේ ප්‍රකාශ කරනතුරු, අඩුම ගාණේ AI සජිත් ප්‍රේමදාසවත්, ඔය විපක්ෂයේ සජබයේ කිසිවෙක් මුජිබුර් රහුමාන් මන්ත්‍රීවරයා වෙනුවෙන් එක ප්‍රකාශයක් කළේ නැහැ. *[බාධා කිරීමක්]* ඔව්, දන්නවා. එතුමා දන්නවා, ඔයගොල්ලන්ගේ තරම. එතුමාට එවැනි ආකාරයේ ප්‍රකාශ කරද්දී, පහර දෙද්දී අඩුම ගාණේ එතුමා ආරක්ෂා කරන්න කටයුතු කළේ නැහැ. *[බාධා කිරීමක්]* අනේ ඉන්න, සුජිත් සංජය පෙරේරා මහත්තයෝ! *[බාධා කිරීමක්]* ඔව්, එයා හොඳට දන්නවා. ඒ නිසා, මුජිබුර් රහුමාන් මහත්මයාට අපි මේකත් කියන්න ඕනෑ. අපි කථාවක් අහලා තිබෙනවා නේ, "බල්ලොත් එක්ක නිදා ගත්තොත් මැක්කොත් එක්ක නැඟිටින්න වෙනවා" කියලා. ඒ ජාතියේ එකක් තමයි එතුමාටත් අත්වෙලා තිබෙන්නේ. අපි විශ්වාස කරන්නේ නැහැ, කිසිසේත්ම එවැනි සම්බන්ධයක් එතුමාගේ ඇති කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් පමණයි ඉතිරිව තිබෙන්නේ.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)

මට තව විනාඩි දෙක තුනක් වැඩිපුර දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

කෙසේ වෙතත්, මේ කාරණයත් මම කියන්න ඕනෑ. මේ රටේ පොත් ලියන එක ගැන අපට ඉතිහාසයක් තිබෙනවා. මම දැක්කා, මේ පාර්ලිමේන්තුවේ ඊයේත් බෙරිහන් දෙමින් ජනාධිපතිතුමාටත් අභියෝග කරපු විධිය. කියන්න දෙයක් නැහැ, ඒ අභියෝග ගැන. කවුද මේ? මහ බැංකුවේ බැඳුම්කර වංචාව ගැන "ඇත්ත-නැත්ත" කියලා පොත් ලියපු උදවිය. අපේ රටේ පොත් ලියපු ඒ වාගේ ඉතිහාසයක් තිබෙනවා. දැන් උදය ගම්මන්පිල උන්නැහේ ලියා තිබෙනවා, "පාස්කු ප්‍රහාරයේ මහ මොළකරු සොයා යෑම" කියලා පොතක්. ඉස්සරහටත් තව ඒවා ඒවි. මට කියන්න තිබෙන්නේ මේකයි. සින්දුවකුත් තිබෙනවා නේ, "පිටුව පෙරලුවට සීතා පොත දන්නවා රාමා" කියලා. ඒ නිසා පොත් පෙරලුවාට, පිටු පෙරලුවාට මේ මහත්තුරු ලියන පොත් ගැනත්, පෙරළන පොත් ගැනත් අපේ රටේ ජනතාව හොඳින්ම දන්නවාය කියන එක අපි අවධාරණය කරන්න ඕනෑ.

විශේෂයෙන්ම අද මේ විවාදයේදී සමහරු නොයෙක් කරුණු මතු කළා. ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමාත් එක සිද්ධියක් සම්බන්ධයෙන් ප්‍රශ්නයක් මතු කරමින් අසා සිටියා, මේ පාස්කු

ප්‍රහාරයට අදාළ පරීක්ෂණ ඉදිරියට ගෙනයෑම සම්බන්ධයෙන් රජයටත් යම් බලපෑමක් තිබෙනවා ද කියලා. නැහැ, අපි මේ කාරණයත් අවධාරණය කරන්න ඕනෑ. වසර 7ක් තිස්සේ මේ රටේ ජනතාවගේ සිත් තුළ ඉතාම දැඩි බලාපොරොත්තුවක් තිබුණා, පාස්කු ප්‍රහාරයට අදාළ අපරාධකරුවන්ට දඬුවම් දීම පිළිබඳව. ඔවුන්ගේ සිත් තුළ එවැනි විශ්වාසයක් තිබුණා. ඔවුන් ජාතික ජන බලවේගයේ ආණ්ඩුව බලයට පත් කරද්දී ඔවුන් තුළ විශාල විශ්වාසයක් තිබුණා, ජාතික ජන බලවේගයේ ආණ්ඩුවෙන්, මාලිමාවේ ආණ්ඩුවෙන් ඔවුන්ට සාධාරණය ඉෂ්ට වෙයි කියලා. අපි මේ රටේ ජනතාවට සහතික වෙනවා. ඒ තමයි, ඔබ අප කෙරෙහි තබපු විශ්වාසය බිඳකුදු අපි බිඳ වට්ටන්නේ නැහැ කියන සහතිකය අද මේ විවාදයට එකතු වෙමින් අපි ඔබට ලබා දෙනවා. ඒ නිසා කවුරු මොන සැක සංකා හදන්න හැදුවත් කිසිදු සැකයක් නැතිව මේ පරීක්ෂණ ඉදිරියට යනවා. පරීක්ෂණ අද වෙනකොට සියයට 99ක් අවසන් වීගෙන යනවා. දැන් අවසාන අදියරේ තිබෙන්නේ. එහෙම තිබියදී තමයි පොත් ලියලා, අධිකරණයේ තිබෙන කටයුත්තක් සම්බන්ධව නැවත නැවත මේ පාර්ලිමේන්තුවේ විවාදයට අරගෙන, නැවත නැවත මේ පරීක්ෂණ, නැත්නම් පාස්කු ප්‍රහාරයට අදාළ අපරාධකරුවන් සොයා යාම බොඳ කරන්න උත්සාහ කරමින් තිබෙන්නේ. ඒ කුමන වුවමනාවකටද කියලා මම අහනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මට තව විනාඩි දෙකක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
එතුමාට විනාඩි දෙකක් දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාල වේලාව සම්බන්ධව ගැටලුවක් තිබෙනවා. ලේකම් මණ්ඩලය කැමැති නම්,-

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ගරු ඇමතිතුමාගෙන් විනාඩි දෙකක් ගන්නවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ඒ නිසා කුමන විධියට උත්සාහ කළත්, අපි එක දෙයක් සහතික වෙනවා. ඔබතුමන්ලාට මේක බොඳ කරන්න අපි ඉඩ තියන්නේ නැහැ. ඔබතුමන්ලාට මේක බොඳ කරන්න අපි ඉඩ තියන්නේ නැහැ. මේ පරීක්ෂණ නිවැරදි විධියට අරගෙන යමින් ඉතිරි වෙලා තිබෙන කෙටසත් අපි අවසන් කරනවා කියලා මේ රටේ ජනතාවට, විශේෂයෙන්ම අපේ වින්දිතයන් ඇතුළු කතෝලික ජනතාව ඇතුළු සමස්ත ජනතාවට අපි සහතික වෙනවා. ඉතින්, අප්‍රේල් 21 ගැන අහනවා. කවුද මේ අහන්නේ? පාස්කු ප්‍රහාරය සිද්ධ වෙලා මාස හතක් බලයේ හිටපු මහත්තුරු. එතකොට කාගේද ආණ්ඩුව? මෛත්‍රී-රනිල්-සජිත්ගේ ආණ්ඩුව. මට මතක විධියට සජිත් ප්‍රේමදාස ඒ ආණ්ඩුවේ හතරවැනියාට වාගේ හිටියේ. මෛත්‍රී-රනිල්-සජිත් ආණ්ඩුව මාස හතක් තිබුණා. මාස හතක් කිසිවක් නොකර බකංනිලාගෙන හිටපු මහත්තුරු තමයි අද අපෙන් ප්‍රශ්න කරන්නේ, පසුගිය අප්‍රේල් 21ට කලින් ඇයි මේක කළේ නැත්තේ කියලා. පසුගිය අප්‍රේල් 21 වෙනකොට අපි බලයට පත් වෙලා මාස හතයි. නමුත් සිද්ධිය සිදු වෙලා අවුරුදු පහමාරක් ගතවෙලා තිබුණා, අපි බලයට පත් වෙනකොට. ඒ නිසා අපි ඉතාම පැහැදිලිව අවධාරණය කරන්න ඕනෑ, කවුරු මොන විධියට මේ පාස්කු ප්‍රහාරයේ පරීක්ෂණ බොඳ කරන්න හැදුවත්, අපි මේ රටේ ජනතාව වෙනුවෙන් ඒ තබපු විශ්වාසය ඒ අයුරින්ම රකිමින් ඉදිරියට යනවා කියන එක. තවදුරටත් මේ රටේ ජනතාවට බොරු කරන්න, තවදුරටත් මේ රටේ ජනතාවගේ බුද්ධියට නිගා කරන්න එපාය කියලා අපි විපක්ෂයෙන් ඉල්ලා සිටිනවා.

අපේ ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමාට, අපේ බදියුදීන් මන්ත්‍රීතුමාට, ඒ වාගේම මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාට අද දවසේ මම විශේෂ ස්තුතියක් කරනවා. විපක්ෂයේ වුණත් ඒ මහත්තුරු අද මේ විවාදයට එකතු වෙමින්, එතුමන්ලාගේ පැත්තෙන් ඉතාම හොඳ සාධනීය අදහස් ඉදිරිපත් කළා. ඒ වෙනුවෙන් මාගේ ගෞරවය, ප්‍රණාමය පුද කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) කවින්ද ජයවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ අදහස් දැක්වීම පටන් ගන්න කලින් මේ කාරණය කියන්න කැමැතියි. අපේ හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමාගේ කථාවේදී ඔබතුමා එතුමාගේ mike එක off කළා. නමුත් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු කථා කරනකොට ඒ අයට ඉස්සරහින් ඉන්න අයගේ වේලාව අරගෙන දුන්නා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නැහැ. එකඟතාවක් මත ඒක කළේ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
දෙපැත්තට බෙදන විධිය! ඒක අසාධාරණයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නැහැ, නැහැ, ඒක පටලවා ගන්න එපා.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෙසේ වෙතත් මගේ කරුණු පැහැදිලි කිරීම -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඒක පැහැදිලි කළා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
වෙලාව දුන්නා. නමුත් ඒ වෙලාව අඩු කරලා නැහැ.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
අපි බලමු, ඔබතුමා ඒ වෙලාව අනෙක් මන්ත්‍රීවරුන්ගෙන් අඩු කරලා තිබෙනවාද කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අඩු කරලා තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අපි ලියාගෙන තිබෙන්නේ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
Sir, I rise to a point of Order. බිමල් රත්නායක ඇමතිතුමාට විනාඩි හතක් වැඩිපුර දුන්නා නේ. ඒ විනාඩි හත කාගෙන්ද අඩු වුණේ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අඩු වෙලා තිබෙනවා, මෙතැනින්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කාගෙන්ද අඩු වුණේ?

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
කාගෙන්ද අඩු කළේ? කාගෙන්වත් අඩු කරලා නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එක එක අඩු වෙලා තිබෙනවා, මෙතැනින්.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
නැහැ, නැහැ. කාගෙන්වත් අඩු වෙලා නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට ඕනෑ නම් මේ ලේඛනය මම පෙන්වන්නම්. ලේකම් මණ්ඩලයෙන් අහන්න.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
අඩු කරලා නැහැ. ඒ විනාඩි හත අඩු කරලා නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
හරිම කැතයි. ඔහොම කරන්න එපා. දෙකේ පන්තියේ වැඩ කරන්න එපා. *[බාධා කිරීම්]*

[අ.භා. 5.59]

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
හොඳයි. දැන් මගේ කථාව කරන්න ඉඩදෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා, හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා, මම පාස්කු ප්‍රහාරය පිළිබඳව මේ පාර්ලිමේන්තුවේ තිබුණු හැම විවාදයකදීම කථා කරලා තිබෙනවා. මට මතකයි, නිරෝෂන් පෙරේරා මන්ත්‍රීතුමාත් කථා කළා. හැබැයි මේ මොහොතේත් අපි පැහැදිලිව දකින්නේ මොකක්ද? ආණ්ඩු පක්ෂයෙන් විපක්ෂයට චෝදනා කරනවා. විපක්ෂයෙන් ආණ්ඩු පක්ෂයට චෝදනා කරනවා. එහෙම නැත්නම් ඉතිහාසයට චෝදනා කරනවා. මේක තමයි අපි දකින්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දැන් හෘදය සාක්ෂියට එකඟව ඇත්ත කථා කරමු. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ගැන කථා කළොත් ශානි මහත්මයා, රවී මහත්මයා කියන්නේ හමුදා බුද්ධි අංශ මේකට සම්බන්ධයි, මේ ප්‍රහාරය පිටුපස තොරතුරු රැස් කරන්න, සංවිධානය කරන්න හමුදා බුද්ධි අංශ හිටියාය කියලා. එතකොට හමුදා බුද්ධි අංශ නිලධාරින්ගෙන් අපි ඇහුවොත් කියන්නේ මොකක්ද? හමුදා බුද්ධි අංශ යටතේ හිටියා නේ, අපේ අරුණ ජයසේකර මහත්මයාත්. එතකොට ඒගොල්ලන් කියන්නේ මොකක්ද? ඒගොල්ලන් කියන්නේ, තොරතුරු ලැබිලා තිබෙද්දීත් ශානි මහත්මයලාට, රවී මහත්මයලාට, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට මේ අපරාධය වළක්වා ගන්න බැරි වුණාය කියලා. එතකොට එක පැත්තකින් හමුදා බුද්ධි අංශ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ඇඟිල්ල දිගු කරනවා. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හමුදා බුද්ධි අංශවලට ඇඟිල්ල දිගු කරනවා. ඒ වාගේම මේ සිදුවීම සිදු වෙනකොට පාලන තන්ත්‍රයේ හිටියේ, යහ පාලන ආණ්ඩුව. එතකොට එක පැත්තකින් එදා හිටපු විපක්ෂය යහ පාලන ආණ්ඩුවට ඇඟිල්ල දිගු කළා, මේ බෝම්බ ප්‍රහාරය වළක්වා ගන්න කටයුතු කළේ නැහැ කියලා.

එතකොට යහ පාලන ආණ්ඩුවේ මත දෙකක් තිබුණා. එක කණ්ඩායමක් කිව්වා, දින 52 ඇති වුණු අර්බුදයත් එක්ක තමයි ජාතික ආරක්ෂාව පිළිබඳ අර්බුදයක් ඇති වෙලා ඒ පිළිබඳ අවධානය කඩාගෙන වැටුණේ කියලා. ඒත් එක්කම තවත් කණ්ඩායමක් කිව්වා, ගෝඨාභය රාජපක්ෂ මහත්මයාව බලයට ගෙනෙන්න කණ්ඩායමක් එකතු වෙලා පාස්කු ප්‍රහාරය සංවිධානය කළා කියලා. ඒත් එක්කම ගෝඨාභය රාජපක්ෂ මහත්තයා එක්ක හිටපු කණ්ඩායම කිව්වා, මේක පිටුපස හිටියේ අන්තවාදීන්, එහෙමත් නැත්නම් මේකට වග කියන්න ඕනෑ යහ පාලන ආණ්ඩුව, එම නිසා අපට බලය දෙන්න කියලා, ඔවුන් බලය ලබා ගත්තා. හැබැයි, යුක්තිය, සාධාරණත්වය ඉෂ්ට වුණේ නැහැ.

ඊට පස්සේ මොකක්ද වුණේ? වර්තමාන ආණ්ඩුවටත් චෝදනා එල්ල වුණා. ජනතා විමුක්ති පෙරමුණේ ඊබ්‍රහිම් නානා ඔහුගේ ෆැක්ටරියේ බෝම්බ ටික හැදුවා, ඔහු ත්‍රස්ත කණ්ඩායමට රුපියල්

මිලියන 30ක්, 40ක් ලබා දුන්නා කියලා සාක්ෂි සහිතව ඔප්පු වුණා. ඊට පස්සේ මොකක්ද වුණේ? මේ සම්බන්ධයෙන් ඔහු අත්අඩංගුවට ගන්න යනකොට ඔහු කිව්වා, තව බෝම්බ පිපිරෙයි කියලා. ඒ විතරක් නොවෙයි. ඔහුගේ දරුවෝ දෙන්නා බෝම්බ පුපුරවාගෙන මේ රටේ අහිංසක මිනිස්සුන්ව මරණයට පත් කළා. ඔහුගේ ලේලි දරු ගැබක් තියාගෙන බෝම්බයක් පුපුරවාගෙන මරණයට පත් වුණා, අහිංසක මිනිස්සුත් මරණයට පත් කළා. මෙන්න මේ පුද්ගලයා ජනතා විමුක්ති පෙරමුණේ ජාතික ලැයිස්තුවේ හිටපු කෙනෙක් කියලා එදා ජනතා විමුක්ති පෙරමුණට ඇඟිල්ල දිගු වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විධියට එහෙට මෙහෙට ඇඟිල්ල දිගු කරනවා පමණයි, අහිංසක කතෝලික ජනතාවට යුක්තිය, සාධාරණත්වය ඉටු වෙලා නැහැ. මොකක්ද, අන්තිමට වෙලා තිබෙන්නේ? අන්තිමට වුණු දේ තමයි, ඊබ්‍රහිම් නානා නිදහස් වෙලා, රාජ සන්තක කරපු දේපළත් නිදහස් කිරීම. දැන් අත්අඩංගුවට අරගෙන ඉන්න අයටත් එහෙම වෙයිද කියන්න දෙවියෝ තමයි දන්නේ. ඒක තමයි අපි කියන්නේ.

අපි පැහැදිලිව අපේ පැත්තෙන් වෙන්න ඕනෑ යුතුකම ඉටු කළා. මේ රටේ කිසිදු දේශපාලන අධිකාරියකින් යුක්තිය, සාධාරණත්වය ඉටු වන්නේ නැති නිසා එදා මමත්, හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමාත්, මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාත් ජිනීවා මානව හිමිකම් කවුන්සලයට ගිහිල්ලා අපේ යුතුකම, වගකීම ඉෂ්ට කළා. මම රෝමයේ වතිකානුවට ගිහිල්ලා ශුද්ධෝත්තම පාප්වහන්සේව මුණ ගැහිලා, Cardinal Pietro Parolin මුණ ගැහිලා මේ රටේ ජනතාව ඉල්ලන යුක්තිය, සාධාරණත්වය උදෙසා කටයුතු කළා. අපි යුරෝපා පාර්ලිමේන්තුවට ගිහිල්ලා මේ පිළිබඳව අදහස් දක්වා මැදිහත් වුණා. අපේ අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් මේ රටේ ජනතාව තුළ ජාතික වශයෙන් අර්බුදයක් ඇති නොවන්න අවශ්‍ය කරන කටයුතු පුළුවන් තරම් කළා වාගේම යුක්තිය, සාධාරණත්වය උදෙසාත් සටන් කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශ්වාස කරන්නේ තවදුරටත් මේ ආණ්ඩුවලින් යුක්තිය, සාධාරණත්වය අපට ඉෂ්ට වෙන්නේ නැහැ කියලායි. අපි විශ්වාස කරන ඒකබලැති දෙවියන් වහන්සේගෙන් පමණයි, අපට යුක්තිය, සාධාරණත්වය ඉෂ්ට කරගන්න පුළුවන්කම ලැබෙන්නේ. එහෙම නැතිව බංකු අරගෙන එන්න, ජාතික ආරක්ෂාව ගැන කියලා දෙන්නම් කියලා ඡන්දය ගත්තාට, අපට යුක්තිය හා සාධාරණත්වය ඉෂ්ට වෙන්නේ නැහැ කියන එක ඉතාම පැහැදිලියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

විමල් වීරවංශ මහත්තයා එක අවස්ථාවකදී කියනවා, මහ මොළකරු ගැන. අපි ඒ තොරතුරු පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පැමිණිල්ලක් දැම්මාම 2026 පෙබරවාරි මස 22 ලිපියක් එවනවා, මේ පරීක්ෂණ තවදුරටත් ක්‍රියාත්මක කරන්න බැහැ කියලා. මේ, ඔබතුමන්ලාගේ ආණ්ඩුව තුළ. මම මේ ලිපියේ පිටපතක් **සභාගත*** කරනවා.

මේවා නිකම් බොරු චිත්‍රපට හා සමානයි. මේවා සන්දර්ශන. එක්කෙනෙක් නිකම් පොත් ලියනවා. තව එක්කෙනෙක් පොත්වල පිටු පෙරළනවා. අපිත් එක්ක ඉන්න සහෝදර මන්ත්‍රීවරයෙකු වන මුජිබුර් රහුමාන්ටත් ඇඟිල්ල දිගු කරනවා. එතුමා කිසිම වරදක් කරපු නැති මන්ත්‍රීවරයෙක්; පාර්ලිමේන්තුවේ හඬ නඟන මන්ත්‍රීවරයෙක්. අනෙක් අය නිකම් සෙල්ලම්, විහිළු දේවල් තේ කියන්නේ. AI කියනවා, BI කියනවා. *[බාධා කිරීමක්]* ඔයගොල්ලන් ලජ්ජා වෙන්න, ලජ්ජා වෙන්න. *[බාධා කිරීම්]* ඔයගොල්ලන් මහ මොළකරු කවුද කියලා කියාගන්න බැරි වුණු කණ්ඩායමක්.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට වෙන් වූ කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
අනුර කුමාර දිසානායක මහතා එදා මීගමුවට ඇවිල්ලා කිව්වා, ලබන අප්‍රේල් 21වැනි දාට කලින් මහ මොළකරුව පෙන්වනවා, ඉදිරිපත් කරනවා කියලා.

කෝ, මහ මොළකරු? කෝ, මහ මොළකරු? ඔයගොල්ලන්ට මහ මොළකරුවෙක් පෙන්වාගන්න විධියක් නැහැ. ඔයගොල්ලෝ කරපු එකම දෙය තමයි, ඔයගොල්ලන්ගේ ජාතික ලැයිස්තුවේ හිටපු ඊබ්‍රාහිම් නානාව නිදහස් කරගත්ත එක. ඒකයි කළේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
ඔයගොල්ලන්ගේ විළි වහගන්න බැරිව පොතක් ගැන කථා කරනවා. පොත ගැන කථා කරන්න එපා. ඔයගොල්ලන්ට විළි නැහැ. මේ රටේ අහිංසක මිනිස්සුන්ට බොරු කියලා, මේ රටේ ජාතිවාදය, ආගම්වාදය ඇති කළා. මතක තබාගන්න, ශානිටයි, රවීටයි පින් සිද්ධ වෙන්න තමයි ජනතාවගේ ඡන්ද ටික අරගෙන ඔයගොල්ලෝ මේ පුටුවල ඉඳගෙන ඉන්නේ. මල් තියලා වඳින්න, ඒ දෙන්නට.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
ඒ දෙන්නාට මල් තියලා වඳින්න. ඒ දෙන්නාව විශ්වාස කරලායි කතෝලික ජනතාව ඡන්දය දුන්නේ. එහෙම නැතිව ඔයගොල්ලන්ව විශ්වාස කරලා නොවෙයි. ඒක මතක තබාගන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
අපේ වෙලාව ඔබතුමන්ලා අඩු කරන්න, ප්‍රශ්නයක් නැහැ. මොකද, ඔබතුමන්ලා දැන් බලයේ ඉන්න නිසා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නැහැ. ඔබතුමා විනාඩියයි, තත්පර 30ක කාලයක් වැඩිපුර අරගෙන තිබෙනවා.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
හැමදාම බලය නැහැ. ඒ වාගේම හැමදාම මේ බලයත් එක්ක සෙල්ලම් කරන්න බැහැයි කියන එකත් මතක තබාගන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හර්ෂණ නානායක්කාර ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 6.08]

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විනාඩි 9ම ගන්නේ නැහැ. *[බාධා කිරීම්]* අයියෝ, යනවා නේ. පොඩ්ඩක් ඉන්නකෝ. *[බාධා කිරීම්]* හරි, thank you. එනවා, කියවනවා, දුවනවා, මාර වැඩක් නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනයේ මේ විවාදය ඉල්ලන්නේ අපි නොවෙයි, සජිත් ප්‍රේමදාස මැතිතුමා. එතුමා දිගින් දිගටම කිව්වා, ඇත්ත හොයන්න, ඇත්ත හොයන්න කියලා. මේ සිද්ධිය වෙන්නේ, යහ පාලන ආණ්ඩුව කාලයේ එතුමා ඒ කැබිනට් මණ්ඩලයේ නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු ඇමතිවරයා වශයෙන් හිටපු කාලයේ. මෙච්චර කාලයක් සත්‍ය හොයපු නැති සජිත්ට දැන් හදිසි වුවමනාවක් ඇතිවෙලා තිබෙනවා, සත්‍යය හොයන්න. මේවාට හිනාවෙන්න අපට දත් තිබෙන්නේ කටේ විතරයි. වෙන තැනක තිබුණා නම් හිනාවෙන්න වෙන්නේ එතැනින්. කෙසේ වෙතත්, මහිම් ගැන. ෂෝක්! ඔහුව නිදහස් කරපු එකලු අපි කළේ. ඔහුට දේපළත් නිදහස් කළාලු. 2022 මැයි 25 අපි නොවෙයි ආණ්ඩු කළේ. අන්න එදා තමයි ඊබ්‍රහිම්ව නිදහස් කළේ. ඒක කළේ අපි නොවෙයි.

අනෙක් කාරණය මෙයයි. අද විවාදයේදී කථා කරපු මන්ත්‍රීවරුන්ට මම ස්තුතිවන්ත වනවා. මොකද, මහදැනමුත්තයි, ගෝලයො රොත්තයි හැරුණුකොට විපක්ෂයේ අනෙක් හැම මන්ත්‍රීවරයෙක්ම තමන්ගේ හෘදය සාක්ෂියට එකඟව කථා කළා. ඔවුන් පැහැදිලිවම පිළිගත් මූලික කාරණාව තමයි, නැවතී තිබුණු විමර්ශන මෙම රජය යටතේ ඉතා සාර්ථක ලෙස ඉදිරියට පවත්වාගෙන යනවා කියන එක. ඒ වාගේම 2019.04.21 දින වූ මේ සිද්ධියෙන් මිය ගිය සංඛ්‍යාව 274යි, තුවාල ලැබූ සංඛ්‍යාව 564යි. ඊට වඩා තුවාල ලබපු කණ්ඩායම තමයි, මේ රටේ වෙසුණු අපේ මුස්ලිම් සහෝදර ජනතාව. ඔවුන් දුෂ්ටයෝ කළා, ත්‍රස්තවාදීන් කළා. අපේ පක්ෂයේ ජාතිවාදය නැති නිසා අපි අන්තවාදයට විතරයි විරුද්ධ වුණේ. අපි මුස්ලිම් සහෝදරවරුන් වෙනුවෙන් පෙනී සිටියා. අපිත් එක්ක එකට කාපු බීපු මුස්ලිම් සහෝදරවරුන් ගෙදරින් එළියට ආවේ නැහැ. ඒ ගැන අපට හරි වේදනායි. මේ රටේ ජාතිවාදය, ආගම්වාදය පටලවලා ජනාධිපති වෙච්ච රාජපක්ෂලා මේවා දැනගන්න ඕනෑ. ඒකයි ඒ මිනිස්සු ඒ කාලයේත් කිව්වේ, මේක පිටුපස මහ මොළකාරයෙක් ඉන්නවා කියන කාරණාව. අපට මේකෙන් දේශපාලනය කරන්න වුවමනාවක් නැහැ. අපි අද මේ විවාදය ඉල්ලුවේත් නැහැ.

කෙසේ වෙතත්, මේ වන විට දිනපතා ත්‍රිපුද්ගල විනිසුරු මඬුල්ලක් ඉදිරියේ නඩු විභාගයක් පැවැත්වෙනවා, 2019.04.21 වුණු පිපිරීම් දාමය සම්බන්ධයෙන්. එතැන චූදිතයින් 25කට විරුද්ධව නඩු අහනවා. ඒ එක පුද්ගලයෙක් මිය ගිහිල්ලා තිබෙනවා. ඒ නඩු දිනපතා අහනවා. ඒ නිසා අපට මේ වසරේදී එහි තීන්දුවත් ලැබේවි.

මිනිස්සු එදා ඉඳලා කිව්වා, ප්‍රශ්නය තිබෙන්නේ එතැන නොවෙයි කියලා. අද ආනන්ද විජේපාල ඇමතිතුමා ඒක පැහැදිලි කළා. හැමෝම කිව්වා, මේක පිටුපස මහ මොළකාරයෙක් ඉන්නවා කියලා. මේක බලයට එන්න රාජපක්ෂලා ගහපු plan එකක් කියලාත් ජනතාවගේ මතයක් තිබුණා. උදය ගම්මන්පිල ඇතුළු ඔක්කෝම අය එතැන තමයි එතකොට හිටියේ.

2018දී වවුනතිව්වල සිදු වූ පොලිස් නිලධාරින් දෙදෙනාගේ ඝාතනය, එල්ටීටීඊ එකේ ඉඳලා පුනරුත්ථාපනය වෙච්ච පුද්ගලයින් කළා කියලා ඒ පරීක්ෂණය වෙනතකට යොමු කළා, ජැකට් බෝක්කු යට දමලා. අපි බලයට ආවාට පස්සේ, අපේ ආණ්ඩුව යටතේ දැන් සොයාගෙන තිබෙනවා, එම සිදුවීම ඇත්තවශයෙන්ම සහරාන්ලා කරපු දෙයක් කියලා.

එහෙනම් මොකක්ද වෙලා තිබෙන්නේ? මහ මොළකරු ආරක්ෂා කරන්න පුද්ගලයන් කට්ටියක් ක්‍රියාත්මක වුණා. ඒ අනුව මේ පරීක්ෂණය වෙනතකට යොමු කළා. අන්න ඒ සම්බන්ධයෙන් වූ විමර්ශන තමයි දැන් ආරම්භ වෙලා තිබෙන්නේ. ඒ සම්බන්ධයෙන් දැන් පුද්ගලයන් අත්අඩංගුවට ගෙන තිබෙනවා. 2018දී සිදු වුණු ප්‍රහාරය සම්බන්ධයෙන් විමර්ශනය හැංගුවේ නැත්නම් 2019දී පාස්කු ප්‍රහාරයක් සිදු වෙන්නේ නැහැ. මොකද, දැන් අනාවරණය වෙනවා, සහරාන්ලාගේ කණ්ඩායම තමයි 2018දී සිදු වුණු ප්‍රහාරයත් කළේ කියලා. එදා ඒ විමර්ශන වෙන පැත්තකට හැරෙව්වේ නැත්නම් පාස්කු ප්‍රහාරයක් 2019දී සිදු වෙන්නේ නැහැ. අන්න ඒ කරුණ පිළිබඳව අපි හොයා ගෙන යනවා.

මේ පාර්ලිමේන්තුව තුළදීම 13 වතාවක් විවාද කර තිබෙනවා, පාස්කු ප්‍රහාරය පිළිබඳව. එහෙම නම් හදිසියේ 14වන වතාවටත් විපක්ෂ නායකතුමා මේ පිළිබඳව විවාදයක් ඉල්ලන්නේ ඇයි? ඒකට හේතුව තමයි සලේ අත්අඩංගුවට පත් වීම. සලේ අත්අඩංගුවට පත් වුණාට පස්සේ දේශපාලනඥයන්, රාජපක්ෂ කඳවුරේ අය සහ වෙනත් අය මාධ්‍ය ප්‍රකාශ නිකුත් කරනවා, පොත් ලියනවා, මහ මොළකාරයා වෙන කවුරුවත් නොවෙයි, සහරාන් හෂීම් කියනවා. මේ කලබලය මතු වෙන්නේ එතැනින්. සලේ අත්අඩංගුවට පත් වීමෙන් පසුව ඇති වුණු කලබලය නිසා තමයි සජිත් ප්‍රේමදාස මහත්තයා මේ පිළිබඳව තව විවාදයක් ඉල්ලන්නේ. අන්න ඒකයි මම මේ කල්පනා කරන්නේ. සජිත් මහත්තයා ඒ පොත එළිදැක්වීමට ගිය එක අහම්බයක්ද, නැත්නම් සංවිධානාත්මක මහ මොළකරුවන් සමඟ එකට ගැවසෙන පුද්ගලයෙක්ද කියන එක ගැන අපට නැවත නැවතත් හිතන්න වෙනවා. පව්, මට දුකයි. සජබයේ සමහර මන්ත්‍රීවරු අද මුළු දවසේම මේ සභාවේදී දැඟලුවේ ඒගොල්ලන්ගේ නායකයාව සුද්ද කරන්නයි. අපි නොවෙයි, එතුමා එතැනට දැම්මේ. අපි කිව්වේ නැහැ, book launch එකට යන්න කියලා. එහෙම ගිහිල්ලා අහු වුණාම ඉස්සෙල්ලා කිව්වා, ඒ සජිත් නොවෙයි, AI තාක්ෂණයෙන් හදපු කෙනෙක් කියලා. තව කෙනෙක් කිව්වා, එතුමා එතැනට ගියා කියලා. තුන්වෙනි කෙනා කිව්වා, ගියා, හැබැයි දන්නේ නැතුවයි ගියේ කියලා. මාසයක් තිස්සේ උදය ගම්මන්පිල කිව්වා, එදාට පාස්කු ප්‍රහාරයේ මහ මොළකරුවන් එළිදක්වනවා කියලා. සහරාන් හෂීම් කියලා මාසයක් තිස්සේ කිව්වා. හැබැයි අපරාදේ කියන්න බැහැ, උදය ගම්මන්පිල මහ මොළකරුවන් ටික ඉස්සරහ පේළියේම වාඩි කරවා තිබුණා. අපි ඒක දැක්කා. මට පුදුම හිතෙන වාගේම මට තිබෙන කම්පනය මේකයි. ප්‍රශ්නය තිබෙන්නේ ඈතක. නමුත්, සජිත් ප්‍රේමදාස මහත්තයා දුවලා ගිහිල්ලා ප්‍රශ්නයට පනිනවා. මඩ වළ තිබෙන්නේ ඈත. නමුත්, එතුමා දුවලා ගිහිල්ලා

ඒ මඩ වළට පැනලා කෑ ගහනවා, ගඳයි, ගඳයි, මේ ජාතික ජන බලවේගය අපිව මඩට දැම්මා කියලා. ඉල්ලන් කාලා අපිව මරාගෙන කන්න එපා. අපි ඔබතුමාට යන්න කිව්වේත් නැහැ, යන්න උපදෙස් දුන්නේත් නැහැ. අද අපට ඒවා ගැන නොවෙයි කථා කරන්න තිබෙන්නේ. මේ විමර්ශන කටයුතු ඉතා ඉක්මනින් අපි අවසන් කරනවා. ඒවා ඉතා සාර්ථක ලෙස ඉදිරියට යනවා. අද අදහස් දක්වපු බහුතරයක් මන්ත්‍රීවරුන්ට මම ස්තුතිවන්ත වෙනවා. දැනට විපක්ෂය පැත්තේ ඉන්නේ බදියුදීන් මන්ත්‍රීතුමා පමණයි. ඔව්, අපි මේ කටයුත්ත කරනවා. අපි යුක්තිය ඉෂ්ට කරනවා. මුජිබුර් මන්ත්‍රීතුමාත් සභාවේ ඉන්නවා. සමාවෙන්න, බොහොම කනගාටුයි, ඔබතුමා සභාවේ ඉන්නවා මම දැක්කේ නැහැ. අනෙක් කට්ටිය නම් සභාවෙන් පිටව ගියා. මොකද, ඒගොල්ලන් හිටියේ වෙන වැඩකට. ඔබතුමන්ලා මේ සභාවේ හිටියේ ඔබතුමන්ලාගේ හෘදය සාක්ෂිය අනුව නිවැරදි දේ කරන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අර්ච්චුනා මන්ත්‍රීතුමාත් ඉන්නවා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
I am sorry, Hon. Member. අපරාදේ කියන්න බැහැ, අර්ච්චුනා මන්ත්‍රීතුමාත් පාර්ලිමේන්තුවට උපරිම සහාය දක්වමින් පස් වරු 6.15 වනතුරුත් සභාවේ රැඳී සිටිනවා. එතුමා point of Order එකක් ගත්තේත් නැහැ. ඒ සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතියි.

ඒ අනුව මම අවසන් කරන්නම්, මගේ අදහස් දැක්වීම. මේ සිදු වුණු අසාධාරණය, වරද නැවත මේ රටේ ඇති වෙන්න බැහැ. කිසිදු සැකයක් තියා ගන්න එපා, මේ රජය විසින් පාස්කු ප්‍රහාරයේ මහ මොළකරුවන්ටත් විරුද්ධව නඩු පවරනවා. ඒ සම්බන්ධයෙන් වූ ත්‍රිපුද්ගල මහාධිකරණ නඩුවත් අහලා ඉවර කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා, ගරු ඇමතිතුමනි.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
මෙහෙම කියලා මේ විවාදය මම අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද කවදාවත් නැතුව විපක්ෂයේ ගොඩක් මන්ත්‍රීවරුන්ට මම ස්තුතිවන්ත වෙනවා. ඇත්තටම දැන් පාස්කු ප්‍රහාරයේ වින්දිතයා වෙලා තිබෙන්නේ සජිත් ප්‍රේමදාස මහත්තයා. ඒ, අලුත්ම වින්දිතයා. එතුමා අහක තිබෙන මඩ වළකට පැනලා. එක්කෝ, එතුමා වෘෂභ ලග්නයේ. එහෙම නැත්නම් උපදෙස් දීපු අය වෘෂභ ලග්නයේ. කෙසේ වෙතත්, ඒක අපට අදාළ වෙන්නේ නැහැ. පාස්කු ප්‍රහාරයේ වින්දිතයන්ට අපි අනිවාර්යයෙන්ම යුක්තිය ඉෂ්ට කරනවා. අපි කිසිසේත්ම මේකෙන් දේශපාලනය කරන්නේ නැහැ. අදටත් අපි කම්පා වෙනවා, එදා සිදු වුණු දේ සහ ඉන්පසුව අපේ රටේ මුස්ලිම් ජනතාවට වුණු හිරිහැර සම්බන්ධයෙන්. එය අපේ රජයක් යටතේ හෝ කිසිදු රජයක් යටතේ නැවත නොවිය යුතු දෙයක් කියලා කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

***එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 6.16ට, 2026 අප්‍රේල් 10වන සිකුරාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 6.16க்கு, பாராளுமன்றம் 2026 ஏப்பிரல் 10, வெள்ளிக்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 6.16 p.m. until 9.30 a.m. on Friday, 10th April, 2026.*

සැ.යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මීන් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில் பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau at the Department of Government Information, No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.